# වාර්ෂික ආර්ථික විවරණය

2023




ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

# වාර්ෂික ආර්ථික විවරණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 80(3) වගන්ති ප්‍රකාරව නියම වී ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරාලමින් මෙම වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත.

**2023**

**පිටපතක මිල**

මහ බැංකු කවුන්ටරයෙන් මිලදී ගැනීමේ දී - පිටපතක මිල රුපියල් 700 යි.

**ISBN 978-624-5917-61-7**
**ISSN 1391-359x**

---

කොළඹ 12, සාන්ත බස්තියම කන්ද, අංක 20 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම විසින් මුද්‍රණය කරන ලදුව, කොළඹ 01 ජනාධිපති මාවතේ, අංක 30 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කරන ලදී.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**
**අධිපති**

**ශ්‍රී ලංකා මහ බැංකුව**
30, ජනාධිපති මාවත,
කොළඹ 01, ශ්‍රී ලංකාව.

2024 අප්‍රේල් 10

**ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය 2023

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 80(3) වගන්ති ප්‍රකාරව, මහ බැංකුව විසින්, සෑම මුදල් වර්ෂයක් අවසාන වී මාස හතරක කාල සීමාවක් ඇතුළත තම ප්‍රතිපත්ති අරමුණු සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය අවධාරණය කරමින්, එම මුදල් වර්ෂය තුළ ආර්ථිකයේ තත්ත්වය පිළිබඳව මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්තාවක් ප්‍රසිද්ධ කර, එය ගරු මුදල් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එම මුදල් වර්ෂය තුළ මහ බැංකුව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් සහ තක්සේරුවක් එම වාර්තාවේ ඇතුළත් විය යුතු වේ.

මෙම නීතිමය අවශ්‍යතාව සපුරාලමින්, 2023 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මහ බැංකුවේ ප්‍රථම වාර්ෂික ආර්ථික විවරණය මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,



# පටුන


මූලික ආර්ථික දර්ශක

මූලික සමාජ දර්ශක

සමස්ත සාරාංශය

පිටුව

1. සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය

සාරාංශය ... ... ... 1

1.1 උද්ධමනය සහ මිල ප්‍රවණතා ... ... ... 2

1.1.1 උද්ධමනය ... ... ... 2

1.1.2 මිල ... ... ... 11

1.1.3 පාරිභෝගික මිල දර්ශක සහ ජීවන වියදම ... ... ... 12

1.1.4 වැටුප් ... ... ... 13

1.2 මූර්ත අංශයේ ප්‍රවණතා ... ... ... 14

1.2.1 ආර්ථික වර්ධනය ... ... ... 14

1.2.2 නිෂ්පාදිතය ... ... ... 15

1.2.3 වියදම ... ... ... 17

1.2.4 ආදායම ... ... ... 18

1.2.5 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය ... ... ... 18

1.2.6 ආර්ථික යටිතල පහසුකම් ... ... ... 19

1.2.7 සමාජ යටිතල පහසුකම් ... ... ... 23

1.3 මුදල් අංශයේ ප්‍රවණතා ... ... ... 25

1.3.1 දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටි කාලීන පොලී අනුපාතික ... ... 25

1.3.2 වෙළඳපොළ පොලී අනුපාතික ... ... ... 26

1.3.3 ණය සමස්ත ... ... ... 29

1.3.4 මුදල් සමස්ත ... ... ... 31

1.4 විදේශීය අංශයේ ප්‍රවණතා ... ... ... 34

1.4.1 ගෙවුම් තුලනය ... ... ... 35

1.4.2 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, සංචිත වත්කම් සහ සමස්ත ශේෂය ... ... 44

1.4.3 විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම් ... ... ... 46

1.4.4 විනිමය අනුපාතිකයේ හැසිරීම ... ... ... 49

1.5 මූල්‍ය අංශයේ ප්‍රවණතා ... ... ... 52

1.5.1 බැංකු අංශය ... ... ... 56

1.5.2 බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ... ... ... 60

1.5.3 මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය ... ... ... 67

1.5.4 මූල්‍ය අන්තර්ගතභාවය ... ... ... 69

1.5.5 මූල්‍ය යටිතල පහසුකම් ... ... ... 70

පිටුව


| | | |
|---|---|---|
| 1.6 | රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා ... ... ... | 75 |
| | 1.6.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් ... ... ... | 75 |
| | 1.6.2 රජයේ ආදායම, වියදම සහ ශුද්ධ ණය දීම් ... ... ... | 76 |
| | 1.6.3 අයවැය හිඟය මූල්‍යනය ... ... ... | 78 |
| | 1.6.4 මධ්‍යම රජයේ ණය සහ රාජ්‍ය ණය ... ... ... | 79 |
| | 1.6.5 මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් ... ... ... | 82 |
| **2.** | **මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය** | |
| | සාරාංශය ... ... ... | 83 |
| 2.1 | මුදල් ප්‍රතිපත්ති රාමුව ... ... ... | 84 |
| 2.2 | මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග ... ... ... | 84 |
| 2.3 | විදේශීය අංශයේ ප්‍රතිපත්ති ... ... ... | 88 |
| | 2.3.1 විනිමය අනුපාතික ප්‍රතිපත්තිය ... ... ... | 88 |
| | 2.3.2 විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ... ... | 89 |
| | 2.3.3 ආනයන සීමා ලිහිල් කිරීම ... ... ... | 90 |
| 2.4 | මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ... ... ... | 91 |
| | 2.4.1 සාර්ව විචක්ෂණශීලී අධිකාරිය නම් කිරීම ... ... ... | 91 |
| | 2.4.2. බලපත්‍රලාභී බැංකුවලට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ... ... | 92 |
| | 2.4.3 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධිත ප්‍රතිපත්ති ... | 93 |
| | 2.4.4 රාජ්‍ය ණය කළමනාකරණ ප්‍රතිපත්ති ... ... ... | 93 |
| | 2.4.5 මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ප්‍රතිපත්ති ... ... ... | 97 |
| | 2.4.6 ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා වන ප්‍රතිපත්ති ... ... ... | 97 |
| | 2.4.7 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම ... | 98 |
| | 2.4.8 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති ... ... ... | 103 |
| | 2.4.9 තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ පිළිබඳ ප්‍රතිපත්ති ... ... | 103 |
| | 2.4.10 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ... ... ... | 104 |
| | 2.4.11 අනෙකුත් ප්‍රතිපත්ති ... ... ... | 104 |
| **3.** | **සාර්ව ආර්ථික ඉදිරි දැක්ම** | |
| | සාරාංශය ... ... ... | 117 |
| 3.1 | ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම ... ... ... | 118 |
| 3.2 | දේශීය ආර්ථිකයේ ඉදිරි දැක්ම ... ... ... | 119 |
| | 3.2.1 උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම ... ... ... | 119 |
| | 3.2.2 වර්ධන අපේක්ෂා ... ... ... | 122 |
| | 3.2.3 මුදල් අංශයේ ඉදිරි දැක්ම ... ... ... | 124 |
| | 3.2.4 විදේශීය අංශයේ ඉදිරි දැක්ම ... ... ... | 125 |
| | 3.2.5 මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම ... ... ... | 129 |
| | 3.2.6 රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම ... ... ... | 130 |
| **සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය** | | |
| **විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය** | | |

# සංඛ්‍යා සටහන්

පිටුව


1. **සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය**

1.1 සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2018-2023) ... ... ... 6

1.2 උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය) ... ... ... 11

1.3 කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම ... ... 15

1.4 පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් ... ... 17

1.5 පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක ... ... 18

1.6 කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය ... ... 19

1.7 පොලී අනුපාතිකවල හැසිරීම ... ... ... 28

1.8 මුදල් සමස්තවල ප්‍රවණතා ... ... ... 32

1.9 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම ... ... ... 34

1.10 වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය ... ... ... 36

1.11 වෙළඳ මිල අනුපාතයෙහි සාරාංශය (2010=100) ... ... ... ... 38

1.12 ශ්‍රී ලංකාව වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන ... ... 40

1.13 මූල්‍ය ගිණුම ... ... ... 43

1.14 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (සාරාංශය) ... ... ... ... 45

1.15 දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය ... ... ... 46

1.16 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ... ... ... 48

1.17 විදේශීය ණය සේවාකරණ ගෙවීම් ... ... ... 49

1.18 විනිමය අනුපාතික වෙනස්වීම් ... ... ... 50

1.19 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික ... ... ... 52

1.20 මූල්‍ය අංශයේ සමස්ත වත්කම් ... ... ... 56

1.21 බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය ... ... ... 57

1.22 බැංකු අංශයේ තැන්පතු සංයුතිය ... ... ... 57

1.23 බැංකු අංශයේ ලාභදායීත්වය ... ... ... 59

1.24 බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය ... ... ... 60

1.25 සේවක අර්ථසාධක අරමුදලෙහි කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය ... ... 67

1.26 රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය ... ... ... 75

1.27 මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී) ... ... ... 81

2. **මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය**

2.1 දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියෙහි සාරාංශය ... ... ... 97

3. **සාර්ව ආර්ථික ඉදිරි දැක්ම**

3.1 ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම ... ... ... 118

3.2 කෙටි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන ... ... ... 121

# රූප සටහන්

පිටුව


1. සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය

1.1 ශ්‍රී ලංකාවේ උද්ධමනයේ මෑත කාලීන හැසිරීම ... ... ... ... 3
1.2 ජීවන වියදම, පාරිභෝගික මිල දර්ශකය සහ උද්ධමනය ... ... ... 13
1.3 2023 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන ... ... 14
1.4 වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතික ... ... ... ... 15
1.5 2023 වසරේ ආර්ථික කටයුතුවල වර්ධනය ... ... ... ... 16
1.6 විදුලිබල හා බලශක්ති අංශයේ ප්‍රවණතා ... ... ... ... 21
1.7 ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ එක්දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ... ... ... ... 26
1.8 තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම ... ... ... ... 27
1.9 රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය ... ... ... 29
1.10 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය ... ... ... 30
1.11 බැංකු පද්ධතියෙන් රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස ... ... ... 31
1.12 පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා තුඩු දුන් සාධක ... ... 33
1.13 විදේශීය අංශයේ සුවිශේෂී කරුණු ... ... ... ... 35
1.14 ජංගම ගිණුමේ ශේෂය සහ එහි සංයුතිය ... ... ... ... 36
1.15 අපනයන සංයුතිය ... ... ... ... 37
1.16 ආනයන සංයුතිය ... ... ... ... 38
1.17 රටවල් අනුව වෙළඳ ශේෂයන් ... ... ... 39
1.18 මූල්‍ය ගිණුම ... ... ... 43
1.19 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය ... ... ... ... 44
1.20 සංචිත වත්කම් තත්ත්වයෙහි ප්‍රධාන සංරචක ... ... ... ... 45
1.21 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ... ... ... ... 47
1.22 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීම් සහ වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය ... ... ... ... 50
1.23 විනිමය අනුපාතික අතිප්‍රමාණය වීම / අවප්‍රමාණය වීම ... ... ... 51
1.24 සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) - මුදල් වර්ග 24 පැස අනුව ... ... 51
1.25 බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2023 අවසානයට) ... ... ... 58
1.26 බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක ... ... ... ... 59
1.27 බැංකු අංශයේ ප්‍රාග්ධන අනුපාත ... ... ... 60
1.28 2022 සහ 2023 වසර සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සේවාවන් අනුව සපයන ලද සමස්ත ණය සහ අත්තිකාරම් (දළ) ... ... 64
1.29 2023 වසරේ විවට වෙළඳපොළ කටයුතු, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම් ... ... ... 68
1.30 මිල දර්ශකවල විචලනයන් සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය ... ... 69
1.31 කොටස් වෙළඳපොළෙහි විදේශ සහභාගීත්වය ... ... ... 69
1.32 සුළු පරිමාණ ගනුදෙනුවල ප්‍රමාණය ... ... ... ... 70
1.33 රාජ්‍ය ආදායමේ සංයුතිය - 2023 ... ... ... 76
1.34 රාජ්‍ය ආදායම, වියදම සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් ... ... ... 77
1.35 රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2023 ... ... ... ... 78
1.36 මධ්‍යම රජයේ නොපියවූ ණය ... ... ... 80
1.37 මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) ... ... 82

3. සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

3.1 කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනයේ පුරෝකථන (කාර්තුමය සාමාන්‍ය, වාර්ෂික ලක්ෂ්‍යමය, %) ... ... ... ... 120
3.2 කාර්තුමය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙහි පුරෝකථනය (වාර්ෂික ලක්ෂ්‍යමය, %) ... ... ... 123

## විශේෂ සටහන්


පිටුව

1. සැපයුම් අංශයේ උද්ධමනය හේතුවෙන් මුදල් ප්‍රතිපත්තියට වන බලපෑම ... ... ... 7

2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන - ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීමක් ... ... ... 53

3. තිරසාර ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම ... ... ... 61

4. වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය: මූල්‍ය පද්ධතියේ විශ්වාසය පවත්වා ගැනීම ... ... 73

5. ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028): මූල්‍ය සාක්ෂරතාවයේ පිරිපුන් ශ්‍රී ලංකාවක් කරා ... ... ... 94

6. ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් වූ අන්‍යොන්‍ය ඇගයීම 2025: එහි ජාතික වැදගත්කම ... ... 99

7. ශ්‍රී ලංකාවේ විදේශීය ජංගම ගිණුමෙහි ප්‍රවණතා වඩාත් තිරසාර කිරීම ... ... ... 126

විශේෂාංග සටහන - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ... ... ... 106


## සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය


සංඛ්‍යා සටහන

**1. මූර්ත අංශය**

කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය ... ... ... 1

ජනගහනය, ශ්‍රම බලකාය සහ විදේශ සේවා නියුක්තිය ... ... ... 2

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) ... ... ... 3

ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) ... ... ... 4

වැටුප් ප්‍රමාණ දර්ශක ... ... ... 5

**2. විදේශීය අංශය**

අපනයන සංයුතිය ... ... ... ... 6

ආනයන සංයුතිය ... ... ... ... 7

අපනයන වෙළඳ දිශාව ... ... ... ... 8

ආනයන වෙළඳ දිශාව ... ... ... ... 9

ගෙවුම් තුලනය ජංගම ගිණුම ... ... ... ... 10

ගෙවුම් තුලනය මූල්‍ය ගිණුම ... ... ... ... 11

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය ... ... ... ... 12

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ... ... ... ... 13

විනිමය අනුපාතිකයේ හැසිරීම (විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය) ... ... 14

**3. රාජ්‍ය මූල්‍ය අංශය**

ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය මූල්‍ය කටයුතු ... ... ... ... 15

මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී) ... ... ... ... 16

**4. මුදල් අංශය**

පවත්නා වෙළඳපොළ මිල අනුව දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය ... ... ... 17

මූල්‍ය ශක්තිමත්භාවය පිළිබඳ දර්ශක බැංකු අංශය ... ... ... ... 18

බලපත්‍රලාභී මුදල් සමාගම් පිළිබඳ තොරතුරු ... ... ... ... 19

# විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

සංඛ්‍යා සටහන


| | | | | | |
|---|---|---|---|---|---|
| **1. මූර්ත අංශය** | | | | | |
| ජනගහනය සහ ශ්‍රම බලකාය | ... | ... | ... | ... | 1 |
| ජාතික නිෂ්පාදිතය | ... | ... | ... | ... | 2 |
| මිල | ... | ... | ... | ... | 3 |
| **2. විදේශීය අංශය** | | | | | |
| ගෙවුම් තුලනය | ... | ... | ... | ... | 4 |
| සංචිත, මුළු විදේශීය වත්කම්, විදේශීය ණය සහ විනිමය අනුපාතික | | ... | ... | ... | 5 |
| **3. රාජ්‍ය මූල්‍ය අංශය** | | | | | |
| රාජ්‍ය මූල්‍ය කටයුතු | ... | ... | ... | ... | 6 |
| මධ්‍යම රජයේ ණය | ... | ... | ... | ... | 7 |
| **4. මුදල් අංශය** | | | | | |
| මුදල් සමීක්ෂණය ($M_{2b}$) | ... | ... | ... | ... | 8 |
| පොලී අනුපාතික | ... | ... | ... | ... | 9 |


# සංඛ්‍යා සටහන් සඳහා අදාළ විග්‍රහ හා විස්තර සටහන්

පහත දැක්වෙන පොදු සටහන් එක් එක් සංඛ්‍යා සටහනෙහි පාදක සටහන් සඳහා පරිපූරක වෙයි.

1. සම්පූර්ණත්වය සඳහා සමහර සංඛ්‍යා සටහන්වල තාවකාලික සංඛ්‍යාවන් ඇතුළත් කොට ඇත.
2. ඇතැම් සංඛ්‍යා සටහන්වල සංඛ්‍යාවන් ආසන්නම පූර්ණ සංඛ්‍යාවට දක්වා ඇත. එබැවින් දක්වා ඇති එකතුවෙහිත්, සංඛ්‍යා එකතු කළ විට ලැබෙන මුළු එකතුවෙහිත් සුළු වෙනස්කම් පැවතිය හැක.
3. කලින් පළ කොට ඇති සංඛ්‍යාවන්ගෙන් වෙනස් වන්නේ, පසුව කළ සංශෝධන නිසාය.
4. වරහන් තුළ සඳහන් කර ඇති සංඛ්‍යා ඍණ වටිනාකම් වේ.
5. පහත සඳහන් සංකේතයන් යොදා ඇත.

| | | |
|---|---|---|
| ... | = | සැලකිය යුතු නොවේ |
| – | = | නැත |
| ලැ.නො. | = | ලැබී නොමැත |

# මූලික ආර්ථික දර්ශක

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 (අ) |
|---|---|---|---|---|---|---|---|
| **ජනගහනය** | | | | | | | |
| මධ්‍ය වාර්ෂික ජනගහනය (පුද්ගලයන් දහස්) (ආ)(ඇ) | 21,453 (සෘ) | 21,670 | 21,803 | 21,919 | 22,156 | 22,181 | 22,037 |
| මධ්‍ය වාර්ෂික ජනගහනයෙහි වර්ධන අනුපාතය (සියයට) (ආ) | 1.1 | 1.1 | 0.6 | 0.5 | 1.1 | 0.1 | -0.6 |
| ජනගහන ඝනත්වය (වර්ග කි.මී. ට පුද්ගලයන්) (ආ) | 342 | 346 | 348 | 350 | 353 | 354 | 351 |
| ශ්‍රම බලකාය (පුද්ගලයන් දහස්) (ඉ) | 8,567 | 8,388 | 8,592 | 8,467 | 8,553 | 8,547 | 8,408 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (සියයට) (ඉ) | 54.1 | 51.8 | 52.3 | 50.6 | 49.9 | 49.8 | 48.6 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) (ඉ) | 4.2 | 4.4 | 4.8 | 5.5 | 5.1 | 4.7 | 4.7 |
| **නිමැවුම (ඊ)** | | | | | | | |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (රු. බිලියන) | 14,387 | 15,352 | 15,911 | 15,646 (සෘ) | 17,612 (සෘ) | 24,064 (අ) (සෘ) | 27,630 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (රු. බිලියන) | 14,034 | 14,962 | 15,470 | 15,223 (සෘ) | 17,217 (සෘ) | 23,433 (අ) (සෘ) | 26,734 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (එ.ජ. ඩොලර් බිලියන) (උ) | 94.4 | 94.7 | 89.0 | 84.4 (සෘ) | 88.6 (සෘ) | 76.8 (අ) (සෘ) | 84.4 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (එ.ජ. ඩොලර් බිලියන) (උ) | 92.0 | 92.4 | 86.5 | 82.1 (සෘ) | 86.6 (සෘ) | 74.9 (අ) (සෘ) | 81.7 |
| ඒක පුද්ගල ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව (රු.) (උෆ) | 670,644 | 708,442 | 729,761 | 713,821 (සෘ) | 794,926 (සෘ) | 1,084,882 (අ) (සෘ) | 1,253,785 |
| ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (රු.) (උෆ) | 654,196 | 690,463 | 709,516 | 694,520 (සෘ) | 777,073 (සෘ) | 1,056,424 (අ) (සෘ) | 1,213,159 |
| ඒක පුද්ගල ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව (එ.ජ. ඩොලර්) (උ)(උෆ) | 4,398 | 4,372 | 4,082 | 3,851 (සෘ) | 3,999 (සෘ) | 3,464 (අ) (සෘ) | 3,830 |
| ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (එ.ජ. ඩොලර්) (උ)(උෆ)(එ) | 4,290 | 4,263 | 3,968 | 3,747 (සෘ) | 3,910 (සෘ) | 3,378 (අ) (සෘ) | 3,706 |
| **මූර්ත නිමැවුම (වෙනස්වීමේ ප්‍රතිශතය) (ඊ)** | | | | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය | 6.5 | 2.3 | -0.2 | -4.6 | 4.2 (සෘ) | -7.3 (අ)(සෘ) | -2.3 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන ආර්ථික කටයුතු | | | | | | | |
| කෘෂිකර්මය | -1.8 | 6.3 | 0.5 | -0.9 | 1.0 (සෘ) | -4.2 (අ)(සෘ) | 2.6 |
| කාර්මික | 13.0 | -1.1 | -4.1 | -5.3 | 5.7 (සෘ) | -16.0 (අ)(සෘ) | -9.2 |
| සේවා | 3.6 | 4.3 | 2.9 | -1.9 | 3.4 (සෘ) | -2.6 (අ)(සෘ) | -0.2 |
| දළ ජාතික ආදායම | 6.6 | 2.2 | -0.5 | -4.5 | 4.7 (සෘ) | -7.6 (අ)(සෘ) | -3.0 |
| **සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (ඊ)** | | | | | | | |
| පරිභෝජනය | 67.0 | 68.9 | 71.7 | 73.3 (සෘ) | 70.7 (සෘ) | 75.0 (අ) (සෘ) | 76.2 |
| පෞද්ගලික | 59.1 | 60.3 | 62.7 | 62.9 (සෘ) | 61.2 (සෘ) | 67.8 (අ) (සෘ) | 69.3 |
| රජය | 7.9 | 8.6 | 9.0 | 10.4 (සෘ) | 9.5 (සෘ) | 7.2 (අ) (සෘ) | 6.9 |
| ආයෝජනය | 39.7 | 38.1 | 34.1 | 32.9 (සෘ) | 36.7 (සෘ) | 28.6 (අ) (සෘ) | 25.3 |
| භාණ්ඩ සහ සේවා ශුද්ධ අපනයන | -6.7 | -6.9 | -5.8 | -6.2 (සෘ) | -7.4 (සෘ) | -3.6 (අ) (සෘ) | -1.5 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 20.2 | 21.4 | 21.8 | 15.5 (සෘ) | 16.9 (සෘ) | 21.6 (අ) (සෘ) | 20.4 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 26.9 | 28.4 | 27.6 | 21.6 (සෘ) | 24.3 (සෘ) | 25.1 (අ) (සෘ) | 21.9 |
| දේශීය ඉතිරිකිරීම් | 33.0 | 31.1 | 28.3 | 26.7 (සෘ) | 29.3 (සෘ) | 25.0 (අ) (සෘ) | 23.8 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික සහ ද්විතීයික ආදායම | 4.2 | 4.0 | 3.7 | 4.7 (සෘ) | 3.6 (සෘ) | 2.2 (අ) (සෘ) | 3.4 |
| ජාතික ඉතිරිකිරීම් | 37.3 | 35.1 | 32.0 | 31.3 (සෘ) | 33.0 (සෘ) | 27.2 (අ) (සෘ) | 27.2 |
| **මිල සහ වැටුප් (වෙනස්වීමේ ප්‍රතිශතය)** | | | | | | | |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021 = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | - | - | - | - | 17.4 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | - | - | - | - | - | - | 4.0 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය (ඒ) | 6.6 | 4.3 | 4.3 | 4.6 | 6.0 | 46.4 | - |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) (ඒ) | 7.1 | 2.8 | 4.8 | 4.2 | 12.1 | 57.2 | - |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2021 = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | - | - | - | - | 16.5 |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2021 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | - | - | - | - | - | - | 4.2 |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය (ඔ) | 7.7 | 2.1 | 3.5 | 6.2 | 7.0 | 50.4 | - |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) (ඔ) | 7.3 | 0.4 | 6.2 | 4.6 | 14.0 | 59.2 | - |
| නිෂ්පාදක මිල දර්ශකය (2018 4 වන කාර්තුව = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | - | 5.8 | 10.9 | 74.0 | 11.5 |
| ද.දේ.නි. අවධමනකය (ඊ) | 5.5 | 4.3 | 3.9 | 3.1 (සෘ) | 8.0 (සෘ) | 47.5 (අ)(සෘ) | 17.5 |
| ද.ජා.ආ. අවධමනකය (ඊ) | 5.4 | 4.4 | 3.9 | 3.0 (සෘ) | 8.1 (සෘ) | 47.3 (අ)(සෘ) | 17.6 |
| නාමික වැටුප් ප්‍රමාණ දර්ශක | | | | | | | |
| විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (1978 දෙසැ. = 100) - වාර්ෂික සාමාන්‍යය (ඕ) | 0.0 | 0.6 | 2.9 | 0.2 | 74.4 | 9.8 | 0.4 |
| රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - වාර්ෂික සාමාන්‍යය | - | 0.2 | 4.7 | 9.2 | 0.0 | 16.1 | 0.0 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018 = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | - | 6.4 | 9.2 | 24.5 | 11.4 |
| **විදේශ වෙළඳාම** | | | | | | | |
| වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන) | -9,619 | -10,343 | -7,997 | -6,008 | -8,139 | -5,185 | -4,900 |
| අපනයන | 11,360 | 11,890 | 11,940 | 10,047 | 12,499 | 13,106 | 11,911 |
| ආනයන | 20,980 | 22,233 | 19,937 | 16,055 | 20,637 | 18,291 | 16,811 |
| වෙළඳ මිල අනුපාතය (වෙනස්වීමේ ප්‍රතිශතය) | 1.2 | 0.02 | -1.6 | 2.5 | -8.6 | -11.6 | -0.6 |
| අපනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | 2.4 | 4.2 | -6.3 | -6.8 | 5.4 | 0.9 | -11.3 |
| ආනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | 1.2 | 4.1 | -4.8 | -9.1 | 15.2 | 14.1 | -10.8 |
| අපනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | 7.6 | 0.5 | 7.2 | -9.7 | 18.0 | 3.9 | 2.4 |
| ආනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | 8.1 | 1.8 | -5.8 | -11.4 | 11.5 | -22.4 | 3.0 |
| **විදේශ මූල්‍ය (එ.ජ. ඩොලර් මිලියන)** | | | | | | | |
| සේවා හා ප්‍රාථමික ආදායම් ශිෂ්ඨම (ශුද්ධ) | 984 | 1,381 | 388 | -1,386 | -373 | 240 (සෘ) | 841 |
| ජංගම පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 6,316 | 6,155 | 5,757 | 6,194 | 5,221 | 3,493 | 5,599 |
| ජංගම නිල සංක්‍රාම (ශුද්ධ) | 11 | 8 | 9 | 13 | 6 | 3 | 20 |
| ජංගම ගිණුමේ ශේෂය | -2,309 | -2,799 | -1,843 | -1,187 | -3,284 | -1,448 (සෘ) | 1,559 |
| සමස්ත ශේෂය | 2,068 | -1,103 | 377 | -2,328 | -3,967 | -2,806 | 2,826 |

(අ) තාවකාලික

(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව

(ඇ) 2012 ජන හා නිවාස සංගණනය මත පදනම්ව ඇත.

(ඈ) සංශෝධිත

(ඉ) ශ්‍රම බලකාය ගණනය කිරීමේ දී වයස අවුරුදු 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය සලකා බලනු ලැබේ.

(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

(උ) 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය යොදා ගෙන ද.දේ.නි./ද.ජා.ආ., එ.ජ. ඩොලර්වලින් ගණනය කර ඇත.

(උෆ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.

(එ) එ.ජ. ඩොලර්වලින් ද.ජා.ආ. ගණනය කිරීම සඳහා වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතික හා සැසඳීමේ දී කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතික භාවිතය තුළින් ඇතිවන වෙනස්කම් හේතුවෙන් මෙම අගයන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අගයන්ගෙන් වෙනස් විය හැක.

(ඒ) මෙම දර්ශකය ගණනය කිරීම 2023 පෙබරවාරි මස සිට අත්හිටුවා ඇත.

(ඔ) මෙම දර්ශකය ගණනය කිරීම 2023 ජනවාරි මස සිට අත්හිටුවා ඇත.

(ඕ) පඩිපාලක සභා මඟින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර් = 100) මඟින් ගණනය කරනු ලබයි.

# මූලික ආර්ථික දර්ශක (සම්බන්ධයි)

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 (අ) |
|---|---|---|---|---|---|---|---|
| ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (ඊ)(ක) | -2.4 | -3.0 | -2.1 | -1.4 | -3.7 | -1.9 (අ) | 1.8 |
| මුළු විදේශීය වත්කම් (එම වර්ෂයේ ආනයන වටිනාකම අනුව මාස ගණන) (ග) | 6.0 | 5.2 | 6.3 | 6.4 | 3.6 | 3.9 | 6.7 |
| දළ නිල සංචිත (එම වර්ෂයේ ආනයන වටිනාකම අනුව මාස ගණන) | 4.6 | 3.7 | 4.6 | 4.2 | 1.8 | 1.2 | 3.1 |
| සමස්ත ණය සේවා අනුපාතය (ච) | | | | | | | |
| භාණ්ඩ හා සේවා අපනයනයේ ප්‍රතිශතයක් ලෙස | 23.9 | 28.9 | 29.7 | 35.2 | 30.7 | 15.4 | 14.9 |
| ජංගම ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස | 17.3 | 21.3 | 21.8 | 22.6 | 22.3 | 12.3 | 10.9 |
| මුළු විදේශීය ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (ඊ)(ක) | 54.7 | 55.3 | 61.6 | 58.1 (අ) | 58.4 (අ) | 64.6 (අ) | 65.0 |
| **විනිමය අනුපාතික** | | | | | | | |
| වර්ෂය අවසානයේ දී | | | | | | | |
| එ.ඒ. ඩොලරයකට රුපියල් | 152.85 | 182.75 | 181.63 | 186.41 | 200.43 | 363.11 | 323.92 |
| වී.ගැ.හි. ඒකකයකට රුපියල් (ජ) | 217.69 | 253.51 | 251.17 | 268.48 | 280.53 | 483.24 | 434.60 |
| වාර්ෂික සාමාන්‍යය | | | | | | | |
| එ.ඒ. ඩොලරයකට රුපියල් | 152.46 | 162.54 | 178.78 | 185.52 | 198.88 | 324.55 | 327.53 |
| වී.ගැ.හි. ඒකකයකට රුපියල් (ජ) | 211.49 | 229.90 | 246.97 | 258.61 | 283.18 | 431.91 | 436.88 |
| නා.ස.ව.ප. (2017 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැසැ) (ට) | 100.00 | 94.05 | 88.17 | 85.93 | 78.64 | 53.99 | 53.30 |
| මූ.ස.ව.ප. (2017 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැසැ) (ට)(ඩ) | 100.00 | 95.45 | 90.42 | 91.52 | 83.58 | 77.49 (අ) | 71.39 |
| **රාජ්‍ය මූල්‍ය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) (ඊ) (ත)** | | | | | | | |
| ආදායම සහ ප්‍රදාන | 12.8 | 12.6 | 11.9 | 8.8 | 8.3 | 8.4 | 11.1 |
| ආදායම | 12.7 | 12.5 | 11.9 | 8.7 | 8.3 | 8.2 | 11.0 |
| ඉන්, බදු ආදායම | 11.6 | 11.2 | 10.9 | 7.8 | 7.4 | 7.3 | 9.8 |
| ප්‍රදාන | 0.1 | 0.1 | 0.0 | 0.0 | 0.0 | 0.1 | 0.1 |
| වියදම් හා ශුද්ධ ණය දීම් | 17.9 | 17.5 | 21.0 | 19.4 | 20.0 | 18.6 | 19.4 |
| පුනරාවර්තන වියදම් | 13.4 | 13.6 | 15.2 | 16.3 | 15.6 | 14.6 | 17.0 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් | 4.5 | 3.9 | 5.7 | 3.1 | 4.4 | 4.0 | 2.4 |
| වර්තන ගිණුමේ ශේෂය | -0.7 | -1.1 | -3.4 | -7.5 | -7.3 | -6.4 | -6.0 |
| ප්‍රාථමික ශේෂය | 0.0 | 0.6 | -3.4 | -4.4 | -5.7 | -3.7 | 0.6 |
| සමස්ත අයවැය ශේෂය | -5.1 | -5.0 | -9.0 | -10.7 | -11.7 | -10.2 | -8.3 |
| අයවැය හිඟය මූල්‍යනය | 5.1 | 5.0 | 9.0 | 10.7 | 11.7 | 10.2 | 8.3 |
| විදේශීය | 3.1 | 2.1 | 3.4 | -0.5 | -0.1 | 1.8 | 1.8 |
| දේශීය | 2.0 | 2.8 | 5.6 | 11.2 | 11.8 | 8.5 | 6.5 |
| මධ්‍යම රජයේ ණය (ද) | 72.2 | 78.4 | 81.9 | 96.6 | 100.0 | 114.2 (ත) | 103.9 (ත) |
| විදේශීය | 32.8 | 38.8 | 39.0 | 38.7 | 37.0 | 51.8 (ත) | 42.1 (ත) |
| දේශීය (ප)(ඛ) | 39.4 | 39.5 | 42.9 | 57.9 | 63.0 | 62.5 (ත) | 61.7 (ත) |
| **මුදල් සමස්ත (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස - සියයට)** | | | | | | | |
| සංචිත මුදල් | 9.8 | 2.3 | -3.0 | 3.4 | 35.4 | 3.3 | -1.5 |
| පටු මුදල් ($M_1$) | 2.1 | 4.7 | 4.2 | 36.0 | 24.0 | -0.4 | 14.1 |
| පුළුල් මුදල් ($M_{2b}$) | 16.7 | 13.0 | 7.0 | 23.4 | 13.2 | 15.4 | 7.3 |
| බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම් | 152.6 | -155.1 | 250.3 | -308.0 | -368.8 | -79.9 | 74.2 |
| බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම් | 9.8 | 16.3 | 4.6 | 27.8 | 20.9 | 20.9 | -2.9 |
| බැංකු ක්‍රමය මගින් සපයන ලද දේශීය ණය | | | | | | | |
| රජයට (ශුද්ධ) | 10.0 | 16.1 | 11.1 | 62.7 | 28.2 | 28.1 | 10.9 |
| රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට | 4.5 | 40.7 | 8.3 | 22.5 | 18.6 | 47.3 | -56.0 |
| පෞද්ගලික අංශයට | 14.7 | 15.9 | 4.2 | 6.5 | 13.1 | 6.2 | -0.6 |
| $M_{2b}$ සඳහා මුදල් ගුණකය (වර්ෂ අවසාන) | 6.71 | 7.42 | 8.18 | 9.75 | 8.15 | 9.11 | 9.93 |
| $M_{2b}$ හි සංසරණ ප්‍රවේගය (වර්ෂය සඳහා සාමාන්‍යය) (ඊ) | 2.43 | 2.27 | 2.16 | 1.84 | 1.73 | 2.04 (අ) | 2.19 |
| **පොලී අනුපාතික (වර්ෂ අවසානයේදී වර්ෂයකට සියයට)** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | 7.25 | 8.00 | 7.00 | 4.50 | 5.00 | 14.50 | 9.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | 8.75 | 9.00 | 8.00 | 5.50 | 6.00 | 15.50 | 10.00 |
| බැංකු අනුපාතිකය (ම) | 15.00 | 15.00 | 15.00 | 8.50 | 9.00 | 30.22 | 14.50 |
| නෛතික පොලී අනුපාතිකය/වෙළඳපොළ පොලී අනුපාතිකය (ය) | 7.06 | 9.08 | 11.50 | 11.64 | 10.12 | 7.48 | 16.97 |
| මුදල් වෙළඳපොළ පොලී අනුපාතික | | | | | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | 8.15 | 8.95 | 7.45 | 4.55 | 5.95 | 15.50 | 9.24 |
| භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික | | | | | | | |
| දින - 91 | 7.69 | 10.01 | 7.51 | 4.69 | 8.16 | 32.64 | 14.51 |
| දින - 364 | 8.90 | 11.20 | 8.45 | 5.05 | 8.24 | 29.27 | 12.93 |
| තැන්පතු අනුපාතික | | | | | | | |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 9.07 | 8.81 | 8.20 | 5.80 | 4.94 | 14.06 | 11.64 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය | 11.48 | 10.85 | 10.05 | 7.14 | 5.94 | 18.49 | 14.88 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය | 10.06 | 10.94 | 8.89 | 4.93 | 6.45 | 23.07 | 11.06 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය | 10.65 | 11.27 | 9.17 | 5.08 | 6.67 | 23.73 | 11.33 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය | 4.00 | 4.00 | 4.00 | 3.50 | 3.50 | 3.00 | 3.00 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මාස 12 ස්ථාවර තැන්පතු අනුපාතිකය | 11.00 | 10.50 | 9.83 | 5.25 | 5.50 | 12.00 | 8.00 |
| ණය පොලී අනුපාතික | | | | | | | |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය-සකිපතා | 11.55 | 12.09 | 9.74 | 5.81 | 8.61 | 27.24 | 12.13 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 13.88 | 14.40 | 13.59 | 10.29 | 9.87 | 18.70 | 14.21 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 14.31 | 14.54 | 12.80 | 8.38 | 9.48 | 26.20 | 14.38 |
| **ප්‍රාග්ධන වෙළඳපොළ** | | | | | | | |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,369.3 | 6,052.4 | 6,129.2 | 6,774.2 | 12,226.0 | 8,489.7 | 10,654.2 |
| S&P SL20 දර්ශකය (2004 දෙසැ. = 1,000) | 3,671.7 | 3,135.2 | 2,937.0 | 2,638.1 | 4,233.3 | 2,635.6 | 3,068.4 |
| ගනුදෙනු කළ කොටස් වටිනාකම (රු. මිලියන) | 220,591 | 200,069 | 171,408 | 396,882 | 1,173,157 | 686,602 | 410,629 |
| ශුද්ධ විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 17,655 | -23,239 | -11,735 | -51,356 | -52,648 | 30,625 | 4,363 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,899.3 | 2,839.5 | 2,851.3 | 2,960.7 | 5,489.2 | 3,847.2 | 4,248.9 |

(ක) එ.ඒ. ඩොලර්වලින් ගණනය කරන ලද ද.දේ.නි. මත පදනම් වේ.

(ග) විදේශ ඍජු ආයෝජන සහ වෙළඳ ණය සහ අත්තිකාරම් ලෙස ලද විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ච) සමස්ත ණය සේවා අනුපාතය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) විදේශීය ණය සංඛ්‍යාන සංස්කරණය (2003) ට අනුරූප වන පරිදි ණය සේවාකරණය ඇතුළත් වන ලෙස ප්‍රතිවර්ගීකරණය කර ඇත.

(ජ) ජා.මූ.අ. ගිණුම් ඒකකය වන විශේෂ ගැනුම් හිමිකම් (වී.ගැ.හි.)

(ට) විනිමය අනුපාතික, දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතික දර්ශකවල අගය ඉහළයෑම හෝ පහළයෑම මගින් සෘජුවම පිළිබිඹු වේ.

(ඩ) මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.ව.ප.) ගණනය කිරීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාවිතා කර ඇත. මූ.ස.ව.ප. ගණනය කරනුයේ පැසැට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නාමික සඵල විනිමය අනුපාතිකයට (නා.ස.ව.ප.) ගැළපීම මගිනි.

(ත) මූදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන කිහිපයක් සංශෝධනය කර ඇත.

(ද) 2014 වසරේ දී ජා.මූ.අ. විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශයන්ට අනුව, අනේවාසික නොපියවූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසික නොපියවූ ජාත්‍යන්තර ස්වේච්ඡත්ව බැඳුම්කර 2019 වසරේ සිට දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, ණය පිළිබඳ දත්ත ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.

(න) මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක්වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව නොගෙවූ ණය පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.

(ප) රජය සතු වාණිජ ව්‍යවසායයන්වලට නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවූ ශේෂයන් ඇතුළත් වේ.

(බ) 2022 වසර දක්වා මහ බැංකුවේ මූල්‍ය සම්ක්ෂණයෙහි වාර්තා කර ඇති මධ්‍යම රජය වාණිජ බැංකු වෙත ඇති වගකීම් දේශීය ණය සම්පාදනය කිරීමට යොදා ගන්නා ලදී. 2023 වසරේ සිට ඉදිරියට දේශීය ණය සම්පාදන ක්‍රමය වෙනස් කර ඇති අතර එය මුදල්, ආර්ථික ස්ථායීකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් තහවුරු කරන ලද දත්ත මත පදනම් වේ.

(ම) අවසාන ණය ලබා දෙන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ආයතනවලට සපයනු ලබන අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය වේ.

(ය) නෛතික පොලී අනුපාතිකය 1990 අංක 6 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මූදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයක දී අදාළ වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයක දී රුපියල් 150,000කට වඩා වැඩි ණය මූදලක් අය කර ගැනීමේ දී ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටක අදාළ වේ. සෑම වසරක් සඳහා වූ නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ඉදිරි වසර සඳහා අදාළ වන පොලී අනුපාතිකය පෙර වසරේ දෙසැම්බර් මාසයේදී රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2024 වසර සඳහා වූ නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ අනුපාතිකය වාර්ෂිකව සියයට 15.15ක් වේ.

# මූලික සමාජ දර්ශක

## භෞතික ලක්ෂණ සහ දේශගුණය

**භූගෝලීය පිහිටීම**

උතුරු අක්ෂාංශ $5^0$ 55' සහ $9^0$ 50' අතර
නැගෙනහිර දේශාංශ $79^0$ 31' සහ $81^0$ 53' අතර

**දුර ප්‍රමාණය**

උතුරේ සිට දකුණට කි.මී. 433 (සැතපුම් 269)
බටහිර සිට නැගෙනහිරට කි.මී. 226 (සැතපුම් 140)

**උස ප්‍රමාණය**

උපරිම උස මීටර් 2,525 (අඩි 8,284)

**භූමි ප්‍රමාණය**

| | | |
|---|---|---|
| මූළු ප්‍රමාණය | : | වර්ග කි.මී. 65,610 |
| බිම් ප්‍රමාණය | : | වර්ග කි.මී. 62,705 |
| අභ්‍යන්තර ජලාශ | : | වර්ග කි.මී. 2,905 |

**දේශගුණය**

| | | |
|---|---|---|
| පහත රට | : | අවම $24.8^0$ සෙල්සියස් - උපරිම $32.1^0$ සෙල්සියස් |
| කඳු රට | : | අවම $18.8^0$ සෙල්සියස් - උපරිම $27.4^0$ සෙල්සියස් |
| වාර්ෂික වර්ෂාපතනය (සාමාන්‍යය) | : | 2023 : 2,536 මිලි මීටර<br>2022 : 1,966 මිලි මීටර |

## ජනගහනය සහ ජීව සංඛ්‍යාති

**ජනගහන සංඛ්‍යාති (අ)**

| | |
|---|---|
| මධ්‍ය වාර්ෂික ජනගහනය ('000) (2023) | : 22,037 |
| වයස් කාණ්ඩ අනුව ව්‍යාප්තිය ('000) (2023) | |
| අවු 0 - 14 | : 5,568 |
| අවු 15 - 64 | : 14,742 |
| අවු 65 සහ ඊට වැඩි | : 1,727 |
| ජනගහන ඝනත්වය වර්ග කි.මී. ට පුද්ගලයින් (2023) | : 351 |
| දළ උපත් අනුපාතය ජනගහනය 1,000 කට (2023) | : 11.2 |
| දළ මරණ අනුපාතය ජනගහනය 1,000 කට (2023) | : 8.2 |
| ස්වාභාවික වර්ධන වේගය ජනගහනය 1,000 කට (2023) | : 3.0 |
| ළදරු මරණ අනුපාතය සජීවී උපත් 1,000 කට (2019) | : 7.4 (සංශෝධිත) |
| යැපීම් අනුපාතය (2023) | : 49.4% |
| සාමාන්‍ය ගෘහ ඒකකයක සාමාජික සංඛ්‍යාව (2019) (ආ) | : 3.7 |

**සේවා නියුක්තිය (2023)**

| | |
|---|---|
| සේවා නියුක්තිකයන් ('000) (ඇ) | : 8,010 |
| කෘෂිකර්මාන්ත | : 26.1% |
| කර්මාන්ත | : 25.5% |
| සේවා | : 48.4% |
| රාජ්‍ය අංශයේ සේවකයන් සංඛ්‍යාව ('000) (ඉ) | : 1,354 |
| රාජ්‍ය අංශය | : 84.7% |
| රජය සතු ව්‍යවසායයන් | : 15.3% |

**ආදායම් ව්‍යාප්තිය (ආ)**

| | |
|---|---|
| ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකය (2019) | : 0.46 |
| මධ්‍යන්‍ය ගෘහ ඒකක ආදායම (2019) | : මසකට රු. 76,414 |
| මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම (2019) | : මසකට රු. 53,333 |

**දරිද්‍රතාව (ආ)**

| | |
|---|---|
| දිනකට ලබා ගන්නා කිලෝ කැලරි ප්‍රමාණය (2019) | : 2,120 |
| ජනගහන දරිද්‍රතා දර්ශකය (ඇ) | : 14.3 (2019) |
| | : 16.0 (2016) |
| | : 22.5 (2012/13) |

**මානව සංවර්ධන දර්ශකය (2022)** : 0.780
රටවල් 193 ක් අතර ශ්‍රී ලංකාවේ තත්ත්වය : 78

**ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය (2021)** : 0.796

| | |
|---|---|
| ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය | : 0.825 |
| ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය | : 0.786 |
| සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය | : 0.777 |

**උපතේදී ජීවිත අපේක්ෂාව (2017)** : අවු 75.5

**සාක්ෂරතාව (2021) (ඈ)**

| | |
|---|---|
| සාමාන්‍ය | : 93.3% |
| පිරිමි | : 94.3% |
| ගැහැණු | : 92.3% |

## භෞතික, සමාජ සහ මූල්‍ය යටිතල පහසුකම්

| | ඒකකය | 2023 |
|---|---|---|
| **ප්‍රවාහනය** | | |
| මහා මාර්ගවල දිග ප්‍රමාණය (ඒ සහ බී) | කි.මී. | 12,225 |
| අධිවේගී මාර්ගවල දිග ප්‍රමාණය | කි.මී. | 312.6 |
| මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන දුම්රිය මාර්ගවල දිග ප්‍රමාණය (2021) | කි.මී. | 1,607.3 |
| **විදුලිබලය** | | |
| විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය (2016) | ප්‍රතිශතය | 99.3 |
| ඒක පුද්ගල විදුලිබල පරිභෝජනය | කි.වෝ.පැ. | 642.2 |
| **පණිවුඩ හුවමාරුව** | | |
| දුරකථන ඝනත්වය | | |
| ස්ථාවර දුරකථන | පුද්ගලයින් 100 කට | 10.5 |
| ජංගම දුරකථන ද ඇතුළත්ව | පුද්ගලයින් 100 කට | 142.0 |
| අන්තර්ජාල ඝනත්වය (ඒ) | පුද්ගලයින් 100 කට | 103.8 |
| තැපැල් කාර්යාලයකින් සේවාව ලබන පුද්ගලයන් | සංඛ්‍යාව | 5,317 |
| **මූල්‍ය ආයතන** | | |
| බැංකු | | |
| බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛා (උ) | සංඛ්‍යාව | 2,929 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු ශාඛා (උ) | සංඛ්‍යාව | 706 |
| භාවිතයේ පවතින ණය කාඩ්පත් | පුද්ගලයින් 100,000 කට | 8,507 |
| බැංකු ඝනත්වය | පුද්ගලයින් 100,000 කට බැංකු ශාඛා | 16 |
| අනෙකුත් මූල්‍ය සමාගම් | | |
| බලපත්‍රලාභී මුදල් සමාගම් ශාඛා | සංඛ්‍යාව | 1,828 |
| විශේෂිත කල්බදු සමාගම් ශාඛා (උඉ) | සංඛ්‍යාව | 05 |
| බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශාඛා | සංඛ්‍යාව | 129 |
| ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATMs), මුදල් ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර (CRMs) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs) | පුද්ගලයින් 100,000 කට | 32 |

| | ඒකකය | 2023 |
|---|---|---|
| **ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව** | | |
| පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය | ප්‍රතිශතය | 97.3 |
| නළ ජල පහසුකම් සඳහා ප්‍රවේශය | ප්‍රතිශතය | 61.6 |
| **සාමාන්‍ය අධ්‍යාපනය (2022)** | | |
| පාසලකින් ආවරණය වන භූමි ප්‍රමාණය (එ) | වර්ග කි.මී. | 6.5 |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය (එ) | සංඛ්‍යාව | 16.8 |
| වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි) | ප්‍රතිශතය | 90.6 |
| ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය | ප්‍රතිශතය | 85.1 |
| **විශ්වවිද්‍යාල අධ්‍යාපනය (ඒ)** | | |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය | සංඛ්‍යාව | 22.5 |
| වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (වයස අවුරුදු 18-22) (ඔ) | ප්‍රතිශතය | 9.9 |
| අ.පොස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ ප්‍රමාණය | ප්‍රතිශතය | 63.3 |
| ඇතුළත්වීම් - සුදුසුකම් ලැබූවන්ගේ ප්‍රතිශතයක් ලෙස | ප්‍රතිශතය | 25.2 |
| අධ්‍යාපනය සඳහා රජයේ වියදම (ඕ) | ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | 1.6 |
| **මහජන සෞඛ්‍යය (ක)** | | |
| ආරෝග්‍යශාලා ඇඳන් | පුද්ගලයින් 1,000 කට | 4.1 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | සංඛ්‍යාව | 985 |
| හෙද සේවක | පුද්ගලයින් 10,000 කට | 17.8 |
| සෞඛ්‍ය සඳහා රජයේ වියදම | ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | 1.5 |

සටහන: 2023 වර්ෂය සඳහා වන දත්ත තාවකාලික වේ.

මූලයන්: අදාළ ආයතන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාලේඛන

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2019 මත පදනම් වේ.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණ වටයේදී, 2002 සමීක්ෂණ දත්ත මත පදනම්ව ගණනය කළ නිල දරිද්‍රතා රේඛාව, 2012/13 සමීක්ෂණ දත්ත භාවිතයෙන් සංශෝධනය කර ඇත. නිල දරිද්‍රතා රේඛාවේ සංශෝධනය සමඟ, ජනගහන දරිද්‍රතා දර්ශක දත්ත ද සංශෝධනය කර ඇත.
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය මත පදනම් වේ.
(ඉ) මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දත්ත මත පදනම් වේ.
(උ) ජංගම අන්තර්ජාල සේවා ඇතුළත්ය.
(ඌ) සිසු තැන්පතු ඒකක රහිතව සියලු බැංකු ශාඛා
(උඉ) අනෙකුත් ඒකක ද ඇතුළත් වේ.
(එ) රජයේ පාසල් පමණි
(ඒ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලවල තොරතුරු ඇතුළත් වේ.
(ඔ) අභ්‍යන්තර වශයෙන් ලියාපදිංචි සිසුන් පමණක් ඇතුළත් වේ.
(ඕ) සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම්
(ක) 2023 ජූනි අවසානයට

# සමස්ත සාරාංශය

නිදහසෙන් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික පසුබෑමෙන් අනතුරුව 2023 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. ආර්ථිකයේ පාර්ශ්වකරුවන් කෙටි කාලීනව දුෂ්කරතාවලට මුහුණ දුන්න ද, රජය සහ මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද තීරණාත්මක ප්‍රතිපත්ති ගැළපුම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් සාර්ව ආර්ථික ස්ථායීතාව යළිත් බොහෝ දුරට ස්ථාපිත කිරීම සඳහා සහාය සැපයිණි. ආර්ථික අර්බුදය තවදුරටත් තීව්‍ර වීම වළක්වාලීමට සහ යථා තත්ත්වයට පත්වීමේ තිරසාර මාවතක් ඔස්සේ ආර්ථිකය හැසිරවීම සඳහා මෙම ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය විය. විවිධ අවදානම් රැසක් පවතින වාතාවරණයක් තුළ, ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සහ ණය තිරසාරත්වය යළි අත්කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කැපවීම සමඟ පුළුල් මහජන පිළිගැනීමක් පැවතීම අත්‍යවශ්‍ය වේ.

ආර්ථික ගැළපුම් ක්‍රියාවලිය 2023 වසර තුළ දී ම යහපත් ප්‍රතිඵල අත්කරගෙන ඇත. 2022 වසරේ දී වාර්තා වූ ඉහළම උද්ධමන මට්ටම්වල සිට, 2023 වසර අවසානය වනවිට උද්ධමනය තනි ඉලක්කමක මට්ටමට පාලනය වී ඇති අතර, එමගින් මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය කිරීමට අවස්ථාව සැලසිණි. ඒ අනුව, කාර්තු හයක් මුළුල්ලේ අඛණ්ඩව පැවති දීර්ඝතම ආර්ථික සංකෝචනයෙන් අනතුරුව, 2023 වසරේ දෙවන භාගය තුළ දී ආර්ථිකය ප්‍රසාරණයක් වාර්තා කළේය. ආර්ථික අර්බුදයෙහි මූලය වූ දිගු කාලයක් මුළුල්ලේ පවතින සමස්ත රාජ්‍ය අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය යන ද්විත්ව හිඟය 2023 වසරේ දී නිවැරදි වීමේ ලක්ෂණ පෙන්නුම් කළේය. එම වසරේ දී රජයේ ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් වාර්තා වූ අතර, විදේශීය ජංගම ගිණුමෙහි ද අතිරික්තයක් වාර්තා විය. අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ දී සම්පූර්ණයෙන් ම පාහේ පිරිහීමට ලක් වූ විදේශීය ස්වාරක්ෂක වසර තුළ දී ක්‍රමයෙන් නැවත වර්ධනය විය. අඩු ආනයන ඉල්ලුම මධ්‍යයේ, සංචාරක සහ අනෙකුත් සේවා අපනයන අංශයෙන් ලද ඉපයීම් මෙන්ම සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ද සමඟ විදේශ විනිමය ප්‍රවාහ වැඩි දියුණු වීම, අර්බුදය සමයේ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා සීමිත වීමේ ගැටලුවෙන් මිදීම සඳහා සහාය විය. මහ බැංකුව විසින් විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීම සහ බහුපාර්ශ්වික හවුල්කාර ආයතනවලින් ලද මූල්‍යන පහසුකම් මගින් දළ නිල සංචිත වර්ධනය කරගැනීම සඳහා සහාය ලැබුණි. මෙම ප්‍රවණතා සහ වැඩි දියුණු වූ වෙළඳපොළ විශ්වාසයත් සමඟ 2023 සහ 2024 වසරේ මුල් කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් විය. රජයේ විදේශීය ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීමේ සාමූහික ප්‍රයත්නය තුළින් එම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමත් සමඟ රට තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා අවශ්‍ය ඉඩකඩ සැලසෙනු ඇත. මේ අතර, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය අවසන් කිරීමත් සමඟ රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතිකවලට අදාළ අවදානම් අධිමිල පහළ යෑම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික සැලකියයුතු ලෙස පහළ ගියේය. වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ මෙම පහළ යෑම සහ වැඩි දියුණු වූ වෙළඳපොළ අපේක්ෂා හේතුවෙන් 2023 වසරේ ජූනි මාසයේ සිට පෞද්ගලික අංශයට ලබාදෙන ණයෙහි සංකෝචනය වීමේ ප්‍රවණතාව වෙනස් විය. මේ අතර, මහ බැංකුවේ පූර්වෝපායික සහ විචක්ෂණශීලී ප්‍රතිපත්ති සහාය මෙන්ම මූල්‍ය ආයතනවල අර්බුද සඳහා ඉහළ පෙර සුදානම තුළින් මූල්‍ය අංශය එහි ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කළේය.

ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රශස්ත ක්‍රමවේද වෙත යොමු වෙමින් සහ ලද අත්දැකීම් භාවිතයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය ප්‍රතිනිර්වචනය කරමින්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී බලාත්මක කෙරිණි. මෙමගින්, මහ බැංකුවේ ස්වාධීනත්වය සහ පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත මහ බැංකුවේ ඇති වගවීම වැඩි දියුණු කිරීමේ මග තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් සලකුණු කෙරිණි. මූලිකව ආර්ථිකයේ ස්ථාවරත්වයක් ඇති කිරීම සහ ඉන් අනතුරුව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය දැක්වීමට මහ බැංකුව විසින් 2023 වසර තුළ දී ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාවට නංවන ලදී. 2023 වසරේ ජූනි මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක සිට ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් වෙත මාරු වීම, විනිමය අනුපාතය තීරණය වීමේ දී ඉහළ නම්‍යශීලිත්වයක් සඳහා ඉඩ හැරීම මෙන්ම ඇතැම් විදේශ විනිමය ගනුදෙනු මත පනවා තිබූ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම යනාදී ක්‍රියාමාර්ග ඊට ඇතුළත් විය. විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ග පිළිබඳව මහ බැංකුව මූල්‍ය අංශය වෙත මාර්ගෝපදේශ සැපයූ අතර, එමගින් දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කෙරිණි. මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ, මූල්‍ය ආයතනවල අධීක්ෂණ අධිකාරිය ලෙස මෙන්ම නිරාකරණ අධිකාරිය ලෙස මහ බැංකුවේ භූමිකාව ශක්තිමත් කිරීමට අමතරව, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ මහ බැංකුවේ කාර්යයභාරය ශක්තිමත් වූ අතර, මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීමට අදාළව එහි දායකත්වය පිළිබඳව ද පිළිගැනීමක් හිමිවිය. මේ අතර, බැංකු සහ බැංකු නොවන මූල්‍ය අංශයේ සුරක්ෂිතතාව හා යහපැවැත්ම ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාවට නැංවිණි. එසේම, ආර්ථිකය තුළ ඩිජිටල් ගෙවීම් පද්ධති සංවර්ධනය කිරීම සඳහා වන සිය ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව කටයුතු කළ අතර, එමගින් මහජනතාව භාවිතා කරන ගෙවීම් ක්‍රමවල කාර්යක්ෂමතාව මෙන්ම ඒ සඳහා වන ප්‍රවේශය ද වැඩිදියුණු කිරීමට සහාය සැලසෙනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජා. මූ. අරමුදල) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යෑමෙහි සහාය ඇතිව, 2023 වසරේ අවසාන භාගය තුළ දී දක්නට ලද ආර්ථික ප්‍රගතිය ඉදිරි වසරවල දී ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ සියලුම ක්ෂේත්‍ර තුළ පුළුල් ආර්ථික වර්ධනයක් බලාපොරොත්තු වන අතර, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ ඉහළ ස්වාධීනත්වය හා වගවීම මෙන්ම මහ බැංකුව විසින් රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම තහනම් වීම හරහා දේශීය මිල ස්ථායීතාව ආරක්ෂාවනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය ස්වාරක්ෂක ගොඩ නැංවීම, විදේශ විනිමය ප්‍රවාහ සාමාන්‍යකරණය වීම සහ රජයේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ විදේශීය අංශයේ ස්ථායීතාව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. නීති සංශෝධන සහ ඉහළ ඒකාබද්ධකරණය මගින් බලගැන්වුණු මූල්‍ය අංශය ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව අත්‍යවශ්‍ය ආයතනික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාවට නංවන අතර, ආර්ථිකය තිරසාර මාවතක් කරා ගෙන යෑම තහවුරු කිරීම සඳහා රජය විසින් සිය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. කෙසේවෙතත්, මේ දක්වා ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යෑම මත ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම රඳා පවතින අතර, මෙම ක්‍රියාවලියෙහි ම කොටසක් ලෙස ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඉතා වැදගත් වේ. තවමත් රට මුළුමනින්ම ආර්ථික අර්බුදයෙන් මිදී නොමැති බැවින්, සැලසුම්ගත මාවතෙන් ඉවත් වීම සඳහා කිසිදු අවකාශයක් නොපවතී. මනාව සැලසුම් නොකළ ප්‍රතිපත්ති අත්හදා බැලීම්වල ව්‍යසනකාරී සමාජ ආර්ථික බලපෑම් මෑත කාලීන අත්දැකීම් මගින් සනාථ කර ඇත. තවද, ක්‍රියාවට නැංවූ සහ සැලසුම් කරන ලද තීරණාත්මක ප්‍රතිසංස්කරණ ආපසු හැරවීම ආර්ථිකය නැවතත් අස්ථායී තත්ත්වයකට ඇද දැමීමට හේතුවනු ඇත. එහෙයින්, ප්‍රතිපත්ති ආපසු හැරවීම හා ඒ හේතුවෙන් ඇතිවන ආර්ථික පසුබෑම් වළක්වා ගැනීම සඳහා පුළුල් දේශපාලනික සහ සමාජයීය එකඟතාවක් මත ආර්ථික ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අතිශයින් තීරණාත්මක වන අතර, තිරසාර වර්ධනයක් තුළින් පොදු ජනතාවගේ සුබසාධනය ඉහළ නැංවීම එමගින් සහතික කෙරෙනු ඇත.

# 1 පරිච්ඡේදය

# සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය

## සාරාංශය

ශ්‍රී ලංකා ආර්ථිකය 2022 වසර තුළ මුහුණ දුන් උග්‍රතම ආර්ථික අර්බුදයෙන් අනතුරුව 2023 වසරේ දී යථා තත්ත්වයට පත්වීමේ මාවතකට පැමිණියේය. මෙලෙස ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා ශීඝ්‍ර නිර්-උද්ධමනය, විදේශ අංශයෙහි කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු වීම, ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ප්‍රධාන වශයෙන් දායක විය. රජය සහ මහ බැංකුව විසින් මනා සම්බන්ධීකරණයකින් යුතුව කඩිනමින් ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජා.මූ. අරමුදලෙහි) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන හා සමගාමීව සිදුවන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ මගින් සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව ශක්තිමත් කෙරිණි. යළි ස්ථාපිත වූ ස්ථායීතාවයේ ප්‍රතිලාභ අත්කර ගනිමින්, ආර්ථිකය වර්ධන මාවතක් වෙත ගමන් කිරීම ආරම්භ විය. ඒ අනුව, කාර්තු හයක් මුළුල්ලේ සංකෝචනය වීමෙන් අනතුරුව, ආර්ථිකය 2023 වසරේ දෙවන භාගය තුළ දී ප්‍රසාරණයක් වාර්තා කළ අතර, ඒ හේතුවෙන් ආර්ථිකයේ වාර්ෂික සංකෝචනය සීමා විය. සමාහාර ඉල්ලුමේ වර්ධනය සඳහා දේශීය ඉල්ලුම සහ ශුද්ධ විදේශීය ඉල්ලුම යන දෙඅංශයේ ම වර්ධනය හේතුවිය. පසුගිය වසර හා සැසඳීමේ දී සේවා වියුක්තිය නොවෙනස්ව පැවතුණ ද, 2023 වසර තුළ දී ශ්‍රම බලකා සහභාගීත්වය තවදුරටත් පහළ ගියේය. 2022 සැප්තැම්බර් මාසයේ දී, මේ දක්වා වාර්තා වී ඇති ඉහළ ම මට්ටම් දක්වා වැඩි වුණු උද්ධමනය, වසරක් තුළ දී තනි ඉලක්කමක මට්ටමක් දක්වා නැවත අඩු වුණු අතර, 2023 වසර අවසානය වන විට ඉලක්කගත මට්ටම ආසන්නයේ පැවතුණි. 2023 වසරේ මැද භාගයේ සිට මහ බැංකුව විසින් ක්‍රියාත්මක කළ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය අවසන් කිරීමත් සමඟ අවදානම් අධිමිල පහළ යෑම හේතුවෙන් රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඇතුළු වෙළඳපොළ පොලී අනුපාතික 2023 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය. පෞද්ගලික අංශයට ලබාදුන් ණය, දීර්ඝ කාලයක් මුළුල්ලේ මාසික වශයෙන් පහළ යෑම් වාර්තා කිරීමෙන් අනතුරුව 2023 වසරේ මැද භාගයේ සිට ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. සේවා අපනයන ඉහළ යෑම හා විදේශ ප්‍රේෂණ ලැබීම් වැඩි දියුණු වීම මධ්‍යයේ වෙළඳ ගිණුම සැලකිය යුතු ලෙස සංකෝචනය වීමෙහි සහාය ලබමින්, විදේශීය ජංගම ගිණුම 2023 වසරේ දී අතිරික්තයක් වාර්තා කළේය. මහ බැංකුව විසින් විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීම සහ බහුපාර්ශ්වික හවුල්කාර ආයතනවලින් ලද මූල්‍යන සහාය හේතුවෙන් දළ නිල සංචිත වැඩි දියුණු විය. ශ්‍රී ලංකා රුපියල තාවකාලික විචලනයන් පෙන්නුම් කළ ද, මහ බැංකුව වෙළඳපොළ මත පදනම් විදේශ විනිමය අනුපාත ප්‍රතිපත්තියක් අනුගමනය කරන පසුබිමක් තුළ බොහෝ දුරට වෙළඳපොළ හැසිරීම් සහ අපේක්ෂා පිළිබිඹු කරමින් 2023 වසර තුළ දී සමස්තයක් ලෙස අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. මේ අතර, දේශීය සහ විදේශීය වශයෙන් කම්පන ඇති වුව ද, පූර්වෝපායික සහ විචක්ෂණශීලී ප්‍රතිපත්ති මෙන්ම අර්බුද සඳහා වන ඉහළ පෙර සුදානම හේතුවෙන් මූල්‍ය අංශය එහි කම්පන සඳහා මුහුණ දීමේ හැකියාව පෙන්නුම් කළේය. අභියෝග මධ්‍යයේ, අවදානම් මත බර තැබූ වත්කම් පහළ යෑමෙහි සහාය ලබමින් ප්‍රාග්ධනය ආරක්ෂා කර ගැනීම හරහා සිය ස්ථාවරත්වය පවත්වාගෙන යෑමට මූල්‍ය අංශයේ ප්‍රමුඛතාව ඇති බැංකු අංශයට හැකිවුණු අතර, ද්‍රවශීලතාවය නියාමන අවමයට ඉහළින් පවත්වා ගැනීමට සමත් විය. ලාභදායීතාව සමඟ බැංකු අංශයේ සමස්ත වත්කම් වැඩි දියුණු වූ අතර, තුන්වන අදියරේ ණය අනුපාතය මගින් පෙන්නුම් කරන ණය අවදානම 2023 වසර තුළ දී ඉහළ ගියේය. රාජ්‍ය ආදායම් ඉහළ නැංවීම සහ වියදම් තාර්කිකකරණය සඳහා වූ ශක්තිමත් ඒකාග්‍රතා පියවර සමඟ 2023 වසර තුළ දී අත්කර ගත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ප්‍රශංසනීය වේ. 2023 වසරේ දී ප්‍රාථමික ශේෂය අතිරික්තයක් පෙන්නුම් කළ අතර, සමස්ත අයවැය හිඟය 2022 වසරට සාපේක්ෂව

# 1

**අඩු විය. විදේශ මූල්‍යන ප්‍රභවයන් වෙත ප්‍රවේශවීම සඳහා වූ අවහිරතා මධ්‍යයේ අයවැය හිඟය මූල්‍යනය සඳහා රජය අඛණ්ඩව ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මත පදනම් විය. ප්‍රධාන වශයෙන් නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හේතුවෙන් මෙන්ම රුපියල අතිප්‍රමාණය වීමෙන් විදේශ ණය මත වන බලපෑම් හේතුකොටගෙන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය 2023 වසර අවසානය වනවිට පහළ ගියේය.**

## 1.1 උද්ධමනය සහ මිල ප්‍රවණතා


### 1.1.1 උද්ධමනය

**උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසගත ඉහළම අගය වාර්තා කළ අතර, එතැන් සිට සීඝ්‍ර නිර්-උද්ධමන ක්‍රියාවලියකින් අනතුරුව, 2023 වසර අවසානය වන විට අඩු තනි අගයක මට්ටමක් දක්වා පහළ ගියේය.** ඉල්ලුම් අංශයෙන් ගත් කළ, උද්ධමනයේ සිදු වූ මෙම පහළ යෑම සඳහා දැඩි මුදල් තත්ත්වයන්ගේ බලපෑම සමස්ත ආර්ථිකයට ක්‍රමයෙන් සම්ප්‍රේෂණය වීම හේතුවෙන් යටපත් වූ ඉල්ලුම් තත්ත්ව මගින් මිල ඉහළ යෑම් පාලනය වීම දායක විය. දැඩි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම නිර්-උද්ධමන ක්‍රියාවලිය තවදුරටත් තීව්‍ර විය. තවද, දේශීය සැපයුම් තත්ත්ව යථා තත්ත්වයට පත් වීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම මෙන්ම, 2022 වසරේ දක්නට ලැබුණු මිල ගණන්වල විශාල මාසික ලක්ෂ්‍යමය ඉහළ යෑම හේතුවෙන් ඇති වූ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම ද 2023 වසරේ මෙම සීඝ්‍ර නිර්-උද්ධමනය සඳහා දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කොපා.මි.ද., 2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 සැප්තැම්බර් මාසයේ දී සියයට 1.3ක් දක්වා පහළ ගියේය. පෙර වසරේ දී වාර්තා වූ ඉහළ උද්ධමනය සඳහා වැඩිම දායකත්වයක් දැක්වූ අංශ දෙකක් වන ආහාර අයිතමයන්ගේ හා ප්‍රවාහන අංශයේ මිල ගණන් 2023 වසරේ මාස කිහිපයක දී අවධමනයක් වාර්තා කළේය. සැපයුම් අංශයේ අවහිරතා යථා තත්ත්වයට පත් වීම සහ ගෝලීය බොරතෙල් මිල ගණන් පහළ යෑම මධ්‍යයේ, පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන මිල සංශෝධන මෙන්ම විනිමය අනුපාතික අතිප්‍රමාණය වීමේ බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් විදුලි ගාස්තුවල නිතර සිදු වූ සංශෝධන ද 2023 වසර තුළ උද්ධමනයේ හැසිරීම කෙරෙහි බලපාන ලදී. විශේෂයෙන් ම, විදුලි ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් 2023 වසරේ පළමු කාර්තුව තුළ නිර්-උද්ධමන ක්‍රියාවලියේ වේගය අඩු වූ අතර, ඉන් අනතුරුව 2023 වසරේ ජූලි මාසයේ දී සිදු වූ විදුලි ගාස්තු පහළ දැමීම උද්ධමනය පහළ යෑමට දායක විය. කෙසේ වෙතත්, විශේෂයෙන් විදුලි ගාස්තු ඉහළ නැංවීම ඇතුළු බලශක්ති මිල ගණන් ඉහළ දැමීම් හේතුවෙන් අපේක්ෂා කළ පරිදි 2023 වසරේ සැප්තැම්බර් මාසයේ සිට උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ඉහළ ගිය අතර, විශේෂයෙන් 2023 වසර අවසානයේ දී කෘෂිකර්මාන්ත අංශය මුහුණ දුන් කාලගුණය ආශ්‍රිත අවහිරතා ද උද්ධමනය තවදුරටත් ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, කොපා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 වසර අවසානය වන විට පැවැති සියයට 57.2ට (2013=100)[1] සාපේක්ෂව, 2023 වසර අවසානය වන විට සියයට 4.0ක් (2021=100) ලෙස වාර්තා වූ අතර, කොපා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 46.4 (2013=100) සිට 2023 වසරේ දී සියයට 17.4ක් (2021=100) දක්වා පහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද මීට සමාන හැසිරීමක් පෙන්නුම් කරමින්, 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 59.2ට (2013=100) සාපේක්ෂව, 2023 වසර අවසානය වන විට සියයට 4.2ක් (2021=100) දක්වා පහළ ගිය අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 50.4 (2013=100) සිට 2023 වසරේ දී සියයට 16.5ක් (2021=100) දක්වා පහළ ගියේය. මේ අතර, 2024 වසර ආරම්භයේ දී එකතු කළ අගය මත බද්ද සියයට 15ක සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම සහ ඇතැම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ සිට උද්ධමනය කෙටි කාලීනව ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2024 වසරේ

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කොපා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කොපා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී.

**1.1 රූප සටහන**

## ශ්‍රී ලංකාවේ උද්ධමනයේ මෑත කාලීන හැසිරීම




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 වසරේ ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.


මාර්තු මාසය ආරම්භයේ දී විදුලි ගාස්තු අඩු කිරීම සහ ඉන් අනතුරුව ඊට අනුරූපව සිදු වූ මිල ගණන් පහළ යෑම් නිසා බදු සංශෝධනවල සෘජු බලපෑම් මෙන්ම වක්‍ර බලපෑම් යම්තාක් දුරකට සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහත සඳහන් හේතු සාධක මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම පෙන්නුම් කරමින් 2024 වසරේ මාර්තු මාසයේ දී උද්ධමනයෙහි විශාල ලෙස පහළ යෑමක් වාර්තා විය.

**මූලික උද්ධමනය ද 2023 වසරේ දී සැලකිය යුතු නිර්-උද්ධමනයක් වාර්තා කළේය.** 2023 වසරේ ජූනි මාසය දක්වා පැවැති දැඩි මුදල් තත්ත්වයන් හා පවතින දැඩි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් මධ්‍යයේ මෙන්ම මහජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අඩු වීමේ අඛණ්ඩ බලපෑම හමුවේ ආර්ථිකයේ ඉල්ලුම් තත්ත්ව අඩුවීම මූලික උද්ධමනය පහළ යෑම මගින් පිළිබිඹු කරයි. 2023 වසර අවසාන භාගයේ දී ඉහළ ගිය මතුපිට උද්ධමනය මෙන් නොව, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය 2023 වසර තුළ දී අඛණ්ඩව පහළ ගිය අතර, එතැන් සිට එහි යම් ඉහළ යෑමක් වාර්තා විය. 2023 වසර අවසානයේ දී මතුපිට උද්ධමනය ඉහළ යෑම සඳහා, මූලික උද්ධමනය ගණනය කිරීමේ දී බැහැර කරනු ලබන බලශක්ති සහ


1

# 2023 වසරේ දී ශ්‍රී ලංකාවේ


## උද්ධමනය සිඟ නිර්-උද්ධමන ක්‍රියාවලියක් වාර්තා කළේය...





## මූර්ත ද.දේ.නි.යේ වර්ධනය ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත්වෙමින් පවතී...





## ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කරන ලදී...





## වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය...




## මුදල් ප්‍රසාරණය අඩු මට්ටමක පැවතිණි...




## 2023 වසරේ දෙවන භාගයේ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණය ඉහළ ගියේය...





**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි ප්‍රගතිය**

**2022 සැප්තැම්බර්**
නව විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන පිළිබඳව ජා.මූ. අරමුදල සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම


**2023 මාර්තු**
ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය සහ පළමු වාරිකය ලැබීම

# ආර්ථිකය සංක්ෂිප්තයක් ලෙස

## 2023 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්විය...




## 2023 වසරේ දී මූල්‍ය පද්ධතිය සමස්තයක් ලෙස ස්ථායීව පැවතිණි...





## තිරසාරභාවය උදෙසා වූ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති...


**රාජ්‍ය ආදායම** (ද.දේ.නි.යෙහි % ලෙස)




**රාජ්‍ය වියදම** (ද.දේ.නි.යෙහි % ලෙස)





**ප්‍රාථමික ශේෂය සහ අයවැය ශේෂය** (ද.දේ.නි.යෙහි % ලෙස)




*ප්‍රාථමික ශේෂයෙන් පොළී වියදම අඩු කළ විට, සමස්ත අයවැය ශේෂයට සමාන වේ.

**මධ්‍යම රජයේ ණය** (ද.දේ.නි.යෙහි % ලෙස)




**2023 ඔක්තෝබර්**
පළමු සමාලෝචනය සඳහා
ජා.මූ. අරමුදල සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම

**2023 දෙසැම්බර්**
ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය සහ දෙවන වාරිකය ලැබීම

**2024 මාර්තු**
දෙවන සමාලෝචනය සඳහා
ජා.මූ. අරමුදල සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම

1

**1.1 සංඛ්‍යා සටහන**

## සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2018-2023)

| දර්ශකය | ඒකකය | 2018 | 2019 | 2020 | 2021 (අ) | 2022 (අ) | 2023 (ආ) |
|---|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඇ)** | | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 2.3 | -0.2 | -4.6 | 4.2 | -7.3 (ආ) | -2.3 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 15,352 | 15,911 | 15,646 (අ) | 17,612 | 24,064 (ආ) | 27,630 |
| ඒක පුද්ගල ද.දේ.නි. (ඈ) (ඉ) | එ.ජ. ඩොලර් | 4,372 | 4,082 | 3,851 (අ) | 3,999 | 3,464 (ආ) | 3,830 |
| **විදේශීය අංශය** | | | | | | | |
| වෙළඳ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -10.9 | -9.0 | -7.1 | -9.2 | -6.7 | -5.8 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -3.0 | -2.1 | -1.4 | -3.7 | -1.9 | 1.8 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් මිලියන | -1,102.9 | 376.6 | -2,327.7 | -3,966.6 | -2,806.1 | 2,825.6 |
| විදේශීය නිල සංචිත | එ.ජ. ඩොලර් මිලියන | 6,919.2 | 7,642.4 | 5,664.3 | 3,139.2 | 1,897.6 | 4,392.1 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ)** | | | | | | | |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -1.1 | -3.4 | -7.5 | -7.3 | -6.4 | -6.0 |
| ප්‍රාථමික ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | 0.6 | -3.4 | -4.4 | -5.7 | -3.7 | 0.6 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.0 | -9.0 | -10.7 | -11.7 | -10.2 | -8.3 |
| මධ්‍යම රජයේ ණය (ඊ) | ද.දේ.නි.යේ % වශයෙන් | 78.4 | 81.9 | 96.6 | 100.0 | 114.2 | 103.9 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (උ) පෞද්ගලික අංශයට ලබා දුන් | සියයට | 13.0 | 7.0 | 23.4 | 13.2 | 15.4 | 7.3 |
| ණය වර්ධනය ($M_{2b}$හි) (උ) | සියයට | 15.9 | 4.2 | 6.5 | 13.1 | 6.2 | -0.6 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (උෘ) | සියයට | 4.3 | 4.3 | 4.6 | 6.0 | 46.4 | 17.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.
(ඈ) නවතම ජනගහන සංඛ්‍යාන සමඟ ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඉ) 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය යොදාගෙන ද.දේ.නි. එ.ජ. ඩොලර්වලින් ගණනය කර ඇත.
(ඊ) ණය සංඛ්‍යාලේඛන ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.
(උ) වසර අවසාන අගයන් මත පදනම්ව වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය.
(උෘ) 2022 වසර දක්වා කොං.පා.මි.ද. (2013=100) මත පදනම්ව සහ 2023 වසර කොං.පා.මි.ද. (2021=100) මත පදනම්ව

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමයන්ගේ මිල ගණන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වූ බව මෙමගින් පිළිබිඹු කෙරෙයි. ඒ අනුව, 2022 වසර අවසානය වන විට පැවැති සියයට 47.7ට (2013=100) සාපේක්ෂව, 2023 වසර අවසානය වන විට කොං.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය සියයට 0.6ක් (2021=100) දක්වා පහළ ගිය අතර, කොං.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 34.6ට (2013=100) සාපේක්ෂව, 2023 වසරේ දී සියයට 14.5ක් (2021=100) දක්වා පහළ ගියේය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2022 වසර අවසානය වන විට පැවැති සියයට 57.5ට (2013=100) සාපේක්ෂව, 2023 වසර අවසානය වන විට සියයට 0.9ක් (2021=100) දක්වා පහළ ගිය අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 43.9ට (2013=100) සාපේක්ෂව, 2023 වසරේ දී සියයට 15.8ක් (2021=100) දක්වා පහළ ගියේය. මේ අතර, මූලික උද්ධමනය මැනීමේ දී සලකනු ලබන පාරිභෝගික පැසෙහි ඇතුළත් බොහෝ අයිතමයන් එකතු කළ අගය මත බදුවලට යටත් වන බැවින්, 2024 වසර ආරම්භයේ දී එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් මිල ඉහළ යෑමේ බලපෑම මූලික උද්ධමනය තුළින් ද දැකගත හැකි විය.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් පෙන්නුම් කරන පරිදි, මෙම වසර තුළ දී ආයතනික සහ කුටුම්භ යන දෙඅංශයෙහිම උද්ධමන අපේක්ෂා 2022 වසරේ දී දක්නට ලද ඉහළ මට්ටම්වලට සාපේක්ෂව පහත වැටුණි.** මේ අතර, කෙටි කාලීනව යම් විචලන දක්නට ලැබුණ ද මැදි කාලීන උද්ධමන අපේක්ෂා පුළුල් ලෙස පාලනය වී පැවතුණි. දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මුදල් ප්‍රතිපත්තිවල සහායයෙන් උද්ධමනය පහළ යෑම ඇතුළු විවිධ සාධක හේතුවෙන් උද්ධමන අපේක්ෂා පහත වැටුණි. මීට අමතරව, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම, සැපයුම් අංශයේ බාධා ලිහිල් වීම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල පහළ යෑම සහ ආනයන සීමා ලිහිල් කිරීම, උද්ධමන අපේක්ෂා පහත වැටීමට දායක විය. ඒ අනුව, ආයතනික අංශයේ උද්ධමන

1

**විශේෂ සටහන I**

## සැපයුම් අංශයේ උද්ධමනය හේතුවෙන් මුදල් ප්‍රතිපත්තියට වන බලපෑම

සැපයුම් අංශයේ උද්ධමනය නිෂ්පාදන පිරිවැයේ වෙනස්වීම් හේතුවෙන් සිදුවන අතර එය බොහෝ විට පිරිවැයෙන් තල්ලුවන උද්ධමනය ලෙස ද හැඳින්වේ. මෙලෙස සැපයුම් අංශයේ උද්ධමනය ඇතිවීම කෙරෙහි යෙදවුම් ලබා ගැනීමට ඇති බාධා, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් වෙනස්වීම්, බදු සංශෝධන සහ රජයේ නියාමන ක්‍රියාමාර්ගවල ඇතිවන වෙනස්වීම්, අහිතකර කාලගුණික තත්ත්ව, ගෝලීය ආර්ථික තත්ත්ව සහ භූ දේශපාලනික අර්බුද හේතුවෙන් ඇතිවන සැපයුම් දාම අවහිරතා, සහ නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ අකාර්යක්ෂමතා වැනි සාධක බලපායි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකීමේ දී, ආහාර උද්ධමනයේ නිරන්තර උච්චාවචන ඇති කරන අවිධිමත් කාලගුණික රටා සැපයුම් අංශය හරහා උද්ධමනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් වේ. අනෙකුත් බොහෝ රටවලට මෙන්ම ශ්‍රී ලංකාවට ද, දේශගුණික විපර්යාස ආර්ථික ක්‍රියාකාරකම් සහ සමාජ යහපැවැත්ම කෙරෙහි බලපෑම් ඇති කරයි. මීට අමතරව, ගෝලීය සැපයුම් දාම වෙනස්වීම් මෙන්ම සැපයුම් අවහිරතා මධ්‍යයේ නිෂ්පාදන පිරිවැය වැඩිවීම, සැපයුම් අංශය හරහා ඇතිවූ උද්ධමනයේ මෑත කාලීන උච්චාවචනවලට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම සැපයුම් අංශයේ පීඩන කෙටි කාලීන වේ නම්, මුදල් ප්‍රතිපත්තිය කෙරෙහි ඒවා සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ඇත. කෙසේ වෙතත්, සැපයුම් සාධක හේතුවෙන් උද්ධමනය අඛණ්ඩව ඉහළ යෑමත් සමඟ ප්‍රධාන වශයෙන් අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සංකීර්ණ කළ හැකි අතර එය මහ බැංකුවක විශ්වසනීයත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකිය. පර්යේෂණ වාර්තා පෙන්වා දෙන පරිදි, සැපයුම් අංශයට වන බාධා කෙටිකාලීන වන විට කිසිදු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයකින් තොරව උද්ධමනය යළි සමතුලිතතාවයට පැමිණෙන අතර, නිරන්තරයෙන් සිදුවන සැපයුම් කම්පන පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව ඇති කරමින් වක්‍ර බලපෑම් ඇති කරයි (John, Kumar and Patra, 2022).

### ශ්‍රී ලංකාවේ උද්ධමනය කෙරෙහි කාලගුණික රටා සහ දේශගුණික විපර්යාසවල බලපෑම

බොහෝ දුරට මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පෘථිවියේ උෂ්ණත්වයේ සහ එහි දේශගුණ පද්ධතියේ විවිධ පැතිකඩයන්හි සිදුවන කල්පවත්නා වෙනස්වීම් දේශගුණික විපර්යාසවලට ඇතුළත් වේ. එහි බලපෑම් පුළුල් සහ විවිධ වන අතර, පාරිසරික, සමාජයීය, ආර්ථිකමය සහ සෞඛ්‍යමය බලපෑම් එයට ඇතුළත් වේ. අක්‍රමවත් කාලගුණික රටා සහ දේශගුණික විපර්යාස නිසා ආහාර උද්ධමනයේ සැලකිය යුතු උච්චාවචන ඇති විය හැකිය. විශේෂයෙන් ම, ආහාර ද්‍රව්‍ය පරිභෝජන පැසෙහි විශාල කොටසකට හිමිකම් කියන ශ්‍රී ලංකාව වැනි රටක, මතුපිට උද්ධමනයේ ඉහළ උච්චාවචනයක් ඇති කිරීමට එය හේතු විය හැකිය.[1] ප්‍රධාන වශයෙන් වර්ෂාපතන රටාවේ වෙනස්වීම් සහ උෂ්ණත්වය ඉහළ යෑම මගින් කෘෂිකාර්මික අංශයට බලපෑම් ඇති විය හැකිය. සහල් සහ පොල්[2] ඇතුළු ශ්‍රී ලංකාවේ ප්‍රධාන භෝගවලට සැලකිය යුතු බලපෑමක් උෂ්ණත්වයේ සහ වර්ෂාපතනයේ වෙනස්කම් නිසා එල්ල වේ. විශේෂයෙන් ම ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් රාත්‍රී කාලයේ උෂ්ණත්වය වැඩිවීම සහල් අස්වැන්න සැලකිය යුතු ලෙස අඩු වීමට හේතු වේ. නිදසුනක් වශයෙන්, පිලිපීනයේ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනයේ දී සිදු කරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ මගින්, වියළි කාලවලදී අවම උෂ්ණත්වයේ සෑම සෙල්සියස් අංශක 1ක වැඩිවීමක් සඳහාම සහල් අස්වැන්න සියයට 10කින් අඩු වන බව සොයාගෙන ඇත (Peng et al., 2004). සාමාන්‍ය කාලගුණික තත්ත්ව ඇති කාලවල දී එළවළු සහ පලතුරු මිල ගණන්හි හැසිරීම යම්තාක් පුරෝකථනය කළ හැකි වුවද, දේශගුණික විපර්යාස හෝ අසාමාන්‍ය කාලගුණික රටාවන්වලදී සහල්, එළවළු සහ පලතුරු මත බලපෑම් ඇතිවන බැවින් ඒවායේ මිල ගණන් පුරෝකථනය කළ නොහැකිය. ඉහත කරුණු වලට අමතරව, දීර්ඝ නියං කාලවල දී අඩු වියදම් ජල විදුලිය වෙනුවට මිල අධික ඉන්ධන මත පදනම්ව විදුලිය උත්පාදනය කිරීමට සිදුවන නිසා එය විදුලි මිලට බලපෑ හැකි අතර, එමගින් කාලගුණය සහ දේශගුණය සම්බන්ධ බාධාවන් පුළුල් ආර්ථිකයට සම්ප්‍රේෂණය කරමින් විශාල සැපයුම් අවහිරතා ඇති කරයි.

ඉහත කරුණුවලට අනුව, අහිතකර කාලගුණික සිදුවීම් සැලකිය යුතු සාර්ව ආර්ථික බලපෑම් ඇති කළ හැකිය. අතීතයේ දී මෙම බලපෑම් බොහෝ දුරට තාවකාලික ලෙස සැලකූ අතර, මහ බැංකු ඒ කෙරෙහි එතරම් සැලකිල්ලක් නොදැක්වීය. කෙසේ වෙතත්, තාපතරංග, දිගු නියඟ හෝ ගංවතුර වැනි කාලගුණික වෙනස්වීම්වල වාර ගණන සහ තීව්‍රතාවය වැඩි වීමේ ඍජු හා වක්‍ර බලපෑම්වල ඒකාබද්ධ බලපෑම හරහා උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා කෙරෙහි වඩා ස්ථීර බලපෑමක් ඇති කළ හැකිය. මෙය ප්‍රතිපත්ති සම්පාදකයින් සැලකිල්ලට භාජනය කරන ප්‍රධාන කරුණක් වන අතර, එය උද්ධමනය පුරෝකථනය කිරීම වඩාත් අභියෝගාත්මක කරයි. මේ අතර, දේශගුණික විපර්යාස කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති බැවින්, ප්‍රධාන ආර්ථික දර්ශක මත දේශගුණික විපර්යාසවලින් ඇතිවිය හැකි බලපෑම් වඩා හොඳින් ග්‍රහණය කර ගැනීම සඳහා මහ බැංකු දේශගුණික විචල්‍යය සහ/හෝ දේශගුණික විශේෂිත අවස්ථා ඔවුන්ගේ සාර්ව ආර්ථික ආකෘතිවලට ක්‍රමානුකූලව ඇතුළත් කරමින් පවතී.

1 කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) යනු ශ්‍රී ලංකාවේ උද්ධමනය මනින මිනුම් වේ. මෙම දර්ශක දෙකෙහිම, කාණ්ඩ 12 ක් අතරින් ආහාර කාණ්ඩයට විශාලතම බර තැබීමක් ඇති අතර, එය කො.පා.මි.ද.හි සියයට 26.2ක් සහ ජා.පා.මි.ද.හි සියයට 39.2ක් වශයෙන් වේ.

2 කො.පා.මි.ද. පැසෙහි සහල් කාණ්ඩයේ දායකත්වය සියයට 2.72ක් වන අතර පොල් කාණ්ඩය සඳහා එය සියයට 1.38කි.

1

### උද්ධමනය මත අනෙකුත් සැපයුම් අංශයේ සාධක සහ රජයේ ප්‍රතිපත්තිවල බලපෑම

ප්‍රවාහනය සහ විදුලි උත්පාදනය යන අංශ දෙක සඳහාම බනිජ තෙල් ආනයනය කරන රටක් ලෙස, ගෝලීය බනිජ තෙල් මිල ගණන් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ලෙස බලපාන අතර එය උද්ධමනයේ හැසිරීම වෙනස් කිරීම සඳහා ඍජු හා වක්‍ර ආකාරයෙන් බලපායි. ශ්‍රී ලංකාව තුළ, බලශක්ති, බනිජ තෙල් සහ ගෑස් මිල ගණන් වර්තමානයේ නිතර සංශෝධනය කෙරෙන අතර එය පුළුල් ලෙස පිරිවැය ආවරණය වන පදනම මත තීරණය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, භූ දේශපාලනික අර්බුද සහ ගෝලීය ආර්ථික තත්ත්ව හේතුවෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිලෙහි සහ නැව් ගාස්තුවල සිදුවන වෙනස්වීම් දේශීය මිල ගණන් කෙරෙහි බලපාන අතර, එය වර්තමානයේ දී පෙරට වඩා දේශීය මිල ගණන් කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ හැකිය.[3] මෑත කාලීන අත්දැකීම් අනුව, අවිනිශ්චිතතා මධ්‍යයේ උද්ධමනය කෙරෙහි විදුලි, ඉන්ධන සහ ගෑස් මිල ගණන් වෙනස්වීමේ වක්‍ර බලපෑම, ඍජු බලපෑමට වඩා වැඩි විය හැකිය. කෙසේ වෙතත්, දේශීය බලශක්ති මිල ගණන් සඳහා නිතිපතා සිදුකරන එවැනි ගැළපීම් මගින්, 2022 සහ 2023 වසරවල දී දේශීය ඉන්ධන සහ විදුලි මිල ගැළපීම් වැනි දේශීය මිල ගණන් සඳහා එක් වරක් පමණක් සිදු කළ දැඩි නිවැරදි කිරීම්වල අවදානම ඉවත් කරනු ඇත. මෙය ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී උද්ධමනයේ විශාල වෙනස්කම් අවම කර ගැනීමට සහාය වනු ඇති අතර, එමගින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට දායක වෙමින් ආර්ථිකයේ පාර්ශ්වකරුවන් විසින් ඉදිරි දැක්මක් සහිතව ආර්ථික තීරණ ගැනීම ප්‍රවර්ධනය කරනු ඇත.

තවද, බදු ව්‍යුහයේ නිතර සිදුවන වෙනස්වීම්, එක් වරක් සිදුවන සිදුවීම් වුවද, උද්ධමනයේ උච්චාවචනයන්ට සැලකිය යුතු ලෙස බලපෑ හැකිය. එකතු කළ අගය මත බද්දෙහි (VAT) සිදුකල මෑත කාලීන සංශෝධන ඉන්ධන මිල ඇතුළු පාරිභෝගික භාණ්ඩ පැසෙහි බොහෝ භාණ්ඩවල මිල කෙරෙහි සැලකිය යුතු ඍජු බලපෑමක් ඇති කළ අතර එමගින් උද්ධමනය කෙරෙහි වැඩි බලපෑමක් ඇති කළේය. එපමණක් නොව, ව්‍යාපාර මෙම බදු සංශෝධන තම අභිමතය පරිදි මිල වෙනස් කිරීමට භාවිතා කළ හැකි බැවින්, මෙම ප්‍රතිපත්තිවල ඍජු හා වක්‍ර බලපෑම් අවිනිශ්චිත විය හැකිය. තවද, අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා තරඟකාරිත්වය අවම වීම මෙන්ම මිල පහළ යෑමට ඇති අවහිරතා ද අඛණ්ඩ මිල පීඩනයන්ට හේතු විය හැකිය. සහල් සහ බිත්තර වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ගණන් වෙළඳපොළේ සුළු පිරිසක් මෙහෙයවන බැවින් (කතිපයාධිකාරය), මෙම භාණ්ඩවල මිල සඳහා ඍජු පීඩනයක් මෙන්ම ඒ හරහා වෙනත් මිල ගණන් කෙරෙහි සැලකිය යුතු වක්‍ර බලපෑමක් ද ඇති කළ හැකිය.

### සමස්ත උද්ධමනය සඳහා සැපයුම් අංශයේ සාධකවල දායකත්වය

උද්ධමනයේ හැසිරීම සඳහා හේතුවන ඉල්ලුම් සහ සැපයුම් සාධක වෙන වෙනම දැක්වීම ඒවා හඳුනාගැනීමේ සංකීර්ණත්වය හේතුවෙන් අභියෝගාත්මක ක්‍රියාවලියක් වේ. ආහාර උද්ධමනය සාමාන්‍යයෙන් සැපයුම් අංශයේ සාධක මත විශාල වශයෙන් රඳා පවතින බවට සැලකේ. කොළඹ පාරිභෝගික මිල දර්ශක (කොෂ.පා.මි.ද.) පැසෙහි ආහාර කාණ්ඩයට අමතරව, ආහාර නොවන කාණ්ඩයේ ඇතැම් භාණ්ඩවල මිල ගණන් සංශෝධනයවන වාර ගණන සහ මිල ගණන් වෙනස්වීමේ ප්‍රමාණය අනුව මෙම භාණ්ඩවල මිල ද උද්ධමනය සඳහා සැපයුම්/පිරිවැය මත පදනම් වූ දායකයින් ලෙස වර්ග කළ හැකිය.[4]


සැපයුම් අංශයේ උද්ධමනය, සැපයුම් නොවන අංශයේ උද්ධමනය හා සසඳන විට බොහෝ විට වැඩි වශයෙන්

3 මෙම බලපෑම මීට පෙර අදාළ රජය සතු වාණිජ ව්‍යාපාර විසින් අවශෝෂණය කරන ලද අතර, එමගින් රාජ්‍ය මූල්‍ය අංශයට හෝ මූල්‍ය අංශයට බලපෑම් ඇති කරමින් මහජනතාව වෙත වක්‍රාකාරයෙන් බලපෑම් ඇතිකරනු ලැබිය.

4 මෙම ඇස්තමේන්තුව තුළ, සැපයුම/පිරිවැය මත පදනම් වූ කාණ්ඩය කොෂ.පා.මි.ද. භාණ්ඩ හා සේවා පැසෙහි ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග සහ පුද්ගලික ප්‍රවාහන උපකරණ සඳහා ඉන්ධන; විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; ජල බිල්පත්; සහ ප්‍රවාහන සේවා වැනි තෝරාගත් පරිපාලිත මිල කාණ්ඩ නියෝජනය කරන අතර, සැපයුම් නොවන කාණ්ඩය කොෂ.පා.මි.ද. පැසෙහි අනෙකුත් සියලුම උප කාණ්ඩ නියෝජනය කරයි.

**රූප සටහන වි.ස. 1.1**

**මතුපිට උද්ධමනය සඳහා දායකත්වය: සැපයුම් සහ සැපයුම් නොවන අයිතම (කොෂ.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)**





(අ) ප්‍රධාන වශයෙන් කොෂ.පා.මි.ද.යේ සැපයුම් සාධක මගින් මිල නිරණයවන අයිතම කාණ්ඩය සැපයුම් අයිතම ලෙස සැලකෙන අතර ඉතිරි අයිතම සැපයුම් නොවන අයිතම ලෙස සැලකේ (කාර්යමණ්ඩල විනිශ්චය මත පදනම්ව).

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්යමණ්ඩල විනිශ්චය

රූප සටහන වි.ස. 1.2

## සැපයුම් අංශයේ උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




(අ) ප්‍රධාන වශයෙන් කො.පා.මි.ද.යේ සැපයුම් සාධක මගින් මිල තීරණයවන අයිතම කාණ්ඩයේ සමස්ත මිලෙහි හැසිරීම මත පදනම්ව.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මහ බැංකු කාර්යමණ්ඩල විනිශ්චය

විචලනය වීමේ ලක්ෂණ නිරූපණය කරයි (සංඛ්‍යා සටහන වි.ස. 1.1). සැපයුම් අංශයේ උද්ධමනය සාමාන්‍යයෙන් ඉතා ඉක්මනින් වෙනස්වන ස්වභාවය අනුව, මහ බැංකු එයට මුහුණදීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග භාවිතා කිරීමේ දී පරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළ හැකිය. තව ද, සැපයුම් බාධාවන් ආර්ථික ක්‍රියාකාරකම් සහ මිල මට්ටම් ප්‍රතිවිරුද්ධ දිශාවලට යොමු කරන අතර, මහ බැංකුවකට ආර්ථික සහ මිල ස්ථායීතාවය යන දෙකම පවත්වා ගැනීමට අපොහොසත් විය හැකිය (Amarasekara, 2009). එවැනි තත්ත්ව තුළ, මිල ස්ථායීතාවය පමණක් ඉලක්ක කරගත් ප්‍රතිපත්ති හරහා සැපයුම් අවහිරතාවල බලපෑම්වලට ගන්නා ප්‍රතිචාර නිසා මූර්ත ආර්ථිකය මත දැඩි බලපෑම් ඇති කරයි. ඇතැම් සැපයුම් අංශයේ කම්පන, ක්ෂණික සහ දැඩි ප්‍රතිපත්ති ප්‍රතිචාරවල අවශ්‍යතාවක් නොමැතිව කාලයත් සමඟ නිවැරදි වීමට ඉඩ හැරීම වඩා යෝග්‍ය විය හැකිය. නිදසුනක් වශයෙන්, කාලගුණය ආශ්‍රිත සාධක වලින් තාවකාලික බලපෑම් පැන නගින්නේ නම්, එය කාලයත් සමඟ ක්‍රමයෙන් අඩු වනු ඇත. එහෙත්, එය භාණ්ඩ හා සේවා මත බදු සංශෝධන හෝ පරිපාලන වෙනස්කම්වල ප්‍රතිඵලයක් නම්, එහි සෘජු බලපෑම ප්‍රධාන වශයෙන් එක් වරක් පමණක් ඇති වේ. තාවකාලික හෝ එක් වරක් පමණක් ඇතිවන සැපයුම් කම්පනවලදී පවා, උද්ධමනයේ අනාගත ගමන් මග පිළිබඳ යම් සහතිකයක් සහ මගපෙන්වීමක් සැපයීමෙන් සහ උද්ධමන අපේක්ෂාවන් මනා ලෙස පාලනය කිරීමෙන් මහ බැංකු සන්නිවේදනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සංඛ්‍යා සටහන වි.ස. 1.1

**සැපයුම් අංශයේ සහ සැපයුම් නොවන අංශයේ උද්ධමනයේ සම්මත අපගමනය (කො.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**

| වසර | මතුපිට උද්ධමනය | සැපයුම් | සැපයුම් නොවන |
|---|---|---|---|
| 2015 | 1.3 | 2.8 | 1.3 |
| 2016 | 1.1 | 2.5 | 0.8 |
| 2017 | 0.9 | 2.2 | 1.0 |
| 2018 | 1.0 | 2.1 | 0.2 |
| 2019 | 0.6 | 1.7 | 0.5 |
| 2020 | 0.8 | 1.3 | 0.5 |
| 2021 | 2.6 | 3.9 | 1.6 |
| 2022 | 20.3 | 32.0 | 11.0 |
| 2023 | 20.1 | 29.9 | 12.9 |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

### උද්ධමනයේ සැපයුම් අංශයේ ගැටළු හැසිරවීමේ දී මහ බැංකුවල කාර්යභාරය සීමා වන්නේ ඇයි?

මහ බැංකු සිය පාලනය මූලික වශයෙන් ඉල්ලුම් අංශයෙන් ඇතිවන උද්ධමන පීඩන කෙරෙහි පවතින බැවින් සැපයුම් අංශයේ කම්පනවලට සාමාන්‍යයෙන් ප්‍රතිචාර නොදක්වයි. සැපයුම් අංශයේ ගැටළු, මිල හා උද්ධමනය කෙරෙහි ක්ෂණික බලපෑමක් ඇති කළ හැකිය. මීට අමතරව, බොහෝ සැපයුම් අංශයේ සාධක ප්‍රධාන වශයෙන්ම ව්‍යුහාත්මක සහ කාලගුණය හා සම්බන්ධ වන අතර හුදෙක් ආර්ථික ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලයක් නොවේ. එබැවින් මේ සඳහා විසඳුම් ලෙස ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් රජයේ සැපයුම් අංශයේ ප්‍රතිපත්ති වැනි දිගුකාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හෝ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අවශ්‍ය විය හැකිය. මහ බැංකුවල අරමුණ ඉල්ලුම මත පදනම් වූ ප්‍රතිපත්ති හරහා ආර්ථික ක්‍රියාවලීන්ගේ උච්චාවචන සඳහා පිළියම් යෙදීම නිසා මහ බැංකුවලට මේ සඳහා පාදක වූ ව්‍යුහාත්මක ගැටළු විසඳීමට නොහැකි වනු ඇත. එබැවින්, මුදල් ප්‍රතිපත්තිය හරහා සැපයුම් අංශයේ මිල පීඩන සඳහා පිළියම් යෙදීමට උත්සාහ කිරීම අහිතකර ප්‍රතිඵලවලට හේතු විය හැකිය. උද්ධමනය අඩු කිරීම සඳහා පොලී අනුපාතික ඉහළ දැමීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී විය හැකි අතර එමගින් සැපයුම් අංශයේ පීඩන තවදුරටත් වැඩි වනු ඇත.

කෙසේ වෙතත්, අබණ්ඩ හෝ දැඩි සැපයුම් අංශ අවහිරතා සමස්ත මිල සහ ආර්ථික ස්ථායීතාව සඳහා පුළුල් වශයෙන් බලපෑම් ඇති කළ හැකි බැවින්, මහ බැංකු විසින් සැපයුම් අංශයේ උද්ධමනය සමීපව නිරීක්ෂණය

1

කරනු ලැබේ. ඇතැම් අවස්ථාවලදී, සැපයුම් අංශයේ ඇතිවන වෙනස්වීම් උද්ධමන අපේක්ෂා මත වක්‍ර බලපෑම් ඇති කරන විට හෝ දීර්ඝ කාලයක් පවත්නා උද්ධමනකාරී වාතාවරණයකට තුඩු දෙන විට, මහ බැංකුවලට මෙම බලපෑම් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සලකා බැලිය හැකිය. මේ සම්බන්ධයෙන් සැලකිමේදී, එක් සැපයුම් කම්පනයකට වඩාත් සුදුසු මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාරය කම්පනයේ ස්වභාවය සහ කාල පරාසය, එහි වක්‍ර බලපෑම් සහ මූර්ත ආදායමට ඇති බලපෑම මත රඳා පවතී (Bandera et al., 2023). මෙම සාධක සියල්ල සලකා බැලීම තුළින්, මුදල් ප්‍රතිපත්තිය ප්‍රතිචාරයක් නොදැක්විය යුතුද (looked through), එසේත් නැතිනම් ප්‍රතිපත්ති සංශෝධනයක් සිදු කළ යුතුද (lean against the shock) යන්න තීරණය කරයි. උද්ධමනකාරී සැපයුම් කම්පන මාලාවක් සඳහා දැඩි ප්‍රතිපත්ති ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. එවැනි අවස්ථාවන්හි දී, එක් එක් කම්පනයට තනි තනිව ප්‍රතිචාර දැක්වීම, මැදි කාලීන උද්ධමනය වෙනුවට නුදුරු කාලීන උද්ධමනය ඉලක්කයෙන් බැහැරවීම කෙරෙහි අවධානය යොමු කිරීම නිසා අනපේක්ෂිත ප්‍රතිඵල අත්විය හැකිය. එබැවින්, සැපයුම් කම්පන මාලාවක් සඳහා දක්වන මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාර එවැනි කම්පනවල සමස්ත සාර්ව ආර්ථික බලපෑම මත පදනම් විය යුතු අතර, උද්ධමන අපේක්ෂාවන්හි හැසිරීම පිළිබඳ මනා තක්සේරුවක් ද ඇතුළත් විය යුතුය. තව ද, විශාල සහ අඛණ්ඩ සැපයුම් කම්පන මධ්‍යයේ, සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මුලදීම ක්‍රියාත්මක කිරීම මගින් උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය කර ගත හැකි අතර, එමගින් මහ බැංකුවේ විශ්වසනීයත්වය ද ආරක්ෂා කර ගත හැකිය (John et al., 2022).

**සැපයුම් අංශයේ උද්ධමනය කළමනාකරණය කිරීමේ රජයේ කාර්යභාරය**

සැපයුම් අංශයේ උද්ධමනය කළමනාකරණය කිරීමේ දී විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම් හරහා රජය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රවාහන සහ බලශක්ති වැනි යටිතල පහසුකම්වල ආයෝජනවලට ප්‍රමුඛත්වය ලබාදීමෙන් රජයට ආර්ථිකයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකිය. මීට අමතරව, පසු අස්වනු හානි වළක්වා ගැනීම සහ ආහාර මිල ස්ථායී කරන අතර දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගබඩා පහසුකම් වැනි කෘෂිකාර්මික යටිතල පහසුකම් සඳහා ආයෝජන ඉහළ නැංවීම කෙරෙහි රජයට, පෞද්ගලික අංශය සමඟ එක්ව, අවධානය යොමු කළ හැකිය. අනෙක් අතට, ආයෝජන සඳහා හිතකර පරිසරයක් ඇති කරමින් වෙළඳපොළ තරඟකාරීත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපාර සඳහා ඇති බාධක ඉවත් කිරීම, සහ රාජ්‍ය ආයතනවල ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ද ක්‍රියාත්මක කළ හැකිය. සැපයුම් අංශයේ කම්පන හේතුවෙන් ඇති වන හදිසි මිල පීඩනයන්ට කෙටි කාලීනව පිළියම් යෙදීම සඳහා, සැපයුම් අවහිරතා සහ හිඟයන් හේතුවෙන් වෙළඳපොළේ හිඟවන ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට අවශ්‍ය පරිදි පහසුකම් සැලසීම සඳහා රජයට පූර්වෝපායිකව පියවර ගත හැකි අතර එමගින් මිල ගණන් ඉහළ යෑම අවම කර ගත හැකිය. ඇමරිකා එක්සත් ජනපදයේ 2022 වසරේ උද්ධමනය අඩු කිරීමේ පනත සැපයුම් අංශයේ ගැටළු විසඳීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධව මෑත කාලීන උදාහරණයකි. ඖෂධ මිල පහත හෙළීම සහ පරිසර හිතකාමී බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කරමින් දේශීය බලශක්ති නිෂ්පාදනය සඳහා ආයෝජනය කිරීම මගින් උද්ධමනය පාලනය කිරීම මෙම පනතේ අරමුණ වේ.

**නිගමනය**

කාලගුණික රටා, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් සහ රජයේ ප්‍රතිපත්ති වැනි සැපයුම් අංශයේ සාධකවල හැසිරීම, සහ උද්ධමනය කෙරෙහි ඒවායේ සැලකිය යුතු බලපෑම අතර සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇත. විශේෂයෙන් ම දේශීය හා ගෝලීය පරිසරයෙන් ඇති වන සාධක රාශියක් මිල මට්ටම්හි උච්චාවචනයන්ට දායකවන ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථික තුළ, සැපයුම මත පදනම් වූ උද්ධමනය වටා ඇති සංකීර්ණතා මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සැලකිය යුතු අභියෝග මතු කරයි. තාවකාලික සැපයුම් කම්පනවලට ක්ෂණික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අවශ්‍ය නොවුවද, සැපයුම් අංශයෙන් අඛණ්ඩව එල්ලවන බාධා මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ කාර්යය සංකීර්ණ කළ හැකිය. තව ද, ඇතැම් සැපයුම් අංශයේ ගැටළුවල ව්‍යුහාත්මක ස්වභාවය සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්ති උපකරණවල විෂය පථයෙන් බොහෝ විට ඔබ්බට ගිය දිගු කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව පෙන්වා දෙනු ලැබේ. සැපයුම මත පදනම් වූ උද්ධමනය ඍජුව පාලනය කිරීමේ සීමා පැවතිය ද, ආර්ථික ස්ථායීතාව සහ උද්ධමන අපේක්ෂාවන් කෙරෙහි අහිතකර බලපෑම් අවම කිරීම අරමුණු කර ගනිමින් මහ බැංකු ඒ පිළිබඳව අවධානයෙන් සිටී. අවසාන වශයෙන්, සැපයුම මත පදනම් වූ උද්ධමනයේ සංකීර්ණතා හැසිරවීමට කෙටි කාලීන ස්ථායීතාව මෙන්ම දිගු කාලීන ආර්ථික තිරසාර බව යන අංශ දෙකම සලකා බලන සමතුලිත උපාය මාර්ගයක් අවශ්‍ය වේ. උද්ධමනය මත ඇති ඉල්ලුම් පීඩන කළමනාකරණය කිරීම සඳහා සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගන්නා අතරම මහ බැංකුවක් විසින් උද්ධමනය මත සැපයුම් අංශයේ බාධාවන්ගේ බලපෑම පිළිබඳව පැහැදිලිව සහ පූර්වෝපායිකව සන්නිවේදනය කිරීම මගින් උද්ධමන අපේක්ෂා කළමණාකරණය කිරීම සහ දේශීය මිල ස්ථායීතාව සහතික කිරීම අපේක්ෂා කරයි.

---

මූලාශ්‍ර


1. Amarasekara, C. (2009) Central bank objectives and aggregate disturbances. *Proceedings of the Central Bank of Sri Lanka International Research Conference - 2009*, pp. 41-55.
2. Bandera, N., Barnes, L., Chavaz, M., Tenreyro, S., and von dem Berge, L. (2023) Monetary policy in the face of supply shocks: The role of inflation expectations. *In ECB Forum on Central Banking*, pp. 26-28.
3. John, J., Kumar, D., and Patra, M.D., (2022) Monetary policy: Confronting supply-driven inflation, *RBI Bulletin, 76(7),* July 2022, pp. 97-109.
4. Peng, S., Huang. J., Sheehy. J., Laza. R., Visperas. R., Zhong. X., Centeno. G., Khush.G. and Cassman. K. (2004) Rice yields decline with higher night temperature from global warming, *Proceedings of the National Academy of Sciences,* 101(27), pp. 9971-9975.

**1.2 සංඛ්‍යා සටහන**

## උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)

සියයට

| | | 2013 = 100 | | | | | 2021 = 100 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | දෙසැ.-19 | දෙසැ.-20 | දෙසැ.-21 | සැප්.-22 | දෙසැ.-22 | සැප්.-23 | දෙසැ.-23 | ජන.-24 | පෙබ.-24 | මාර්.-24 |
| මතුපිට | කො.පා.මි.ද. | 4.8 | 4.2 | 12.1 | 69.8 | 57.2 | 1.3 | 4.0 | 6.4 | 5.9 | 0.9 |
| උද්ධමනය | ජා.පා.මි.ද. | 6.2 | 4.6 | 14.0 | 73.7 | 59.2 | 0.8 | 4.2 | 6.5 | 5.1 | |
| මූලික | කො.පා.මි.ද. | 4.8 | 3.5 | 8.3 | 50.2 | 47.7 | 1.9 | 0.6 | 2.2 | 2.8 | 3.1 |
| උද්ධමනය | ජා.පා.මි.ද. | 5.2 | 4.7 | 10.8 | 64.1 | 57.5 | 1.7 | 0.9 | 2.2 | 2.7 | |
| ආහාර | කො.පා.මි.ද. | 6.3 | 9.2 | 22.1 | 94.9 | 64.4 | -5.2 | 0.3 | 3.3 | 3.5 | 3.8 |
| උද්ධමනය | ජා.පා.මි.ද. | 8.6 | 7.5 | 21.5 | 85.8 | 59.3 | -5.2 | 1.6 | 4.1 | 5.0 | |
| ආහාර නොවන | කො.පා.මි.ද. | 4.3 | 2.0 | 7.5 | 57.6 | 53.4 | 4.7 | 5.8 | 7.9 | 7.0 | -0.5 |
| උද්ධමනය | ජා.පා.මි.ද. | 4.2 | 2.2 | 7.6 | 62.8 | 59.0 | 5.9 | 6.3 | 8.5 | 5.1 | |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අපේක්ෂා 2023 අගෝස්තු මස වන විට තනි අගයක මට්ටම කරා ළඟා විය. ඉන් අනතුරුව, 2023 ඔක්තෝබර් මාසයේ දී සිදුකරන ලද විදුලි ගාස්තු සංශෝධනයෙන් හා 2023 දෙසැම්බර් මාසයේ දී එකතු කළ අගය මත බදු සංශෝධන ප්‍රකාශයට පත් කිරීමෙන් පසු උද්ධමන අපේක්ෂාවන්හි සිදු වූ සුළු වැඩිවීම් හැරුණු විට ඉතිරි කාලසීමාව තුළ දී උද්ධමන අපේක්ෂා තවදුරටත් පහළ ගියේය. මේ අතර, කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා 2023 නොවැම්බර් මස වන විට තනි අගයක මට්ටම කරා ළඟා වූ අතර, ඉන් පසුව 2023 දෙසැම්බර් මාසයේ දී සුළු වශයෙන් ඉහළ ගියේය.

### 1.1.2 මිල

**පෙර වසරේ සැලකිය යුතු ඉහළ මට්ටමක පැවති කොපාමිද. සහ ජාපාමිද. යන මිල දර්ශක පදනම් කරගනිමින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2023 වසරේ දී සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.** දේශීයව නිෂ්පාදනය කරනු ලබන මෙන්ම ආනයනික ආහාර අයිතමවල මිල ගණන් 2023 වසරේ දී ඉහළ ගිය ද, එය 2022 වසරේ දී නිරීක්ෂණය වූ සැලකිය යුතු මිල ඉහළ යෑමට සාපේක්ෂව අඩු වේගයකින් සිදු විය. එමෙන්ම, 2023 වසරේ ආහාර නොවන අයිතමවල මිල වෙනස්වීම් කෙරෙහි පිරිවැය පිළිබිඹු කෙරෙන මිල ගැළපුම් ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම ප්‍රවණතාවන්ට සමගාමීව, පාරිභෝගික මිල දර්ශක මගින් පෙන්නුම් කරනු ලබන ආර්ථිකයේ ජීවන වියදම් මට්ටම 2023 වසරේ දී අඛණ්ඩව ඉහළ ගිය ද, එහි වර්ධන වේගය 2022 වසරට සාපේක්ෂව මන්දගාමී විය.

**ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ සාධක මත තීරණය වන ආහාර අයිතමවල මිල ගණන් කෙරෙහි, උත්සව සමයන්හි දී ඉල්ලුම ඉහළ යෑම මගින් යම් බලපෑමක් ඇති වුව ද, 2022 වසරේ දී ඒවායෙහි සිදු වූ සැලකිය යුතු මිල ඉහළ යෑම් වලට සාපේක්ෂව 2023 වසරේ දී සුළු වැඩිවීමක් පමණක් පෙන්නුම් කළේය.** ප්‍රමාණවත් පරිදි රසායනික පොහොර සැපයීම හේතුවෙන් ඉහළ අස්වැන්නක් ලැබීම සහ ඉන්ධන මිල අඩුකිරීම් හා සමගාමීව යෙදවුම් පිරිවැය අඩුවීම හේතුවෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ඇතැම් ආහාර අයිතමවල මිල ගණන් පහත වැටීම මෙම වසර තුළ දී නිරීක්ෂණය විය. එසේ වුව ද, වසරේ අග භාගයේ දී සමස්ත දිවයින පුරා පැවති ඉතා අහිතකර කාලගුණ තත්ත්ව හා උත්සව සමයේ දී ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2022 වසරේ දී සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ ආනයනික ආහාර අයිතමවල මිල, 2023 වසර තුළ දී යම් පහළ යෑමක් පෙන්නුම් කළ අතර, මේ සඳහා ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම සහ ඇතැම් රටවල් විසින් පනවා තිබූ අපනයන සීමා මධ්‍යයේ වුව ද ගෝලීය භාණ්ඩ මිල පහළ යෑම හේතු විය.

**ආහාර නොවන අයිතමවල මිල විචලන යම් ආකාරයකට විධිමත් වීම සඳහා පිරිවැය පදනම් කරගත් මිල සූත්‍ර ප්‍රධාන වශයෙන් හේතු විය.** ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල 2023 වසරේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, 2022 වසරේ දී නිරීක්ෂණය කළ ඉතා ඉහළ වැඩිවීම් හා සසඳන විට අඩු මට්ටමක පැවතිණි. ඒ අනුව, 2023 පෙබරවාරි 16 වන දින සිට

1

බලපැවැත්වෙන පරිදි ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ විදුලි බිල්පත් සඳහා සිදු කළ සියයට 66ක ගාස්තු ඉහළ දැමීමට සමගාමීව ඒකක 90ක[2] විදුලි බිල්පත් සඳහා ගාස්තුව සියයට 146කින් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2023 මාර්තු දක්වා ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වුව ද, 2023 මාර්තු මාසයේ සිට ජූලි මාසය දක්වා කාලය තුළ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල පහළ ගිය අතර, ඉන් අනතුරුව පරිපාලිත අයිතම කිහිපයක සිදු වූ මිල සංශෝධන හේතුවෙන් 2023 නොවැම්බර් දක්වා මිල ඉහළ යෑමක් පෙන්නුම් කළේය. මේ අතර, 2023 ජූලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒකක 90ක විදුලි බිල්පත් සඳහා වූ ගාස්තුව සියයට 24කින් පහත දැමූ අතර, නැවතත් එම ගාස්තුව 2023 ඔක්තෝබර් 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 18කින් ඉහළ දමන ලදී. තවද, විදුලි ගාස්තු සංශෝධනවල බලපෑම කිසියම් දුරකට හේතුකොටගෙන 2023 අගෝස්තු 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒකක 22ක ජල ගාස්තුව සියයට 102කින් ඉහළ නංවමින් ගාස්තු සංශෝධනයක් සිදු කරන ලදී. පෙට්‍රල් (ඔක්ටේන් 92), සුදු ඩීසල් සහ භූමිතෙල් මිල, 2023 පෙබරවාරි සහ ජූලි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ ඉහළ යෑම් පෙන්නුම් කළ ද, සමස්තයක් ලෙස වසර තුළ දී පහළ යෑමේ ප්‍රවණතාවක් වාර්තා කළේය. ගෝලීය වෙළඳපොළ තුළ සිදු වූ බලශක්ති මිල විචලනයන් මධ්‍යයේ පිරිවැය පදනම් කරගත් මිල සූත්‍රයන්ට අනුගතව මෙම සංශෝධනයන් සිදුකරන ලදී. තවද, 2023 වසරේ දී සමස්ත අඩුවීමක් පෙන්නුම් කළ එල්.පී. ගෑස් මිල, පෙබරවාරි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් යන මාසවල දී ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඉන්ධන මිලෙහි සිදු වූ වෙනස්වීම්වලට සමගාමීව, 2023 මාර්තු 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි බස් ගාස්තු සියයට 7කින් පහළ දමන ලද අතර, ඉන් අනතුරුව 2023 සැප්තැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි බස් ගාස්තු සියයට 4කින් ඉහළ දමන ලදී. කෙසේ වුව ද, 2023 වසරේ දී දුම්රිය ගාස්තු සංශෝධනයක් සිදු නොවුණි. එමෙන්ම, 2023 ජූලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සුරාබදු ඉහළ නැංවූ අතර, ඒ හේතුවෙන් මද්‍යසාර සහ දුම්කොළ මිල ගණන් ඉහළ ගියේය.

2 කො.පා.මි.ද. පදනම් කරගත් අයිතම පැසෙහි ඒකක 90ක විදුලි බිල සඳහා වැයවන මුදල සලකා බලයි.

### 1.1.3 පාරිභෝගික මිල දර්ශක සහ ජීවන වියදම

**මෙම පසුබිම තුළ, පොදු මිල මට්ටමේ වෙනස්වීම් මනිනු ලබන නිල පාරිභෝගික මිල දර්ශක ද්විත්වයෙහිම සුළු වැඩිවීමක් 2023 වසර තුළ දී වාර්තා විය.** ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව මන්දගාමී වේගයකින් ඉහළ ගිය කො.පා.මි.ද. (2021=100), 2023 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 195.1ක් වාර්තා කළේය. 2023 ජූනි, අගෝස්තු, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස හැර අනෙකුත් මාස වල දී කො.පා.මි. දර්ශකයෙහි විචලනය විශාල වශයෙන් ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල විචලනය හා සමගාමී විය. 2023 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 208.8ක් වාර්තා කළ ජා.පා.මි.ද. (2021=100) 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී මන්දගාමී වේගයකින් ඉහළ ගියේය. 2023 මැයි, ජූනි, සැප්තැම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස හැර අනෙකුත් මාසවල දී ජා.පා.මි. දර්ශකයෙහි විචලන සඳහා ප්‍රධාන වශයෙන් ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල විචලන හේතු විය.

**පාරිභෝගික මිල දර්ශක මගින් පෙන්නුම් කෙරෙන පරිදි ජීවන වියදම,[3] 2022 වසරේ දක්නට ලැබුණු තීව්‍ර ඉහළ යෑමට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද 2023 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය.** කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන වියදම[4] 2022 වසරේ පැවති රුපියල් 150,184හි සිට 2023 වසරේ දී රුපියල් 176,253 දක්වා සියයට 17.4කින් ඉහළ ගිය අතර, මෙය 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී වාර්තා වූ සියයට 63.5ක වර්ධන වේගයට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි. එමෙන්ම, 2022 වසරේ වාර්තා වූ සියයට 74.9ක ඉහළ යෑම හා සැසඳීමේ දී සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරමින්, ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන වියදම[5] 2022 වසරේ පැවති රුපියල් 88,704හි සිට 2023 වසරේ දී රුපියල් 103,283 දක්වා සියයට 16.5කින් ඉහළ ගියේය. තවද, ආහාර සහ ආහාර නොවන අයිතම අතර පරිභෝජන වියදමෙහි බෙදී

3 පාරිභෝගික මිල දර්ශක, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව හඳුනාගත් ස්ථාවර පරිභෝජන පැස මත පදනම් වේ. එබැවින් කාලයත් සමඟ ගෘහස්ථ පරිභෝජන රටාවල සිදුවන වෙනස්කම් මෙමගින් පිළිබිඹු නොවේ.


4 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ සාමාන්‍ය කුටුම්බයක් පුද්ගලයන් 3.8කින් සමන්විත වේ.

5 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය කුටුම්බයක් පුද්ගලයන් 3.7කින් සමන්විත වේ.


**1.2 රූප සටහන**

## ජීවන වියදම, පාරිභෝගික මිල දර්ශකය සහ උද්ධමනය

කො.පා.මි. දර්ශකයට (2021=100) අනුව ජීවන වියදම (රුපියල්)





ජා.පා.මි. දර්ශකයට (2021=100) අනුව ජීවන වියදම (රුපියල්)




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කො.පා.මි.ද. සහ මතුපිට උද්ධමනය




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

*සටහන: 2022 වසර සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය කො.පා.මි.ද. (2013=100) මත පදනම් වේ.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණ වන දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා, පොදු මිල මට්ටම තවදුරටත් ඉහළ යෑම අවම කිරීම හරහා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට ළඟා කර ගැනීම, 2022 වසරේ පැවති ඉහළ උද්ධමන කාල පරාසයට පසුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියේ කාර්යභාරය විය. එවැනි නිසි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නොගත්තේනම්, 2021 වසර අවසානයේ දී සහ 2022 වසරේ දී මිල මට්ටම්වල දක්නට ලැබුණු තියුණු ඉහළ යෑම් තවදුරටත් පැවතෙමින් අධි උද්ධමනකාරී තත්ත්වයක් කරා ළඟා විය හැකිව තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව මිල ස්ථායීතාව තහවුරු කිරීම හරහා, දීර්ඝ කාලීන තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා අත්‍යාවශ්‍ය ආර්ථිකයේ සමස්ත තත්ත්වයන් සහ ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වෙයි.**

යෑම සැලකීමේ දී, කුටුම්බයක් විසින් ආහාර නොවන අයිතම සඳහා වැඩි වියදමක් දරන බව පෙනී යයි. තවද, 2022 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ආහාර මිල ගණන් හේතුවෙන් සමස්ත වියදමෙන් ආහාර කාණ්ඩය සඳහා යෙදවූ වියදම් ප්‍රමාණයේ දක්නට ලැබුණු සැලකිය යුතු ඉහළ යෑම, ආර්ථිකයේ සැපයුම් තත්ත්ව වැඩිදියුණු වීමත් සමඟ 2023 වසරේ දී මන්දගාමී විය.

### 1.1.4 වැටුප්


**පවතින දත්ත වලට අනුව,[6] පෙර වසරට සාපේක්ෂව ඉහළ යෑමක් වාර්තා කළ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් හැර අනෙකුත් අංශවල වැටුප් 2023 වසරේ දී බොහෝදුරට නොවෙනස්ව පැවතුණි.** අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්හි සිදු වූ ඉහළ යෑම සඳහා ජීවන වියදම ඉහළ යෑම සහ ශ්‍රම සැපයුම් හිඟය හේතුවෙන් දෛනික වැටුප් උපයන්නන් විසින් වැඩි වැටුප් සඳහා කළ ඉල්ලීම් ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත පෞද්ගලික සහ රාජ්‍ය අංශවල මූර්ත වැටුප් 2023 වසර පුරා පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වුව ද, මෙම වැටුප් දර්ශක, එනම් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100), සම්බන්ධයෙන් පවත්නා යම් යම් සීමාකාරී ස්වාභාවයන් හේතුකොටගෙන,

6 මෙම කොටසෙහි දක්වා ඇති තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මත පදනම් වේ.

1

**1.3 රූප සටහන**

**2023 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත ආර්ථිකයේ වැටුප් පිළිබඳ සමස්ත තත්ත්වය මෙමගින් පෙන්නුම් නොකෙරේ.

### පෞද්ගලික අංශයේ වැටුප්

**අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2023 වසර මුළුල්ලේ ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** මෙම අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 11.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එම දර්ශකයේ උප ක්‍රියාකාරකම්, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ක්‍රියාකාරකම්වලට අදාළ දර්ශක 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී, පිළිවෙළින්, සියයට 13.0කින්, සියයට 9.9කින් සහ සියයට 13.1කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා වැඩිවන ජීවන වියදමට සමගාමීව, දෛනික වැටුප් ලබන්නන් විසින් ඉහළ වැටුප් සඳහා අඛණ්ඩව කළ ඉල්ලීම් ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශේෂයෙන් ම පළපුරුදු සේවකයන් රඳවා තබා ගනිමින් ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා දෛනික වැටුප් වැඩි කිරීමට සේවා යෝජකයන්ට සිදු විය. තවද, විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් සංක්‍රමණය වීම හේතුවෙන් සියලු අංශවල සැලකිය යුතු ශ්‍රම හිඟයක් ඇති විය. එමගින්, පළපුරුදු සේවකයන් සඳහා තරඟකාරී පරිසරයක් නිර්මාණය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වැටුප් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2023 වසරේ මුල් කාලය දක්වා පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 7.1කින් පහළ ගියේය.

**කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, පඩි පාලක සභා මගින් පාලනය වන සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2023 වසරේ දී සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.** ඒ අනුව, අවම නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 0.4කින් සුළු වශයෙන් ඉහළ ගියේය. එසේ වුව ද, අවම මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 17.6කින් පහළ ගියේය.

### රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2023 වසරේ දී නොවෙනස්ව පැවතිය ද, එම අංශයේ මූර්ත වැටුප් පෙර වසරට සාපේක්ෂව සියයට 17.5කින් පහළ ගියේය.** එසේ වුව ද, 2024 අයවැය මගින් යෝජනා කළ පරිදි, රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා වන ජීවන වියදම් දීමනාව 2024 ජනවාරි මස සිට රුපියල් 10,000කින් වැඩි කරන ලදී. පවත්නා රාජ්‍ය මූල්‍ය සීමා හේතුවෙන් 2024 ජනවාරි සිට මාර්තු දක්වා රාජ්‍ය සේවකයන්ට රුපියල් 5,000ක අර්ධ ගෙවීමක් සිදු කළ අතර, ඉන් අනතුරුව, 2024 අප්‍රේල් මස සිට රුපියල් 10,000ක සම්පූර්ණ වැඩිවීම ලබා දෙනු ඇත. මේ අතර, 2024 වසරේ මුල් මාස තුන සඳහා වන හිඟ මුදල, 2025 ජනවාරි මාසයේ සිට සමාන වාරික තුනකින් ලබා දෙනු ඇත.

## 1.2 මූර්ත අංශයේ ප්‍රවණතා

### 1.2.1 ආර්ථික වර්ධනය

**ශ්‍රී ලංකා ආර්ථිකය, 2022 වසරේ දී වාර්තා කළ සියයට 7.3ක සැලකිය යුතු සංකෝචනයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 2.3ක අඩු සංකෝචනයක් වාර්තා කරමින් යළි යථා තත්ත්වයට පත්වීමේ සළකුණු පෙන්නුම් කළේය.** මෙහිදී, වසරේ දෙවන භාගය තුළ, ක්‍රමිකව එහෙත් ස්ථාවර ලෙස ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණු අතර,


මෙම කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.)[7] ධනාත්මක වර්ධනයක් වාර්තා විය. උද්ධමනය පහත වැටීම හා විදේශීය අංශයේ අවහිරතා ලිහිල් වීම මධ්‍යයේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය යළි වැඩිදියුණු වීම මේ සඳහා හේතු විය.

**සියයට 17.5ක් වූ ද.දේ.නි. ගම්‍ය අවධමනකය මගින් පිළිබිඹු කෙරෙන පරිදි, මිල බලපෑම හේතුවෙන් පවත්නා මිල අනුව ද.දේ.නි. 2023 වසරේ දී රුපියල් බිලියන 27,629.7ක් දක්වා සියයට 14.8කින් වර්ධනය විය.** තවද, ද.දේ.නි. සඳහා ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැළපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන දළ ජාතික ආදායම (ද.ජා.ආ.) ද 2023 වසරේ දී සියයට 14.1කින් වර්ධනය විය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන් එ.ජ. ඩොලර් වටිනාකම අනුව ද.දේ.නි, 2022 වසරේ දී වාර්තා කළ බිලියන 76.8 සිට 2023 වන විට බිලියන 84.4ක් දක්වා ඉහළ ගියේය.

**පවත්නා මිල අනුව ද.දේ.නි.හි ඉහළ යෑම සහ මධ්‍ය වාර්ෂික ජනගහනය පහත වැටීම හේතුවෙන්, 2022 වසරේ දී රුපියල් 1,084,882ක් වූ ඒක පුද්ගල ද.දේ.නි. 2023 වසර වන විට රුපියල් 1,253,785ක් දක්වා ඉහළ ගියේය.** තවද, 2022 වසරේ දී රුපියල් 1,056,424ක් වූ ඒක පුද්ගල ද.ජා.ආ. 2023 වසර වන විට රුපියල් 1,213,159ක් දක්වා ඉහළ ගියේය. එ.ජ. ඩොලර් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි, 2022 වසරේ දී වාර්තා කළ 3,464ට සාපේක්ෂව 2023 දී 3,830ක් දක්වා ඉහළ ගිය අතර, ඒක පුද්ගල ද.ජා.ආ. 2022 වසරේ දී වාර්තා කළ 3,378 සිට 2023 වසරේ දී 3,706ක් දක්වා ඉහළ ගියේය.

7 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

**1.4 රූප සටහන** **වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතික (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ (2015 පදනම් වර්ෂය)

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2.2 නිෂ්පාදිතය

### කෘෂිකර්මාන්තය

**කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2022 වසරේ දී වාර්තා කළ සියයට 4.2ක පහළ යෑමට**

**1.3 සංඛ්‍යා සටහන** **කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)**

| ආර්ථික කටයුතු | වර්ධනය (%) | | වර්ධනය සඳහා දායකත්වය (%) | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|---|
| | 2022 (ඇ) | 2023 | 2022 (ඇ) | 2023 | 2022 (ඇ) | 2023 |
| කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය | - 4.2 | 2.6 | - 0.3 | 0.2 | 7.5 | 7.9 |
| නිෂ්පාදන කර්මාන්ත, පතල් සහ කැණීම් සහ අනෙකුත් කර්මාන්ත | - 13.9 | - 4.7 | - 2.9 | - 0.9 | 19.6 | 19.1 |
| එයින්: නිෂ්පාදන කර්මාන්ත කටයුතු | - 12.7 | - 3.2 | - 2.2 | - 0.5 | 16.1 | 16.0 |
| ඉදිකිරීම් | - 20.9 | - 20.8 | - 1.9 | - 1.6 | 7.6 | 6.2 |
| තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවා සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා | 2.4 | 3.1 | 0.6 | 0.8 | 26.5 | 28.0 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවා | - 0.4 | - 13.2 | - 0.0 | - 0.5 | 3.4 | 3.0 |
| මූල්‍ය හා රක්ෂණ කටයුතු | - 18.3 | - 5.3 | - 1.0 | - 0.3 | 5.0 | 4.8 |
| නිවාස අයිතිය හා දේපළ වෙළඳාම | - 12.1 | - 6.0 | - 0.6 | - 0.3 | 4.6 | 4.4 |
| වෘත්තීයමය සේවා | - 17.7 | 2.4 | - 0.4 | 0.0 | 2.0 | 2.1 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවා | - 0.3 | - 0.6 | - 0.0 | - 0.1 | 9.6 | 9.8 |
| වෙනත් පොද්ගලික සේවා | 0.3 | 0.4 | 0.0 | 0.0 | 8.2 | 8.4 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | - 7.0 | - 2.6 | - 6.6 | - 2.5 | 94.1 | 93.7 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර | - 12.4 | 2.8 | - 0.8 | 0.2 | 5.9 | 6.3 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | - 7.3 | - 2.3 | - 7.3 | - 2.3 | 100.0 | 100.0 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | - 4.5 | - 23.7 | | | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | - 7.6 | - 3.0 | | | | |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

**සාපේක්ෂව 2023 වසරේ දී යහපත් අතට හැරෙමින් සියයට 2.6ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය.** මේ සඳහා, විශේෂයෙන් පොහොර, වෙනත් කෘෂි රසායනික යෙදවුම් සහ ඉන්ධන ආදී සැපයුම් තත්ත්වයන් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, වී, පළතුරු සහ එළවළු වගා කිරීම සහ ධීවර කටයුතු යන උප අංශවල වර්ධනය කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා ප්‍රධාන ලෙස දායක විය. කෙසේ වුවත්, පැවති කාළගුණ විෂමතාවල අහිතකර බලපෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන තේ, රබර් හා පොල් වගා කටයුතු වසර තුළ දී පහත වැටුණි.

## කර්මාන්ත


**2023 වසර තුළ දී සැපයුම් තත්ත්වයන්ගේ ක්‍රමික වර්ධනයක් දක්නට ලැබුණ ද, ඉල්ලුම් අංශයේ පසුබෑම හේතුවෙන් කර්මාන්ත කටයුතු වසර තුළ දී සියයට 9.2කින් පහත වැටුණි.** ආර්ථික පසුබෑම්වල දී දැඩි සේ බලපෑමට ලක්වන ඉදිකිරීම් කර්මාන්තයේ ව්‍යාපෘති අත්හිටුවීම මෙම පහත වැටීම සඳහා බොහෝ දුරට දායක විය. තවද, රෙදිපිළි, නිමි ඇඳුම්, සම් හා සම් භාණ්ඩ නිෂ්පාදන සඳහා වන ගෝලීය ඉල්ලුම සැලකිය යුතු ලෙස පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන කර්මාන්ත අංශයේ ප්‍රධානම කාණ්ඩය වන නිෂ්පාදන කර්මාන්ත කටයුතු වසර තුළ දී පහත වැටුණි. කෙසේ වුවත්, විශේෂයෙන් ම ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතු සහ අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු නිෂ්පාදන කටයුතුවල ප්‍රධාන දායකත්වයෙන් වසරේ අවසන් භාගය වන විට අනෙකුත් බොහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය විය.

## සේවා

**සංචාරක කර්මාන්තය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ විදුලිබල හා බලශක්ති සැපයුමෙහි අඛණ්ඩතාව තහවුරු කිරීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන නවාතැන් සහ ආහාර පාන සැපයීමේ සේවා සහ ප්‍රවාහන කටයුතු වර්ධනය වීම, සේවා කටයුතුවල සමස්ත සංකෝචනය සියයට 0.2ක මට්ටමට සීමා වීම සඳහා බොහෝ දුරට හේතු විය.** කෙසේ වුවත්, විශේෂයෙන් ම වසරේ පළමු භාගය තුළ පැවති ඉහළ පොලී අනුපාතික හේතුවෙන්, මූල්‍ය සහ මූල්‍ය අතරමැදි සේවා සහ දේපළ වෙළඳාම්

**1.5 රූප සටහන**

**2023 වසරේ ආර්ථික කටයුතුවල වර්ධනය (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ (2015 පදනම් වර්ෂය)

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කටයුතු බලපෑමට ලක්වීම සහ පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවල අඛණ්ඩ පහත වැටීම හේතුවෙන් වසර තුළ දී සමස්ත සේවා කටයුතුවල පහත වැටීමක් වාර්තා විය.

### 1.2.3 වියදම

**වියදම් ප්‍රවේශය සලකන විට, පවත්නා මිල අනුව ආර්ථිකයේ සමස්ත ඉල්ලුම සඳහා දේශීය මෙන්ම විදේශීය ඉල්ලුම ද ධනාත්මක දායකත්වයක් දක්වා ඇත.** දේශීය වියදමෙහි ප්‍රධානම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම 2023 වසරේ දී සියයට 16.7කින් වර්ධනය වූ අතර, ආයෝජන වියදම සියයට 1.6කින් වර්ධනය විය. පරිභෝජන වියදමෙහි වර්ධනය සඳහා මිල මට්ටම්වල බලපෑම හේතුවෙන් පෞද්ගලික මෙන්ම රජයේ පරිභෝජන වියදම් ඉහළ යෑම හේතු විය. වසර තුළ දී ආයෝජන වියදම ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් වියදම පහත වැටීම හේතුවෙන් ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පහත වැටුණි. තවද, රුපියල් වටිනාකම අනුව, භාණ්ඩ හා සේවා ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව තිබියදී භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම සැලකිය යුතු ලෙස වර්ධනය විය.

**ස්ථාවර මිල අනුව වියදම් ඇස්තමේන්තු සැලකීමේ දී, ක්‍රය ශක්තිය පිරිහීම හේතුවෙන් පරිභෝජන වියදම පහත වැටුණු අතර, ආයෝජන සඳහා පැවති අයහපත් පරිසරය හේතුවෙන් ආයෝජන වියදම ද පහත වැටුණි.** මේ අතර, 2023 වසරේ දී ස්ථාවර මිල අනුව ශුද්ධ අපනයන වියදම සැලකිය යුතු ඉහළ වර්ධනයක් වාර්තා කිරීම හේතුවෙන් ද.දේ.නි.යේ මූර්ත වර්ධනයෙහි පහත වැටීම සියයට 2.3කට සීමා විය.

**2023 වසරේ දී පවත්නා මිල අනුව ශ්‍රී ලංකාවේ දේශීය ඉතුරුම් සියයට 9.2කින් වර්ධනය වූ අතර, ජාතික ඉතුරුම් සියයට 14.7කින් වර්ධනය විය.** ජාතික ඉතුරුම්වල ඉහළ වර්ධනය සඳහා, රුපියල් වටිනාකම අනුව විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම පහත වැටීම හමුවේ වුව ද, විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම කැපී පෙනෙන ලෙස වැඩි වීම හේතු විය. 2023 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම් සියයට

**1.4 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් (අ)(ආ)**

| ශීර්ෂය | රුපියල් බිලියන | | වර්ධනය (%) | | ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|---|
| | 2022 (ඇ) | 2023 | 2022 (ඇ) | 2023 | 2022 (ඇ) | 2023 |
| **1. දේශීය ඉල්ලුම** | 24,921.2 | 28,042.4 | 31.8 | 12.5 | 103.6 | 101.5 |
| 1.1 පරිභෝජනය | 18,038.2 | 21,051.6 | 45.0 | 16.7 | 75.0 | 76.2 |
| පෞද්ගලික | 16,311.0 | 19,158.5 | 51.3 | 17.5 | 67.8 | 69.3 |
| රාජ්‍ය | 1,727.3 | 1,893.1 | 3.8 | 9.6 | 7.2 | 6.9 |
| 1.2 ආයෝජන (දළ ප්‍රාග්ධන සම්පාදනය) | 6,883.0 | 6,990.8 | 6.4 | 1.6 | 28.6 | 25.3 |
| දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 5,724.1 | 4,859.6 | 23.4 | -15.1 | 23.8 | 17.6 |
| තොග වෙනස්වීම සහ වටිනාදේ අත්පත් කරගැනීම් හා අත්හැරීම් | 1,159.0 | 2,131.2 | -36.7 | 83.9 | 4.8 | 7.7 |
| **2. ශුද්ධ විදේශීය ඉල්ලුම** | -857.5 | -412.7 | 34.1 | 51.9 | -3.6 | -1.5 |
| භාණ්ඩ හා සේවා අපනයන | 5,187.9 | 5,634.2 | 74.1 | 8.6 | 21.6 | 20.4 |
| භාණ්ඩ හා සේවා ආනයන | 6,045.4 | 6,046.9 | 41.2 | 0.0 | 25.1 | 21.9 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)** | 24,063.8 | 27,629.7 | 36.6 | 14.8 | 100.0 | 100.0 |
| **4. දේශීය ඉතුරුම් (3-1.1)** | 6,025.5 | 6,578.1 | 16.6 | 9.2 | 25.0 | 23.8 |
| පෞද්ගලික | 7,566.0 | 8,228.9 | 17.1 | 8.8 | 31.4 | 29.8 |
| රාජ්‍ය | -1,540.4 | -1,650.9 | -19.4 | -7.2 | -6.4 | -6.0 |
| **5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඇ)** | -631.2 | -895.3 | -59.6 | -41.8 | -2.6 | -3.2 |
| **6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඇ)** | 1,159.4 | 1,836.2 | 12.1 | 58.4 | 4.8 | 6.6 |
| **7. ජාතික ඉතුරුම් (4+5+6)** | 6,553.7 | 7,519.0 | 12.8 | 14.7 | 27.2 | 27.2 |
| **8. ඉතුරුම්-ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2) | -857.5 | -412.7 | | | -3.6 | -1.5 |
| ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2) | -329.3 | 528.2 | | | -1.4 | 1.9 |
| **9. විදේශීය ජංගම ශිෂ්ඨම් ශේෂය (2+5+6) (ඇ)** | -329.3 | 528.2 | | | -1.4 | 1.9 |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1

23.8ක් ලෙස වාර්තා වූ අතර, ජාතික ඉතුරුම් සියයට 27.2ක් විය. තවද, විදේශීය අංශයේ සැලකිය යුතු වැඩිදියුණු වීමත් සමඟ ආයෝජනවලට සාපේක්ෂව ජාතික ඉතුරුම් වැඩි වේගයකින් ඉහළ යෑම හේතුවෙන් ජාතික ඉතුරුම් - ආයෝජන පරතරය 2023 වසරේ දී අතිරික්තයක් වාර්තා කළේය.

### 1.2.4 ආදායම

**2023 වසරේ ආදායම් ඇස්තමේන්තු සලකන විට, විශාලතම ආදායම් සංරචකය වූ දළ මෙහෙයුම් අතිරික්තය 2022 වසරේ දී වාර්තා කළ සියයට 39.8ක වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 21.2කින් වර්ධනය වෙමින්, දළ එකතු කළ අගයෙන් සියයට 37.9කට දායකත්වය දක්වා ඇත.** තවද, දෙවන විශාලම ආදායම් සංරචකය වූ දළ මිශ්‍ර ආදායම 2022 වසරේ දී වාර්තා කළ සියයට 43.4ක වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 13.8කින් වර්ධනය වී ඇත. අනෙකුත් ආදායම් සංරචක සලකන විට, නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද බදු 2023 වසරේ දී වර්ධනය වී ඇති අතර, මූල්‍ය නොවන ආයතනික අංශයේ සේවක ආදායම පහත වැටීම හේතුවෙන් සමස්ත සේවක ආදායම පහත වැටී ඇත. දළ එකතු කළ අගය සඳහා දායකත්වය දක්වන ආයතනික අංශ අනුව ආදායම ජනනය කිරීම සැලකීමේ දී, මූල්‍ය නොවන ආයතනික අංශය ප්‍රධානතම දායකත්වය ලබාදුන් අතර, ඉන් අනතුරුව ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන අංශය, මූල්‍ය ආයතන අංශය සහ රාජ්‍ය අංශය පිළිවෙළින් සිය දායකත්ව සපයා ඇත.

### 1.2.5 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

**රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි උපත් අඩු වීම සහ මරණ හා ශුද්ධ සංක්‍රමණ වැඩි වීම හේතුවෙන් 2023 වසරේ දී ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 22.037ක් දක්වා සියයට 0.6කින් පහත වැටී ඇත.** ජනගහනය පහත වැටීමට සමගාමීව, ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය 2022 වසරේ දී වාර්තා කළ වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 354 සිට 2023 වසර වන විට වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 351ක් දක්වා අඩු වී ඇත.

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2022 වසරේ දී මිලියන 8.547ක් වූ ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය[8] (ශ්‍රම බලකාය) 2023 වසරේ දී මිලියන 8.408ක් දක්වා පහත වැටී ඇත.** ශ්‍රම බලකාය සහ කුටුම්බ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ද 2022 වසරේ දී වාර්තා වූ සියයට 49.8 සිට 2023 වසර වන විට සියයට 48.6ක් දක්වා පහත වැටී ඇත.

**සේවා වියුක්ත ජනගහනය[9] මෙන්ම ශ්‍රම බලකාය පහත වැටීමෙහි ඒකාබද්ධ බලපෑම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතිකය, පෙර වසර හා සැසඳීමේ දී 2023 වසරේ දී සියයට 4.7ක අගයෙහි නොවෙනස්ව පැවතුණි.** සේවා වියුක්ත ජනගහනය 2022 දී

8 ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය, එනම් සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

9 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාරගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

**1.5 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ) (ආ)**

| ශීර්ෂය | ප්‍රතිශත දායකත්වය (%) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022 (ඇ) | | | | | 2023 | | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය | දළ එකතු කළ අගය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය | දළ එකතු කළ අගය |
| සේවක ආදායම | 48.2 | 10.3 | 23.4 | 18.1 | 27.0 | 44.7 | 11.1 | 23.7 | 20.6 | 23.8 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 85.7 | 12.0 | 2.3 | - | 35.4 | 84.3 | 13.8 | 2.0 | - | 37.9 |
| මිශ්‍ර ආදායම | - | - | - | 100.0 | 37.3 | - | - | - | 100.0 | 37.6 |
| නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර) | 71.2 | 11.1 | - | 17.7 | 0.2 | 64.1 | 14.6 | - | 21.3 | 0.7 |
| මූලික මිල ගණන් අනුව දළ එකතු කළ අගය | 43.5 | 7.1 | 7.1 | 42.3 | 100.0 | 43.0 | 7.9 | 6.4 | 42.6 | 100.0 |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
*ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**1.6 සංඛ්‍යා සටහන** **කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය**

| ශීර්ෂය | 2022 | 2023 (අ) |
|---|---|---|
| කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000 (ආ) | 17,162 | 17,306 |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | 8,547 | 8,408 |
| සේවා නියුක්ත | 8,148 | 8,010 |
| සේවා වියුක්ත | 399 | 398 |
| සේවා වියුක්ත අනුපාතිකය | 4.7 | 4.7 |
| පුරුෂ | 3.7 | 3.6 |
| ස්ත්‍රී | 6.5 | 7.0 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ) | 49.8 | 48.6 |
| පුරුෂ | 70.5 | 68.6 |
| ස්ත්‍රී | 32.1 | 31.3 |

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ඇ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

වාර්තා වූ මිලියන 0.399 සිට 2023 වන විට මිලියන 0.398ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි. එසේම, සේවා නියුක්ත ජනගහනය[10] ද 2022 වසරේ දී වාර්තා වූ මිලියන 8.148 සිට 2023 වන විට මිලියන 8.010ක් දක්වා පහත වැටී ඇත.

**2023 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් 297,656ක් ලෙස ඉහළ මට්ටමක පැවතුණ ද, එය 2022 වසරේ දී පිටත්ව ගිය පුද්ගලයින් 311,056ට සාපේක්ෂව සියයට 4.3ක පහත වැටීමකි.** ප්‍රතිශතයක් ලෙස ගත් කල, වසර තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පිරිසෙන් සියයට 55.3ක් පුරුෂයින් ද සියයට 44.7ක් කාන්තාවන් ද විය.

### 1.2.6 ආර්ථික යටිතල පහසුකම්

#### විදුලිබලය හා බලශක්තිය

#### බනිජ තෙල්

**වසරේ අග භාගයේ දී භූ දේශපාලනික අර්බුද හේතුවෙන් ඉහළ මිල පීඩනයක් නිර්මාණය වුව ද, 2023 වසර තුළ ගෝලීය බොරතෙල් මිලෙහි සමස්තයක් ලෙස දක්නට ලද පහළ යෑමේ ප්‍රවණතාව මෙන්ම, ශ්‍රී ලංකා රුපියල අනිප්‍රමාණය වීම හේතුවෙන් 2023 වසර තුළ දී බනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් 2022 වසරට සාපේක්ෂව පහළ ගියේය.** ඔපෙක් සංවිධානය සහ එයට සහාය දක්වන අනෙකුත් රටවල් විසින් ස්වේච්ඡාවෙන් තම නිෂ්පාදන සීමා කිරීම හේතුවෙන් වූ බලපෑම ඉක්මවා ගෝලීය ඉල්ලුම පහළ යෑම බොහෝ දුරට හේතුකොටගෙන 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී ගෝලීය බොරතෙල් මිල ගණන් පහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 99.06 සිට 2023 වසරේ දී එ.ජ. ඩොලර් 82.22ක් දක්වා සියයට 17.0කින් පහළ ගියේය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල මෙම පහළ යෑමේ ප්‍රවණතාවට අනුකූලව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි වාර්ෂික සාමාන්‍යය එ.ජ. ඩොලර් 89.60ක් දක්වා පහළ ගිය අතර, ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අතිප්‍රමාණය වීම ද රුපියල් වටිනාකම අනුව ආනයන මිල පහළ යෑමට සහාය විය. වසර තුළ දී, පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍රයට අනුකූලව ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් සඳහා මාසික සංශෝධන සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර අවසානය වන විට, ලං.ඛ.නී.සං. විසින් අලෙවි කරන ලද පෙට්‍රල් 92, සුදු ඩීසල්, සහ භූමිතෙල් යන නිෂ්පාදිතවල මිල ගණන් 2022 වසර අවසානයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 6.5ක, 21.7ක සහ 32.3ක පහළ යෑම් වාර්තා කළේය. කෙසේ වෙතත්, රජය විසින් 2023 වසරේ ජනවාරි සහ ජූනි යන මාසවල දී, දෙවරක්, ප්‍රධාන පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සඳහා ලීටරයකට රුපියල් 25.00ක නිෂ්පාදන බද්දක් පැනවීම හේතුවෙන් වසර තුළ දී තවදුරටත් මිල ගණන් පහළ යෑම සීමා විය.[11]

**ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම සහ විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වය වැඩිදියුණු වීමත් සමඟ ඉන්ධන සුලභව පැවතීම පිළිබිඹු කරමින් 2023 වසරේ දී බනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය ඉහළ ගියේය.** 2023 වසරේ දී, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත බනිජ තෙල් නිෂ්පාදිතවල විකුණුම් පරිමාව සියයට 7.1ක වර්ධනයක් වාර්තා කළේය. තවද,

10 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේවායන් සහ තමාගේම වැඩ කටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට ආදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

11 පෙට්‍රල් 92, පෙට්‍රල් 95, සුදු ඩීසල් සහ සුපිරි ඩීසල් යන ප්‍රධාන බනිජ තෙල් නිෂ්පාදිත සඳහා 2024 වසරේ ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කරන ලද අතර, භූමිතෙල් මත එම බදු නිදහස් කිරීම එලෙසම පවත්වා ගැනුණි.

1

සැපයුම් අවහිරතා අවම වීමත් සමඟ, 2023 වසරේ අප්‍රේල් සහ මැයි මාසවල දී ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රමය යටතේ සතිපතා ලබා දෙන සලාක වැඩි කිරීම සහ පසුව 2023 වසරේ සැප්තැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම සලාක අහෝසි කිරීම මගින්, 2022 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ග ලිහිල් කිරීමට රජය පියවර ගත්තේය.

**වසර තුළ දී ලං.ඛ.නී.සං.වේ මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් අත්කර ගත්තේය.** පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීමට හේතු වූ අතර, සංස්ථාව විසින් 2022 වසරේ වාර්තා කරන ලද රුපියල් බිලියන 617.6ක අලාභයට සාපේක්ෂව 2023 වසරේ දී රුපියල් බිලියන 120.3ක ලාභයක් වාර්තා කළේය. ලං.ඛ.නී.සං.වේ මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස, ලං.ඛ.නී.සං.හි එ.ජ. ඩොලර් බිලියන 2.5ක් පමණ වූ රජයේ ඇපකර සහිත විදේශ විනිමය ණය තොගය, රාජ්‍ය ණය වගකීම් යටතට පැවරීමට 2022 වසර අවසානයේ දී රජය තීරණය කළේය. 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සේවය සහ ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) වෙතින් ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු වෙළඳ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ, රාජ්‍ය ආයතනවලින් ලං.ඛ.නී.සං.ට අයවිය යුතු සමස්ත හිඟ ණය මුදල, 2023 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට රුපියල් බිලියන 17.7ක් දක්වා රුපියල් බිලියන 206.0කින් පහළ ගියේය. මේ අතර, ශ්‍රීලංකන් ගුවන් සේවය සහ ලං.වි.ම. වෙතින් ලං.ඛ.නී.සං.ට අය විය යුතු මුදල් පියවීමත් සමඟ 2023 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට ඉන්දීය ණය පහසුකමට අදාළ සිය වගකීම් පියවීමට ලං.ඛ.නී.සං. කටයුතු කළේය.

**ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ තරගකාරිත්වය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව දේශීය ඛනිජ තෙල් වෙළඳපොළ ලිහිල්කරණය කිරීම සඳහා 2023 වසරේ දී ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** 2023 වසරේ මාර්තු මාසයේ දී, ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ගබඩා කිරීම, බෙදා හැරීම සහ පෙර තීරණය කරන ලද අලෙවි නියෝජිතයන් විසින් මෙහෙයවනු ලබන බෙදාහැරීමේ ජාලයක් හරහා විකිණීම සඳහා පෞද්ගලික සමාගම් තුනකට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන්නේය.


ඒ අනුව, විදේශීය සැපයුම්කරුවන් දෙදෙනෙක් 2023 වසරේ දී සහ 2024 වසරේ මුල් භාගයේ දී සිය ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කළහ. නව වැඩපිළිවෙළ යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍රය මගින් තීරණය කරනු ලබන ලං.ඛ.නී.සං. විසින් අලෙවි කෙරෙන ඛනිජ තෙල් නිෂ්පාදිතවල සිල්ලර මිල ගණන්, වෙළඳපොළහි උපරිම මිලක් ලෙස ක්‍රියා කරන අතර, නව සැපයුම්කරුවන්ට එම මිල ගණන්වලට යටත්ව තම නිෂ්පාදිතවල මිල තීරණය කළ හැකිය.

### විදුලිබලය


**විදේශ විනිමය ද්‍රවශීලතාව සීමා වීම නිසා ඇති වූ ඉන්ධන හා ගල් අඟුරු හිඟය මෙන්ම ජලාශවල ජල මට්ටම අඩු වීම මධ්‍යයේ ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට සිදු කරන ලද දෛනික විදුලිබල කප්පාදු කිරීම්, විදුලිබල උත්පාදනය සඳහා ප්‍රමාණවත් ලෙස තාප ප්‍රභව ලබා ගැනීමට හැකිවීමත් සමඟ ක්‍රමානුකූලව අඩු කරමින් 2023 වසරේ පෙබරවාරි මාසයේ මැද සිට විදුලිබලය අඛණ්ඩව සැපයීම සඳහා කටයුතු කරන ලදී.** 2022 වසරේ දී පැවති දෛනික විදුලිබල අත්හිටුවීම් මධ්‍යයේ පැවති අඩු මට්ටමේ විදුලිබල උත්පාදනයෙහි හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑමක් පැවතිය ද, 2023 වසරේ දී විදුලිබල උත්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.2ක අඩුවීමක් පෙන්නුම් කළේය. පිරිවැය පිළිබිඹු කෙරෙන විදුලිබල ගාස්තු සහ මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම්වල ඒකාබද්ධ බලපෑමෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ බලශක්ති ඉල්ලුම දුර්වල වීම මෙමගින් පිළිබිඹු කරයි. එල්-නිනෝ බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස නිරිතදිග මෝසම් වර්ෂාව ප්‍රමාද වීම හේතුවෙන් 2023 වසරේ දෙවන සහ තුන්වන කාර්තු තුළ දී විදුලිබල අංශය අභියෝග රැසකට මුහුණ දුන්නේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස විදුලිබල නිෂ්පාදනය සඳහා මිල අධික තාප ප්‍රභව භාවිතය ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2023 වසරේ සැප්තැම්බර් මාසයේ අග භාගයේ සිට වාර්තා වූ අසාමාන්‍ය ඉහළ වර්ෂාපතනය මධ්‍යයේ ජලාශවල ජල මට්ටම වර්ධනය වීමත් සමඟ 2023 වසරේ තුන්වන කාර්තුව අවසානය වනවිට මෙම ප්‍රවණතාව වෙනස් විය. වසර තුළ දී ජලය, ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් සමස්ත බලශක්ති උත්පාදනය සඳහා

රූප සටහන 1.6


## විදුලිබල හා බලශක්ති අංශයේ ප්‍රවණතා





මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය




මූලය: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය




(ඇ) උත්පාදන අන්තයේ සාමාන්‍ය පිරිවැය

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

*වසර තුළ දී ගෝලීය බොරතෙල් මිල ගණන් පහත වැටීමේ ප්‍රවණතාව සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන් බනිජ තෙල් නිෂ්පාදනවල දේශීය මිල ගණන් පහළ ගිය අතර, විදුලිබල උත්පාදන සංයුතියේ දක්නට ලැබුණු විචලතා හේතුවෙන් විදුලිබල ගාස්තු ඉහළ අගයක පැවතිණි.*

දැක්වූ දායකත්වය, පිළිවෙළින්, සියයට 29ක්, සියයට 20ක්, සියයට 30ක්, සහ සියයට 21ක් බැගින් විය.

**විදුලිබලය සඳහා හඳුන්වා දුන් පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ ක්‍රමවේදය හේතුවෙන් ලං.වි.මයෙහි මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු විය.** පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ ක්‍රමවේදයක් මගින් ලං.වි.ම.යේ මූල්‍ය ගැටලු විසඳාලීම සඳහා 2023 වසරේ දී රජය විසින් අර්ධ වාර්ෂික ගාස්තු සංශෝධනය කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කළේය. කෙසේ වෙතත්, වසර තුළ දී විදුලිබල උත්පාදන සංයුතියේ පැවති අස්ථාවරභාවය හේතුවෙන්, 2023 වසරේ පෙබරවාරි සහ ඔක්තෝබර් මාසවල විදුලිය ගාස්තු ඉහළ නැංවීමේ සංශෝධන දෙකක්, සහ ජූලි මාසයේ දී විදුලිය ගාස්තු පහළ දැමීමේ සංශෝධනයක් ලෙස වසර තුළ දී විදුලිය ගාස්තු තුන් වතාවක් සංශෝධනය කරන ලදී. ඒ අනුව, සාමාන්‍ය විදුලිබල ගාස්තුව 2023 වසරේ පෙබරවාරි සහ ඔක්තෝබර් මාසවල දී, පිළිවෙළින්, ආසන්න වශයෙන් සියයට 66කින් සහ සියයට 18කින් වැඩි කරන ලද අතර, 2023 වසරේ ජූලි මාසයේ දී ආසන්න වශයෙන් සියයට 14කින් අඩු කරන ලදී. තවද, මෙම ප්‍රවණතා මත පදනම්ව, 2024 වසරේ පළමු කාර්තුවේ සිට ක්‍රියාත්මක වන පරිදි ගාස්තු සංශෝධන චක්‍රය මාස තුන දක්වා අඩු කිරීමට රජය විසින් තීරණය

1

කරන ලදී. ඒ අනුව, 2024 වසරේ මාර්තු 05 දින සිට ක්‍රියාත්මකවන පරිදි විදුලිය ගාස්තු අඩු කරමින් ගාස්තු සංශෝධනයක් සිදු කරන ලදී. විධිමත් විදුලිය ගාස්තු සංශෝධන ලං.වි.ම.යේ මුදල් ප්‍රවාහයේ කැපී පෙනෙන වර්ධනයකට දායක වී ඇති අතර, ඒ හේතුවෙන් 2016 වසරේ සිට වසර හතක පමණ කාලයක් මුළුල්ලේ අඛණ්ඩව අලාභ වාර්තා කිරීමෙන් අනතුරුව, ලං.වි.ම. 2023 වසරේ දී රුපියල් බිලියන 61.2ක සැලකිය යුතු ලාභයක් වාර්තා කළේය. 2023 වසරේ දී ලං.වි.ම.යේ වැඩි දියුණු වූ මූල්‍ය කාර්යසාධනය සඳහා, විශේෂයෙන් ම 2023 වසරේ අග භාගයේ දී සමස්ත විදුලිය උත්පාදනය තුළ ජලවිදුලිබල දායකත්වය ඉහළ යෑම ද උපකාරී විය.

**ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය විදුලිබල අංශයේ තරගකාරිත්වය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් එම අංශයෙහි ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කරන ලදී.** රජය සතු වාණිජ ව්‍යවසායයන්වලට අදාළව සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ මධ්‍යයේ, විදුලිබල අංශය සඳහා යෝජිත නව නීති මගින් එම අංශය තුළ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කඩිනම් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් බලශක්ති සුරක්ෂිතතාව සහතික කෙරෙන කාර්යක්ෂම සහ මූල්‍ය ශක්‍යතාවෙන් යුත් අංශයක් නිර්මාණය කෙරෙනු ඇත. තවද, විශේෂයෙන් ම විදේශීය ආයෝජන හරහා මූල්‍යනය කරනු ලබන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතවන විවිධ විදුලිබල ව්‍යාපෘති හරහා බලශක්ති ප්‍රභව විවිධාංගීකරණය කිරීම සහ උත්පාදන ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ රජයේ ප්‍රමුඛතාව තුළින්, වර්ධනය වන බලශක්ති ඉල්ලුම, පිරිවැය ඵලදායී සහ තිරසාර අයුරින් සපුරාලන අතර ම, 2030 වසර වන විට බලශක්ති උත්පාදනයෙන් සියයට 70ක් පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් උත්පාදනය කිරීමේ ජාතික අවශ්‍යතාව සාක්ෂාත් කරගැනීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ලං.ඛ.නී.සං. සහ ලං.වි.ම.හි මූල්‍ය කාර්යසාධනය මෑත කාලීනව යහපත් අතට හැරීම තුළින් රාජ්‍ය මූල්‍ය අංශය මත වන පීඩනය කිසියම් දුරකට අවම කර ගැනීමට උපකාරී වී ඇත. කෙසේ වෙතත්, රජය සතු මෙම ප්‍රධාන වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය කාර්යසාධනය වර්ධනය වීම හේතුවෙන් එම ව්‍යවසායයන් මූල්‍ය පද්ධතිය මත අනවශ්‍ය ලෙස රඳා පැවතීම අවම වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, රජය සතු වාණිජ ව්‍යවසායයන්හි අලාභ හේතුවෙන් එම ව්‍යවසායයන් වෙත සංකේන්ද්‍රණය වී පැවති මූල්‍ය පද්ධතියේ වටිනා සම්පත් ආර්ථිකයේ ඵලදායී අංශ වෙත නැවත යොමු කිරීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ ක්‍රමවේදය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ කැපවීම මෙන්ම විදුලිබල හා බලශක්ති අංශවල විවිධාංගීකරණය, තරගකාරිත්වය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා වූ අඛණ්ඩ ප්‍රතිසංස්කරණ, අනාගතයේ දී මෙම අංශවල ඇතිවන ඕනෑම අර්බුදයක් වළක්වා ගැනීම සඳහා ඉතා වැදගත් වනු ඇත.

### ප්‍රවාහන අංශය

**ඉන්ධන සැපයුම සාමාන්‍ය පරිදි සිදුවීම මෙන්ම ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීම ආරම්භ වීම හේතුවෙන් වසර තුළ දී ප්‍රවාහන කටයුතු නැවතත් වර්ධනය විය.** ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී.ලං.ග.ම.) ධාවන කිලෝමීටර් ගණන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 11.2ක වර්ධනයක් වාර්තා කළ අතර, මගී කිලෝමීටර් ගණන වසර තුළ දී සියයට 4.6ක පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, 2023 වසරේ දී පෞද්ගලික අංශයේ මගී කිලෝමීටර් ගණන සහ ධාවන කිලෝමීටර් ගණන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 23.7ක සහ සියයට 94.3ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. 2023 වසරේ දී දුම්රිය ප්‍රවාහන අංශයේ ඇස්තමේන්තුගත මගී කිලෝමීටර් ගණන සහ භාණ්ඩ කිලෝමීටර් ගණන වාර්ෂික ලක්ෂ්‍යයමය පදනම මත, පිළිවෙළින්, සියයට 6.7කින් සහ සියයට 15.0කින් ඉහළ ගියේය. 2023 වසරේ දී සිවිල් ගුවන් සේවා අංශය තුළ මිලියන 7.5ක මගී පැමිණීම් (සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ) වාර්තා වූ අතර, එය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 35.8ක වර්ධනයක් පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, වසර තුළ දී භාණ්ඩ මෙහෙයුම් සියයට 5.0ක පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, රජය විසින් 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව අයිතිය පවරා දීමට සුදුසු විභව ආයෝජකයන්ගෙන් අභිමතය විමසීමේ යෝජනා කැඳවමින් ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. 2023 වසරේ මුල් භාගයේ දී සැලකිය යුතු පසුබෑමකට ලක් වූ වරාය අංශය, ක්‍රමානුකූලව සිදු වූ ආනයන සීමා ලිහිල් කිරීම සහ

වර්ධනය වූ වෙළඳ කටයුතුවල සහාය ලැබීමත් සමඟ ඉන් පසු කාලසීමාව තුළ දී වර්ධනය විය. ඒ අනුව, බහාලු මෙහෙයුම් සහ භාණ්ඩ මෙහෙයුම්, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.3ක සහ සියයට 3.4ක වර්ධනයන් වාර්තා කළ අතර, නැව් පැමිණීම් ද 2023 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 18.4ක වර්ධනයක් වාර්තා කළේය. විශේෂයෙන් ම වසරේ අවසාන භාගයේ දී නෞකා රතු මුහුද මඟහැර යාත්‍රා කිරීම හේතුවෙන් සිදු වූ ප්‍රතිනැව්ගත කිරීම්වල ඉහළ යෑම ද මෙම යහපත් කාර්යසාධනය සඳහා හේතු විය.

### අනෙකුත් ප්‍රවණතා

**අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2023 වසරේ දී ක්‍රමයෙන් නැවත ආරම්භ විය.** කොළඹ වරාය නගරය, එහි මාර්ග සහ අනෙකුත් උපයෝගිතා ඇතුළුව බිම් මට්ටමේ යටිතල පහසුකම් ඉදිකිරීමෙහි පළමු අදියරෙහි අවසාන භාගය කරා ළඟා වී ඇති අතර, එම කටයුතු 2024 වසරේ මැද භාගය වන විට අවසන් කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කොළඹ වරාය නගරයෙහි නීතිමය රාමුව අඛණ්ඩව ශක්තිමත් කිරීම සඳහා වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබූ අතර, ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරාකරණය කිරීමේ මධ්‍යස්ථානය පිහිටුවීම එම ක්‍රියාමාර්ග අතර ප්‍රධාන සන්ධිස්ථානයක් විය. කොළඹ වරායේ නැගෙනහිර බහලුම් පර්යන්තයෙහි දෙවන අදියර සහ බටහිර බහලුම් පර්යන්තයෙහි පළමු අදියරට අදාළ ව යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වසර තුළ දී අඛණ්ඩව සිදු වූ අතර, එමගින් 2027 වසර වනවිට වරායෙහි ධාරිතාව අඩි විස්සේ බහලු ඒකක මිලියන 6කින් පමණ පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. වසර තුළ දී, නාගරික සංවර්ධන අධිකාරිය විසින්, *සියක් නගර - නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන* හරහා ප්‍රාදේශීය නගර මධ්‍යස්ථාන පුරවැසි කේන්ද්‍රීය නගර බවට පත් කිරීම අරමුණු කරගත් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් නුවරඑළිය, කුරුණෑගල සහ ගාල්ල යන ප්‍රදේශ ද ඇතුළුව ප්‍රදේශ කිහිපයක අවසන් කරන ලදී. 2023 වසරේ දී මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ යළි ආරම්භ කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පියවර ගත්තේය. එමෙන්ම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල සම්පාදන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී නිම කරන ලදී. මේ අතර, රජයේ *DIGIECON 2030* වැඩසටහන යටතේ ද විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවෙමින් පවතින අතර, ශ්‍රී ලංකාව ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම වේගවත් කිරීමට මෙම මුලපිරීම් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1.2.7 සමාජ යටිතල පහසුකම්

### අධ්‍යාපනය

**අධ්‍යාපන අංශයේ නැවත සාමාන්‍ය තත්ත්වයට පත්වී ඇති බවක් පෙනී ගිය ද, අර්බුද කාලපරිච්ඡේදය තුළ අධ්‍යාපන පද්ධතියෙහි උග්‍ර වූ විෂමතා සඳහා තවමත් නිසි පිළියම් යෙදී නොමැත.** වසර තුනක් පමණ මංගත සහ භෞතික ලෙස මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීමෙන් අනතුරුව, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ අවහිරතා ඉවත්ව යෑමත් සමඟ 2023 වසරේ දී අධ්‍යාපන අංශයේ කටයුතු සඳහා නැවත පූර්ණ වශයෙන් භෞතික ඉගෙනුම් ක්‍රමවේද භාවිතා කිරීම ආරම්භ විය. ජාතික මට්ටමේ සියලු විභාග රජය විසින් අඛණ්ඩව පැවැත්වීමට කටයුතු කරනු ලැබුව ද, අධ්‍යයන වර්ෂයක් ප්‍රමාද වීමට අදාළව දිගින් දිගටම විසඳුමක් නොමැති වීම නිසා, 11 සහ 13 යන ශ්‍රේණිවල ශිෂ්‍ය කණ්ඩායම් දෙක බැගින් විභාග සඳහා මුහුණ දීමට එකම කාලය තුළ සුදානම් කිරීමට සිදුවීම හේතුවෙන් එම සිසුන්ට තම පාසල්වලින් සම්පත් ලබා ගැනීමේ දී අවාසි සහගත තත්ත්වයන් නිර්මාණය වී ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කළ සමීක්ෂණයක ප්‍රතිඵල අනුව, ආර්ථික අර්බුදය මගින් වයස අවුරුදු 3-21ත් අතර පුද්ගලයන් සියයට 54.9කගේ පාසල් අධ්‍යාපනය කෙරෙහි බලපෑම් ඇති වී තිබේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින්, සිසුන් පාසල් අධ්‍යාපනය හැර යෑම අවම කිරීම මෙන්ම ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය සහ සහභාගීත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් 2023 වසර තුළ දී රජය විසින් ශිෂ්‍ය සුබසාධන සහ සහනාධාර වැඩසටහන්වල අඛණ්ඩව ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. පාසල් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, නොමිලේ පෙළ පොත් ලබාදීම, නොමිලේ පාසල් නිල ඇඳුම් සහ පාසල් පාවහන් ලබාදීම මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. කෙසේ වෙතත්, පරම්පරා කිහිපයක සිට මුහුණ දෙන දරිද්‍රතාවයෙන් සහ අවදානමෙන් මිදීම සඳහා අධ්‍යාපනය වඩාත් වැදගත් වන, විශේෂයෙන් ම

1

ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස්වල අධ්‍යාපනික ප්‍රතිඵල මත අර්බුදයෙන් පසු ඇතිවන දිගු කාලීන බලපෑම මෙම ක්‍රියාමාර්ග හරහා අඩු කර ගත හැක්කේ යම් සීමාවකට පමණක් බව නැවත අවධාරණය කළ යුතුය.

### සෞඛ්‍ය

**බෝවන සහ බෝ නොවන රෝග යන දෙඅංශයෙහි ම අභියෝගවලට සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණ දුන් අතර, සීමිත සම්පත් මධ්‍යයේ එම රෝග සඳහා ප්‍රතිකාර සැපයීමේ දී උද්ගත වූ අමතර මූල්‍ය දුෂ්කරතා තුළින් ඉස්මතු වී පෙනෙන්නේ එම රෝග කාර්යක්ෂමව කළමනාකරණය සහ වැළැක්වීම සඳහා අවශ්‍ය විස්තීර්ණ උපායමාර්ග සහ සම්පත්වල අවශ්‍යතාවයයි.** 2017 වසරේ දී (රෝගීන් 186,101) සහ 2019 වසරේ දී (රෝගීන් 105,049) වාර්තා වූ ඉහළ ම ඩෙංගු ව්‍යාප්තිවලින් පසුව, රෝගීන් 89,799ක් වාර්තා කරමින් තෙවන විශාලතම ඩෙංගු ව්‍යාප්තිය 2023 වසරේ දී සනිටුහන් විය. තවද, මැලේරියා රෝගය යළි හිස එසවීමේ අවදානමක් නිර්මාණය කරමින්, 2023 වසරේ දී විදේශ රටක දී මැලේරියා රෝගය ආසාදනය වී මෙරටට පැමිණි රෝගීන් 62ක් මෙරටින් වාර්තා විය. මෑතකාලීනව පෝෂණය සම්බන්ධ දර්ශක මගින් පවතින සමාජ ආර්ථික අභියෝග මධ්‍යයේ සහ විශේෂයෙන් ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට අයත් ළමුන් සහ කාන්තාවන් අතර පවතින අසතුටුදායක මෙන්ම තවදුරටත් දුර්වල වෙමින් පවතින පෝෂණ තත්ත්ව පිළිබිඹු කෙරේ. මෙම පසුබිම තුළ, එවැනි ගැටලුවල දිගුකාලීන බලපෑම අවම කිරීම සඳහා වන ප්‍රයත්නයක් ලෙස සංවර්ධනය සඳහා සහාය සපයන ආයතනවල සහයෝගය ඇතිව ළමා පෝෂණ සේවා සැපයීම සඳහා අදාළ බලධාරීන් විසින් වසර තුළ දී අඛණ්ඩව කටයුතු සිදු කරන ලදී. කෙසේ වෙතත්, මන්දපෝෂණයේ ප්‍රතිවිපාක දිගු කාලීන වන අතර, එමගින් පරම්පරා ගණනාවක පිරිසක් දුර්වල ඵලදායීතාවයේ විෂම චක්‍රය තුළට කොටු කරමින් දරිද්‍රතාවට පැමිණවිය හැකි බැවින් මේ සඳහා පුළුල් හා වඩාත් ඉලක්කගත උපායමාර්ගයක් අත්‍යවශ්‍ය වේ.

**සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පවතින දුර්වලතා වඩාත් අර්බුදකාරී වෙමින් පවතින අතර, එමගින් එම ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව පිළිබඳ බරපතළ අවිනිශ්චිතතා ඉස්මතු කරයි.** ඖෂධ සහ අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කෙරෙහි එක හා සමාන ලෙස බලපෑම් ඇති කළ විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය සමඟ උද්ගත වූ ආර්ථික අර්බුදය හේතුවෙන් මහජන සෞඛ්‍ය අංශයේ සේවා සැපයීම දැඩි බලපෑමට ලක් වී ඇත. මෙම අංශයට එල්ල වූ බලපෑම බොහෝ දුරට සමනය වී ඇතත්, දුර්වල තත්ත්ව පාලන ක්‍රමවේද සහ ඊට අදාළව දැඩි නියාමන යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන් ඖෂධවල ප්‍රමිතිය පිළිබඳ ගැටලු මෑත කාලයේ නිරන්තරයෙන් ඇති විය. තවද, සෞඛ්‍ය සේවා සැපයීමේ දී දක්වන සැලකිලිමත්බව අඩුවීම වඩාත් ගැටලුකාරී තත්ත්වයක් බවට පත්වෙමින් පවතී. මෙම ගැටලු ද්විත්වයෙහි ම ප්‍රතිඵලයක් ලෙස ජීවිත හානි සිදුවී ඇති අතර, එය සෑමට සමාන අවස්ථා සහිත සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑම සඳහා වූ රජයේ දිගුකාලීන ප්‍රයත්නය පිළිබඳව සැලකීමේ දී ඉතා කණගාටුදායක තත්ත්වයක් ලෙස සඳහන් කළ යුතුය. මෙම ප්‍රවණතා හේතුවෙන් සෞඛ්‍ය සේවාව විසින් මෙතෙක් අත්කරගත් ජයග්‍රහණ අවතක්සේරුවට භාජනය වීමේ අවදානමක් ද පවතී. රටේ සෞඛ්‍ය සේවා පද්ධතිය, ආර්ථිකයේ මානව සම්පත් ප්‍රාග්ධන පදනමෙහි තීරණාත්මක අංගයක් වන බැවින් එය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දැඩි අවශ්‍යතාව මෙමගින් අවධාරණය කෙරේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සඳහා කඩිනම් ප්‍රමුඛතාව ලබා දීමට අමතරව, මෙම අංශය පුද්ගල යහපැවැත්ම සහ මිනිස් ජීවිත සමඟ කටයුතු කරන බව සැලකිල්ලට ගනිමින්, ඖෂධ නිෂ්පාදන සහ වෛද්‍ය උපකරණවලට අදාළ සැපයුම් දාමයේ සෑම අදියරකදී ම දැඩි නියාමන යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. තිරසාර සෞඛ්‍ය මූල්‍යන ප්‍රතිපත්තිය කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම ද ඉතා කඩිනමින් සිදු කළ යුතු අත්‍යවශ්‍ය පියවරකි. සේවා සැපයීම සම්බන්ධව පමණක් නොව, යටිතල පහසුකම් සංවර්ධනය, ඖෂධ සහ වෛද්‍ය උපකරණ නිෂ්පාදනය මෙන්ම මෙම අංශයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඇතුළු සෞඛ්‍ය සේවා සැපයීම ආශ්‍රිත වෙනත් අංශ සඳහා ද රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සක්‍රීය ලෙස දිරිගැන්වීම මැදි කාලීනව තිරසාර සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා පදනම වේ. මේ අතර, මේ දක්වා සාක්ෂාත් කරගෙන ඇති ජයග්‍රහණ මෙම මෑත කාලීන අහිතකර ප්‍රවණතා මගින් දුර්වල වීමක් නොවන බව සහතික කිරීම සඳහා මානව ප්‍රාග්ධනය අහිමි වීම සම්බන්ධ ගැටලු මෙන්ම අවශ්‍ය මානව සම්පත නිර්මාණය කිරීම සඳහා යටිතල පහසුකම් නොමැති වීමේ ගැටලු විසඳීමට පියවර ගැනීමේ කඩිනම් අවශ්‍යතාවක් පවතී.

**සමාජ ආරක්ෂණ ජාල**

**ආර්ථික අර්බුදය මගින් අවදානමට ලක්විය හැකි කුටුම්බ කෙරෙහි ඇති විය හැකි විෂමාකාර මෙන්ම දිගුකල් පවත්නා බලපෑම සැලකිල්ලට ගනිමින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ සිදු කෙරෙන සාර්ව ආර්ථික ගැළපුම් හා අනුව යමින් රටේ සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා පියවර ගනු ලැබිණි.** ඒ අනුව, සමෘද්ධි සංවර්ධන වැඩසටහන වෙනුවට නව වැඩසටහනක් හඳුන්වාදීමේ අරමුණින් 2023 ජූලි මාසයේ දී සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ අස්වැසුම සමාජ සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන ආරම්භ කරන ලදී. බහුවිධ පරාමිතීන් සැලකිල්ලට ගනිමින් සුබසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතියක් ගොඩනැගීමෙන් අනතුරුව, ප්‍රතිලාභ අවශ්‍ය කෙරෙන කාණ්ඩ ඵලදායී ලෙස ඉලක්ක කිරීම සහතික කිරීම සඳහා වැඩිදියුණු කළ තොරතුරු තහවුරු කිරීමේ පද්ධතියක් සමඟ මෙම වැඩසටහන නිර්මාණය කර ඇති අතර, ප්‍රතිලාභ වැඩසටහන සඳහා ඇතුළත් නොවන අවස්ථාවල දී ඊට අදාළව අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ද ලබා දී ඇත. අස්වැසුම වැඩසටහන යටතේ වර්ගීකරණය කර ඇති ප්‍රධාන කාණ්ඩ, එනම් සංක්‍රාන්ති, අවදානමට ලක් වූ, දුප්පත් සහ අන්ත දුප්පත් යන කාණ්ඩ යටතේ ප්‍රතිලාභ ලබා දීම සඳහා වැඩසටහන ආරම්භයේ දී මිලියන 3.7ක අයදුම්කරුවන් අතරින් මිලියන 1.4ක අයදුම්කරුවන් තෝරා ගන්නා ලදී. තවද, මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබිය යුතු පිරිස් ඉලක්කගත කිරීම වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු නැවත සහතික කිරීම, තහවුරු කිරීමේ ක්‍රියාවලීන් මෙන්ම නිරන්තර සමාලෝචන යනාදිය සමඟ තෝරා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ, 2023 වසර තුළ දී රුපියල් බිලියන 53.8ක් පමණ බෙදා දී ඇත. මේ අතර, නව ප්‍රතිලාභ වැඩසටහන යටතේ අභියාචනා ක්‍රියාවලිය අවසන් වනතෙක් සමෘද්ධි සහනාධාර වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නැංවීම සඳහා 2023 වසරේ ජූලි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. ඒ අනුව, 2023 වසර අවසානය වනවිට සමෘද්ධි වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව, 2023 වසර ආරම්භයේ වාර්තා වූ පවුල් මිලියන 1.7ට සාපේක්ෂව පවුල් 363,214ක් විය. සමාජ ආරක්ෂණ වැඩසටහන්හි සඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා වන රජයේ ප්‍රයත්න ප්‍රශංසනීය වුව ද ආර්ථික අර්බුදයෙන් පසුව දරිද්‍රතාව, අවදානමට ලක්වීමේ හැකියාව සහ විෂමතා පිළිබඳව ජාතික මට්ටමේ සංඛ්‍යාලේඛන නොමැති වීම ගැටලුකාරී වන අතර, එවැනි සංඛ්‍යා ලේඛන නොමැති වීම දරිද්‍රතාව තුරන් කරලීම සඳහා මෙන්ම සමාජ සහනාධාර ප්‍රයත්න නිසි කලට ක්‍රියාත්මක කිරීම කෙරෙහි බාධා පමුණුවයි.

## 1.3 මුදල් අංශයේ ප්‍රවණතා

### 1.3.1 දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටි කාලීන පොලී අනුපාතික


**දේශීය මුදල් වෙළඳපොළ එක්දින ද්‍රවශීලතාව හිඟ මට්ටමේ සිට සමස්තයක් ලෙස සමතුලිත මට්ටමක් දක්වා 2023 වසරේ දී සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය.** මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, එක්දින පදනමින් ද්‍රවශීලතාව සැපයීමට අමතරව විවට වෙළඳපොළ කටයුතු යටතේ අවශ්‍ය පරිදි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි මගින් වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීමත්, අඛණ්ඩ ද්‍රවශීලතා හිඟයන් පැවති ඇතැම් බලපත්‍රලාභී බැංකුවලට විශේෂ ද්‍රවශීලතා පහසුකම් සැපයීමත් මගින් මහ බැංකුව විසින් වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. මීට අමතරව, මහ බැංකුව විසින් සැලකිය යුතු ලෙස ශුද්ධ පදනමින් විදේශ විනිමය මිලදී ගැනීම් මගින් ද දේශීය මුදල් වෙළඳපොළට රුපියල් ද්‍රවශීලතාව සපයන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2023 අගෝස්තු මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 2.00 දක්වා පදනම් අංක 200කින් අඩු කිරීම මගින් දේශීය මුදල් වෙළඳපොළට රුපියල් බිලියන 200ක පමණ අමතර ද්‍රවශීලතාව සැපයිණි. ඒ අනුව, 2022 වසර තුළ දී සාමාන්‍යයක් ලෙස රුපියල් බිලියන 450ක පමණ හිඟ මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, 2023 වසරේ දී සාමාන්‍යයක් ලෙස රුපියල් බිලියන 70ක පමණ හිඟ ද්‍රවශීලතා මට්ටමක් දක්වා වැඩිදියුණු විය. මහ බැංකුව විසින් නිත්‍ය පහසුකම් මත පැනවූ සීමාවන්[12] හේතුවෙන් සලකා බලන කාලය තුළ දී එක්දින ද්‍රවශීලතාවයේ විචලනයන් පැවතුණි. කෙසේ වෙතත්, 2024

12 2023 ජනවාරි 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන මාසයක් තුළ පස් වතාවකට (05) සීමා කරන ලද අතර, නිත්‍ය ණය පහසුකම ඕනෑම එක් දිනක් සඳහා අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පවතින ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් සියයට 90ක් දක්වා ප්‍රමාණයකට සීමා කෙරිණි.

1

**1.7 රූප සටහන**

**ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ එක්දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

පෙබරවාරි සහ මාර්තු මාසවල දී එම සීමාවන්[13] ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ද්‍රවශීලතාවයේ පැවති විචලන සහ අවිනිශ්චිතතා ඉදිරි කාලය තුළ දී සාමාන්‍ය තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බලපත්‍රලාභී වාණිජ බැංකු අතර ද්‍රවශීලතා ව්‍යාප්තිය අඛණ්ඩව අසමමිතිකව පැවති අතර විදේශීය බැංකු විශාල ද්‍රවශීලතා අතිරික්ත පවත්වාගෙන ගියේය. ඉතා දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පැවති කාලය තුළ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයේ පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය,[14] මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීම[15] සහ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වය ක්‍රමයෙන් වැඩිදියුණු වීමට ප්‍රතිචාර වශයෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව දක්වා අඩු විය. මෙය සමස්තයක් ලෙස වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය පහළ යෑමට පහසුකම් සැපයීය.

### 1.3.2 වෙළඳපොළ පොලී අනුපාතික

**වෙළඳපොළ පොලී අනුපාතික 2022 වසරේ ආරම්භ වූ ඉහළම මට්ටම්වල සිට 2023 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු විය.** 2023 වසරේ ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ තවත් විවිධ සාධක කිහිපයක් මෙම පොලී අනුපාතික අඩු වීම සඳහා හේතු විය.[16] ශීඝ්‍ර නිර්-උද්ධමන ක්‍රියාවලිය හා උද්ධමන අපේක්ෂා අඩුවීමේ සහාය ඇතිව අධික ලෙස ඉහළ මට්ටමේ පැවති වෙළඳපොළ පොලී අනුපාතික අඩු කිරීම ඉලක්ක කරගත් නියාමන ක්‍රියාමාර්ග හා ශිෂ්ඨ ප්‍රයෝග මෙන්ම දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික හා සම්බන්ධ අවදානම් අධිමිල අඩු වීම, වෙළඳපොළ ණය පොලී අනුපාතික සමස්තයක් ලෙස පහළ යෑම සඳහා දායක වූ අනෙකුත් සාධක වේ. අධික ලෙස ඉහළ මට්ටමක පැවති ණය පොලී අනුපාතික අඩු කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේ දී හඳුන්වා දුන් නියාමන ක්‍රියාමාර්ග මෙන්ම රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික ක්‍රමානුකූලව අඩු කිරීමට 2023 වසරේ අග භාගයේ දී හඳුන්වා දුන් පුළුල් මාර්ගෝපදේශවල ප්‍රතිඵලයක් ලෙස ණය පොලී අනුපාතික අඩු වූ අතර, එමගින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත මනාව සම්ප්‍රේෂණය වීම පිළිබිඹු වේ. රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ යෑමේ යම් මන්දගාමී වීමක් පෙන්නුම් කළේය. 2023 වසරේ දී, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික (බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය) ප්‍රතිශතාංක 2.42 - 3.61ක පරාසයකින් අඩු වූ අතර, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික (බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය)

13 නිත්‍ය පහසුකම් සඳහා වූ සීමාවන් අදියර දෙකකින් ලිහිල්/ ඉවත් කරන ලදී. පළමුව, 2024 පෙබරවාරි 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යැමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම සඳහා පැවති සීමා ඉවත් කරන ලද අතර නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන මාසයක් තුළ පස් වතාවක් (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී. අවසාන වශයෙන්, 2024 අප්‍රේල් 01 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යැමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවති ඉතිරි සීමා ඉවත් කරන ලදී.


14 නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මෙහෙයුම් ඉලක්කය ලෙස මහ බැංකුව විසින් සම්පව නිරීක්ෂණය කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතිකය වේ.

15 මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ආරම්භ වූ 2023 ජූනි මාසයේ සිට මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික 2023 වසරේ දී පදනම් අංක 650කින් සහ 2024 වසරේ මේ දක්වා කාලය තුළ දී පදනම් අංක 50කින් අඩු කරන ලද අතර, සමස්තයක් ලෙස පොලී අනුපාතික පදනම් අංක 700කින් පහළ දැමීය.

16 2021 වසරේ අගෝස්තු මාසයේ ආරම්භ වූ දැඩි මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ කාල පරාසයේ අවසන් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම ලෙස 2023 මාර්තු මාසයේ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් වැඩි කළේය.

**1.8 රූප සටහන**

## තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිශතාංක 12.01 - 12.40ක පරාසයකින් අඩු විය. ණය පොලී අනුපාතික, විශේෂයෙන් ම වෙළඳපොළේ පදනම් පොලී අනුපාතිකයක් ලෙස සලකනුලබන, සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දුන් කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය) 2023 වසරේ දී ප්‍රතිශතාංක 15.11කින් විශාල ලෙස අඩු විය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම ණය හා අත්තිකාරම්වලට අදාළ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය) සහ මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව ණය හා අත්තිකාරම්වලට අදාළ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය) 2023 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 4.49කින් සහ ප්‍රතිශතාංක 11.82කින් අඩු විය. අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු වීම හා සමගාමීව කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතික ද 2023 වසර තුළ දී අඩු විය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් සියලුම ණය හා අත්තිකාරම් මත පදනම් වූ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය) සහ මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් නව ණය හා අත්තිකාරම් සඳහා වූ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය) 2023 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 5.40කින් සහ ප්‍රතිශතාංක 11.95කින් අඩු විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය දීමේ පොලී අනුපාතිකවල සමස්ත අඩු වීමක් පැවතිය ද, ණය ස්වභාවය සහ ඒ ආශ්‍රිත අවදානම් හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය විශේෂයෙන් කුඩා ප්‍රමාණයේ ණය සඳහා අය කරන ලද පොලී අනුපාතික සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතිණි. ලිහිල් මුදල් තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් අඩු වීමට ඇති ඉඩකඩ පෙන්නුම් කරමින් වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීමේ ප්‍රවණතාවය 2024 මුල් කාලයේ දී ද අඛණ්ඩව පැවතුණි. මෙම ප්‍රවණතා මධ්‍යයේ වුව ද අඩු උද්ධමන මට්ටම හේතුවෙන් මූර්ත වෙළඳපොළ පොලී අනුපාතික ධනාත්මකව පැවති අතර, එමගින් පොලී අනුපාතික අනුව සලකා බලන විට මුදල් තත්ත්වයන් තරමක් දැඩිව පවතින බව පෙන්නුම් කරයි. මේ අතර, ගෝලීය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩිව පැවතිය ද, වෙළඳ භාණ්ඩ හා සේවා අංශයේ අපනයනවලින් මෙන්ම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් විදේශ විනිමය ගලා ඒම මගින් බැංකු අංශයේ විදේශ විනිමය ශේෂයන් වැඩිදියුණු වීම හේතුවෙන් විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික පෙර වසරට

1

1.7 සංඛ්‍යා සටහන

## පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| පොලී අනුපාතිකය | 2022 අවසානයට | 2023 අවසානයට | ප්‍රතිශතාංක වෙනස |
|---|---|---|---|
| **ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 9.00 | -5.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 10.00 | -5.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 15.50 | 9.24 | -6.26 |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | | |
| **ප්‍රාථමික වෙළඳපොළ (අ)** | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 32.64 | 14.51 | -18.13 |
| දින 182 | 32.20 | 14.16 | -18.04 |
| දින 364 | 29.27 | 12.93 | -16.34 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 33.01 (ආ) | 13.87 (ඇ) | -19.14 |
| වසර 3 | 31.36 (ආ) | 14.07 (ඇ) | -17.29 |
| වසර 4 | - | 14.21 (ඇ) | - |
| වසර 5 | 31.78 (ආ) | 14.32 (ඇ) | -17.46 |
| වසර 10 | 30.86 (ආ) | - | - |
| **ද්විතීයික වෙළඳපොළ** | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 30.75 | 14.13 | -16.62 |
| දින 182 | 29.50 | 13.86 | -15.64 |
| දින 364 | 28.39 | 12.71 | -15.68 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 28.19 | 13.52 | -14.67 |
| වසර 3 | 28.32 | 13.62 | -14.70 |
| වසර 4 | 27.60 | 13.66 | -13.94 |
| වසර 5 | 26.78 | 13.74 | -13.04 |
| වසර 10 | 26.18 | 13.10 | -13.09 |
| **තැන්පතු පොලී අනුපාතික** | | | |
| **බලපතලාභී වාණිජ බැංකු (ඇ)** | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25-6.00 | 0.25-13.00 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඉ) | 4.50-30.00 | 1.00-22.00 | - |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඊ) | 14.06 | 11.64 | -2.42 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ) | 18.49 | 14.88 | -3.61 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඊ) | 23.07 | 11.06 | -12.01 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ) | 23.73 | 11.33 | -12.40 |
| **අනෙකුත් මූල්‍ය ආයතන (උ)** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 8.00 | -4.00 |
| බලපතලාභී මුදල් සමාගම් (උෆ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.63-8.03 | 4.33-6.62 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 20.48-27.15 | 11.88-13.56 | - |

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| පොලී අනුපාතිකය | 2022 අවසානයට | 2023 අවසානයට | ප්‍රතිශතාංක වෙනස |
|---|---|---|---|
| **ණය පොලී අනුපාතික** | | | |
| **බලපතලාභී බැංකු (එ)** | | | |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය | 20.73 | 15.33 | -5.40 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය | 26.91 | 14.96 | -11.95 |
| **බලපතලාභී වාණිජ බැංකු (ඇ)** | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික) | 28.19 | 12.39 | -15.80 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 18.70 | 14.21 | -4.49 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 26.20 | 14.38 | -11.82 |
| **බලපතලාභී විශේෂිත බැංකු (උ)** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 28.00-32.00 | 15.00-20.00 | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඒ) | 18.00-27.25 | 9.50-21.00 | - |
| **බලපතලාභී මුදල් සමාගම් (උෆ)** | | | |
| මූල්‍ය කල්බදු | 21.53-35.37 | 14.98-32.48 | - |
| නිශ්චල දේපළ මත ලබා දුන් ණය | 26.80-28.43 | 14.18-23.86 | - |
| **සාංගමික ණය වෙළඳපොළ** | | | |
| ණයකර | 15.42-28.00 | 13.50-29.50 | - |
| වාණිජ පත්‍රිකා | 11.00-36.00 | 17.00-26.50 | - |

(අ) ආසන්නතම වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික

(ආ) 2022 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - දෙසැ. 13| වසර 3 - දෙසැ. 29|
වසර 5 - ඔක්. 28| වසර 10 - නොවැ. 11

(ඇ) 2023 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - දෙසැ. 28| වසර 3 - දෙසැ. 12|
වසර 4 - දෙසැ. 28| වසර 5 - දෙසැ. 12

(ඈ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඉ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.

(ඊ) සියයට 15ක් වූ ජ්‍යේෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළඳපොළ පොලී අනුපාතික මගිනි. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා වේ. කෙසේ වුවද, 01.10.2022 සිට ජ්‍යේෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු සඳහා ලබාදුන් සියයට 15ක පොලිය ලබාදීම නවතා දමන ලදී.

(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(උෆ) පොලී අනුපාතික ප්‍රරාසයන් බලපතලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේදී තැන්පතු ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2023 වසර සඳහා දත්ත තාවකාලික වේ.

(එ) බලපතලාභී වාණිජ බැංකු හා බලපතලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඒ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.


මූලයන්: අදාළ මූල්‍ය ආයතන
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂව 2023 වසර තුළ දී අඩු අගයක් වාර්තා කළේය.

**2023 ජූලි මාසයේ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ සැලකිය යුතු ලෙස පහත වැටුණු රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික, මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ රජයේ සුරැකුම්පත් හා සම්බන්ධ අවදානම් අධිමිල ක්‍රමයෙන් අඩුවීම හේතුවෙන් තවදුරටත් අඩු විය.** තවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න හා රාජ්‍ය ආදායමේ වැඩිදියුණු වීම, රජය විසින් මුදල් ප්‍රවාහ ක්‍රියාවලිය සඳහා ආරක්ෂක අරමුදල් ගොඩ නැඟීම, උද්ධමනය අඩු වීම සහ උද්ධමන අපේක්ෂා අඩු වීම මෙන්ම වෙළඳපොළ අපේක්ෂා හිතකරවීම ද රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සාමාන්‍යකරණය වීමට සහාය විය. ඒ අනුව, 2023 වසර තුළ දී සියලු කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික ප්‍රතිශතාංක 16.34 - 18.13කින් අඩු වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික ද අඩු විය. මේ අතර, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ පැවති ගැටලු සහ රජයේ ඉහළ ණය ගැනීමේ අවශ්‍යතා මගින් ඇති වූ අවිනිශ්චිතතා හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ සිට අසාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරන ලද ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය, 2023 වසරේ වැඩි කාලයක් තුළ දී ද ද්විත්ත්ව නැමි සහිත ප්‍රතිලෝම ඵලදා වක්‍රයක් නිරූපණය කළේය. කෙසේ වෙතත්, දේශීය ණය ප්‍රශස්තකරණ

**1.9 රූප සටහන**

**රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




ක්‍රියාවලියෙන් සහ වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය තත්ත්වයෙන් පසු රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ යෑම හේතුවෙන් ඵලදා වක්‍රය 2024 වසරේ මුල් කාලයේ සිට ඉහළට බෑවුම් සහිත සාමාන්‍ය ඵලදා වක්‍රයක් බවට පත් විය.

### 1.3.3 ණය සමස්ත

**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2023 ජූනි මාසයේ දී ඉහළ යෑමත් සමඟ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය මාසිකව සංකෝචනය වීමේ දීර්ඝතම කාල සීමාව අවසන් විය.** ණය ප්‍රසාරණය සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමානුකූලව ලිහිල් කිරීම මෙන්ම ආර්ථික ක්‍රියාකාරකම් සහ වෙළඳපොළ හිතකර අපේක්ෂා වැඩිදියුණු වීම සහාය විය. ඒ අනුව, 2023 ජූනි - දෙසැම්බර් කාලය තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණයෙහි වැඩි වීම රුපියල් බිලියන 367.4ක් විය. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2023 වසරේ දෙවන භාගයේ දී යථා තත්ත්වයට පත් වුව ද, 2023 වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය රුපියල් බිලියන 45.0කින් සංකෝචනය වූ අතර 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 6.2ක (වාර්ෂික ලක්ෂ්‍යමය) වර්ධනය හා සැසඳීමේ දී 2023 වසර අවසානයේ දී සියයට 0.6ක සංකෝචනය වීමක් වාර්තා විය. කෙසේ වෙතත්, 2024 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු සංශෝධන ක්‍රියාත්මක කිරීම මත පදනම්ව එයට පෙර වියදම් සිදු කිරීම සහ වසර අවසාන උත්සව සමයේ ව්‍යාපාර විසින් ලබා ගත් කෙටි කාලීන ණය පියවීමේ යම් බලපෑම් හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වැඩිවීමේ ප්‍රවණතාවය 2024 ජනවාරි මාසයේ දී අනපේක්ෂිත මාසික සංකෝචනයක් (රුපියල් බිලියන 52.2ක සංකෝචනයක්) වාර්තා කළේය. තවද, ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන් ණය රුපියල්වලින් ගණනය කිරීමේදී ඇතිවන වටිනාකම් වෙනස්වීමේ බලපෑම ද 2024 ජනවාරි මාසයේ දී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සංකෝචනය සඳහා හේතු විය. එසේ වුව ද, 2024 පෙබරවාරි මාසයේ දී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය යම් ප්‍රමාණයකට වැඩි වූ අතර, අපේක්ෂා කරන පරිදි වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් අඩු වීම සහ ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වැඩිදියුණු වීමත් සමඟ පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය වැඩි වීමක් ඉදිරි කාලයේ දී අපේක්ෂා කෙරේ. මේ අතර, සාපේක්ෂ ලෙස දැඩි ද්‍රවශීලතා තත්ත්ව සහ ඉහළ පොලී අනුපාතික මධ්‍යයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2023 වසර තුළ දී රුපියල් බිලියන 32.9කින් සංකෝචනය වූ අතර 2023 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.8ක සංකෝචනය වීමක් වාර්තා කරන ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ද 2023 වසර තුළ දී රුපියල් බිලියන 24.2කින් සංකෝචනය වූ අතර 2023 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.8ක සංකෝචනය වීමක් වාර්තා කරන ලදී.


**ආර්ථිකයේ ප්‍රධාන අංශ වෙත ලබා දුන් ණය[17] 2023 වසරේ පළමු භාගයේ දී සංකෝචනය වුව ද ඉන් පසුව යථා තත්ත්වයට පත් වීම ආරම්භ විය.** කර්මාන්ත අංශය වෙත ලබා දුන් ණය යම් පසුබෑමකට ලක් වුව ද 2023 වසර තුළ දී අනෙකුත් ඵලදායී අංශ සඳහා ලබා දුන් ණයෙහි වැඩි වීමක් දක්නට ලැබුණි. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2023 වසර තුළ දී කෘෂිකාර්මික සහ සේවා අංශ වෙත ලබා දුන් ණය, පිළිවෙළින්, සියයට 0.9කින් සහ සියයට 2.1කින් වර්ධනය විය. කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල පුළුල් ලෙස වර්ධනය වීමක් පිළිබිඹු කරමින් කෘෂිකාර්මික අංශය තුළ තේ, වී සහ


17 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම්ව සකසා ඇත.

1

1.10 රූප සටහන

## බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය





ධීවර උප අංශ වෙත ලබා දුන් ණය වසර තුළ දී ප්‍රසාරණය විය. සේවා අංශයේ තොග සහ සිල්ලර වෙළඳාම, සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය, සහ නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශන උප අංශවල ණය ප්‍රසාරණයක් 2023 වසර තුළ දී වාර්තා වූ අතර, එමගින් ආර්ථිකයේ සේවා ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් නැවත යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, රජය මගින් යෙදවිය හැකි මුදල් සීමා සහිත වීම, ඉහළ යන අමුද්‍රව්‍ය මිල ගණන් සහ 2022 වසරේ සහ 2023 වසරේ මුල් භාගයේ දී පැවති ඉහළ පොලී අනුපාතික හේතුවෙන් වූ මූල්‍ය පිරිවැය මගින් ඉදිකිරීම් උප අංශය දැඩි ලෙස බලපෑමට ලක් වූ අතර එමගින් රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘති සීමා සහිත වීමේ බලපෑමෙන් කර්මාන්ත අංශයට ලබා දුන් ණය දුර්වල මට්ටමක පැවතුණි. රෙදිපිළි සහ ඇඟලුම්, හා ආහාර සහ පාන වර්ග උප අංශ වෙත ලබා දුන් ණයෙහි ද සංකෝචනයක් වාර්තා වූ අතර, එය 2023 වසරේ දෙවන භාගය තුළ දී යම් යථා තත්ත්වයට පත්වීමක් සිදු විය. කෙසේ වෙතත්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කර්මාන්ත අංශයට ලබා දුන් ණය 2023 වසරේ දී සියයට 5.6කින් සංකෝචනය විය. මේ අතර, පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණය 2023 වසරේ දී සියයට 0.2ක සුළු සංකෝචනයකට ලක් වුව ද, කොවිඩ්-19 පැවති කාලයේ සිට අඛණ්ඩව ඉහළ ගිය උකස් හා සම්බන්ධ ණය ලබාදීමේ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2023 වසරේ දෙවන භාගයේ දී පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණය නැවත වැඩි වීමක් පෙන්නුම් කළේය.

**2022 වසර තුළ දී වාර්තා වූ සැලකිය යුතු වර්ධනය හා සැසඳීමේ දී රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2023 වසරේ දී සංකෝචනය විය.** ප්‍රධාන වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සපයන ලද රජයේ ඇපකර යටතේ පැවති විදේශ විනිමය ණය, රජය විසින් පවරා ගැනීම සහ පිරිවැය පිළිබිඹු කෙරෙන මිල වෙනස්වීම් ක්‍රියාත්මක කිරීමෙන් පසු රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාරයන්හි මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වීම හරහා එම ආයතන බැංකු මූල්‍යන මත රඳා පැවතීම අඩු වීම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය 2023 වසර තුළ දී රුපියල් බිලියන 979.9කින් සංකෝචනය විය.

**බැංකු පද්ධතිය, රජයට දේශීය මූල්‍යන ලබාගැනීමේ ප්‍රධාන මූලාශ්‍රවලින් එකක් වූ බැවින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය.** බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසරේ දී රුපියල් බිලියන 813.9කින් ඉහළ ගිය ද

**1.11 රූප සටහන**

**බැංකු පද්ධතියෙන් රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස (අ)**




(අ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2022 වසරේ දී ලබා දුන් ණය ප්‍රමාණයට වඩා පහළ මට්ටමක පැවතුණි (රුපියල් බිලියන 1,638.7ක ප්‍රසාරණයකි). පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය අඩු වීම මධ්‍යයේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජයේ සුරැකුම්පත්වල සිදුකරන ලද ආයෝජන ඉහළ යෑම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සපයන ලද රජයේ ඇපකර යටතේ පැවති විදේශ විනිමය ණය රජයට පැවරීම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසර තුළ දී රුපියල් බිලියන 1,870.1ක ඉහළ යෑමක් වාර්තා කරන ලදී. එසේ වුව ද, ප්‍රධාන වශයෙන් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය අඩු කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ද්‍රවශීලතා තත්ත්ව ක්‍රමානුකූලව වැඩිදියුණු වීම සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම භාවිතා කිරීම අඩු වීම හේතුවෙන් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසර තුළ දී රුපියල් බිලියන 1,056.3ක සංකෝචනයක් වාර්තා කරන ලදී. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍යන සීමා කිරීම් සමඟ මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන ලබා දීම නැවත්වීම මෙන්ම මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය අඩු කිරීම කෙරෙහි ඇති කැපවීම, මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය අඩු වීමට හේතු විය. මේ අතර, මූල්‍ය සමීක්ෂණය ($M_4$)[18] යටතේ 2023 වසරේ දී රජය වෙත ලබා දුන් ශුද්ධ ණයෙහි ඉහළ යෑම රුපියල් බිලියන 1,038.6ක් වූ අතර එයින් රුපියල් බිලියන 140.7ක් බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් ද රුපියල් බිලියන 84.0ක් බලපත්‍රලාභී මුදල් සමාගම් මගින් ද විය.

### 1.3.4 මුදල් සමස්ත

**2023 වසරේ දී සංචිත මුදල්වල සුළු පහළ යෑමක් වාර්තා වුව ද මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් 2023 වසරේ මුල් කාලයේ සිට සංචිත මුදල්වල ඉහළ විචලන දක්නට ලැබුණි.** බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීම සීමා කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විවිධ කාල පරාසයන් තුළ මහ බැංකුවේ විශාල අතිරික්ත සංචිත පවත්වා ගැනීමට පෙළඹිණි. මෙමගින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙනයන තැන්පතුවල දෛනික විචලන ඇති වූ අතර ඒ හේතුවෙන් සංචිත මුදල්වල විචලන වාර්තා විය. 2023 අගෝස්තු මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පදනම් අංක 200කින් අඩු කිරීමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගත යුතු තැන්පතු සැලකිය යුතු ලෙස අඩු වූ නමුත් 2023 වසර තුළ දී නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීම සඳහා පැනවූ සීමා තවදුරටත් පැවතීම හේතුවෙන් එම තැන්පතුවල විචලන අඛණ්ඩව පැවතිණි. මේ අතර, 2023 අප්‍රේල් මස උත්සව සමයෙන් පසු සැලකිය යුතු ලෙස අඩු වූ සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය පිළිබඳව පැවති අවිනිශ්චිතතා පිළිබිඹු කරමින් 2023 ජූනි මස අවසානය වන විට යම් ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, දේශීය ණය ප්‍රශස්තකරණය පිළිබඳව මහජනතාව වඩාත් හොඳින් දැනුම්වත් වීමත් සමඟ, 2023 ජූලි මස මැද සිට මන්දගාමීව වුව ද බැංකු පද්ධතියට ව්‍යවහාර මුදල් ආපසු ලැබීම දක්නට ලැබිණි. පෙර වසරවල දී මෙන්ම උත්සව සමයේ ව්‍යවහාර මුදල් සඳහා පවතින ඉල්ලුම හේතුවෙන් 2023 වසර අවසානය වන විට සංසරණයේ පවතින

18 මූල්‍ය සමීක්ෂණය මුදල් සැපයුම පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුළුව සියලුම තැන්පතු බාරගන්නා ආයතන ආවරණය කරනු ලබයි.

1

1.8 සංඛ්‍යා සටහන

## මුදල් සමස්තවල ප්‍රවණතා

රුපියල් බිලියන

| අයිතමය | 2019 අවසානයට | 2020 අවසානයට | 2021 අවසානයට | 2022 අවසානයට | 2023 අවසානයට (අ) |
|---|---|---|---|---|---|
| 1. සංචිත මුදල් | 933 | 964 | 1,306 | 1,349 | 1,329 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | -3.0 | 3.4 | 35.4 | 3.3 | -1.5 |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | 896 | 527 | -387 | -1,614 | -837 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | 37 | 438 | 1,693 | 2,963 | 2,166 |
| 2. පටු මුදල් සැපයුම ($M_1$) | 865 | 1,177 | 1,460 | 1,454 | 1,658 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 4.2 | 36.0 | 24.0 | -0.4 | 14.1 |
| 3. පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 7,624 | 9,406 | 10,647 | 12,290 | 13,189 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 7.0 | 23.4 | 13.2 | 15.4 | 7.3 |
| 3.1 ශුද්ධ විදේශීය වත්කම් | 101 | -209 | -982 | -1,767 | -456 |
| මුදල් අධිකාරීන් (ආ) | 896 | 527 | -387 | -1,614 | -837 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -795 | -736 | -595 | -153 | 381 |
| 3.2 ශුද්ධ දේශීය වත්කම් | 7,523 | 9,615 | 11,629 | 14,056 | 13,645 |
| දේශීය ණය | 9,411 | 11,721 | 14,002 | 16,632 | 16,421 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 2,796 | 4,548 | 5,832 | 7,471 | 8,285 (ඇ) |
| මහ බැංකුව | 363 | 869 | 2,094 | 3,432 | 2,376 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 2,433 | 3,679 | 3,738 | 4,039 | 5,909 |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය | 818 | 1,002 | 1,188 | 1,750 (ඇ) | 770 (ඇ) |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 5,797 | 6,171 | 6,981 | 7,411 (ඇ) | 7,366 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 4.2 | 6.5 | 13.1 | 6.2 | -0.6 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -1,887 | -2,106 | -2,373 | -2,576 | -2,776 |
| 4. පුළුල් මුදල් සැපයුම ($M_4$) | 9,445 | 11,462 | 12,985 | 14,840 | 15,829 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 8.2 | 21.4 | 13.3 | 14.3 | 6.7 |
| 4.1 ශුද්ධ විදේශීය වත්කම් | 89 | -217 | -999 | -1,767 | -456 |
| මුදල් අධිකාරීන් (ආ) | 896 | 527 | -387 | -1,614 | -837 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -795 | -736 | -595 | -153 | 381 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | -12 | -8 | -17 | 0 | 0 |
| 4.2 ශුද්ධ දේශීය වත්කම් | 9,356 | 11,679 | 13,984 | 16,607 | 16,285 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 3,483 | 5,366 | 6,769 | 8,469 | 9,507 (ඇ) |
| මහ බැංකුව | 363 | 869 | 2,094 | 3,432 | 2,376 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 2,433 | 3,679 | 3,738 | 4,039 | 5,909 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 614 | 742 | 845 | 881 | 1,022 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 73 | 75 | 92 | 116 | 200 |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු මගින්) | 818 | 1,002 | 1,188 | 1,750 (ඇ) | 770 (ඇ) |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 7,793 | 8,285 | 9,339 | 9,917 (ඇ) | 9,815 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 3.9 | 6.3 | 12.7 | 6.2 | -1.0 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 5,797 | 6,171 | 6,981 | 7,411 (ඇ) | 7,366 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 814 | 936 | 1,094 | 1,159 | 1,126 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,182 | 1,177 | 1,264 | 1,347 | 1,323 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,738 | -2,973 | -3,312 | -3,529 | -3,807 |
| විශේෂ සටහන්: | | | | | |
| මුදල් ගුණකය ($M_{2b}$) | 8.18 | 9.75 | 8.15 | 9.11 | 9.93 |
| සංසරණ ප්‍රවේගය ($M_{2b}$ සාමාන්‍ය) (ඉ) | 2.16 | 1.84 | 1.73 | 2.04 (ඇ) | 2.19 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.

(ඇ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

(ඇ) සංශෝධිත


(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද) මත පදනම් වේ.

ව්‍යවහාර මුදල් සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද එම ව්‍යවහාර මුදල්වලින් කොටසක් උත්සව සමයෙන් පසුව බැංකු පද්ධතියට නැවත ලැබීම ද සිදු විය. කෙසේ වෙතත්, මෑතකාලීනව බදු සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග සමඟ මුදල් මත පදනම් වූ ගනුදෙනු ඉහළ යෑම මෙන්ම තැන්පතු පොලී අනුපාතික අඩු වීම හේතුවෙන් මුදල් ළඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය අඩු වීමත් සමඟ මුදල් ළඟ තබා ගැනීමට ඇති කැමැත්ත ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉන් පසුව අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, 2023 වසර අවසානය වන විට සංචිත මුදල් රුපියල් බිලියන 1,328.7ක් දක්වා සුළු වශයෙන් අඩු වූ අතර එය වාර්ෂික ලක්ෂ්‍යමය පදනමින් සියයට 1.5ක සංකෝචනයක් විය. මේ අතර, 2024 පෙබරවාරි සහ මාර්තු මාසවල දී නිත්‍ය පහසුකම් සඳහා පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීමත් සමඟ දෛනික සංචිත මුදල්වල විචලන යම් අඩු වීමක් පෙන්නුම් කළේය.

**මහ බැංකු ශේෂ පත්‍රයේ වත්කම් අංශයෙන් සැලකූ විට, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමට වඩා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් පහළ යෑම මුළුමනින්ම හේතුවෙමින් 2023 වසරේ දී සංචිත මුදල්වල අඩු වීමක් වාර්තා විය.** මහ බැංකුව විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය අඩු වීම, විශේෂයෙන් ම මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) අඩු වීම හේතුවෙන් මහ බැංකුවේ

**1.12 රූප සටහන**

**පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා තුඩු දුන් සාධක**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශුද්ධ දේශීය වත්කම් 2023 වසර තුළ දී රුපියල් බිලියන 797.2කින් අඩු විය. එසේ වුව ද, ශුද්ධ දේශීය වත්කම්හි මෙම අඩු වීම යම්තාක් දුරකට සීමා කරමින් අනෙකුත් අයිතම (ශුද්ධ) ඉහළ යෑමක් වාර්තා වූ අතර ඒ සඳහා දේශීය ණය ප්‍රශස්තකරණය හේතුවෙන් සිදු වූ පළමු දින අලාභයෙහි ප්‍රතිඵලයක් ලෙස 2023 සැප්තැම්බර් මාසයේ සිට රඳවාගත් ලාභ සෘණ අගයක් ගැනීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීම අඩු වීම හේතු විය. මේ අතර, 2021 අගෝස්තු මාසයේ සිට සෘණ අගයක් වූ මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්, විදේශීය සංචිත ඉහළ යෑමත් සමඟ මහ බැංකුවේ විදේශීය වත්කම් වැඩි වීම සහ මහ බැංකුවේ විදේශීය වගකීම් අඩු වීම පිළිබිඹු කරමින් 2023 වසරේ දී ක්‍රමයෙන් ඉහළ ගියේය. 2023 වසරේ දී මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 776.5කින් වැඩි වූ නමුත් 2023 වසර අවසානය වන විට අඛණ්ඩව සෘණ අගයක පැවතිණි.

**බැංකු පද්ධතිය විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සහ ශුද්ධ විදේශීය වත්කම් වැඩි වීම මධ්‍යයේ වුව ද බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සහ රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය සංකෝචනය වීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2023 වසරේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය අඩු මට්ටමක පැවතිණි.** විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය සහ දළ නිල සංචිත වැඩිදියුණු වීම පිළිබිඹු කරමින් විදේශීය වගකීම් පහළ යෑම සහ විදේශීය වත්කම් ඉහළ යෑම හේතුවෙන්, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් 2023 වසර තුළ දී රුපියල් බිලියන 1,310.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මහ බැංකුව මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විදේශීය වගකීම් පියවීම, බැංකු පද්ධතියේ විදේශීය වගකීම් පහළ යෑමට උපකාරී වූ අතර, බහුපාර්ශ්වික නියෝජිත ආයතනවලින් ලද ලැබීම් මෙන්ම විදේශ විනිමය සඳහා ඇති අඩු ඉල්ලුම හේතුවෙන් විදේශ විනිමය බැංකු පද්ධතිය තුළ රඳා පැවතීම, බැංකු පද්ධතියේ විදේශීය වත්කම් ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, මෙම ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික ලක්ෂ්‍යමය පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$), 2022 වසර අවසානයේ පැවති සියයට 15.4 සිට 2023 වසර අවසානය වන විට සියයට 7.3ක් දක්වා ක්‍රමයෙන් අඩු වූ අතර 2024 ජනවාරි මස අවසානය වන විට සියයට 6.4ක් දක්වා තවදුරටත් අඩු විය. $M_{2b}$ පුළුල් මුදල් සැපයුමෙහි

1

වගකීම් අංශයෙන් සැලකූ විට, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති මහජනතාව සතු කාලීන සහ ඉතුරුම් තැන්පතු වැඩි වීම 2023 වසර තුළ දී $M_{2b}$හි වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණය සඳහා සියයට 77කින් දායක විය. මේ අතර, වැඩි වූ ජීවන වියදම මධ්‍යයේ ව්‍යවහාර මුදල් වැඩි වශයෙන් ළඟ තබා ගැනීම සහ ඉල්ලුම් තැන්පතු වැඩි වීම මෙන්ම පොළී අනුපාතික අඩු වීම මගින් මුදල් ළඟ තබා ගැනීමේ හා ඉල්ලුම් තැන්පතුවල ආවස්ථික පිරිවැය අඩු වීම යම්තාක් දුරකට හේතුකොටගෙන 2023 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති මහජනතාව සතු ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවල ද ඉහළ යෑමක් වාර්තා විය. $M_{2b}$හි ප්‍රවණතාවට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් $M_4$ පුළුල් මුදල් සැපයුමේ වර්ධනය ද 2023 වසර තුළ දී අඩු මට්ටමක පැවතිණි.

## 1.4 විදේශීය අංශයේ ප්‍රවණතා

**වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී විවිධ අංශ මත ධනාත්මක වර්ධනයන් ඇති කරමින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2023 වසරේ දී ශක්තිමත් ලෙස නැවත යථා තත්ත්වයට පත් වෙමින් ඉහළ ස්ථාවරත්වයක් පෙන්නුම් කළේය.** 2023 වසරේ මාර්තු මාසයේ දී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ආරම්භ කිරීම සහ එය මේ දක්වා සාර්ථකව පවත්වාගෙන යෑම විදේශීය අංශයේ ස්ථාවරත්වය ළඟා කර ගැනීමට බෙහෙවින් උපකාරී වී ඇත. විදේශීය ජංගම ගිණුම 2023 වසරේ දී අතිරික්තයක් වාර්තා කළේය. වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීම සහ සේවා අපනයන සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ලැබීම මෙයට හේතු විය. 2023 වසරේ වෙළඳ ගිණුමේ හිඟය 2010 වසරෙන් පසු එහි අඩුම මට්ටම වාර්තා කර ඇති අතර, අපනයන ආදායම අඩු වීමට සාපේක්ෂව විශාල වශයෙන් ආනයන වියදම අඩු වීම මෙයට හේතු විය. පසුගිය වසර හතර තුළ අභියෝග ගණනාවකට මුහුණ දීමෙන් පසු සංචාරක පැමිණීම් අපේක්ෂිත මට්ටමට යථා තත්ත්වයට පත් වීමත් සමඟ සංචාරක ඉපැයීම් කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සේවා ගිණුමේ අතිරික්තය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. නොගෙවූ පොළී ද ඇතුළත් වූ විදේශීය ණය සඳහා පොළී වියදම් වැඩි වීම හේතුවෙන් උපචිත පදනම මත සම්පාදනය කරන ලද ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2023 වසරේ දී පුළුල් විය. තවද, අඛණ්ඩව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සහ නිල මාර්ග හරහා වූ ඉහළ ලැබීම් හේතුවෙන් විදේශ සේවා

**1.9 සංඛ්‍යා සටහන** ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

| ශීර්ෂය | එ.ඇ. ඩොලර් මිලියන | |
|---|---|---|
| | 2022 (අ) | 2023 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-1,448** | **1,559** |
| ලැබීම් | 20,228 | 23,780 |
| ගෙවීම් | 21,677 | 22,221 |
| **වෙළඳ ශේෂය** | **-5,185** | **-4,900** |
| අපනයන | 13,106 | 11,911 |
| ආනයන | 18,291 | 16,811 |
| **සේවා (ශුද්ධ)** | **2,110** | **3,404** |
| ලැබීම් | 3,062 | 5,416 |
| එයින්; | | |
| ප්‍රවාහන | 676 | 1,550 |
| සංචාරක | 1,136 | 2,068 |
| පරිගණක සේවා | 1,066 | 795 |
| ඉදිකිරීම් | 9 | 355 |
| ගෙවීම් | 953 | 2,012 |
| එයින්; | | |
| ප්‍රවාහන | 333 | 732 |
| සංචාරක | 244 | 152 |
| පරිගණක සේවා | 133 | 198 |
| ඉදිකිරීම් | 11 | 111 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-1,870** | **-2,564** |
| ලැබීම් | 266 | 463 |
| සේවක වැටුප් | 30 | 53 |
| ආයෝජන ආදායම් | 237 | 410 |
| කෘජු ආයෝජන | 15 | 12 |
| විවිධ ආයෝජන | - | - |
| අනෙකුත් ආයෝජන | 217 | 349 |
| ගෙවීම් | 2,136 | 3,027 |
| සේවක වැටුප් | 69 | 30 |
| ආයෝජන ආදායම් | 2,068 | 2,997 |
| කෘජු ආයෝජන | 549 | 888 |
| විවිධ ආයෝජන | 778 | 866 |
| අනෙකුත් ආයෝජන | 741 | 1,243 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **3,496** | **5,619** |
| ලැබීම් | 3,793 | 5,989 |
| එයින්; | | |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 3,789 | 5,970 |
| ගෙවීම් | 296 | 371 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **19** | **63** |
| ලැබීම් | 38 | 94 |
| ගෙවීම් | 19 | 31 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,429** | **1,622** |
| | | |
| **ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස** | | |
| වෙළඳ ශේෂය | -6.7 | -5.8 |
| භාණ්ඩ හා සේවා | -4.0 | -1.8 |
| ජංගම ගිණුම | -1.9 | 1.8 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**1.13 රූප සටහන**

**විදේශීය අංශයේ සුවිශේෂී කරුණු**


ජංගම ගිණුමේ ශේෂය, වෙළඳ ශේෂය, සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ




අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය




දළ නිල සංචිත සහ විනිමය අනුපාතිකය




වෙළඳ හිඟය මධ්‍යස්ථ වීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ නැවත ඉහළ යෑම, සංචාරක ඉපැයීම් සහ සේවා අංශය වෙත වූ අනෙකුත් ශුද්ධ ලැබීම්, 2023 වසරේ ජංගම ගිණුමේ අතිරික්තයට දායක වූ අතර, එය විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට සහ දළ නිල සංචිත ඉහළ නැංවීමට හේතු විය.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. එහෙත්, විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඩු වීමත් සමඟ මූල්‍ය ගිණුමේ ක්‍රියාකාරිත්වය අඩු මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, 2023 වසරේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් සහ කොටස් වෙළඳපොළෙන් විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් වාර්තා විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මහ බැංකුව විසින් සිදු කරන ලද කැපී පෙනෙන ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන ණය මුදාහැරීම්, සහ ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශ්වික ආයතනවලින් ලද විදේශ මූල්‍යකරණ 2023 වසර අවසාන වන විට දළ නිල සංචිත සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට උපකාරී විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ අපේක්ෂාවන් වැඩි දියුණු වීම හේතුවෙන් 2022 වසරේ දී වාර්තා වූ සැලකිය යුතු අවප්‍රමාණය වීමට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2023 වසරේ දී කැපී පෙනෙන ලෙස අතිප්‍රමාණය විය.


## 1.4.1 ගෙවුම් තුලනය


### ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

**විදේශීය ජංගම ගිණුම 2022 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,448ක හිඟයට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,559ක අතිරික්තයක් වාර්තා කළේය.** ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය කැපී පෙනෙන ලෙස පුළුල් වීම

1

**1.14 රූප සටහන** **ජංගම ගිණුමේ ශේෂය සහ එහි සංයුතිය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

හමුවේ වුව ද, විදේශීය ජංගම ගිණුමේ මෙම අතිරික්තය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 5.2ක වෙළඳ හිඟයට සාපේක්ෂව 2023 වසරේ දී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් බිලියන 4.9ක් දක්වා අඩු වීම, විශේෂයෙන් ම සංචාරක ඉපැයීම් ඇතුළු සේවා වෙළඳාමේ වර්ධනය සහ ද්විතීයික ආදායම් ගිණුමේ ඉහළ අතිරික්තය යනාදියයි.

### වෙළඳ භාණ්ඩ ගිණුම

**2023 වසරේ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2010 වසරට පසුව එහි අඩුම මට්ටමට ළඟා වූ අතර, අපනයන ආදායම පහළ යෑමට සාපේක්ෂව ආනයන වියදම විශාල වශයෙන් අඩුවීම ඒ සඳහා බොහෝ දුරට හේතු විය.** 2023 වසරේ දී අපනයන ආදායම පහළ ගිය අතර, ඒ සඳහා ඇඟලුම් අපනයන පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන සැලකිය යුතු ලෙස අඩුවීම හේතු විය. මේ අතර, ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, වැය කළ හැකි ආදායම පහළ යෑම, ආනයන සීමා කිරීම් සහ දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් ආනයන වියදම්වල සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි. ඒ අනුව, වෙළඳ ගිණුමේ හිඟය 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,185ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 4,900ක් දක්වා පහත වැටුණි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, වෙළඳ හිඟය 2022 වසරේ දී වාර්තා වූ සියයට 6.7ක සිට 2023 වසරේ දී සියයට 5.8ක් දක්වා අඩු විය. අපනයන ඒකක මිල දර්ශකය සහ ආනයන ඒකක මිල දර්ශකය යන දර්ශක දෙකම 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී ආසන්න මට්ටම්වලින් පහත වැටීම හේතුවෙන් අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය සුළු වශයෙන් පහත වැටුණි. මේ අතර,

**1.10 සංඛ්‍යා සටහන** **වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය**

| කාණ්ඩය | 2022 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | 2023 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වාර්ෂික වෙනස්වීම (%) |
|---|---|---|---|
| **අපනයන** | **13,106.4** | **11,910.7** | **-9.1** |
| කාර්මික | 10,465.3 | 9,277.7 | -11.3 |
| කෘෂිකාර්මික | 2,568.0 | 2,566.5 | -0.1 |
| බනිජ | 50.0 | 38.5 | -23.1 |
| වර්ග නොකළ | 23.2 | 28.0 | 20.8 |
| **ආනයන** | **18,291.0** | **16,811.1** | **-8.1** |
| පාරිභෝගික | 2,813.0 | 3,043.9 | 8.2 |
| ආහාර හා පාන වර්ග | 1,607.9 | 1,693.0 | 5.3 |
| ආහාර නොවන පාරිභෝගික | 1,205.1 | 1,350.9 | 12.1 |
| අන්තර් | 12,438.8 | 11,006.6 | -11.5 |
| ආයෝජන | 3,030.5 | 2,744.6 | -9.4 |
| වර්ග නොකළ | 8.8 | 16.0 | 82.9 |
| **වෙළඳ ශේෂය** | **-5,184.6** | **-4,900.4** | |
| **මුළු වෙළඳාම** | **31,397.4** | **28,721.8** | **-8.5** |

මූලයන්ඃ ශ්‍රී ලංකා රේගුව
බනිජ තෙල් අපනයනකරුවන් සහ ආනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව


අපනයන ආදායම සහ ආනයන වියදම ඇතුළත් සමස්ත වෙළඳ අගය පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 8.5කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි.

### අපනයන ක්‍රියාකාරිත්වය

**2023 වසරේ දී වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.** 2023 වසරේ දී අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 11,911ක් වාර්තා වූ අතර, එය 2022 වසරට සාපේක්ෂව සියයට 9.1ක අඩුවීමකි. අපනයනවල මෙම පහළ යෑම සඳහා ශ්‍රී ලංකාවේ අපනයන මිල දී ගන්නා ප්‍රධාන රටවල ජීවන වියදම ඉහළ යෑම හා ආර්ථික අවපාත ඇතිවීම මෙන්ම භූ-දේශපාලනික ගැටලු ආදී වූ ගෝලීය සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ඇති ඉල්ලුම අඩුවීම හේතු විය. එසේම, ඉහළ මෙහෙයුම් වියදම් සහ අන්තර් භාණ්ඩ සැපයුමට ඇති වූ බාධාවන් වැනි දේශීය සාධක ද අපනයනවල සමස්ත තරඟකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. තවද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, අපනයන ආදායම 2022 වසරේ දී වාර්තා වූ සියයට 17.1ක සිට 2023 වසරේ දී සියයට 14.1ක් දක්වා පහළ ගියේය.

**අපනයන පහත වැටීම පොදුවේ සෑම අංශයක් මතම සිදු වුව ද, අපනයන ආදායම පහළ යෑමට කාර්මික අපනයන පහළ යෑම බොහෝ දුරට දායක විය.** ශ්‍රී ලංකාවේ විශාලතම තනි අපනයන භාණ්ඩය වන රෙදිපිළි සහ ඇඟලුම් සමස්ත අපනයන ආදායම පහත වැටීමට වැඩිම දායකත්වයක් සපයමින් 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 18.0ක

**1.15 රූප සටහන** **අපනයන සංයුතිය**




පහළ යෑමක් වාර්තා කළේය. නැව් සහ ගුවන් යානා ඉන්ධනවල අඩු මිල ගණන් හේතුවෙන් 2023 වසරේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනවල කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණි. අනෙකුත් බොහෝ කාර්මික භාණ්ඩවල අපනයන ආදායම් ද මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, 2023 වසරේ දී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායමේ ඉහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී කෘෂිකාර්මික අපනයන ආදායමෙහි සුළු අඩුවීමක් වාර්තා විය. කෘෂිකාර්මික අපනයන අතරින්, ප්‍රධාන වශයෙන් තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයනවල වාර්තා වූ වර්ධනය පොල්, රබර් සහ මුහුදු ආහාර අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වය මගින් යටපත් විය. අපනයන පරිමාවේ පහළ යෑමක් තිබුණ ද තේ අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ යෑම මගින් ඉහළ අපනයන මිල ගණන්වල බලපෑම පිළිබිඹු කරයි. 2022 වසරට සාපේක්ෂව ඛනිජ අපනයන පහළ යෑමක් වාර්තා කළ අතර, 2023 වසරේ දී ටයිටේනියම් ලෝපස් අපනයනය අඩු වීම ඒ සඳහා හේතු විය.


### ආනයන ක්‍රියාකාරිත්වය

**2023 වසරේ දී ආනයන වියදම්වල කැපී පෙනෙන පහළ යෑමක් දක්නට ලැබුණි.** අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම්, ආර්ථිකයේ ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව සීමාවීම ඇතුළු කරුණු කිහිපයක් නිසා 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,811ක් දක්වා සියයට 8.1කින් පහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, ආනයන වියදම 2022 වසරේ දී වාර්තා වූ සියයට 23.8ක සිට 2023 වසරේ දී සියයට 19.9ක් දක්වා පහළ ගියේය.

**අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස ආනයන වියදම අඩු වූ අතර, ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයෙහිම ආනයන වියදම් ඉහළ ගියේය.** 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී සහල් ආනයන පරිමාව පහළ යෑම හේතුවෙන් සහල් ආනයන වියදම සැලකිය යුතු ලෙස අඩු වුව ද, සීනි, තෙල් හා මේද, කිරිපිටි වැනි අනෙකුත් බොහෝ ආහාර ආනයනය සඳහා වූ වියදම් ඉහළ

1

**1.16 රූප සටහන** **ආනයන සංයුතිය**




(අ) පරිප්පු, එණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

යෑම හේතුවෙන් එහි බලපෑම යටපත් විය. මේ අතර, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ ජංගම දුරකථන ආනයනය හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම් විශාල වශයෙන් ඉහළ ගියේය. මීට අමතරව, ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ වර්ග කර ඇති අනෙකුත් බොහෝ අයිතම සඳහා වන ආනයන වියදම 2023 වසරේ අවසාන භාගයේ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ වියදම් අඩු වූ අතර ඒ සඳහා ඇඟලුම් අපනයන අඩුවීමට සමගාමීව රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන පහළ යෑම සැලකිය යුතු ලෙස දායක විය. ආනයන පැසෙහි විශාලතම අයිතමය වන ඉන්ධන ආනයනය සඳහා වන වියදම, ප්‍රධාන වශයෙන් ඒ යටතේ ඇති සියලු නිෂ්පාදන වන බොරතෙල්, පිරිපහදු කළ ඛනිජතෙල් (එල්.පී. ගෑස් ඇතුළුව) සහ ගල් අඟුරු ආනයන මිල ගණන් අඩුවීම හේතුවෙන් පහත වැටුණ ද බොරතෙල් සහ ගල් අඟුරු ආනයන පරිමාවේ ඉහළ යෑමක් වාර්තා විය. ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම පිළිබිඹු කරමින්, අනෙකුත් බොහෝ අන්තර් භාණ්ඩ වියදම් ද 2023 වසරේ දී පහත වැටුණි. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී ආයෝජන භාණ්ඩ වලට අයත් ප්‍රධාන කාණ්ඩ තුනෙහි ම කැපී පෙනෙන අඩුවීමක් සිදුවූ අතර, ප්‍රධාන වශයෙන් ආනයන සීමා කිරීම් සහ ආර්ථික ක්‍රියාකාරකම්, විශේෂයෙන් ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම් මන්දගාමීවීම හේතුවෙන් 2023 වසරේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ (ප්‍රධාන වශයෙන් ඉංජිනේරු උපකරණ), ගොඩනැගිලි ද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ) සහ ප්‍රවාහන උපකරණ සහ ඒවායේ

**1.11 සංඛ්‍යා සටහන** **වෙළඳ මිල අනුපාතයෙහි සාරාංශය (2010=100)**

| කාණ්ඩය | වාර්ෂික වෙනස්වීම 2022/ 2023 (%) | | |
|---|---|---|---|
| | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය |
| **මුළු අපනයන** | **-9.1** | **2.4** | **-11.3** |
| කෘෂිකාර්මික අපනයන | -0.1 | -0.3 | 0.3 |
| කාර්මික අපනයන | -11.3 | 3.0 | -13.9 |
| බනිජ අපනයන | -23.1 | -15.0 | -9.5 |
| **මුළු ආනයන** | **-8.1** | **3.0** | **-10.8** |
| පාරිභෝගික භාණ්ඩ | 8.2 | -1.4 | 9.7 |
| අන්තර් භාණ්ඩ | -11.5 | 0.7 | -12.1 |
| ආයෝජන භාණ්ඩ | -9.4 | 10.6 | -18.1 |
| **වෙළඳ මිල අනුපාතය** | | | **-0.6** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බොහෝ උපකාණ්ඩවල ආනයන වියදම් අඩුවීම ඒ සඳහා හේතු විය.

### වෙළඳ මිල අනුපාතය


**අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපණය කරනු ලබන වෙළඳ මිල අනුපාතය, 2023 වසරේ දී සුළු වශයෙන් පහළ ගියේය.** අපනයන මිල සහ ආනයන මිල දර්ශක, පිළිවෙළින්, දර්ශකාංක 82.7ක් සහ දර්ශකාංක 96.6ක් දක්වා පිළිවෙළින් සියයට 11.3කින් සහ සියයට 10.8කින් පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළඳ මිල අනුපාතය 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 0.6කින් පහළ ගියේය. කාර්මික අපනයන සහ ඛනිජමය අපනයනවල මිල දර්ශක අඩු වීම, අපනයන මිල ගණන් පහළ යෑමට දායක වූ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනය කිරීමේ මිල ගණන් අඩු වීම සමස්ත ආනයන මිල දර්ශකයේ පහළ යෑමට දායක විය. කාර්මික අපනයන හැර අනෙකුත් සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල පරිමා දර්ශක පහළ ගිය අතර, පාරිභෝගික භාණ්ඩ හැර අනෙකුත් සියලුම ප්‍රධාන කාණ්ඩ සඳහා ආනයන පරිමා දර්ශක 2023 වසර තුළ ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

### වෙළඳ දිශාව

**2023 වසරේ දී සමස්ත වෙළඳ ගනුදෙනු ප්‍රමාණය පහළ යෑමට අනුකූලව බොහෝ ප්‍රධාන වෙළඳ**

1.17 රූප සටහන

## රටවල් අනුව වෙළඳ ශේෂයන්




**හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික වෙළඳාම සැලකිය යුතු ලෙස පහළ ගියේය.** ඉන්දියාව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරු ලෙස අබණ්ඩව කටයුතු කළ අතර, ඉන් අනතුරුව චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වේ. ඒ අනුව, 2023 වසරේ දී, මෙම ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් තිදෙනා සාමූහිකව ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳ ගනුදෙනු ප්‍රමාණයට සියයට 37කින් පමණ දායක විය. ඉන්දියාව සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ඡ. ඩොලර් බිලියන 4කට ආසන්න වූ අතර, චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සමස්ත වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එක් එක් රට සඳහා එ.ඡ. ඩොලර් බිලියන 3ක් ඉක්මවා ඇත. ආනයන පහළ යෑමට සමගාමීව බොහෝ රටවල් සමඟ සමස්ත ගනුදෙනු ප්‍රමාණය පහළ ගියේය. 2023 වසරේ දී, ප්‍රධාන රටවල් අනුව වෙළඳ ශේෂයන් බොහෝදුරට නොවෙනස්ව පැවති අතර, එහිදී, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉතාලිය, ජර්මනිය සහ නෙදර්ලන්තය සමඟ සැලකිය යුතු වෙළඳ අතිරික්තයන් වාර්තා කළ අතර චීනය, ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මැලේසියාව සහ සිංගප්පූරුව සමඟ සැලකිය යුතු වෙළඳ හිඟයන් වාර්තා කළේය.

### විදේශ වෙළඳ ප්‍රතිපත්ති, ප්‍රවණතා සහ ආයතනික සහාය

**2023 වසරේ දී වෙළඳ අංශයේ මන්දගාමී වූ කාර්යසාධනය හමුවේ වුව ද, වෙළඳ ප්‍රතිපත්ති ක්ෂේත්‍රය නව ගම්‍යතාවයකින් ඉදිරියට ගමන් කළේය.** 2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක නොවූ නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා 2023 වසරේ දී කඩිනම් කිරීම සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) 2024 වසරේ පෙබරවාරි මාසයේ දී අත්සන් කළේය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන්හි හිතකර වර්ධනයත් සමඟ 2020-2022 කාලපරිච්ඡේදය තුළ පනවන ලද බොහෝ ආනයන සීමා කිරීම් 2023 වසරේ දී ලිහිල් කරන ලදී. ඒ අනුව, තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම මත මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මාසයේ දී පනවා තිබූ සියයට 100ක ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවය 2023 වසරේ මැයි මාසයේ දී ඉවත් කරන ලදී. මේ අතර, තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන තාවකාලිකව තහනම් කිරීමේ ආනයන සීමා කිරීම් ද 2023 වසරේ ජූනි, ජූලි සහ ඔක්තෝබර් මාසයන්හි දී රජය විසින් ක්‍රමයෙන් ලිහිල් කරන ලදී. ඉන් පසුව මෝටර් රථ පමණක් තාවකාලිකව තහනම් කරන ලද ලැයිස්තුවේ ඉතිරි විය. 2022 වසරේ මැයි මාසයේ දී ගෙවීම් ක්‍රම සඳහා, ප්‍රධාන වශයෙන් විවෘත ගිණුම් භාවිතය සඳහා පනවන ලද සීමා කිරීම් 2023 වසර පුරා පැවතියද, පිළිගැනීම මත ලේඛන (Documents against Acceptance-DA) සහ ගෙවීම් මත ලේඛන (Documents against Payment-DP) ගෙවීම් ක්‍රම යටතේ ආනයන සඳහා වාණිජ බැංකුවලින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය 2024 වසරේ පෙබරවාරි මාසයේ දී ඉවත් කළේය.

**ශ්‍රී ලංකාව සිය සිව්වන ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම තායිලන්තය සමඟ අත්සන් කළ අතර තවත් නිදහස් වෙළඳ ගිවිසුම් කිහිපයක සාකච්ඡා කඩිනම් වී ඇත.** ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ තෙවැනි වටයේ සාකච්ඡා 2023 වසරේ ජනවාරි මාසයේ දී නැවත ආරම්භ කරන ලද අතර, 2023 වසරේ නොවැම්බර් මාසයේ පැවති 8වන වටයේ දී සාකච්ඡා අවසන් විය. මෙම පුළුල් නිදහස් වෙළඳ ගිවිසුම භාණ්ඩ හා සේවා වෙළඳාම යන දෙඅංශයට අමතරව ආයෝජන, රේගු ක්‍රියාපටිපාටි, බුද්ධිමය දේපළ හිමිකම් ආදී වූ අංශ ආවරණය කරයි. ඉන්දියාව සමඟ ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) පිළිබඳ සාකච්ඡා 12වන වටය සඳහා 2023 වසරේ ඔක්තෝබර් මාසයේ ශ්‍රී ලංකාවේ දී නැවත ආරම්භ කළ අතර 13වන වටය 2024 වසරේ ජනවාරි මාසයේ දී පැවැත්විණි. ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම මගින් ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් ගිවිසුමට (ISFTA) සාපේක්ෂව පුළුල් විෂය පථයක් ආවරණය වේ. මෙම සාකච්ඡා මගින් වත්මන් භාණ්ඩ වෙළඳාම, තාක්ෂණ සහයෝගීතාව,

1

1.12 සංඛ්‍යා සටහන

## ශ්‍රී ලංකාව වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන

| වරණීය ගිවිසුම | 2022 | 2023 (අ) | | |
|---|---|---|---|---|
| | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වර්ධනය (%) | දායකත්වය (%) |
| වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රම | 4,314.7 | 3,803.5 | -11.8 | 79.7 |
| එයින් යුරෝපා සංගමය (ජී. එස්.පී. ප්ලස් සහිතව) | 2,440.3 | 2,094.5 | -14.2 | 43.9 |
| ඇමෙරිකා එක්සත් ජනපදය (ආ) | 719.0 | 663.4 | -7.7 | 13.9 |
| එක්සත් රාජධානිය | 659.0 | 562.4 | -14.7 | 11.8 |
| රුසියානු සමූහාණ්ඩුව (ඇ) | 125.7 | 127.9 | 1.7 | 2.7 |
| ඕස්ට්‍රේලියාව | 97.0 | 93.3 | -3.8 | 2.0 |
| කැනඩාව | 86.2 | 72.9 | -15.4 | 1.5 |
| ජපානය | 80.7 | 68.3 | -15.3 | 1.4 |
| තුර්කිය | 45.3 | 62.6 | 38.1 | 1.3 |
| වෙනත් ජී.එස්.පී. ක්‍රම | 61.6 | 58.2 | -5.5 | 1.2 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 561.5 | 536.4 | -4.5 | 11.2 |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඈ) | 228.4 | 213.9 | -6.4 | 4.5 |
| දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) | 75.2 | 93.2 | 23.9 | 2.0 |
| ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) | 62.5 | 79.1 | 26.7 | 1.7 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 56.6 | 46.1 | -18.6 | 1.0 |
| සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) | 1.5 | 1.1 | -24.5 | 0.0 |
| **එකතුව** | **5,300.4** | **4,773.4** | **-9.9** | **100.0** |
| **ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස** | **40.4** | **40.1** | | |

(අ) තාවකාලික

(ආ) එක්සත් ජනපදය මගින් ලබා දුන් ජී. එස්.පී සහනය 2020 වසරේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ බැවින් ජී.එස්.පී.සහනය ලැබීමට සුදුසු අපනයන පෙන්නුම් කරයි.

(ඇ) රුසියාව, බෙලාරුස් සහ කසකස්ථානය ඇතුළත් වේ.

(ඈ) පෙර මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: වාණිජ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

ආර්ථික සහයෝගීතාව, සේවා සහ ආයෝජන ලිහිල්කරණය පිළිබඳ කටයුතු පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඩු අපනයන ඉපැයීම්වලට සමගාමීව, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් ගිවිසුම, පකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) මෙන්ම අනෙකුත් බොහෝ කලාපීය වෙළඳ ගිවිසුම් යටතේ අපනයන 2023 වසරේ දී පහළ ගියේය. කෙසේ වෙතත්, මෙක්සිකෝවට කුරුඳු අපනයනය හේතුවෙන් ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) යටතේ අපනයන ඉහළ ගිය අතර, ඉන්දියාවට ගම්මිරිස් අපනයනය හේතුවෙන් දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ අපනයනය වැඩි විය. බංගලාදේශය සමඟ වරණීය වෙළඳ ගිවිසුමෙහි සාකච්ඡා වට 4ක් සම්පූර්ණ කර ඇති අතර ඉන්දුනීසියාව, මැලේසියාව සහ වියට්නාමය සමඟ වෙනත් වරණීය වෙළඳ ගිවිසුම් කිහිපයක් පිළිබඳ සාකච්ඡා ඉදිරියේ දී සිදුකිරීමට අපේක්ෂිතය. අනෙකුත් වෙළඳාම සම්බන්ධ විධිවිධානවල දී, 14 වන එක්සත් ජනපද-ශ්‍රී ලංකා වෙළඳ සහ ආයෝජන රාමුව පිළිබඳ ගිවිසුම (TIFA) කවුන්සිලයේ රැස්වීම 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී කොළඹ දී පැවැත්වුණු අතර, 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ (IORA) රැස්වීමේ දී ශ්‍රී ලංකාව 2023 වසරේ සිට 2025 වසර දක්වා කාලපරිච්ඡේදය සඳහා එම සංවිධානයේ සභාපතිත්වය භාර ගත්තේය.

**යුරෝපා සංගමය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය වෙත ඇඟලුම් සහ අනෙකුත් ප්‍රධාන අපනයන අයිතම වල අඩු කාර්යසාධනයක් තිබියදීත්, මෙම ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් විසින් පිරිනමනු ලබන වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රමවලින් (ජී.එස්.පී) ශ්‍රී ලංකාවට අඛණ්ඩව ප්‍රතිලාභ හිමිවිය.** යුරෝපා සංගමයේ ජී.එස්.පී යෝජනා ක්‍රමය 2023 වසරේ දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වීමට නියමිතව තිබූ අතර, ශ්‍රී ලංකාව දැනටමත් අනුමත කර ඇති අතිරේක ජාත්‍යන්තර සම්මුතීන් හයක් ඇතුළත් වසර 10ක නව යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වරණීය වෙළඳාම පිළිබඳ පොදු

ක්‍රමයක් (ජී.එස්.පී+), 2024 වසරේ ජනවාරි මස 01 සිට 2033 වසරේ දෙසැම්බර් මස 31 දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබුණි. කෙසේ වෙතත්, 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී, යුරෝපා කවුන්සිලය වත්මන් යුරෝපා සංගමයේ ජී.එස්.පී යෝජනා ක්‍රමයෙහි වලංගු කාලය 2027 වසර අග දක්වා දීර්ඝ කරන ලදී. එක්සත් රාජධානියේ නව ජී.එස්.පී යෝජනා ක්‍රමය වන "සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය" (DCTS) 2023 වසරේ ජූනි මාසයේ දී ක්‍රියාත්මක වූ අතර, ශ්‍රී ලංකාව වසර 3ක් සඳහා එහි වැඩි දියුණු කළ වරණීය යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිතය. 2020 වසරේ දෙසැම්බර් මස 31 දිනෙන් කල් ඉකුත් වූ එක්සත් ජනපද ජී.එස්.පී යෝජනා ක්‍රමය සඳහා තවමත් එක්සත් ජනපද රජය විසින් නැවත අවසර ලබා දී නොමැති වුව ද එක්සත් ජනපද රජයේ සාමාන්‍ය ක්‍රමවේදයන්ට අනුව අතීතයට බලපාන පදනමක් යටතේ නැවත අවසර ලැබෙනු ඇතැයි අපේක්ෂිතය. අනෙකුත් බොහෝ ජී.එස්.පී යෝජනා ක්‍රමයන් හි අපනයන කාර්යසාධනය 2023 වසර තුළ දී අඩු මට්ටමක පැවතුණි.

**2023 වසරේ දී වෙළඳ ප්‍රතිපත්ති මූලපිරීම්වල ප්‍රගතිය සඳහා ආයතනික සහයෝගය ප්‍රධාන විය.** මේ සම්බන්ධයෙන් සලකා බලන විට, සියලු ජාත්‍යන්තර වෙළඳ සාකච්ඡා පිළිබඳව කටයුතු කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ජාත්‍යන්තර වෙළඳ කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. රේඛීය ආයතන කිහිපයක ඒකාබද්ධ ප්‍රයත්න ලෙස තායිලන්ත-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා කඩිනමින් අවසන් කිරීමට ද මෙම කාර්යාලය මූලිකත්වය ගෙන කටයුතු කළේය. මේ අතර, වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ සාකච්ඡා ක්‍රියාවලීන් සඳහා සහාය දක්වන අතර ම ජී.එස්.පී යෝජනා ක්‍රම සහ දැනට පවතින අනෙකුත් නිදහස් වෙළඳ ගිවිසුම් අබණ්ඩව පවත්වාගෙන යෑමට අවශ්‍ය පියවර ගන්නා ලදී. අපනයන ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව පිළිගත් අපනයන ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම සඳහා 2023 වසරේ නොවැම්බර් මාසයේ දී ජාතික අපනයන සන්නාමය "Your Vital Island - Sri Lanka" දියත් කරන ලදී. 2022 වසර අවසානයේ දී ජාතික අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව අවසන් වූ අතර, ජාතික අපනයන ක්‍රමෝපාය ව්‍යාපෘතිය යළි නගා සිටුවීම සඳහා කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. මේ අතර, ශ්‍රී ලංකා රේගුව 2024-2028 කාලපරිච්ඡේදය සඳහා උපාය මාර්ගික ක්ෂේත්‍ර හතරක් වන ආදායම, වෙළඳ පහසුකම් සැලසීම, පාරිසරික සමාජ ආරක්ෂණය සහ ආයතනික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් සිය උපායමාර්ගික සැලැස්ම ආරම්භ කළේය. ආයෝජන සහ අපනයන ප්‍රවර්ධනය සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධ කිරීමේ අපේක්ෂාවෙන් යුතුව ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව ස්ථාපිත කිරීම සඳහා 2023 වසරේ නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. මේ අතර, සමස්ත ප්‍රතිපත්ති මඟ පෙන්වීම සඳහා වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් නව ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරමින් පවතී. ආර්ථිකයේ වෙළඳ අංශයෙහි තිරසාර සංවර්ධනයට මෙවැනි මූලපිරීම් වැදගත් වේ.

### සේවා ගිණුම

**සේවා ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය.** සේවා ගිණුමේ අතිරික්තය 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,110ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,404ක් විය. සංචාරක, ප්‍රවාහන, ඉදිකිරීම් සහ විදුලි සන්දේශ සේවා යන අංශ ඇතුළු සේවා අංශයේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. රක්ෂණ සහ විශ්‍රාම වැටුප් සේවා හා අනෙකුත් ව්‍යාපාරික සේවා වෙත වූ ශුද්ධ ලැබීම් මධ්‍යස්ථව පැවති අතර, පරිගණක සේවා ඇතුළු අනෙකුත් උප අංශ වෙත වූ ලැබීම් සැලකිය යුතු ලෙස අඩු විය. 2023 ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) යොදා ගනිමින් දත්ත රැස් කිරීම ආරම්භ කළ මහ බැංකුව, 2024 ජනවාරි මාසයේ දී පළමු වරට ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මත පදනම්ව සේවා අංශයේ දත්ත මාසිකව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය. තවද මෙම පද්ධතිය යටතේ, පරිගණක සේවා, ගුවන් ප්‍රවාහනය, මුහුදු ප්‍රවාහනය, ඉදිකිරීම් සේවා වැනි අංශයන් හි දැනටමත් පවතින දත්තවල සැලකිය යුතු වැඩි දියුණු කිරීමක් සිදු විය. සංචාරක ව්‍යාපාරය 2022 වසරේ දී වාර්තා වූ සංචාරක පැමිණීම් මෙන් දෙගුණයකටත් වඩා වර්ධනය වීම මගින් 2023 වසරේ දී සංචාරක පැමිණීම් 1,487,303ක් වාර්තා කරමින් අබණ්ඩව යථා තත්ත්වයට පත් විය.

1

ඒ අනුව, සංචාරක ඉපැයීම් ද 2022 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,136ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,068ක් දක්වා වැඩි විය.

### ප්‍රාථමික ආදායම් ගිණුම

**ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2023 වසරේ දී පුළුල් විය.** ආසියානු නිශ්කාෂණ සංගමයේ නොපියවා ඉතිරිව ඇති වගකීම් මෙන්ම සහ බංගලාදේශ බැංකුව සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇති ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට අදාළව මහ බැංකුව විසින් සිදු කරන ලද පොලී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම් අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස නොගෙවා උපචිත වූ පොලී ගෙවීම් ද ඇතුළුව සියලුම පොලී වියදම් ප්‍රධාන වශයෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් සඳහා දායක විය. ඒ අනුව, ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,870ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,564ක් විය. වසර තුළ ඍජු ආයෝජන ව්‍යාපාර විසින් ගෙවන ලද ලාභාංශ ඉහළ ගිය ද, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී ප්‍රතිආයෝජිත ඉපැයීම්වල වැඩි වීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, ණය සුරැකුම්පත් මත පොලී ගෙවීම් එකම මට්ටමේ නොවෙනස්ව පැවතුණි. එසේ වුව ද, විශේෂයෙන් ම ඉන්දියානු සංචිත බැංකුවේ ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම සහ ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ නොගෙවූ වගකීම් එකතු කරමින් සකස් කළ නව විදේශ විනිමය හුවමාරු පහසුකම හේතුවෙන් රජයේ සහ මහ බැංකුවේ නොගෙවූ හිඟ මුදල් ද ඇතුළුව, විදේශීය ණය සඳහා පොලී ගෙවීම්වල කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබුණි. මේ අතර, 2023 වසර තුළ දළ නිල සංචිතවල කැපී පෙනෙන වර්ධනයත් සමඟ සංචිත වත්කම් තුළින් ලත් ආදායම ඉහළ ගියේය.

### ද්විතීයික ආදායම් ගිණුම

**2022 වසරේ දෙවන භාගයේ සිට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් අඛණ්ඩව වර්ධනය වීමත් සමඟ 2023 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය වැඩි විය.** විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් අඛණ්ඩව සිදු වීම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වැඩි වීමට හේතු විය. නිල විනිමය අනුපාතිකය සහ අවිධිමත් වෙළඳපොළෙහි පිරිනමන විනිමය අනුපාතිකය අතර පැවති ඉහළ පරතරය නිවැරදි වීම තුළින් විධිමත් මාර්ග හරහා ලැබීම් ඉහළ යෑම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් වර්ධනය වීමට සහාය විය. එබැවින්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,789ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,970ක් දක්වා සියයට 57.5කින් සැලකිය යුතු ලෙස වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ද්විතීයික ආදායම් ගිණුම 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,496ක අතිරික්තයට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,619ක අතිරික්තයක් වාර්තා කළේය.

### ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

**ප්‍රාග්ධන ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් 2023 වසරේ දී වැඩි විය.** රජය වෙත වූ ප්‍රාග්ධන ප්‍රදාන මධ්‍යස්ථ මට්ටමක පැවතිය ද, 2023 වසරේ දී රජය සහ පෞද්ගලික අංශ වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම වැඩි විය. ඒ අනුව, ප්‍රාග්ධන ගිණුම 2022 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 19ක අතිරික්තයට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 63ක අතිරික්තයක් වාර්තා කළේය.


### මූල්‍ය ගිණුම

**2023 වසරේ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම තුළ වගකීම්වල ශුද්ධ වෙනස්වීම් සහ මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් යන දෙකෙහිම කැපී පෙනෙන වර්ධනයක් වාර්තා විය.** වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2022 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,652ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,171ක වැඩිවීමක් වාර්තා කළේය. 2023 වසර තුළ මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම්වලට ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙන් ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 670ක් පමණ වූ ලැබීම් සහ ලෝක බැංකුවෙන් හා ආසියානු සංවර්ධන බැංකුවෙන් පිළිවෙලින් එ.ජ. ඩොලර් මිලියන 500ක් සහ එ.ජ. ඩොලර් මිලියන 550ක් පමණ වූ ලැබීම් ඇතුළත් විය.

### ඍජු ආයෝජන

**ඍජු ආයෝජන ව්‍යාපාර ලද විදේශීය ණය ද ඇතුළුව විදේශීය ඍජු ආයෝජන ලැබීම් වසර තුළ මධ්‍යස්ථව පැවතුණි.** හිමිකම් කොටස් ආයෝජන සහ ප්‍රතිආයෝජිත ඉපැයීම් 2023 වසරේ දී වැඩිවීමක් වාර්තා කළ ද, ඍජු ආයෝජන ව්‍යාපාර සඳහා සම්බන්ධ පාර්ශ්වයන්ගෙන් ලැබුණු ණයෙහි සැලකිය යුතු අඩුවීමක් වාර්තා විය. මේ අතර, 2023 වසරේ දී

**1.18 රූප සටහන** **මූල්‍ය ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමාගම් වෙත වූ විදේශීය ණය ලැබීම් මධ්‍යස්ථ විය. ඒ අනුව, විදේශීය ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,167ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 758ක් විය. තවද, විදේශීය ණය හැර විදේශීය සෘජු ආයෝජන 2022 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 884ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 712ක් විය. ඒ ඒ අංශ මත පදනම්ව සලකා බැලීමේ දී, ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත ලැබුණු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රධාන වශයෙන් සැපයුම් සේවා, විදුලි සංදේශ, හෝටල් සහ නිෂ්පාදන යන අංශයන්ට ලැබුණු අතර, ආයෝජන මණ්ඩලය සමඟ ලියාපදිංචි නොවූ එහෙත් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම් වෙත ලැබුණු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රධාන වශයෙන් විදුලි සංදේශ සහ ඉන්ධන, ගෑස්, හා ඛනිජ තෙල් යනාදී අංශ වෙත විය.

### විවිධ ආයෝජන

**කොළඹ කොටස් වෙළඳපොළෙහි හිමිකම් කොටස් සහ ආයෝජන අරමුදල් කොටස් ආකාරයෙන් පැවති විවිධ ආයෝජන 2023 වසර තුළ දී මධ්‍යස්ථව පැවති අතර, රාජ්‍ය සුරැකුම්පත්වල විදේශීය ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** රාජ්‍ය සුරැකුම්පත්වල විදේශීය ආයෝජනවල කැපී පෙනෙන වර්ධනයට ප්‍රධාන වශයෙන් 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ සිට තාවකාලිකව ගෙවීම් අත්හිටුවන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල උපචිත පොලී වගකීම් හේතු විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි, විශේෂයෙන් ම භාණ්ඩාගාර බිල්පත්වල අනේවාසික ආයෝජන 2023 වසරේ දී

**1.13 සංඛ්‍යා සටහන** **මූල්‍ය ගිණුම**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | |
|---|---|---|
| | 2022 (අ) | 2023 (ආ) |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-1,569** | **1,304** |
| මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | 84 | 3,474 |
| වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | 1,652 | 2,171 |
| **සෘජු ආයෝජන: වත්කම්** | **15** | **34** |
| හිමිකම් | 11 | 29 |
| ණය උපකරණ | 5 | 5 |
| **සෘජු ආයෝජන: වගකීම්** | **884** | **712** |
| හිමිකම් | 275 | 496 |
| ණය උපකරණ | 610 | 216 |
| **විවිධ ආයෝජන: වත්කම්** | **-** | **173** |
| ණය සුරැකුම්පත් | - | 173 |
| **විවිධ ආයෝජන: වගකීම්** | **370** | **931** |
| හිමිකම් | 151 | 8 |
| ණය සුරැකුම්පත් | 218 | 923 |
| රජය | 212 | 910 |
| කෙටිකාලීන (භාණ්ඩාගාර බිල්පත්) | 30 | 132 |
| දිගුකාලීන | 183 | 778 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 21 | 78 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 2 | -27 |
| ස්වෛරීත්ව බැඳුම්කර | 159 | 727 |
| අනෙකුත් අංශ | 6 | 12 |
| දිගුකාලීන | 6 | 12 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** |
| **අනෙකුත් ආයෝජන: වත්කම්** | **1,302** | **1,022** |
| මුදල් සහ තැන්පතු | 514 | 114 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 282 | 186 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 506 | 721 |
| **අනෙකුත් ආයෝජන: වගකීම්** | **398** | **528** |
| මුදල් සහ තැන්පතු | -583 | -143 |
| ණය | 385 | 1,056 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -895 | -555 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 1,492 | 171 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - |
| **සංචිත වත්කම්** | **-1,234** | **2,245** |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-139** | **-318** |
| **සමස්ත ශේෂය (ඇ)** | **-2,806** | **2,826** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 1.15 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කුපන නොගෙවීම හේතුවෙන් එකතු වන උපචිත වගකීම් සහ විදේශීය ණය මත පොලී අදාළ ණය උපකරණයේ නොපියවා ඉතිරිව පවතින වගකීමට එකතු කරන ලදී. ඒ අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි කුපන වගකීම්වලින් එ.ජ. ඩොලර් මිලියන 727ක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි උපචිත පොලී වගකීම් ලෙස වාර්තා විය. තවද, 2023 වසරේ දී රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් අනේවාසිකයින්ට නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කරවලට අදාළ උපචිත

1

පොලී වගකීම් එ.ජ. ඩොලර් මිලියන 12ක් ලෙස වාර්තා විය.

### අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම්

**මේ අතර, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට වසර තුළ දී නව වෙළඳ ණය පහසුකම් ලබා ගැනීමට නොහැකිවූ අතර, එහි වෙළඳ ණය වගකීම් වසර පුරා ආපසු ගෙවීමට අඛණ්ඩව කටයුතු කිරීමත් සමඟ වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල සැලකිය යුතු පහළ යෑමක් වාර්තා විය.** විශේෂයෙන් ම, 2023 වසරේ දී බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය ඉහළ යෑමත් සමඟ පැවති ණය ආපසු ගෙවීම හේතුවෙන් මෙන්ම නව විදේශීය ණය ගැනීම් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස, බැංකු අංශයේ විදේශීය ණය වසර තුළ දී පහත වැටුණි. මේ අතර, පෞද්ගලික සමාගම් අංශයේ ණය ගැනීම් අඛණ්ඩව සීමිතව පැවති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම අංශය වෙත වසර තුළ දී ලද ශුද්ධ ලැබීම් ඉතා සුළු අගයක් විය.

**මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 84ක සුළු ශුද්ධ වැඩිවීමකට සාපේක්ෂව, 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,474ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය.** 2022 වසරේ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් මිලියන 1,234කින් අඩු වීමට සාපේක්ෂව 2023 වසරේ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් මිලියන 2,245කින් වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මහ බැංකුව විසින් සිදු කළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් සැලකිය යුතු ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලද ණය ලැබීම් දළ නිල සංචිත වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, 2023 වසරේ දී බැංකු අංශයේ මුදල් හා තැන්පතු, වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් ඉහළ ගියේය.

## 1.4.2 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, සංචිත වත්කම් සහ සමස්ත ශේෂය


### අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**2023 වසරේ දී ශ්‍රී ලංකාවේ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිරිහීමට ලක් විය.** 2022 වසර අවසානයට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට රටේ මුළු විදේශීය වගකීම් තත්ත්වය සහ මුළු විදේශීය වත්කම් තත්ත්වය යන දෙකෙහිම කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, 2022 වසර අවසානයට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට මුළු වගකීම් තත්ත්වයෙහි වැඩිවීම මුළු වත්කම් තත්ත්වයෙහි වැඩිවීම ඉක්මවීය.

**රටෙහි නොපියවා ඉතිරිව ඇති විදේශීය වගකීම් තත්ත්වය සලකා බැලීමේ දී, ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති අන්තර්ජාතික විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි සහ ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වයන් වෙනුවට නව ණය උපකරණයක් නිකුත් කිරීම සඳහා මහ බැංකුව, ඉන්දියානු සංචිත බැංකුව සමඟ විශේෂ විදේශ විනිමය හුවමාරු ගිවිසුමකට එළැඹුණි.** මෙම උපකරණය 2023 වසර අවසානයේ දී මහ බැංකුවෙහි මුදල් සහ තැන්පතුවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය යටතේ පිළිබිඹු වූ අතර, එමගින් අනෙකුත් ගෙවිය යුතු ගිණුම් යටතේ වර්ගීකරණය කර තිබූ ආසියානු නිශ්කාෂණ සංගමයේ නොපියවා ඉතිරිව ඇති තත්ත්වය වෙනුවට මෙය ආදේශනය විය. විදේශීය සෘජු ආයෝජන අඩු වීම සහ පොදු ලැයිස්තුගත සමාගම්වල වෙළඳපොළ මිල ගණන් අඩු මට්ටමක පැවතීම හේතුවෙන් වසර තුළ දී විදේශීය සෘජු ආයෝජනවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය සුළු වශයෙන් පමණක් ඉහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල[19] ඉහළ යෑම සහ උපචිත කුපන ගෙවීම් හේතුවෙන් ණය සුරැකුම්පත්වල වගකීම් තත්ත්වය ඉහළ ගියේය. ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් රජය වෙත වූ ලැබීම් මෙන්ම රජයේ

19 ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල පදනම් වී ඇත්තේ ජාත්‍යන්තර වෙළඳපොළ මූලාශ්‍රයන්ගේ පවතින වෙළඳපොළ මිල මත වන අතර එමගින් වසර තුළ ජාත්‍යන්තර වෙළඳපොළවල ද්විපාර්ශ්වික වෙළඳාම් අනිවාර්යයෙන් නිරූපණය නොවිය හැකිය.

**1.19 රූප සටහන** **අන්තර්ජාතික ආයෝජන තත්ත්වය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**1.14 සංඛ්‍යා සටහන** **අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (සාරාංශය) (අ)**

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| ශීර්ෂය | 2022 (ආ) | | 2023 (ඇ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන** | **1,534** | **14,047** | **1,560** | **14,831** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,489 | 8,103 | 1,511 | 8,671 |
| ණය උපකරණ | 45 | 5,944 | 50 | 6,160 |
| **විවිධ ආයෝජන** | **0.1** | **4,366** | **174** | **7,744** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 332 | | 484 |
| ණය සුරකුම්පත් | 0.1 | 4,035 | 174 | 7,260 |
| **අනෙකුත් ආයෝජන** | **5,399** | **39,689** | **6,420** | **41,412** |
| මුදල් සහ තැන්පතු | 1,656 | 5,880 | 1,770 | 7,941 |
| ණය | | 29,497 | | 31,721 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 1,493 | 1,020 | 1,679 | 464 |
| අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් | 2,250 | 2,028 | 2,971 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | | 1,265 | | 1,285 |
| **සංචිත වත්කම්** | **1,898** | | **4,392** | |
| **මුළු වත්කම් / වගකීම්** | **8,830** | **58,102** | **12,546** | **63,986** |
| **ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය** | | **-49,272** | | **-51,440** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | 8,830 | 58,102 | 12,546 | 63,986 |
| කෙටිකාලීන | 7,091 | 7,957 | 9,330 | 5,516 |
| දිගුකාලීන | 1,739 | 50,145 | 3,216 | 58,471 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි සවිස්තරාත්මක සංරචක සඳහා සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය වගුව 12 පරිශීලනය කරන්න
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

නොගෙවූ විදේශීය ණයවල උපචිත පොලිය වැඩි වීම හේතුවෙන් විදේශීය ණය ඉහළ ගියේය. ඒ අනුව, 2023 වසර අවසානයේ දී රටෙහි මුළු විදේශීය වගකීම් තත්ත්වය 2022 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 58.1ක සිට එ.ජ. ඩොලර් බිලියන 64.0ක් දක්වා ඉහළ ගියේය.


**2023 වසර තුළ දී රටෙහි විදේශීය වත්කම් තත්ත්වය වර්ධනය විය.** වසර තුළ දී සංචිත වත්කම් ස්වරූපයෙන් වූ විදේශීය වත්කම් තත්ත්වය සහ බැංකු අංශයේ විදේශීය වත්කම් ඉහළ ගියේය. මහ බැංකුවේ සංචිත වත්කම් තත්ත්වය වසර තුළ දී දෙගුණයකට වඩා වැඩි විය. තවද, බැංකුවල මුදල් හා තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල වැඩි වීම හේතුවෙන් බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය ද ඉහළ ගියේය. ඒ අනුව, 2023 වසර අවසානයේ දී රටෙහි මුළු විදේශීය වත්කම් තත්ත්වය 2022 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 8.8ක සිට එ.ජ. ඩොලර් බිලියන 12.5ක් දක්වා ඉහළ ගියේය. මුළු වගකීම් තත්ත්වයේ ඉහළ යෑම මුළු වත්කම් තත්ත්වයේ ඉහළ යෑමට වඩා වැඩි වූ බැවින්, 2023 වසර අවසානයේ දී අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙන් පිළිබිඹු වන රටෙහි ශුද්ධ වගකීම් තත්ත්වය, 2022 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 49.3ක සිට එ.ජ. ඩොලර් බිලියන 51.4ක් දක්වා ඉහළ ගියේය.

### සංචිත වත්කම් තත්ත්වය

**වසර තුළ දී විදේශීය අංශයේ දක්නට ලැබුණු හිතකර වර්ධනයන් පිළිබිඹු කරමින් 2023 වසර අවසානයේ දී දළ නිල සංචිත,[20] 2022 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,898ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,392ක් දක්වා හිතකර මට්ටමකට වර්ධනය විය.** මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය මිල දී ගැනීම සහ දැනට ක්‍රියාත්මක ජා.මු. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි පළමුවන හා දෙවන වාරික ලැබීම් හා ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු මූල්‍ය සහාය වැනි අනෙකුත් විදේශ විනිමය ලැබීම්, දළ නිල සංචිත ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ දී මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වෙමින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 1,683ක් (වටිනාකම මත පදනම් වූ දිනයට අනුව) අවශෝෂණය කළ අතර, දේශීය බැංකු සමඟ ඇති කරගත් විදේශ විනිමය හුවමාරු පහසුකම් ශුද්ධ අගය මත එ.ජ. ඩොලර් මිලියන 861ක් (වටිනාකම මත පදනම් වූ දිනයට අනුව) විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් සෘජුව විදේශ විනිමය අවශෝෂණය කිරීම හරහා දළ නිල සංචිත

20 2022 සහ 2023 වසර අවසානයේ දී පැවති දළ නිල සංචිත ප්‍රමාණයට චීන මහජන බැංකුවෙන් ලද චීන යුවාන් බිලියන 10ක ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත් වූ අතර, එය පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 1,433ක් සහ එ.ජ. ඩොලර් මිලියන 1,420ක් ලෙස අගය කර ඇත.

**1.20 රූප සටහන** **සංචිත වත්කම් තත්ත්වයෙහි ප්‍රධාන සංරචක**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

**1.15 සංඛ්‍යා සටහන**

## දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| | ශීර්ෂය | 2019 | 2020 | 2021 | 2022 | 2023 (අ) |
|---|---|---|---|---|---|---|
| 1. | රජයේ විදේශීය වත්කම් | 386 | 155 | 177 | 39 | 875 |
| 2. | මහ බැංකුවේ විදේශීය වත්කම් | 7,256 | 5,510 | 2,962 | 1,858 | 3,517 |
| 3. | **දළ නිල සංචිත (1+2)** | **7,642** | **5,664** | **3,139** | **1,898** | **4,392** |
| 4. | තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම් | 2,760 | 2,856 | 2,983 | 3,976 | 4,981 |
| 5. | **මුළු විදේශීය වත්කම් (3+4) (ආ)** | **10,402** | **8,521** | **6,122** | **5,874** | **9,373** |
| 6. | සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 1,771 | 2,121 | 3,562 | 5,127 | 4,796 |
| 7. | **ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)** | **5,871** | **3,543** | **-423** | **-3,229** | **-404** |
| 8. | **සමස්ත ශේෂය (ඈ)** | **377** | **-2,328** | **-3,967** | **-2,806** | **2,826** |
| 9. | දළ නිල සංචිත මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 4.6 | 4.2 | 1.8 | 1.2 | 3.1 |
| 10. | මුළු විදේශීය වත්කම් මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 6.3 | 6.4 | 3.6 | 3.9 | 6.7 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදු කරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම්

ගොඩනැංවීම තුළින් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක අභිබවා යෑමට මහ බැංකුවට හැකි විය. බැංකු අංශයේ විදේශීය වගකීම් තත්ත්වයට වඩා ඉහළ විදේශීය වත්කම් තත්ත්වයක් වාර්තා කිරීම හේතුවෙන් බැංකු අංශයේ ශුද්ධ වත්කම් තත්ත්වය ධන මට්ටමක පැවතුණි. 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය 2022 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 3,976 සිට එ.ජ. ඩොලර් මිලියන 4,981 දක්වා ඉහළ ගියේය. ඒ අනුව, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය සංචිත 2023 වසර අවසානය වන විට කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

### සමස්ත ශේෂය

**ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස පිළිබිඹු කරන ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය, 2020 වසරේ සිට ඉහළ හිඟයන් වාර්තා කිරීමෙන් පසු, 2023 අවසානය වන විට සැලකිය යුතු ඉහළ අතිරික්තයක් වාර්තා කළේය.** මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය සැලකිය යුතු ලෙස අවශෝෂණය කර ගැනීම සහ බහුපාර්ශ්වික ආයතන වෙතින් වූ සැලකිය යුතු ලැබීම් හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස වැඩි විය. ඒ අනුව, 2023 වසර අවසානය වන විට ශුද්ධ ජාත්‍යන්තර සංචිත පෙර වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ශේෂය 2022 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 2,806ක හිඟයකට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,826ක පමණ අතිරික්තයක් වාර්තා කළේය.

### 1.4.3 විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

#### විදේශීය ණය


**වෙළඳපොළ වටිනාකම[21] අනුව ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ විදේශීය ණය 2023 වසරේ දී වැඩි විය.** 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ රජයේ විදේශීය ණය ප්‍රමාණයේ කැපී පෙනෙන වර්ධනයක් ඇති වූයේ ප්‍රධාන වශයෙන් 2022 වසරේ වාර්තා වූ සැලකිය යුතු මට්ටමේ අඩු වෙළඳපොළ අගයන්ට සාපේක්ෂව රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ අගය ඉහළ යෑම හේතුවෙනි. තවද, පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ සෘජු ආයෝජන ව්‍යාපාරවල විදේශීය ණය ප්‍රමාණයෙහි මධ්‍යස්ථ වැඩිවීමක් වාර්තා විය. මේ අතර, මහ බැංකුවේ සහ බැංකු අංශයේ විදේශීය ණය ප්‍රමාණයෙහි අඩුවීමක් වාර්තා විය.


**2023 වසරේ දී රජයේ විදේශීය ණය ප්‍රමාණයෙහි කැපී පෙනෙන වැඩිවීමක් වාර්තා විය.** රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම ඉහළ යෑම,


21 ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව අත්පොතෙහි 6වන සංස්කරණයට (BPM6) අනුව ගෙවුම් තුලන සම්පාදනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිල ප්‍රකාශන අරමුණු සඳහා විදේශීය ණය සංඛ්‍යා දත්ත 2012 වසරේ සිට වෙළඳපොළ වටිනාකම අනුව ගණනය කෙරේ.

**1.21 රූප සටහන**

## නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය




"වෙළඳපොළ වටිනාකම මත පදනම් වූ ශ්‍රී ලංකාවේ විදේශීය ණය තත්ත්වය 2023 වසර අවසානය වන විට එ.ඇ. ඩොලර් බිලියන 54.8ක් වූ අතර, එය මුහුණත වටිනාකම අනුව විදේශීය ණය තත්ත්වය ලෙස වූ එ.ඇ. ඩොලර් බිලියන 60.2ට වඩා සැලකියු යුතු ලෙස අඩු මට්ටමකි. වෙළඳපොළ වටිනාකම මත පදනම් වූ විදේශීය ණය තත්ත්වය අඩු වීමට, රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීම හේතු විය."

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල උපචිත කුපන ගෙවීම්වල වැඩි වීම, බහුපාර්ශ්වික හවුල්කරුවන්ගේ ලැබීම් හා සම්බන්ධ රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණයෙහි වැඩි වීම, රජයේ ද්වීපාර්ශ්වික විදේශීය ණයවල උපචිත පොලිය වැඩි වීම සහ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජනවල මධ්‍යස්ථ වැඩි වීම, රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වැඩි වීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගනුදෙනු කළ හැකි ණය උපකරණ සඳහා වෙළඳපොළ වටිනාකම්න් ප්‍රකාශිත රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2022 වසර අවසන් වන විට එ.ඇ. ඩොලර් බිලියන 27.5ට සාපේක්ෂව 2023 වසර අවසන් වන විට එ.ඇ. ඩොලර් බිලියන 33.1ක් විය. මුහුණත වටිනාකමට අනුව, 2023 වසර අවසන් වන විට රජයේ විදේශීය ණය ප්‍රමාණය එ.ඇ. ඩොලර් බිලියන 38.4ක් පමණ විය.

**2016 වසරේ දී ලබාගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ක්‍රමානුකූලව ආපසු ගෙවීම සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇති කරගත් විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම ආපසු ගෙවීම ආරම්භ කිරීමත් සමඟ මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සුළු වශයෙන් අඩු විය.** මේ අතර, කෙටි කාලීන සහ දිගු කාලීන ණය යන ණය දෙවර්ගයේම අඩුවීම හමුවේ, බැංකු අංශයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය පහළ ගියේය. පෞද්ගලික අංශයේ නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණයවල කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණ ද, පෞද්ගලික අංශයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වැඩි වූ අතර, රජය සතු වාණිජ ව්‍යවසායයන්හි

1

## 1.16 සංඛ්‍යා සටහන

## නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| ශීර්ෂය | 2022 (අ) | 2023 (ආ) |
|---|---|---|
| **රජය** | **27,518** | **33,117** |
| භාණ්ඩාගාර බිල්පත් (පොත් අගය මත පදනම්ව) | 31 | 210 |
| භාණ්ඩාගාර බැඳුම්කර (පොත් අගය මත පදනම්ව) | 34 | 124 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (මුහුණත වටිනාකම මත පදනම්ව) | 27 | - |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (උපචිත පොලිය ඇතුළුව වෙළඳපොළ මිල මත පදනම්ව) | 3,866 | 6,794 |
| නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (උපචිත පොලිය ඇතුළුව) | 23,562 | 25,988 |
| **මහ බැංකුව** | **6,391** | **6,081** |
| මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | 0.2 | 0.3 |
| ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් | 2,028 | - |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 1,265 | 1,285 |
| ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම | 400 | - |
| ඉන්දියානු සංචිත බැංකුවේ සහ ආසියානු නිශ්කාෂණ සංගමයේ ඒකාබද්ධ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම | | 2,451 |
| බංගලාදේශ බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම | 200 | - |
| චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම | 1,434 | 1,420 |
| විදේශ විනිමය හුවමාරු පහසුකම් සඳහා අදාළ වන උපචිත පොලිය | 3 | 20 |
| ජා.මූ. අරමුදලේ ණය | 1,062 | 904 |
| **තැන්පතු භාර ගන්නා ආයතන** | **5,370** | **4,933** |
| මුදල් සහ තැන්පතු (ඇ) | 3,843 | 4,050 |
| ණය - කෙටිකාලීන | 704 | 307 |
| ණය - දිගුකාලීන | 823 | 576 |
| **අනෙකුත් අංශ (ඈ)** | **4,443** | **4,542** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඉ) | 1,020 | 464 |
| ණය සුරැකුම්පත් (උපචිත පොලිය ඇතුළුව වෙළඳපොළ මිල මත පදනම්ව) | 78 | 132 |
| පෞද්ගලික අංශයේ සමාගම්හි ණය | 2,361 | 2,966 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථාවන්හි ණය | 985 | 980 |
| **සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඊ)** | **5,944** | **6,160** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **49,667** | **54,832** |
| **ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස** | | |
| දළ විදේශීය ණය | 64.6 | 65.0 |
| කෙටිකාලීන ණය | 9.9 | 6.0 |
| දිගුකාලීන ණය | 54.7 | 59.0 |
| **දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස** | | |
| කෙටිකාලීන ණය | 15.4 | 9.2 |
| දිගුකාලීන ණය | 84.6 | 90.8 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **අනේවාසිකයන් සතු ණය සුරැකුම්පත්-මුහුණත වටිනාකම අනුව ආංශික වර්ගීකරණය** | **11,622** | **12,615** |
| රජය | 11,447 | 12,440 |
| භාණ්ඩාගාර බිල්පත් | 34 | 233 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 36 | 130 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 27 | - |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 10,800 | 10,800 |
| අනේවාසිකයන්ට ගෙවිය යුතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කූපනවල උපචිත පොලිය | 551 | 1,278 |
| අනෙකුත් අංශ | 175 | 175 |
| **නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම** | **12,550** | **12,550** |
| අනේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය | 10,800 | 10,800 |
| නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය | 1,750 | 1,750 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(ඈ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඉ) ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(ඊ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සමාන මට්ටමක පැවතුණි. සෘජු ආයෝජන ව්‍යාපාර විසින්, සම්බන්ධ පාර්ශ්ව සමඟ ඇති කරගත් නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ද 2023 වසර තුළ දී වැඩි විය.

**රටේ විදේශීය ණය තත්ත්වය, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 2022 වසර අවසානයේ සහ 2023 වසර අවසානයේ වන විට සමාන මට්ටම් වල පැවතියේය.** රටේ විදේශීය ණය තත්ත්වය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 2022 වසර අවසාන වන විට පැවති සියයට 64.6ට සාපේක්ෂව 2023 වසර අවසාන වන විට සියයට 65.0ක් විය. තවද, කෙටිකාලීන ණය ප්‍රතිශතය වසර තුළ දී අඩුවීමක් වාර්තා කළේය. එමෙන්ම, රජයේ ණය සේවාකරණය අත්හිටුවීමත් සමඟ අනේවාසිකයන් වෙත වූ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකමෙහි වෙනසක් සිදු නොවීය.

### විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**2022 වසරේ අප්‍රේල් මාසයේ දී තෝරාගත් රජයේ ණය ගෙවීම් අත්හිටුවීම නිවේදනය කිරීමෙන් පසු 2022 සහ 2023 යන වසර දෙකේදී ම ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණය මධ්‍යස්ථව පැවතුණි.** 2019, 2020 සහ 2021 වසරවල දී වසරකට එ.ජ. ඩොලර් බිලියන 5.0කට ආසන්න සාමාන්‍යයක් වූ රටේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2022 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.5ක් දක්වා සහ 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.6ක් දක්වා ද අඩු විය. මහ බැංකුවේ විදේශීය ණය සේවාකරණ වැඩි වීම හේතුවෙන් 2023 වසරේ දී විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2022 වසරට වඩා සුළු වශයෙන් ඉහළ ගියේය. ණය සේවාකරණය අත්හිටුවීමත් සමඟ 2023 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු නොගෙවීම හේතුවෙන් 2023 වසරේ දී රජයේ විදේශීය ණය සේවාකරණය සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, 2023 වසර තුළ දී බහුපාර්ශ්වික ආයතනවල ණය ආපසු ගෙවීම සහ පොළී ගෙවීම නිසා රජයේ විදේශීය ණය සේවාකරණය ඉහළ ගියේය. මහ බැංකුව විසින් බංගලාදේශ බැංකුවට ගෙවිය යුතුව තිබූ එ.ජ. ඩොලර් මිලියන 200ක ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම ආපසු ගෙවන ලද අතර, ඉන්දියානු සංචිත බැංකුව සමඟ පවත්නා විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි

**1.17 සංඛ්‍යා සටහන** **විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2022 (අ) | 2023 (ආ) |
|---|---|---|
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **2,483** | **2,589** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **1,714** | **1,869** |
| රජය | 1,236 | 1,043 |
| ව්‍යාපෘති ණය | 845 | 1,041 |
| ණය සුරැකුම්පත් | 391 | 2 |
| මහ බැංකුව | 140 | 522 |
| ජා.මූ. අරමුදල | 140 | 172 |
| ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම් | - | 350 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන | 339 | 304 |
| විදේශීය ණය | 339 | 304 |
| **1.2 පොළී ගෙවීම්** | **769** | **720** |
| රජය | 465 | 405 |
| ව්‍යාපෘති ණය | 273 | 377 |
| ණය සුරැකුම්පත් | 192 | 28 |
| මහ බැංකුව | 57 | 118 |
| ජා.මූ. අරමුදල | 20 | 57 |
| ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම් | 36 | 60 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන | 216 | 185 |
| විදේශීය ණය | 204 | 173 |
| ණය සුරැකුම්පත් | 12 | 12 |
| ඍජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 31 | 12 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **16,169** | **17,327** |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **20,228** | **23,779** |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | |
| 4.1 ඉහත 2හි ප්‍රතිශතයක් වශයෙන් | | |
| සමස්ත අනුපාතිකය | 15.4 | 14.9 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 14.4 | 13.6 |
| 4.2 ඉහත 3හි ප්‍රතිශතයක් වශයෙන් | | |
| සමස්ත අනුපාතිකය | 12.3 | 10.9 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 11.5 | 9.9 |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 1,701 | 1,448 |
| 5.2 ඉහත 1හි ප්‍රතිශතයක් වශයෙන් | 68.5 | 55.9 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර

නොපියවා ඉතිරිව ඇති වගකීම් ප්‍රමාණය ආපසු ගෙවීම ආරම්භ කරන ලදී. තවද, 2016 වසරේ දී ආරම්භ වුණු ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි ගෙවිය යුතු වගකීම් ප්‍රමාණය ද මහ බැංකුව විසින් අඛණ්ඩව ගෙවන ලදී. 2023 වසරේ දී පෞද්ගලික අංශයේ ආයතනවල ණය සේවාකරණ ගෙවීම් 2022 වසරේ මට්ටමට ආසන්න වශයෙන් සමාන මට්ටමක පැවතුණි.

### 1.4.4 විනිමය අනුපාතිකයේ හැසිරීම

**විටින් විට යම් විචලනයන් පෙන්නුම් කළ ද 2023 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද වෙළඳපොළ පදනම් කරගත් විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් යටතේ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය.** 2022 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.8කින් අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2023 වසරේ දී සියයට 12.1කින් අතිප්‍රමාණය විය. 2023 වසරේ මුල් මාස දෙක තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 362ක පමණ අගයකට ආසන්නව ස්ථාවරව පැවතියේය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව ලබා දුන් දෛනික මාර්ගෝපදේශයට අනුව එතැන් විනිමය අනුපාතිකයක් මත පදනම්ව මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය සහ විචලන සීමාවන් ප්‍රකාශයට පත් කිරීමේ සහාය ලබමින් සැලකිය යුතු අස්ථාවරත්වයක් පෙන්වූ විනිමය අනුපාතිකය ස්ථාවර වීම හේතුවිය. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා රුපියල කැපී පෙනෙන ලෙස අතිප්‍රමාණය වීම සඳහා විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවය ඉහළ නැංවීමට සහ විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී වඩාත් නම්‍යශීලී බවක් ලබා දීමට මහ බැංකුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග උපකාරී විය. 2023 වසරේ පෙබරවාරි 27 දින සිට රුපියල්වලට පරිවර්තනය කළ අපනයන ආදායම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හා සම්බන්ධ විදේශ විනිමය මහ බැංකුවට අනිවාර්යයෙන්ම විකිණීමේ අවශ්‍යතාවයට අදාළව බලපත්‍රලාභී බැංකු වෙත පනවා තිබූ නියමයන් ක්‍රමානුකූලව ලිහිල් කිරීම ආරම්භ කළ අතර, පසුව බැංකු පද්ධතියේ විදේශ විනිමය ද්‍රවශීලතාවය ඉහළ නැංවීමේ අරමුණින් 2023 වසරේ මාර්තු 07 දින සිට බලපැවැත්වෙන පරිදි එම අවශ්‍යතාවය අවලංගු කරන ලදී. තවද, මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ වෙළඳපොළ මත පදනම් වූ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සහ විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී වැඩි නම්‍යශීලී බවක් ලබා දීම සඳහා 2023 වසරේ මාර්තු 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි විනිමය අනුපාතික පිළිබඳ දෛනික මාර්ගෝපදේශ සැපයීම මහ බැංකුව විසින් අත්හිටුවන ලදී. පසුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු වූ අතර එතැන් විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරිත්වය ඉහළ ගියේය. 2023 වසරේ මාර්තු මාසයේ ජා.මූ.

1

**1.18 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2021 | 2022 | 2023 | 2021 | 2022 | 2023 | 2022 | 2023 | 2022 | 2023 |
| යූරෝ | 226.86 | 386.93 | 358.75 | 235.10 | 339.04 | 354.11 | -41.37 | 7.86 | -30.66 | -4.26 |
| ඉන්දියානු රුපියල් | 2.69 | 4.39 | 3.90 | 2.69 | 4.11 | 3.97 | -38.59 | 12.57 | -34.57 | 3.63 |
| ජපන් යෙන් | 1.74 | 2.74 | 2.29 | 1.81 | 2.44 | 2.34 | -36.41 | 19.53 | -25.92 | 4.54 |
| බ්‍රිතාන්‍ය පවුම් | 270.60 | 437.35 | 412.61 | 273.51 | 396.89 | 407.07 | -38.13 | 5.99 | -31.09 | -2.50 |
| එක්සත් ජනපද ඩොලර් | 200.43 | 363.11 | 323.92 | 198.88 | 324.55 | 327.53 | -44.80 | 12.10 (ආ) | -38.72 | -0.91 (ආ) |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) | 280.53 | 483.24 | 434.60 | 283.18 | 431.91 | 436.88 | -41.95 | 11.19 | -34.43 | -1.14 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.


(ආ) විශ්ලේෂණාත්මක අරමුණු සඳහා, මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රුපියලේ අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම ගණනය කරනු ලබන්නේ වසර අවසාන විනිමය අනුපාතිකය මත පදනම්වය. ඒ අනුව, 2022 වසර අවසානයට සාපේක්ෂව 2023 වසර අවසානයේ පැවති විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියලේ අතිප්‍රමාණය වීමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය.

අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ආරම්භ කිරීමෙන් පසුව ඇති වූ හිතකර වෙළඳපොළ අපේක්ෂා ද විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමට උපකාරී විය.

**හිතකර වර්ධනයන් කිහිපයක් හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලේ කැපී පෙනෙන අතිප්‍රමාණය වීමක් දෙවන කාර්තුවේ දී, විශේෂයෙන් ම 2023 වසරේ මැයි මස සහ ජූනි මස මුල දී, වාර්තා විය.** අපනයන ආදායම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන වැනි විදේශ විනිමය ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස වැඩිදියුණු වූ වෙළඳපොළ ද්‍රවශීලතාවය සහ දැඩි මූල්‍ය

**1.22 රූප සටහන**


**දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීම සහ වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

තත්ත්වයන් හමුවේ ආනයන සඳහා ඇති ඉල්ලුම අඩුවීම මෙම අතිප්‍රමාණය වීමට ප්‍රධාන සාධක විය. තවද, 2023 වසරේ මැයි මාසයේ දී ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලද අයවැය සහාය සඳහා විශේෂ ප්‍රතිපත්ති මත පදනම් වූ ණය සහ 2023 වසරේ ජූනි මාසයේ දී ලෝක බැංකු මූල්‍යන යනා දී ලැබීම් වෙළඳපොළ අපේක්ෂාවන් වැඩිදියුණු කිරීමට හිතකර ලෙස බලපෑවේය. සමස්තයක් ලෙස, වසර ආරම්භයේ සිට 2023 වසරේ ජූනි මස 08 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 24.8ක ඉහළම අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. ඉන් අනතුරුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති සාපේක්ෂ දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබිඹු කරමින් 2023 වසරේ තුන්වන කාර්තුව තුළ දී ශ්‍රී ලංකා රුපියල යම් විචලනයක් සහ අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. මෙම අවප්‍රමාණය වීමේ පීඩනයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල්වලින් පියවීම හා සම්බන්ධව බැංකුවලින් ඔවුන්ගේ විදේශ විනිමය තත්ත්වය ආවරණය කිරීම සඳහා වූ ඉල්ලුම වැඩිවීම හේතුවෙන් විදේශ විනිමය ද්‍රවශීලතාව අඩු වීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 වසරේ තුන්වන කාර්තුව තුළ දී බලපෑමට ලක් වූ බැංකුවට සහ විදේශ විනිමය වෙළඳපොළට ද්‍රවශීලතා සහාය වරින් වර ලබා දෙමින් මහ බැංකුව මැදිහත් විය. කෙසේ වෙතත්, 2023 වසරේ ජූනි මාසයේ සිට ආනයන පාලන ක්‍රමයෙන් ලිහිල් කිරීම ආරම්භයේදී, ආනයන සඳහා

**1.23 රූප සටහන** **විනිමය අනුපාතික අතිප්‍රමාණය වීම / අවප්‍රමාණය වීම**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

එම පාලන ක්‍රියාත්මකව තිබූ අවධිය තුළ ගොඩනැගී තිබුණු ඉල්ලුම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇතිවනු ඇතැයි අපේක්ෂා කළ පීඩනය මගින් විශාල බලපෑමක් ඇති නොකරන ලදී. වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සේවා අංශයට වර්ධනය වූ විදේශ විනිමය ලැබීම් නිරීක්ෂණය විය. ප්‍රධාන වශයෙන් 2023 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි දෙවන වාරිකය ලැබීම සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ලෝක බැංකුවෙන් විදේශ විනිමය ලැබීම් හේතුවෙන් වෙළඳපොළ අපේක්ෂාවන් අබණ්ඩව වැඩිදියුණු විය. ඒ අනුව වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී විටින් විට යම් විචලනයන් ඇති වුව ද රුපියල අතිප්‍රමාණයවීමක් වාර්තා විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළට මහ බැංකුවේ මැදිහත්වීම හේතුවෙන් 2023 වසරේ දී ශුද්ධ පදනම මත (වෙළඳ දිනය මත පදනම්ව) එ.ජ. ඩොලර් මිලියන 1,896ක් අවශෝෂණය කර ගැනීමට හැකි විය. මෙයට එ.ජ. ඩොලර් මිලියන 2,722ක මිලදී ගැනීමක් සහ එ.ජ. ඩොලර් මිලියන 826ක සැපයුමක් ඇතුළත් විය. එහෙත්, 2022 වසරේ දී මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 2,147ක් මිල දී ගත් අතර වෙළඳපොළට එ.ජ. ඩොලර් මිලියන 2,726ක විදේශ විනිමය ප්‍රමාණයක් සපයන ලදී.


**ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාවය 2024 වසරේ දී ද අබණ්ඩව පැවතුණි.** ඒ අනුව, 2024 මාර්තු අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 7.6කින් අතිප්‍රමාණය විය. සංචාරක ඉපැයීම් හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලෙස වූ ඉහළ ලැබීම් සහ ආනයන වියදමෙහි වූ අඩු වීම මෙම අතිප්‍රමාණය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ පළමු කාර්තුව තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,200ක පමණ ශුද්ධ පදනම මත (වෙළඳ දිනය මත පදනම්ව) සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් මිල දී ගැනීමට මහ බැංකුවට හැකි වූ අතර, එය වෙළඳපොළ තුළ රුපියල අතිප්‍රමාණය වීම සඳහා වූ අධික පීඩනය වැළැක්වීමට දායක විය.

**ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් පෙර වසර සමඟ සැසඳීමේදී 2023 වසරේ දී රුපියල අනෙකුත් සියළුම මුදල් ඒකකයන්ට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස අතිප්‍රමාණය විය.** ඒ අනුව, 2023 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ (සියයට 7.9), ස්ටර්ලින් පවුම (සියයට 6.0), ජපන් යෙන් (සියයට 19.5) සහ ඉන්දියානු රුපියල (සියයට 12.6)ට සාපේක්ෂව අතිප්‍රමාණය විය. ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියලේ අගය අතිප්‍රමාණය වීමේ ඒකාබද්ධ බලපෑමත් සමඟ ශ්‍රී ලංකා රුපියල වසර තුළ දී විශේෂ ගැනුම් හිමිකම්වලට සාපේක්ෂව ද සියයට 11.2කින් අතිප්‍රමාණය විය.

### නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2023 වසර තුළ දී නාමික සඵල විනිමය අනුපාතික දර්ශක ඉහළ ගිය අතර, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක පහළ ගියේය.** මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය

**1.24 රූප සටහන** **සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) - මුදල් වර්ග 24 පැස අනුව**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

1

**1.19 සංඛ්‍යා සටහන**

**නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික**

| සඵල විනිමය අනුපාතික දර්ශක (අ) (ආ) (2017=100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍ය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍ය දර්ශකය | |
| | 2021 | 2022 | 2023 | 2021 | 2022 | 2023 | 2022 | 2023 | 2022 | 2023 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 79.65 | 47.32 | 53.66 | 78.64 | 53.99 | 53.30 | -40.59 | 13.39 | -31.34 | -1.28 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 90.51 | 79.74 | 69.84 | 84.76 | 77.49 | 71.39 | -11.90 | -12.42 | -8.58 | -7.87 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැළපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ආ) දර්ශක අනුව විනිමය අනුපාතිකය අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළ යාම/පහළ යාම මගින් පිළිවෙලින් පිළිබිඹු කෙරෙයි.

අනුපාතික දර්ශකය සියයට 10.52කින් ඉහළ ගිය අතර, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශකය සියයට 13.39කින් ඉහළ ගියේය. නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන්ගේ ඉහළ යෑම තුළින්, තෝරාගත් ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අතිප්‍රමාණය වීම සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කෙරේ. තවද, මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකය සියයට 12.87කින් පහළ ගිය අතර, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකය සියයට 12.42කින් පහළ ගියේය. සමස්තයක් ලෙස, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක දෙකම, 2017 පදනම් වර්ෂයේ පැවති මට්ටමට වඩා සැලකිය යුතු අඩු අගයක පැවති අතර, එමගින් ශ්‍රී ලංකා රුපියලේ අඛණ්ඩ තරඟකාරීත්වය පිළිබිඹු කරන ලදී.

## 1.5 මූල්‍ය අංශයේ ප්‍රවණතා

**ආර්ථික අර්බුදයෙන් පැන නැඟුණු අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුව ද, සමස්ත මූල්‍ය අංශයේ ස්ථායීතාවය 2023 වසර තුළ දී ද පවත්වා ගෙන යෑමට සමත් විය.** මූල්‍ය අංශය සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන බැංකු අංශය, අවදානම් මත බර තැබූ වත්කම්වල පහළ යෑම හේතුවෙන් ප්‍රාග්ධනය අඛණ්ඩව පවත්වාගත් අතර, රාජ්‍ය සුරැකුම්පත්වල සිදු කරන ආයෝජන වැඩි කිරීමත් සමඟ ද්‍රවශීලතාවය නියාමන අවම මට්ටමට වඩා ඉහළින් පවත්වා ගනිමින් බැංකු අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට සමත් විය. තවද, 2022 වසරට සාපේක්ෂව 2023 වසර තුළ දී, 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් පෙන්නුම් කරන ණය පැහැර හැරීමේ අවදානම වැඩි වූ අතර බැංකු අංශයේ මුළු වත්කම් සහ ලාභදායීත්වය වැඩිදියුණු විය. එමෙන්ම, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශයේ වත්කම් පදනම ද වැඩිදියුණු වූ අතර, එම අංශයේ ණය පැහැර හැරීමේ අවදානම 2023 වසරේ දී 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතයට අනුව වැඩි වීමක් වාර්තා කළේය. ඒ අනුව, 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් පිළිබිඹු වන ඉහළ ණය අවදානම බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් යන අංශ දෙකෙහිම අවදානම් සාධකයක් ලෙස පැවතිණි. මේ අතර, දිගුකාලීන සහ සාමාන්‍ය උපප අංශ ඇතුළත් රක්ෂණ අංශය වසර තුළ විචල්‍යමය මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කළේය. මූල්‍ය වෙළඳපොළ තුළ, දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා හිඟය වසර අවසන් වන විට සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්වය වැඩිදියුණු විය. තවද, රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකය, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ යන දෙකෙහිම පහත වැටීමක් වාර්තා කළේය. මිල දර්ශක, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සහ දෛනික පිරිවැටුම අනුව ගත් කල දේශීය කොටස් වෙළඳපොළ එකිනෙකට වෙනස් කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී විදේශීය සහභාගීත්වය තවදුරටත් අඩු විය. මූල්‍ය අංශයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා ශක්තිමත් මූල්‍ය යටිතල පහසුකම් සැපයීම සහතික කිරීමේ සහ මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධ ක්‍රියාකාරකම්වල මහ බැංකුව අඛණ්ඩව නිරත විය. තවද, මහ බැංකුවේ නියාමන විෂය පථය යටතේ මූල්‍ය සේවා සපයන්නන් සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීම අරමුණු කරගත් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

**විශේෂ සටහන 2**

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන - ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීමක්

2022 වසරේ සිදු වූ ඓතිහාසික සමාජ-ආර්ථික හා දේශපාලන අර්බුදයෙන් පසුව සාර්ව ආර්ථික ස්ථායීතාවය, ණය තිරසාරභාවය සහ ලෝකය සමඟ සබඳතා යළි ගොඩනැංවීම සඳහා වන සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනක් හා සම්බන්ධ වූ මූල්‍ය වැඩපිළිවෙළක් ලබා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) සමඟ සාකච්ඡා ආරම්භ කළේය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී, ජා.මූ. අරමුදලේ කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරීන් විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 2.286ක (එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) විස්තීර්ණ ණය පහසුකම යටතේ මාස 48ක වැඩපිළිවෙලක් සඳහා කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹුණි. ඉන් අනතුරුව, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ දහ හත් වැනි ජා.මූ. අරමුදල් වැඩසටහන ආරම්භ කිරීම සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණවලට සහාය වීම සඳහා රජයට අයවැය ආධාර ලෙස, 2023 වසරේ මාර්තු මස 20වන දින විස්තීර්ණ ණය පහසුකම අනුමත කරන ලදී. ඒ අනුව, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පළමු සහ දෙවන වාරික වශයෙන් සමස්ත වටිනාකම වි.ගැ.හි. මිලියන 508ක් (එ.ජ. ඩොලර් මිලියන 670ක් පමණ) පිළිවෙලින් 2023 වසරේ මාර්තු සහ දෙසැම්බර් මාසවල දී මුදා හරින ලදී. විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දක්වා ඇති ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක (Quantitative Performance Criteria - QPCs), අඛණ්ඩ කාර්යසාධන නිර්ණායක (Continuous Performance Criteria - CPCs), මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය (Monetary Policy Consultative Clause - MPCC), දර්ශක ඉලක්ක (Indicative Targets - ITs) සහ ව්‍යුහාත්මක මිණුම් දඬු (Structural Benchmarks - SBs) යනාදී නිර්ණායක භාවිතයෙන් ජා.මූ. අරමුදල සහ අදාළ බලධාරීහු විස්තීර්ණ ණය පහසුකමෙහි ප්‍රගතිය නිරන්තරයෙන් අධීක්ෂණය කරති. ශ්‍රී ලංකාව වෙනුවෙන් මෙම ඉලක්ක සපුරා ගැනීමේ වගකීම රජය සහ මහ බැංකුව වෙත පැවරී ඇත. වැඩසටහන් කාර්යසාධනය සම්බන්ධයෙන් ගත් කළ, 2023 වසරේ දෙසැම්බර් මස අවසානය සඳහා සමාජ ව්‍යදම් පිළිබඳ දර්ශක ඉලක්කය හැර සියලුම ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක සපුරා ඇති අතර, 2024 වසරේ පෙබරවාරි මස අවසානයට පෙර බොහෝ ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරාලීමට හෝ ප්‍රමාද වී සපුරා ගැනීමට හැකි විය. 2024 වසරේ මාර්තු මස 21වන දින ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය අවසන් කිරීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවකට එළඹුණි. ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් මෙම සමාලෝචනය අනුමත කළ පසු, ශ්‍රී ලංකාවට තවත් වි.ගැ.හි. මිලියන 254ක (එ. ජ. ඩොලර් මිලියන 337ක් පමණ) මූල්‍යකරණය සඳහා ප්‍රවේශය හිමිවනු ඇත.

ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ රාජ්‍ය ණය තිරසාර බව යළි ඇති කිරීම සඳහා, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් මත රැඳෙන විස්තරාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ලෙස සැලසුම් කර ඇත. මෙම සාධක අතරට ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, වඩාත් අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ණය තිරසාරභාවය යළි ඇති කිරීම අරමුණු කර ගත් ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපාය මාර්ගයක්, මිල ස්ථායීතාවය යළි ඇති කිරීමේ බහු විධ උපාය මාර්ගයක් සහ වඩාත් නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ ජාත්‍යන්තර සංචිත යළි ගොඩනැගීම, මූල්‍ය අංශයේ ස්ථායීතාවය සුරැකීමේ ප්‍රතිපත්ති, පාලනය සහ දූෂණ අවදානම් සඳහා විසඳුම් ලබා දීම ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණ සහ ආර්ථික වර්ධනය වැඩි දියුණු කරන පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළත් වේ.

දැනට පවතින ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රධාන ඉලක්ක සහ මූලිකාංග, පහත සාකච්ඡා කෙරේ.

### ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය

ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සංචිත සම්බන්ධ වගකීම් හැර මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සංචිත මට්ටම මැන බැලීම සඳහා විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකයක් වේ. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඛණ්ඩව මධ්‍යස්ථ වීම, බහුපාර්ශ්වික ණය හිමියන්ට සිදු කරනු ලැබූ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ මූලික වශයෙන් වසර තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කළ ශුද්ධ විකුණුම් හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස පහත වැටුණු බැවින් 2022 වසරේ සහ 2023 වසරේ මුල් කාලපරිච්ඡේදය තුළ දී සංචිත අඩු මට්ටමක පැවතුණි. වැඩසටහන ආරම්භයේ දී, එනම් 2023 වසරේ මාර්තු මස අවසානය වන විට, සංචිත සම්බන්ධ වගකීම් සංචිත වත්කම්වලට වඩා බෙහෙවින් වැඩි වූ නිසා ශුද්ධ ජාත්‍යන්තර සංචිත විශාල ඍණ මට්ටම්වල පැවතුණි. විස්තීර්ණ ණය පහසුකම යටතේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ මූලික අරමුණ වනුයේ වගකීම් අභිබවා දළ

1

නිල සංචිත වත්කම් වැඩි වීම සහතික කිරීම සහ එමගින් ශුද්ධ ජාත්‍යන්තර සංචිත ධනාත්මක මට්ටම්වල පවත්වා ගැනීමයි. මේ දක්වා, විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ පදනමක් මත විදේශ විනිමය මිලදී ගනිමින් සංචිත ගොඩ නැගීම අඛණ්ඩව සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ නිල සංචිත මට්ටම ද 2022 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 1.9ක සිට 2023 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 4.4ක් පමණ දක්වාත්, 2024 වසරේ මාර්තු මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.0ක් පමණ දක්වාත් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය.

**මහ බැංකුව විසින් රජයට ලබා දෙන ශුද්ධ ණය පිළිබඳ ඉලක්කය**

අතීතයේ පටන්, අනුප්‍රාප්තික රජයන් විසින් මූල්‍යන ලබා ගැනීම සඳහා මහ බැංකුව වෙත යොමු වීම, 2022 වසරේ දී උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමකට නැංවීමට බලපෑ ප්‍රධාන හේතුවක් විය. මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ණය සහ රජය විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රුපියල් තැන්පතු අතර වෙනස මගින් මහ බැංකුවෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය ගණනය කරනු ලැබේ. ජා.මූ. අරමුදලේ වැඩසටහනට පෙර, රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීමට මහ බැංකුවට නිරන්තරයෙන් සිදු විය. රජයට මහ බැංකුවෙන් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි ඕනෑම මාර්ගයක් වැළැක්වීම ජා.මූ. අරමුදලේ වැඩසටහනේ එක් ප්‍රධාන අරමුණක් වූ අතර, මෙය 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම හරහා සාක්ෂාත් කර ගන්නා ලදී. මහ බැංකුව විසින් රජයට අලුතින් මූල්‍යන සැපයීමකින් තොරව සහ මහ බැංකුවේ දැනට පවතින රජයේ සුරැකුම්පත් තොගය ක්‍රමානුකූලව අඩු කිරීම තුළින් ජා.මූ. අරමුදලේ වැඩසටහනට අනුව 2023 වසරේ දෙසැම්බර් අවසානය වන විට සපුරා ගත යුතුව තිබූ මහ බැංකුවෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය ඉලක්කය ද සාක්ෂාත් කර ගන්නා ලදී.

**මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය**

ශ්‍රී ලංකාවේ උද්ධමනය 2022 වසරේ දී ඉතිහාසයේ පෙර වාර්තා නොවූ ආකාරයේ ඉහළ මට්ටම් වාර්තා කළේය. දේශීය මිල ස්ථායීතාවය පවත්වා ගැනීමේ අරමුණට අනුකූලව ශ්‍රී ලංකාව ඉලක්කගත උද්ධමන මට්ටම සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා උද්ධමනයේ ප්‍රවණතා සමීපව නිරීක්ෂණය කිරීමට මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය පිහිටුවා ඇත. එය පෙර තීරණය කළ ඉලක්කගත දිනයන්හි දී කාර්තුමය උද්ධමනය නිරීක්ෂණය කරයි. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) (2021=100) මත පදනම්ව ගණනය කරනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කාර්තුමය සාමාන්‍ය උද්ධමනය, ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල වාර්තාවේ තාක්ෂණික අවබෝධතා ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ක්‍රමවේදයට අනුව ගණනය කිරීමේ දී 2023 වසරේ දෙසැම්බර් මස වන විට සියයට 3.0ක් විය. එබැවින්, 2023 වසරේ දෙසැම්බර් මස වාර්තා කළ උද්ධමනය මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තියෙහි දක්වා ඇති සියයට 2.0-3.5 අතර පහළ බාහිර පරාසය තුළ පැවතියේය.

**ප්‍රාථමික ශේෂ ඉලක්කය, රාජ්‍ය ආදායම සහ සමස්ත අයවැය ශේෂය**

ශ්‍රී ලංකා රජයේ ආදායම එක් රැස් කිරීම ලොව පහළම ආදායම් එක් රැස් කිරීමේ මට්ටමක් ලෙස හඳුනාගෙන ඇති අතර ඉතිහාසය පුරාවට සැලකිය යුතු ප්‍රාථමික ශේෂ හිඟයකට හේතු වී ඇත. ශ්‍රී ලංකාව ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, සමාජ ආරක්ෂණ ජාල, රාජ්‍ය ආයතන සහ රජය සතු ව්‍යවසායයන් සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඇති අවශ්‍යතා වන අතර, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ රාජ්‍ය භාණ්ඩාගාරයට ඇති බලපෑම අඩු කිරීම ඒ තුළින් අරමුණු කර ගෙන ඇත. දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන්ගේ සහාය ඇතිව රජය විසින් 2023 වසර සඳහා ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කර ඇති අතර එය 2023 වසර සඳහා ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඉලක්කගත ප්‍රාථමික හිඟය සමඟ සැසඳීමේ දී ඉතා හිතකර තත්ත්වයකි. මේ අතර, 2023 වසරේ රාජ්‍ය වියදම ඉහළ ගිය ද රාජ්‍ය ආදායමේ සැලකිය යුතු ලෙස වැඩිවීම නිසා සමස්ත අයවැය හිඟය අඩු විය.

මීට අමතරව, රජයේ බදු ආදායම ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දර්ශක ඉලක්කයක් ලෙස දක්වා ඇත. ජා.මූ. අරමුදලේ මෑතක දී අවසන් වූ වැඩසටහන් සමාලෝචනයේ දී බදු ආදායම් එකතු කිරීමේ කැපී පෙනෙන දියුණුව ඇගයීමට ලක් විය.

**අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක**

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක දෙකක් නියම කර ඇත. මේ තුළ (i) මූල්‍ය නොවන රාජ්‍ය ආයතන සහ මහ බැංකුව විසින් විදේශ ගෙවීම්වලට අදාළව උපචිත අගයන් වාර්තා නොකිරීමට වග බලා ගැනීම සහ (ii) මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් තවදුරටත් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම් සිදු නොකිරීම ද ඇතුළත් වේ. වැඩසටහනේ මෙතෙක් පැවති මෙම අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක ශ්‍රී ලංකා බලධාරීන් විසින් සපුරා ඇත. මීට අමතරව, මධ්‍යම රජයේ බදු ආදායම, මධ්‍යම රජයේ සමාජ වියදම්, ඉන්ධන සහ විදුලිය සඳහා වන වාණිජ නොවන වගකීම්වල පිරිවැය සහ භාණ්ඩාගාර ඇපකර සම්බන්ධ සීමාවන් යනාදිය සම්බන්ධ දර්ශක ඉලක්ක මෙම වැඩසටහන මගින් නියම කර ඇත. 2023 වසරේ

දෙසැම්බර් මස අවසානය වන විට සමාජ වියදම් හැර අනෙකුත් සියලුම දර්ශක ඉලක්ක, වැඩසටහන යටතේ රජය විසින් සපුරා ගන්නා ලදී.

**ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රගතිය**

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් අපේක්ෂා කරන පරිදි තිරසාර මාවතක් කරා රාජ්‍ය ණය අඩු කිරීමේ දිශානතියකට යොමු කිරීමේ අරමුණින් විදේශීය ණය සඳහා සහන ලබා ගැනීමට රජය විසින් විදේශීය ණය හිමියන් සමඟ සාකච්ඡා කරමින් සිටියි. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යුතු ප්‍රගතියක් ලබා ගෙන ඇත. 2023 වසරේ නොවැම්බර් මාසයේ දී, නිල ණය හිමියන්ගේ කමිටුව සමඟ බලධාරීන් ප්‍රතිපත්තිමය එකඟතාවකට එළඹුණු අතර, ශ්‍රී ලංකාව පිළිබඳ එහි වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා චීන අපනයන-ආනයන බැංකුව ශ්‍රී ලංකාව සමඟ මූලික එකඟතාවකට ද එළඹුණි. දැනට, වැඩසටහන් පරාමිතීන් හා සැසඳිය හැකි ආකාරයෙන් ණය ගිවිසුම්වලට එළඹීම සඳහා ශ්‍රී ලංකාව නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීන අපනයන-ආනයන බැංකුව සමඟ සමීපව කටයුතු කරයි. මේ අතර, ශ්‍රී ලංකාව විදේශීය වාණිජ ණය හිමියන් සමඟ සාකච්ඡා තුළින් සහ තොරතුරු අඛණ්ඩව හුවමාරු කර ගැනීම තුළින් මනා විශ්වාසයෙන් යුතුව සමීපව කටයුතු කරමින් සිටින අතර, ණය සඳහා ගනු ලබන පිළියම් ක්‍රියාමාර්ග පිළිබඳව ඉක්මනින් එකඟතාවකට පැමිණීම අරමුණු කර ගෙන ඇත.

මීට අමතරව, රජය විසින් 2023 වසරේ ජූලි මාසයේ දී සිය දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන දියත් කරන ලද අතර, එහි මූලික කර්තව්‍යයන් 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී අවසන් කරන ලදී. ඉදිරිපත් කර ඇති ණය හුවමාරුව රජයේ අනාගත වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතා තිරසාර මට්ටම්වලට අඩු කිරීමට දායක වන අතර රජයට සැලකිය යුතු ද්‍රවශීලතා සහනයක් ලබා දීමට යොමු විය.

**ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දඬු**

දැනට ක්‍රියාත්මක ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි රාජ්‍ය මූල්‍ය, රජය සතු ව්‍යවසායයන් සහ සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණ, මූල්‍ය අංශය සහ පාලනය වැනි ක්ෂේත්‍රවල ව්‍යුහාත්මක මිණුම් අන්තර්ගත වේ. මෙම ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරා ගැනීම සම්බන්ධයෙන් මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මහ බැංකුවට අදාළ වන ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දඬු අතරට මහ බැංකු පනත බලාත්මක කිරීම, විශාලතම රාජ්‍ය බැංකු දෙක සහ විශාලතම පෞද්ගලික අංශයේ බැංකු තුන සඳහා බැංකු නිර්ණ කිරීමේ ව්‍යායාමයේ වත්කම්වල ප්‍රමිතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම, බැංකු පද්ධතියේ ප්‍රාග්ධනය සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයන් සඳහා විසඳුම් සෙවීමට ඉදිරි දැක්ම සකස් කිරීම, සහ ප්‍රාග්ධනීකරණ සැලැස්මක් සකස් කිරීම ඇතුළත් වේ. තවද, බැංකු පනතේ සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ප්‍රමාදයකින් වුවද ලබා ගන්නා ලදී. රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්, පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන මිල නියම කිරීම සහ සූත්‍ර මත පදනම් වූ ගැළපීම් සමඟ විදුලි ගාස්තු තීරණය කිරීමේ රාමුවක් සැකසීම වැනි වැදගත් ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව වැනි දීර්ඝ කාලීනව පාඩු ලබන ආයතන ලාභදායී තත්ත්වයට වැඩි දියුණු වීමත් සමඟ මෙම උත්සාහයන් දැනටමත් සාර්ථක ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. 2024 වසරේ විසර්ජන පනතට පාර්ලිමේන්තු අනුමැතිය ලැබීම, රාජ්‍ය ඇපකරවල සීමාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5ක් දක්වා අඩු කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීම, එකතු කළ අගය මත බදු (VAT) ආපසු ගෙවීමේ ක්‍රමයක් ගොඩනැගීමේ උපාය මාර්ගයක් සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම සහ සරල කළ අගය එකතු කළ බද්ද (SVAT) සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහ බදු අනුකූලතාව සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දීම රාජ්‍ය මූල්‍ය අංශයට සම්බන්ධ මේ වන විට සපුරා ඇති ව්‍යුහාත්මක මිණුම් දඬු කිහිපයකි.

**පාලනය**

ශ්‍රී ලංකාවේ තිරසාර සහ සෑමට ප්‍රතිලාභ අත්වන ලෙස ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සහතික කිරීම සඳහා දූෂණ අවදානම් සඳහා විසඳුම් සෙවීම ඉතා වැදගත් වේ. වැඩසටහනේ ප්‍රධාන කේන්ද්‍රීය ප්‍රතිසංස්කරණයක් වන පාලනය සහ දූෂණ විරෝධී ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යෑමට ශ්‍රී ලංකාව කැපවී සිටී. මේ සම්බන්ධයෙන්, ජා.මූ. අරමුදලේ පාලන නිර්ණය පිළිබඳ ක්‍රියාවලිය සිදුකළ ආසියාවේ පළමු රට බවට පත් වෙමින් ශ්‍රී ලංකාව 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී පාලන නිර්ණ වාර්තාව ප්‍රකාශයට පත් කළේය. තවද, පාලන නිර්ණ වාර්තාවේ ප්‍රධාන නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකාව විසින් ක්‍රියාකාරී සැලැස්ම මෑතක දී ප්‍රකාශයට පත් කරන ලද අතර, මෑතක දී අවසන් වූ සමාලෝචනයේ දී ජා.මූ. අරමුදල විසින් මෙය ඇගයීමට ලක් කරන ලදී. දූෂණ අවදානම් පිළිබඳ අවධානය යොමු කිරීම, ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩනැංවීම සහ ආර්ථික වර්ධනය වඩාත් ශක්තිමත් සහ සෑමට ප්‍රතිලාභ අත්වන ආකාරයෙන් සිදු වීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට තිරසාර ප්‍රයත්නයන්ගේ අවශ්‍යතාවය ජා.මූ. අරමුදල විසින් අවධාරණය කර ඇත.

1

**1.20 සංඛ්‍යා සටහන**

**මූල්‍ය අංශයේ සමස්ත වත්කම්**

| | 2022 (අ) | | 2023 (ආ) | |
|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) |
| **බැංකු අංශය** | **23,928.0** | **76.2** | **24,611.5** | **74.1** |
| මහ බැංකුව | 4,510.3 | 14.4 | 4,205.4 | 12.7 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 17,226.3 | 54.9 | 18,121.0 | 54.6 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 2,191.4 | 7.0 | 2,285.0 | 6.9 |
| **තැන්පතු බාරගන්න අනෙකුත් මූල්‍ය ආයතන** | **1,812.1** | **5.8** | **1,914.1** | **5.8** |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,610.2 | 5.1 | 1,692.0 | 5.1 |
| සමූපකාර ග්‍රාමීය බැංකු (ඇ) | 201.2 | 0.6 | 221.3 | 0.7 |
| සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපාකාර සමිති | 0.8 | 0.0 | 0.9 | 0.0 |
| **විශේෂිත මූල්‍ය ආයතන** | **328.9** | **1.0** | **728.7** | **2.2** |
| විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | 1.0 | 0.0 | 1.2 | 0.0 |
| බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් | 9.9 | 0.0 | 11.7 | 0.0 |
| ප්‍රාථමික අලවිකරුවන් | 131.7 | 0.4 | 270.8 | 0.8 |
| කොටස් තැරැව්කරුවන් | 24.8 | 0.1 | 24.3 | 0.1 |
| එකක භාර / එකක භාර කළමනාකරණ සමාගම් | 153.5 | 0.5 | 411.6 | 1.2 |
| වෙළඳපොළ අතරමැදියන් (ඈ) | 8.0 | 0.0 | 9.1 | 0.0 |
| ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් | ලැ.නො. | ලැ.නො | ලැ.නො | ලැ.නො |
| **ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන** | **5,320.3** | **16.9** | **5,945.5** | **17.9** |
| රක්ෂණ සමාගම් | 947.3 | 3.0 | 1,086.9 | 3.3 |
| සේවක අර්ථසාධක අරමුදල | 3,491.8 | 11.1 | 3,895.1 | 11.7 |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 465.0 | 1.5 | 520.5 | 1.6 |
| අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල | 330.4 | 1.1 | 347.2 | 1.0 |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 85.9 | 0.3 | 95.8 | 0.3 |
| **එකතුව** | **31,389.4** | **100.0** | **33,199.8** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) දත්ත නොමැතිකම හේතුවෙන් 2023 වසර අවසානයේ සමූපකාර ග්‍රාමීය බැංකුවල වත්කම් පදනම ලෙස එම වසරේ තුන්වන කාර්තුවේ වත්කම් පදනම යොදාගෙන ඇත.
(ඈ) වෙළඳපොළ අතරමැදියන් ලෙස ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හැර.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
කම්කරු දෙපාර්තමේන්තුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
සණස මහා සංගමය
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
ශ්‍රී ලංකා එකක භාර සංගමය

පිළිබඳ නව රෙගුලාසි 2023 වසරේ දී නිකුත් කරන ලදී. තවද, මූල්‍ය පද්ධතියේ තත්ත්වයන් පිළිබඳ විස්තර 2023 මූල්‍ය ස්ථායීතා විවරණය මඟින් ලබාගත හැක[22].

### 1.5.1 බැංකු අංශය

**මූල්‍ය අංශයේ ප්‍රධාන අංශය වන බැංකු අංශය, 2023 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 61.5කට හිමිකම් කියමින්, අවම නියාමන අවශ්‍යතාවන්ට වඩා වැඩියෙන් පවත්වාගත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් වල සහාය ඇතිව, ආර්ථික අර්බුදයෙන් හා අහිතකර ගෝලීය තත්ත්වයන්ගෙන් පැන නැගුණු අභියෝගවලට ඔරොත්තු දීමට සමත් විය.** 2023 වසර අවසන් වන විට, බැංකු අංශය, බැංකු 30කින්, එනම් විදේශ බැංකු ශාඛා 11ක් ද ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. බැංකු අංශය විසින්, බැංකු ජාලය පුළුල් කිරීම සහ බැංකු සේවා වැඩි දියුණු කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණය සඳහා අඛණ්ඩව සහයෝගය ලබා දුන් අතර එමගින් මූල්‍ය අන්තර්ගතභාවය

22 https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/financial-system-stability-review

**1.21 සංඛ්‍යා සටහන**

## බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

| අයිතමය | 2022 (අ) | | 2023 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2022 | 2023 |
| **වත්කම්** | | | | | | |
| ණය සහ අත්තිකාරම් | 11,312.5 | 58.3 | 11,017.6 | 54.0 | 5.5 | (2.6) |
| ආයෝජන | 5,931.7 | 30.5 | 7,314.0 | 35.8 | 19.4 | 23.3 |
| වෙනත් (ඇ) | 2,172.4 | 11.2 | 2,074.4 | 10.2 | 92.1 | (4.5) |
| **වගකීම්** | | | | | | |
| තැන්පතු | 15,298.7 | 78.8 | 16,623.6 | 81.5 | 18.8 | 8.7 |
| ණය ගැනුම් | 1,871.6 | 9.6 | 1,389.0 | 6.8 | (13.9) | (25.8) |
| ප්‍රග්ධන අරමුදල් | 1,598.1 | 8.2 | 1,766.9 | 8.7 | 18.5 | 10.6 |
| වෙනත් | 648.2 | 3.3 | 626.5 | 3.1 | 52.2 | (3.4) |
| මුළු වත්කම්/වගකීම් | 19,416.6 | 100.0 | 20,406.0 | 100.0 | 15.4 | 5.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, සථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රවර්ධනය කරන ලදි. 2023 වසර තුළ දී, බැංකු ශාඛා 7ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 272ක් ස්ථාපිත කළ අතර, බැංකු ශාඛා 4ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 31ක් වසා දමන ලදි. ඒ අනුව, 2023 වසර අවසානය වන විට සමස්ත බැංකු ඒකක සංඛ්‍යාව සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව, පිළිවෙළින්, 7,517ක් සහ 6,943ක් දක්වා ඉහළ ගොස් ඇත. බැංකු අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය වසර තුළ රුපියල් බිලියන 989.4කින් ඉහළ ගිය අතර 2023 දෙසැම්බර් වන විට එය රුපියල් ට්‍රිලියන 20.0 ඉක්මවීය. 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 15.4ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, 2023 වසර අවසානයේ සියයට 5.1ක වාර්ෂික වර්ධනයක්, බැංකු අංශයේ වත්කම් වාර්තා කරන ලදි. විනිමය අනුපාතිකය අධි ප්‍රමාණය වීමත් සමඟ විදේශ මුදල් වලින් නාමනය කරන ලද ණය සහ ලැබිය යුතු දෑ සහ ආයෝජන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වීම මෙම වර්ධනයේ පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ණය සහ ලැබිය යුතු දෑ, 2022 අවසානයේ පැවති සියයට 5.5ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, 2023 අවසානයේ දී සියයට 2.6කින් වාර්ෂික සංකෝචනයකට ලක් වූ අතර, 2023 වසරේ පළමු භාගය තුළ පැවති දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙයට හේතු විය. මේ අතර, ආයෝජනවල වාර්ෂික වර්ධනය 2022 වසර අවසානයේ සියයට 19.4 සිට 2023 වසර අවසානය වන විට සියයට 23.3ක් දක්වා වැඩි විය. සලකා බලන කාලය තුළ ආයෝජනවල වර්ධනයට, වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම මත, ගණනය වන ආයෝජන රුපියල් බිලියන 828.2කින් වැඩි වීම සහ ක්‍රමක්ෂිත

**1.22 සංඛ්‍යා සටහන**

## බැංකු අංශයේ තැන්පතු සංයුතිය

| | 2022 (අ) | | 2023 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2022 | 2023 |
| ඉල්ලුම් තැන්පතු | 1,060.0 | 6.9 | 1,079.0 | 6.5 | 19.4 | 1.8 |
| ඉතුරුම් තැන්පතු | 3,713.0 | 24.3 | 4,293.0 | 25.8 | (7.4) | 15.6 |
| ස්ථාවර තැන්පතු | 10,393.0 | 67.9 | 11,042.3 | 66.4 | 32.2 | 6.2 |
| වෙනත් තැන්පතු | 133.2 | 0.9 | 209.3 | 1.3 | 12.0 | 57.2 |
| මුළු තැන්පතු | 15,299.1 | **100.0** | 16,623.6 | **100.0** | **18.8** | **8.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

1


පිරිවැය මත ගණනය වන මූල්‍ය ආයෝජන රුපියල් බිලියන 311.2කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය.

**බැංකු අංශයේ අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති තැන්පතු, 2023 වසර අවසානය වන විට මුළු ශේෂ පතු වගකීම්වලින් සියයට 81.5ක් වූ අතර, ණය ගැනීම් වල දායකත්වය සියයට 6.8ක් විය.** 2023 වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින්, කාලීන තැන්පතු සියයට 66.4ක් වූ අතර, ඉතුරුම් තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු, පිළිවෙළින්, සියයට 25.8ක් සහ සියයට 6.5ක් විය. ඒ අනුව, ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය, 2022 වසරේ පැවති සියයට 31.2ක සිට 2023 වසරේ දී සියයට 32.3ක් දක්වා ඉහළ ගියේ ය. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම්, 2022 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 301.4ක (ඍණ සියයට 13.9) පහත වැටීමට සාපේක්ෂව, 2023 දී රුපියල් බිලියන 482.5කින් (ඍණ සියයට 25.8) පහත වැටීමක් පෙන්නුම් කරන ලදි. ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීම්වල බලපෑම පිළිබිඹු කරමින් 2023 වසරේ දී විදේශ විනිමය ණය ගැනීම් සියයට 40.8කින් (එ.ජ. ඩොලර් මිලියන 514.5) අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අතර, 2023 වසරේ දී රුපියල් ණය ගැනීම් ද සියයට 19.4කින් (රුපියල් බිලියන 256.0) පහත වැටීමක් වාර්තා කරන ලදි.

**බැංකු අංශයේ ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණ, 2022 වසරේ දී වාර්තා වූ සියයට 0.6ක ඍණාත්මක වර්ධනයට (රුපියල් බිලියන 26.3ක අඩුවීම) සාපේක්ෂව 2023 වසරේ දී සියයට 15.6ක වර්ධනයක් (රුපියල් බිලියන 724.4ක වැඩිවීම) පෙන්නුම් කරන ලදි.** 2023 වසර තුළ දී ශේෂ පත්‍රයෙන් බාහිර විදේශ විනිමය මිලදී ගැනීම් (රුපියල් බිලියන 415.0), ශේෂ පත්‍රයෙන් බාහිර විදේශ විනිමය විකුණුම් (රුපියල් බිලියන 261.0), භාවිතා නොකළ ණය සීමා (රුපියල් බිලියන 118.4) සහ ලේඛිත ණය (රුපියල් බිලියන 52.3) සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ඇපකර හා බැඳුම්කර (රුපියල් බිලියන 223.8) සහ ප්‍රතිග්‍රහණ (රුපියල් බිලියන 3.8) පහළ යෑමක් වාර්තා කරන ලදි.

**1.25 රූප සටහන**

**බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2023 අවසානයට)**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


**3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් නිරූපණය කෙරෙන පරිදි, 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ ණය අවදානම ඉහළ මට්ටමක පැවතුණි.** ප්‍රධාන වශයෙන් 3 වන අදියර යටතේ පවතින ණය වැඩිවීම සහ ණය සහ ලැබිය යුතු දෑ වල සංකෝචනය හේතුවෙන්, බැංකු අංශයේ 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය, 2022 වසර අවසානයේ පැවති සියයට 11.3 ට සාපේක්ෂව 2023 වසර අවසානයේ දී සියයට 12.8 දක්වා වැඩි වූ අතර, එමගින් බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුව ද, 3 වන අදියර යටතේ පවතින ණය සඳහා වෙන් කිරීම් (භාවිතා නොකළ ණය සීමා ඇතුළුව) සියයට 18.4කින් (වාර්ෂික) වර්ධනය වීම මගින්, 2022 වසර අවසානයේ පැවති 3 වන අදියර යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය වූ සියයට 44.9 ට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී එය සියයට 49.3 දක්වා ඉහළ යෑමක් වාර්තා කළේය.

**රුපියල් වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත් වලින් නියෝජනය වන ද්‍රවශීල වත්කම්වල ඉහළ වර්ධනය හේතුවෙන්, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය (SLAR) සහ ද්‍රවශීලතා ආවරණ අනුපාත (LCRs) මගින් පෙන්නුම් කෙරෙන බැංකු අංශයේ ද්‍රවශීලතාවය 2023 වසරේ දී වර්ධනය විය.** ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය, 2023 වසර අවසානයේ දී සියයට 44.9 දක්වා වැඩි වූ අතර, එය අවම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පැවතුණි. තවද, සමස්ත වත්කම්වලට ද්‍රවශීලතා වත්කම් අනුපාතය ද 2022 වසර අවසානයේ පැවති සියයට 23.6 ට සාපේක්ෂව 2023 අවසානයේ දී සියයට 35.9 දක්වා වර්ධනය විය. 2023 වසර තුළ බැංකු අංශයේ ද්‍රවශීලතා ආවරණ අනුපාතයන්හි සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. 2023 වසර අවසානය වනවිට බැංකු අංශයේ රුපියල් සහ සියලු මුදල් ඒකක සඳහා අදාළ ද්‍රවශීලතා ආවරණ අනුපාත, පිළිවෙළින් සියයට 340.9 සහ සියයට 286.4

විය. මීට අමතරව, බැංකුවලට ප්‍රමාණවත් ලෙස ස්ථායී අරමුදල් මූලාශ්‍ර පවත්වාගැනීම සඳහා 2019 වසරේ දී හඳුන්වා දුන් ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR), 2023 අවසානයේ දී සියයට 158.4ක්ව පැවතුණු අතර, එය අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 100 ට වඩා ඉහළ අගයක පැවතුණි.

**ප්‍රධාන වශයෙන් නව ණය හානිකරණ ගාස්තු අඩුවීම හේතුවෙන් වසර තුළ දී ලාභදායීත්වය වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.** 2023 වසර තුළ බැංකු අංශයේ පොලී ආදායම සියයට 25.5කින් ඉහළ ගිය අතර, පොලී වියදම් සියයට 42.7කින් වැඩි වීම, ශුද්ධ පොලී ආදායම සියයට 4.9කින් අඩු වීමට හේතුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසර අවසානයේ සියයට 4.0ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2023 වසර අවසානයේ දී සියයට 3.6 දක්වා අඩු විය. 2023 වසර තුළ දී සේවක පිරිවැය රුපියල් බිලියන 16.8කින් වැඩි වීම සහ ණය හානිකරණ හා අනෙකුත් අලාභ වෙන්කිරීම් රුපියල් බිලියන 305.0කින් අඩු වීම හේතුවෙන් පොලී නොවන වියදම් රුපියල් බිලියන 49.2කින් වැඩිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, නියාමන වාර්තාකරණයට අනුව 2023 වසර සඳහා වන බදු පෙර ලාභය රුපියල් බිලියන 294.4ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 116.6ක ඉහළ යෑමකි. 2023 වසර තුළ දී බැංකු අංශයෙහි බදු පසු ලාභය රුපියල් බිලියන 188.9ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 22.8ක වර්ධනයකි. මෙම ලාභයෙහි වැඩිවීම, වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) අනුපාතය 2022 වසර අවසානයේ දී වාර්තා වූ

**1.26 රූප සටහන** **බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක**




මූලයා: ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 1.0 සිට 2023 වසර අවසානය වන විට සියයට 1.5 දක්වා වැඩි වීම මෙන්ම, හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) අනුපාතය 2022 වසරේ දී පැවති සියයට 10.2 සිට 2023 වසරේ දී සියයට 10.6 දක්වා වැඩි වීම තුළින් ද පිළිබිඹු විය. තවද, ප්‍රධාන වශයෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශයේ කාර්යක්ෂමතාවය 2022 වසර අවසානයේ දී සියයට 31.5 සිට 2023 වසර අවසානයේ දී සියයට 40.5 දක්වා පිරිහීමට ලක්විය.

**සමස්තයක් වශයෙන්, 2023 වසර තුළ දී, අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල වීමට බැංකු අංශය සමත්විය.** ප්‍රධාන වශයෙන්, සමස්ත ණයවල සංකෝචනය රජයේ සුරැකුම්පත්වල ආයෝජන ඉහළ යෑම, සහ ශ්‍රී ලංකා රුපියල අධි ප්‍රමාණය වීම හේතුවෙන්, 2023 වසර තුළ දී අවදානම මත බර තැබූ වත්කම් ප්‍රමාණය පහත වැටීමෙන්, 2022 වසර

**1.23 සංඛ්‍යා සටහන** **බැංකු අංශයේ ලාභදායීත්වය**


| අයිතමය | 2022 (අ) වටිනාකම (රුපියල් බිලියන) | 2022 (අ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 2023 (ආ) වටිනාකම (රුපියල් බිලියන) | 2023 (ආ) සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| **ශුද්ධ පොලී ආදායම** | **750.8** | **4.0** | **713.8** | **3.6** |
| පොලී ආදායම | 2079.4 | 11.0 | 2609.0 | 13.0 |
| පොලී වියදම | 1328.6 | 7.0 | 1895.2 | 9.4 |
| **පොලී නොවන ආදායම** | **280.6** | **1.5** | **206.8** | **1.0** |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 127.0 | 0.7 | 132.1 | 0.7 |
| **පොලී නොවන වියදම** | **324.0** | **1.7** | **373.2** | **1.9** |
| සේවක පිරිවැය | 173.2 | 0.9 | 190.0 | 0.9 |
| **ණය සහ වෙනත් අලාභ සඳහා වෙන්කිරීම්** | **468.8** | **2.5** | **163.8** | **0.8** |
| **බදු පෙර ලාභය (එකතුකළ අගය මත බදු අඩු කළ පසු)** | **177.8** | **0.9** | **294.4** | **1.5** |
| **බදු පසු ලාභය** | **153.8** | **0.8** | **188.9** | **0.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයා: ශ්‍රී ලංකා මහ බැංකුව

1

**1.27 රූප සටහන** **බැංකු අංශයේ ප්‍රාග්ධන අනුපාත**



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

අවසානයට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයෙහි දියුණුවක් වාර්තා විය. අභියෝගාත්මක ව්‍යාපාරික තත්ත්වයන් තුළින් සහ බාහිර ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම් මගින් පැන නැගිය හැකි අවදානම් හේතුවෙන් සිදුවිය හැකි අලාභ අවශෝෂණය කර ගැනීම පිණිස, උසස් තත්ත්වයේ ප්‍රාග්ධන ස්වාරක්ෂක එක්රැස් කිරීමට බැංකු දිරිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසර තුළ දී බැංකු විසින් ලාභ රඳවා ගැනීම් (රුපියල් බිලියන 82.7), නව කොටස් නිකුත් කිරීම් (රුපියල් බිලියන 18.6) සහ සංචිත ඉහළ නැංවීම් (රුපියල් බිලියන 17.2) හරහා පළමු ස්ථර ප්‍රාග්ධනය ඉහළ නංවාගෙන ඇත. වසර තුළ දී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය සියයට 8.5කින් වර්ධනය වූ අතර, එයට පළමු ස්ථර ප්‍රාග්ධනයේ සියයට 89.7ක වැඩිවීම දායක විය. මේ අතර, උපකාරක ණයකර නිකුත් කිරීම මගින් බැංකු අංශය විසින් එහි දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය ඉහළ නංවා ඇත.

### 1.5.2 බැංකු නොවන මූල්‍ය ආයතන අංශය

#### බලපත්‍රලාභී මුදල් සමාගම්

**අභිතකර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් අභියෝගවලට මුහුණ දීමට සිදු වුව ද, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය වසර පුරා ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සංචිත සමඟ ශක්තිමත්ව පැවතිණි.** මෙම අංශය විසින් වත්කම්, තැන්පතු පදනම සහ ලාභදායීත්වය අනුව වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, 3 වන අදියරෙහි ණය ඉහළ යාමෙන් පිළිඹිබු වන පරිදි, මෙම අංශයෙහි වත්කම්වල ගුණාත්මකභාවය පහත වැටිණි. 2023 වසර අවසානය වන විට, මෙම අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 33කින්[23] සමන්විත වූ අතර, මුළු වත්කම්වලින් සියයට 5.1ක් නියෝජනය කරන ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ශාඛා 1,827ක් පැවති අතර, ඉන් ශාඛා 1,198ක් (සියයට 65.6) බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබිණි. 2022 වසරේ දී පෙන්නුම් කළ සියයට 10.9ක වර්ධනයට සාපේක්ෂව, මෙම අංශයේ වත්කම් පදනම 2023 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,692.0ක් දක්වා සියයට 5.1ක

23 ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් හැර (2023 දෙසැම්බර් මස 15 වන දින, කොළඹ වාණිජ මහාධිකරණය විසින් ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමට නියම කරන ලදී).

**1.24 සංඛ්‍යා සටහන** **බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය**

| අයිතමය | රුපියල් බිලියන | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2022 (ඇ) | 2023 (ඇ) | 2022 (ඇ) | 2023 (ඇ) |
| **ප්‍රථම ස්ථරය : ප්‍රාග්ධන** | **1152.0** | **1261.6** | **100.0** | **100.0** |
| කොටස් ප්‍රාග්ධනය | 366.7 | 385.3 | 31.8 | 30.5 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 74.3 | 81.1 | 6.4 | 6.4 |
| නොබෙදූ ලාභ | 544.5 | 627.2 | 47.3 | 49.7 |
| පොදු හා අනෙකුත් සංචිත | 295.2 | 312.4 | 25.6 | 24.8 |
| වෙනත් | 67.2 | 77.2 | 5.8 | 6.1 |
| නියාමක ගැලපීම් | (195.9) | (221.6) | (17.0) | (17.5) |
| **දෙවන ස්ථරය : ප්‍රාග්ධන** | **277.7** | **290.2** | **100.0** | **100.0** |
| ප්‍රත්‍යාගණන සංචිත | 35.4 | 42.4 | 12.7 | 14.6 |
| උපකාරක ණය | 135.4 | 148.8 | 48.8 | 51.3 |
| පොදු වෙන්කිරීම් සහ වෙනත් | 107.3 | 99.6 | 38.6 | 34.3 |
| නියාමක ගැලපීම් | (0.5) | (0.6) | (0.2) | (0.2) |
| **සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම** | **1429.6** | **1551.8** | | |

(ඇ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 3**

## තිරසාර ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම

### පසුබිම

පසුගිය වසර කිහිපය තුළ පැවති අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ, බොහෝ ව්‍යාපාරික ණය ගැණුම්කරුවන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් අඩපණ වූ අතර, එය ඔවුන්ගේ ණය සේවාකරණ හැකියාවට අහිතකර අන්දමින් බලපාන ලද අතර එමගින් බලපත්‍රලාභී බැංකුවල[1] ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ද අඩාල විය. බලපත්‍රලාභී බැංකුවල අක්‍රිය ණය,[2] 2023 අග වන විට සියයට 12.8ක් දක්වා සුළු වශයෙන් අඩු වුවද, 2019 වසර අවසානයේ දී පැවති සියයට 5.2ක සිට 2023 වසරේ 3වන කාර්තුව අවසන් වන විට සියයට 13.6ක් දක්වා වැඩි වූ අතර, එකී වැඩිවීම මගින් පෙන්නුම් කරන පරිදි බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස පිරිහී ඇත. එබැවින්, එවැනි ව්‍යාපාර පුනර්ජීවනය කිරීම මගින් ආර්ථික ක්‍රියාකාරකම් සහ රැකියා අවස්ථා වැඩිදියුණු වී, එය ජාතික ආර්ථිකයේ පුනර්ජීවනයට හිතකර අන්දමින් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2019 දී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාර, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය සමඟ පැවති අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හි ඍණාත්මක බලපෑම හේතුවෙන් ණය ගෙවීමේ හැකියාව දුර්වල වී පීඩාවට පත් ණය ගැණුම්කරුවන්ට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට වරින් වර විවිධ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. දැනටමත්, බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකක ස්ථාපිත කර ඇති අතර, ණය ගැණුම්කරුවන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් නිර්ණායක, පුනර්ජීවන යාන්ත්‍රණ, ආයතනික යළි පණ ගැන්වීමේ රාමු සහ යහපාලනය පිළිබඳව බලපත්‍රලාභී බැංකුවලට මග පෙන්වීම මගින් මූලික වශයෙන් ශක්‍ය ණය ගැණුම්කරුවන් පුනර්ජීවනය කිරීමට වැඩි දියුණු කළ විෂය පථයක් සහිත වඩාත් ප්‍රමිතිගත රාමුවක් සැකසීම කාලෝචිත අවශ්‍යතාවයකි.

විවිධ හේතූන් මත ආර්ථිකයන් මන්දගාමී වීමත් සමඟ, ව්‍යාපාර පුනර්ජීවන රාමු බොහෝ රටවල පිළිගැනීමට ලක් විය. "අධිකරණයෙන් පරිබාහිර ගිවිසුම්" යනු පරිපාලන මාර්ගෝපදේශ සහිතව හෝ රහිතව, ණය ගැණුම්කරුවන් සහ ණය ලබා දෙන්නා අතර අන්‍යෝන්‍ය එකඟත්වයෙන් සිදු කෙරෙන ප්‍රතිව්‍යුහගත කිරීම් වේ. "අධිකරණයෙන් පරිබාහිර ගිවිසුම්වල" ප්‍රධාන වාසි ලෙස ඉක්මණින් ක්‍රියාත්මක කළ හැකි වීම, සාපේක්ෂව අඩු පිරිවැය, රහස්‍යභාවය ආරක්ෂා වීම සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ නියමයන් සහ කොන්දේසි සම්බන්ධයෙන් ඉහළ නම්‍යශීලිතාවය යනාදිය පෙන්වාදිය හැක.

මීට විකල්පයක් ලෙස, සමහර රටවල් බුන්වත්භාවය පිළිබඳ නීති මගින් සපයනු ලබන නීතිමය රාමුවේ වපසරිය තුළ සිට අධිකරණ ක්‍රියා පටිපාටිවල මැදිහත්වීම් හරහා සිය ව්‍යාපාර පුනර්ජීවන ක්‍රියාවලියේ යොදවනු ලැබේ.

ඉහත සාධක සලකා බැලීමෙන් අනතුරුව, අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ පීඩාවට පත් වූ ව්‍යාපාරවල පුනර්ජීවනයට පහසුකම් සැලසීම සඳහා සහ ඊට අදාළව බලපත්‍රලාභී බැංකු තුළ විනිවිද සහ ඵලදායී විසඳුම් ප්‍රතිපත්ති රාමුවක් පැවතීම සහතික කිරීමට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2024 මාර්තු මාසයේ දී "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වූ මාර්ගෝපදේශ" යන මැයෙන් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. බලපත්‍රලාභී බැංකුවල දැනටමත් පිහිටුවා ඇති පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකක තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වන පාලන රාමුව, අවශ්‍ය සම්පත්, ණය ගැණුම්කරුවන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් නිර්ණායක, ආයතනික යළි පණ ගැන්වීමේ රාමු සඳහා පුනර්ජීවන යාන්ත්‍රණ, ගිණුම්කරණ සලකා බැලීම් සහ නියාමන වාර්තාකරණය පිළිබඳ පුළුල් මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛයට ඇතුළත් වේ.

### බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීමේ අරමුණු

ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකවල පරමාර්ථය වනුයේ ආදායම්, මුදල් ප්‍රවාහ හෝ විකුණුම් අඩුවීම, ව්‍යාපාර කටයුතු අඩු වීම හා අඩාල වීම හෝ අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපාර තාවකාලිකව වසා දැමීම යන හේතු මත වර්තමානය වනවිට මූල්‍ය (සහ/හෝ ව්‍යාපාර) අභියෝගවලට මුහුණ දෙන හෝ ඉදිරියේ දී එවැනි දුෂ්කරතාවයන්ට මුහුණ දිය හැකි, සක්‍රීය සහ අක්‍රීය ණය ගැනුම්කරුවන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ ව්‍යාපාර යළි පණගැන්වීමට සහාය වීමයි.

මෙම ඒකකය මගින් මූලික වශයෙන් නැවත නඟාසිටුවීමට ශක්‍යතාවයක් ඇති නමුත් දැනට හෝ අනාගතයේ දී මූල්‍ය අපහසුතාවලට මුහුණ දෙන ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට අපේක්ෂා කරන අතර, ඒ තුළින් එම ණය ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභ ලබා දීමට බලාපොරොත්තු වන අතර, ඒ තුළින් එම ව්‍යාපාර නගා සිටුවීම හරහා රටේ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ ජාතික ආර්ථිකයේ සංවර්ධනයට ද මග පාදා දෙනු ඇත.

### ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකවල පාලනය සහ මෙහෙයුම් රාමුව

මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දෙන හෝ මුහුණ දීමේ අවදානමක් සහිත බැංකුවල ණයගැණුම්කරුවන්ගේ

1

ශක්‍ය ව්‍යාපාර යළි නඟා සිටුවීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකු විසින් පුනර්ජීවන සහ පුනරුත්ථාපන ප්‍රතිපත්ති සකස් කළයුතු අතර, මෙම ප්‍රතිපත්ති සමාලෝචනය කර යාවත්කාලීන කිරීම අවම වශයෙන් වාර්ෂිකව සිදුකළ යුතුය.

ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකය මගින්, විෂය පථයට යටත් ණය සඳහා අදාළ සියලු තොරතුරු සහ පද්ධති ප්‍රවේශය, ණය දෙන අංශය, නීති සහ අවදානම් කළමනාකරණ අංශ සහ ණය අයකරගැනීමේ අංශය යන බහුවිධ අංශ සමඟ ඵලදායීව බෙදාගත යුතු අතර, ඒ අංශ සමඟ විධිමත්ව සහ ස්වාධීනව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. තවද, බලපත්‍රලාභී බැංකු විසින් ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සම්පත් සැපයිය යුතු අතර, බැංකු කටයුතු දීපව්‍යාප්තව විසිරී පවතින බලපත්‍රලාභී බැංකු විසින්, මෙහෙයුම් කටයුතුවල ඵලදායීතාවය පදනම් කර ගනිමින් ප්‍රාදේශීය වශයෙන් මෙම ඒකක පිහිටුවීමට දිරිමත් කරනු ලැබේ.

ශක්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ඵලදායී මෙන්ම විනිවිද භාවයෙන් සිදු විය යුතු බැවින්, ව්‍යාපාර පණගැන්වීමේ ක්‍රියාවලිය යටතේ සිදු කරන්නා වූ මූලික ශක්‍යතා තක්සේරුව තීරණාත්මක කාර්යයක් වනු ඇත. මූලික ශක්‍යතා තක්සේරුව යටතේ, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශක, විචක්ෂණශීලී පදනමක් මත සලකා බැලිය යුතුය. මෙම දර්ශකවලට, ලාභදායීතාවය, තෝලනය, ද්‍රවශීලතාවය, වගකීම්වල කල් පිරීමේ ස්වභාවය සහ අනෙකුත් අදාළ ගුණාත්මක නිර්ණායක පිළිබඳ තක්සේරුව ඇතුළත් වනු ඇත. අදාළ ශක්‍යතා තක්සේරුව, හැකිතාක් දුරට ණයගැණුම්කරුගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම් විය යුතුය. කෙසේ වෙතත්, ණයගැණුම්කරු හට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නොමැති අවස්ථාවන්හි දී, පිළිගත හැකි හේතූන් මත, බලපත්‍රලාභී බැංකුවල අභිමතය පරිදි ඒ සඳහා සුදුසු සහ විශ්වසනීය තොරතුරු මූලාශ්‍ර භාවිතා කළ හැකිය. මේ සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් ණයගැනුම්කරුවන්ගේ අඛණ්ඩ සහයෝගය පවතින බව සහතික කර ගත යුතු වන අතර, එවැනි ණය ගැනුම්කරුවන් පමණක් මෙම පුනර්ජීවනය කිරීමේ කාර්යය සඳහා සලකා බලනු ලබයි.

තවද, වගවීම සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සිය ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකවලට අදාළ වන පාලන රාමුව, මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ ශක්‍යතා තක්සේරු ක්‍රමවේද, ඔවුන්ගේ වාර්ෂික වාර්තාවේ හෝ සුදුසු වෙනත් වාර්තා හරහා අනාවරණය කිරීම දිරිමත් කරනු ලැබේ.

**පුනර්ජීවන යාන්ත්‍රණ: මූල්‍ය සහ මෙහෙයුම්**

ව්‍යාපාර පණගැන්වීමේ ඒකකය විසින් පීඩාවට පත් වූ, එනමුත් ශක්‍යතාවයක් සහිත ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සඳහා මූල්‍ය සහ/හෝ මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීමේ මෙවලම් සහ ක්‍රමවේද භාවිතා කරනු ඇත.

- මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමේ මෙවලම්වලට, ණය කපා හැරීම, ණය ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම සඳහා සහන කාල සීමාවන් ලබා දීම ඇතුළුව ණය ප්‍රතිලේඛනගත කිරීම, පොලී අනුපාත සංශෝධනය කිරීම, ණය ගෙවීමේ කාලසීමාව දීර්ඝ කිරීම සහ අන්තර් මූල්‍ය පහසුකම් සහ බැහැර වීමට අදාළ මූල්‍ය පහසුකම් ඇතුළු වෙනත් සුදුසු නව මූල්‍ය පහසුකම් සැපයීම යනාදිය ඇතුළත් වේ.
- මෙහෙයුම් ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ, ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක විසින් ව්‍යාපාරයක මෙහෙයුම් හෝ වත්කම්වල වාණිජමය ශක්‍යතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා මූලික වෙනස්කම් යෝජනා කිරීම, නව ව්‍යාපාර සැලැස්මක්/උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ එවැනි ව්‍යාපාරවල මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහ ලාභදායීත්වය වැඩි දියුණු කිරීම, මුදල් කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම, මිලකරණ ක්‍රමවේදය සමාලෝචනය කිරීම සහ පාරිභෝගිකයන් රඳවා තබා ගැනීම සහ/හෝ නව වෙළඳපොළ අත්පත් කරගැනීමේ උපාය මාර්ග සමාලෝචනය කිරීම යනාදිය සලකා බැලිය හැක. තවද, ව්‍යාපාර පණගැන්වීමේ ඒකක මගින් ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීමට සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද, අනාගත ආයෝජකයින් වෙත ළඟාවීමේ දී ණය උපදේශන සහ ව්‍යාපාර උපදේශන සේවා සැපයීම ද සිදු කළ හැක.

**ආයතනික යළි පණගැන්වීම් සඳහා වන රාමු**

ව්‍යාපාර යළි පණගැන්වීමේ ක්‍රියාවලිය යටතේ ආයතනික යළි පණගැන්වීමේ රාමුවක් යනු, ණය ගැනුම්කරුවෙකු සහ බැංකු ණයහිමියන් කිහිපදෙනෙක් අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ විය හැකි ව්‍යාපාර යළි පණගැන්වීමේ සැලැස්මක් සඳහා වන පුළුල් රාමුවක් ලෙස අලුතින් හඳුන්වා දුන් යාන්ත්‍රණයකි. මෙය පාර්ශ්වයන් අතර අන්‍යෝන්‍ය එකඟතාවයක් වන බැවින් අධිකරණ මැදිහත්වීමක් අවශ්‍ය නොවේ. බලපත්‍රලාභී බැංකු විසින්, බලපත්‍රලාභී බැංකු සහ ආයතනික යළි පණගැන්වීමේ රාමුවෙන් ප්‍රයෝජන ගැනීමට අපේක්ෂා කරන ආයතනික ණයගැණුම්කරුවෙකු අතර, ආයතනික යළි පණගැන්වීමේ රාමුව සඳහා පොදු ආකෘතියකට අන්‍යෝන්‍ය වශයෙන් එකඟ විය හැකිය. දැනට බලපත්‍රලාභී බැංකු විසින් එවැනි පොදු ආකෘතියක් සකස් කරමින් පවතී. අන්‍යෝන්‍ය වශයෙන් එකඟ විය හැකි කොන්දේසි සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියේ දී ඇතිවිය හැකි සංකීර්ණතා සහ පිරිවැය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින්, මෙම රාමුව ආයතනික ණය ගැනුම්කරුවන් සඳහා යොදා ගැනීමට නිර්දේශ කරනු ලැබේ.

**ඉදිරි දැක්ම**

බලපත්‍රලාභී බැංකුවල යෝජිත ව්‍යාපාර යළි පණගැන්වීමේ යාන්ත්‍රණයට අනුව, බලපත්‍රලාභී බැංකුවල මඟපෙන්වීම හමුවේ, ව්‍යාපාර මෙහෙයුම් පුනර්ජීවනය වී එමගින් ඇති වන මුදල් ප්‍රවාහයන් තුළින්, දැනට අක්‍රීය තත්ත්වයේ පවතින ණය නැවත ගෙවීම ආරම්භ වී, එමගින් බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, රටේ සාර්ව ආර්ථික තත්ත්වයන්හී දියුණුවත් සමඟ විශේෂයෙන් ම රටේ ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම හරහා රටේ තිරසාර ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථා ඉහළ නැංවිය හැකිවනු ඇති අතර, එමගින් ජාතික ආර්ථිකයේ සංවර්ධනය වඩාත් තිරසාර වනු ඇත. මීට අමතරව, ජාතික ණය ඇප වීමේ ආයතනය (National Credit Guarantee Institute) පිහිටුවීම, සුරක්ෂිතලත් ගනුදෙනු පනත (Secured Transaction Act) හරහා වැඩිදියුණු කළ නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සහ ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා වන අර්ථ දැක්වීම පුළුල් පරාසයක් තුළ ව්‍යාපාර ආවරණය කිරීමට හැකිවන පරිදි පුළුල් කිරීම වැනි, ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් ක්‍රියාමාර්ග තුළින් බලපෑමට ලක් වූ ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට වඩාත් හිතකර වටපිටාවක් සැකසෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඒ තුළින් ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු වීමට දායක වනු ඇත.

---

සටහන්

1. බලපත්‍රලාභී බැංකු යන්නට 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු අයත් වේ.
2. අක්‍රීය ණය යනු ගනුදෙනුකරුවෙකුගේ හිවිසුම්ගත ගෙවීම් දින 90කට වැඩි කාලයක් හිඟ හිටි හෝ දින 90කට වඩා වැඩි කාලයක් සඳහා අනුමත ණය සීමාව ඉක්මවා ඇති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09 (SLFRS 9) යටතේ 3වන අදියරෙහි ණය පහසුකමක් ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වේ (විභව අවදානම් සහ ණය හානිකරණය සහිතව උපදවන ලද මූල්‍ය වත්කම් මත).

(රුපියල් බිලියන 81.8) වර්ධනයක් වාර්තා කළේය. රජයේ සුරැකුම්පත්වල ආයෝජනයන්හි ඉහළ යෑමත් සමඟ ආයෝජන කළඹෙහි සිදු වූ සැලකිය යුතු වර්ධනය, මෙම අංශයේ වත්කම් වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ණය සහ අත්තිකාරම්, සමස්ත වත්කම්වලින් සියයට 68.6 ක් විය.** 2022 වසරේ දී වාර්තා කළ සියයට 7.7ක වර්ධනයට සාපේක්ෂව, මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ 2023 වසර තුළ දී රුපියල් බිලියන 1,160.4ක් දක්වා සියයට 3.2කින් (රුපියල් බිලියන 38.0) සංකෝචනය විය. මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹේ ඉහළ නියෝජනය මූල්‍ය කල්බදු මගින් සිදු කර ඇති අතර, එහි නියෝජනය, 2022 වසර අවසානයේ දී වාර්තා වූ සමස්ත ණය සහ අත්තිකාරම්වලින් සියයට 41.6ට සාපේක්ෂව, 2023 වසර අවසානය වන විට සියයට 41.5ක් විය. 2023 වසර අවසානය වන විට, වාහන ණය ඇතුළත්ව වෙනත් සුරැකුම් ණය, සමස්ත ණය සහ අත්තිකාරම්වලින් සියයට 32.5ක් වූ අතර, එම ප්‍රතිශතය 2022 වසර අවසානයේ දී සියයට 33.8ක් විය. තවද, වසර තුළ දී රන් සුරැකුම් මත ණය දීම් සහ තැන්පතු මත ණය දීම් පිළිවෙලින් සියයට 4.7කින් සහ සියයට 3.2කින් සංකෝචනය විය. මේ අතර, 2022 වසර තුළ දී වාර්තා වූ සියයට 23.2ක වර්ධනයට සාපේක්ෂව, ප්‍රධාන වශයෙන් මුදල් සහ බැංකු හා මූල්‍ය ආයතනවල පවත්නා ශේෂයන් අඩංගු වන වෙනත් වත්කම්, 2023 වසර තුළ දී සියයට 3.2කින් ඉහළ යන ලදී.


**2022 වසර අවසානයේ දී පෙන්නුම් කළ සියයට 17.4ට සාපේක්ෂව, දළ 3 වන අදියරෙහි ණය අනුපාතය සියයට 17.8ක් දක්වා ඉහළ යාමෙන් පිළිඹිබු වන පරිදි, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පහළ ගොස් ඇත.** 3 වන අදියරෙහි ණය වර්ගීකරණය කිරීමේදී, කල් ඉකුත් වූ දිනය ලෙස දින 120 භාවිතා කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම්වලට තිබූ නියාමන අවශ්‍යතාවය, 2023 අප්‍රේල් 01 සිට පෙර පැවති දින 120 වර්ගීකරණය වෙනුවට දින 90 දක්වා තීව්‍ර කරන ලදී. මේ අතර, 2023 වසර අවසානය වන විට මෙම අංශයේ 3 වන අදියරේ ණය සඳහා හානිකරණ ආවරණ අනුපාතය සියයට 32.5ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට සියයට 12.3ක් ලෙස වාර්තා වූ ශුද්ධ 3 වන අදියරෙහි ණය අනුපාතය 2023 වසර අවසානය වන විට සියයට 12.0ක් ලෙස යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**ශුද්ධ පොලී ආදායමේ සහ පොලී නොවන ආදායමේ ඉහළ යෑම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ බදු පසු ලාභය 2022 වසරේ පැවති රුපියල් බිලියන 42.8 සිට 2023 වසරේ දී රුපියල් බිලියන 47.7ක් දක්වා සියයට 11.3කින් ඉහළ ගියේය.** 2022 වසර අවසානය වන විට සියයට 3.7ක් ලෙස වාර්තා වූ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2023 වසර අවසානය වන විට සියයට 4.3ක් ලෙස ඉහළ යෑම තුළින් ලාභදායීත්වයේ ඉහළ යෑම පිළිබිඹු විය.

1

**1.28 රූප සටහන**

**2022 සහ 2023 වසර සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සේවාවන් අනුව සපයන ලද සමස්ත ණය සහ අත්තිකාරම් (දළ)**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වෙතත්, හිමිකම් ප්‍රාග්ධනයේ සාපේක්ෂ ඉහළ වර්ධනය හේතුවෙන්, 2022 වසරේ දී සියයට 12.7ක් ලෙස දැක්වුණු මෙම අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය, 2023 වසරේ දී සියයට 12.4ක් ලෙස සුළු අඩුවීමක් පෙන්නුම් කළේය. ආදායම මත පිරිවැය අනුපාතය 2022 වසරේ පැවති සියයට 79.9 සිට 2023 වසරේ දී සියයට 81.1ක් දක්වා වර්ධනය විය.

**2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 317.0ක් ලෙස වාර්තා වූ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන පදනම සියයට 3.9ක (රුපියල් බිලියන 12.3) සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් 2023 වසර අවසානය වන විට රුපියල් බිලියන 329.0ක් ලෙස වාර්තා විය.** මෙම අංශයේ මූලික ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත 2022 වසර අවසානය වන විට පිළිවෙළින් වාර්තා වූ සියයට 20.6 සහ සියයට 22.0 සිට පිළිවෙළින් සියයට 21.1 සහ සියයට 22.3 දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී මුදල් සමාගම් 6ක්[24] අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල නොවීය.

**සමස්තයක් ලෙස ගත් කල, 2023 වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ද්‍රවශීල වත්කම් ප්‍රමාණය, අවම නියාමන මට්ටමට වඩා ඉහළ අගයක පවත්වා ගැනීමට හැකි විය.** 2022 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 86.9ක ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව 2023 වසර අවසානයේ රුපියල් බිලියන 151.5ක ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කරමින්, අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය වූ රුපියල් බිලියන 103.4ට එරෙහිව, 2023 වසර අවසානය වන විට පැවැති සමස්ත නියාමන ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 254.9ක් විය.

**බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ වගකීම් වලින් ප්‍රධාන කොටස තවදුරටත් ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මගින් නියෝජනය කළ අතර එය සියයට 55.3ක් විය.** 2023 වසර තුළ දී තැන්පතු රුපියල් බිලියන 935.3ක් දක්වා සියයට 8.2කින් (රුපියල් බිලියන 70.8) වර්ධනය වූ අතර, ණය ගැනීම් රුපියල් බිලියන 264.6ක් දක්වා සියයට 17.9කින් (රුපියල් බිලියන 57.8) පහත වැටුණි.

### විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම

**2023 දෙසැම්බර් අවසානය වන විට රුපියල් බිලියන 1.2ක වත්කම් පදනමක් සහ රුපියල් බිලියන 0.7ක ණය සහ අත්තිකාරම් සහිත විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් පමණක් පැවතියේය.** එහි දළ සහ ශුද්ධ 3 වන අදියරේ ණය අනුපාත පිළිවෙළින් සියයට 57.8 සහ සියයට 33.6ක් විය. ශුද්ධ පොලී ආදායම අඩුවීම හේතුවෙන් මෙම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ 2022 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 1.1 බදු පසු ලාභය 2023 වසරේ දී රුපියල් බිලියන 0.1ක් දක්වා සියයට 94.3කින් අඩු විය.

### රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකාර සමාගම්

**2023 වසර අවසානය වන විට රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි සක්‍රීය ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස ලියාපදිංචි වූ බලපත්‍රලාභී වාණිජ බැංකු[25] 5ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්[26] 5ක් ක්‍රියාත්මක විය.** ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත වත්කම් 2022 දී පැවති රුපියල් බිලියන 131.7ට සාපේක්ෂව

24 අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල නොවූ බලපත්‍රලාභී මුදල් සමාගම් මත තැන්පතු මත උපරිම සීමා, ණයදීම් මත උපරිම සීමා, නව තැන්පතු භාර ගැනීම අත්හිටුවීම සහ නව ණය ලබාදීම් මත උපරිම සීමා වැනි නියාමන සීමාකිරීම් පනවා ඇත.

25 පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හැර (රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගී වීම 2017 වසරේ අගෝස්තු මස 15 දින සිට අත්හිටුවන ලදී).

26 එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී (2017 ජූලි මස 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවීමට එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී වෙත නියෝග කර ඇත. අනාරක්ෂිත ආයෝජකයෙකු විසින් මෙම සමාගම ණයගිම්යන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය මඟින් 2022 ජූනි මස 17 දින ගණන් බේරා වසා දැමීම සඳහා වන නියෝගය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ගණන් බේරා වසා දැමීම සඳහා ගොනු කල නඩුව වෙනත් නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් විභාග වෙමින් පවතී), සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම (2017 වසරේ ජූලි මස 06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අත්හිටුවා ඇති අතර, මෙම අත්හිටුවීම 2024 ජනවාරි 05 දින තෙක් තවත් මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී), යන ආයතන හැර.

2023 දී රුපියල් බිලියන 270.8ක් දක්වා සියයට 105.7කින් වර්ධනය වී ඇත. රජයේ සුරැකුම්පත් වල සමස්ත ආයෝජන කළඹ 2023 අවසන් වන විට රුපියල් බිලියන 261.9ක් වූ අතර, එය 2022 දී වාර්තා වූ රුපියල් බිලියන 126.1ට සාපේක්ෂව සියයට 107.7ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය.

**පොලී ආදායම, ප්‍රාග්ධන ලාභ සහ ප්‍රත්‍යාගණන ලාභවල සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2022 වසර තුළ වාර්තා කළ රුපියල් බිලියන 1.7ක ලාභයට සාපේක්ෂව, ප්‍රාථමික අලෙවිකාර සමාගම් 2023 වසර තුළ දී රුපියල් බිලියන 35.8ක බදු පසු ලාභයක් වාර්තා කරන ලදී.** තවද, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2022 වසරේ දී වාර්තා වූ පිළිවෙළින් සියයට 3 සහ සියයට 19.9 සිට 2023 වසර අවසාන වනවිට පිළිවෙළින් සියයට 25.7 සහ 139.3 දක්වා වැඩිවිය. එමෙන්ම, වසර තුළ දී ඉපයූ ලාභ හේතුවෙන් අයිතිකරුවන්ගේ හිමිකම සියයට 142.4කින් ඉහළ ගොස් ඇත. 2022 වසර අවසානයේ දී සියයට 23.2ක් ලෙස වාර්තා වූ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතිකය, 2023 වසර අවසානයේ දී සියයට 22.3 දක්වා සුළු පහළ යෑමක් වාර්තා කළ ද, එය අවම අවශ්‍යතාව වන සියයට 10ට වඩා වැඩි අගයක පැවැතුණි.

### බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

**බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් 4කින් සමන්විත වන බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අංශය සියයට 18.2ක වර්ධනයක් සමඟින් 2023 වසර අවසානයේ දී වාර්තා කළ මුළු වත්කම් පදනම රුපියල් බිලියන 11.7ක් විය.** සමස්ත වත්කම් ප්‍රමාණයෙන් විශාලතම දායකත්වය, ක්ෂුද්‍රමූල්‍ය ණය හා අත්තිකාරම් වූ අතර, 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 7.4ක් ලෙස වාර්තා වූ ක්ෂුද්‍රමූල්‍ය ණය හා අත්තිකාරම් 2023 වසර අවසානයේ දී සියයට 8.4ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 8.9ක් ලෙස වාර්තා විය. මෙම අංශයේ සමස්ත තැන්පතු පදනම, 2022 වසරේ පැවති රුපියල් මිලියන 648.3ක අගයෙහි සිට 2023 වසරේ දී රුපියල් මිලියන 812.8ක් දක්වා සියයට 31.7කින් වර්ධනය විය. මෙම අංශයේ මූලික ප්‍රාග්ධන මට්ටම රුපියල් බිලියන 2.6ක් ලෙස සටහන් වූ අතර, සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් මූලික ප්‍රාග්ධනය සඳහා වන අවම විවක්ෂණශීලී රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය.

### ඒකක භාර අංශය

**ක්‍රියාත්මකව පවතින ඒකක භාර සංඛ්‍යාව 2022 වසර අවසානයේ වාර්තා වූ 80 සිට 2023 වසර අවසානය වන විට 84 දක්වා ඉහළ ගිය අතර, මුළු වත්කම්වල සැලකිය යුතු වැඩි වීමක් වාර්තා විය.** ඒකක භාර කළමනාකරණ සමාගම් සංඛ්‍යාව 2022 වසර අවසානයට සාපේක්ෂව 2023 වසර අවසානයේ 16ක් ලෙස නොවෙනස්ව පැවතුණි. ඒකක භාර අරමුදල් ප්‍රධාන වශයෙන් මුදල් වෙළඳපොළ අරමුදල් සහ ආදායම් අරමුදල් වලින් සමන්විත අතර එමගින් ඒකක භාර අංශයේ, සියයට 84.9ක් නියෝජනය විය. 2022 වසර අවසානයේ රුපියල් බිලියන 150ක් ලෙස පැවති ඒකක භාරවල මුළු වත්කම්, 2023 වසර අවසානයේ දී සියයට 171.0කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, එය රුපියල් බිලියන 406.5ක් ලෙස පැවතිණි. නිකුත් කරන ලද ඒකක සංඛ්‍යාව 2022 වසර අවසානයේ වාර්තා වූ මිලියන 6,283 සිට 2023 වසර අවසන් වන විට මිලියන 13,371 දක්වා වර්ධනය විය. මීට අමතරව, 2022 වසර අවසානයේ 67,912ක් වශයෙන් වාර්තා වූ සමස්ත ඒකක හිමියන් සංඛ්‍යාව 2023 වසර අවසානයේ දී 93,450ක් දක්වා වර්ධනය විය. මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ඒකක භාර මගින් රාජ්‍ය සුරැකුම්පත්වල කරන ලද ආයෝජන, 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 56.7 සිට 2023 වසර අවසන් වන විට සියයට 77.2 දක්වා සැලකිය යුතු අයුරින් ඉහළ ගියේය. මේ අතර, ඒකක භාර වත්කම්වල කොටසක් ලෙස කොටස් ආයෝජනය 2022 වසර අවසානයේ පැවති සියයට 7.9ට සාපේක්ෂව 2023 වසර අවසන් වන විට සියයට 4.5ක් දක්වා අඩු විය.

### රක්ෂණ අංශය

**දිගුකාලීන සහ සාමාන්‍ය යන උප අංශවලින් සමන්විත රක්ෂණ අංශය 2023 වසර තුළ මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය.** 2023 වසර අවසන් වන විට රක්ෂණ අංශයේ මෙහෙයුම් කටයුතු වල නිරත වන සමාගම් 28ක් වූ අතර, ඉන් 14ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි පමණක් ද, සමාගම් 12ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි පමණක් ද, සමාගම් 2ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර දෙකෙහිම ද නිරත විය. මීට අමතරව, 2023 වසර අවසන් වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් 78ක් ක්‍රියාත්මක විය. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකයෙහි වර්ධනය වීමක් වාර්තා විය. වසර

1

තුළ දී, දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ අංශවල වාර්ෂික පදනම මත දළ ලියාහළ වාරිකය පිළිවෙළින් සියයට 12.9කින් සහ සියයට 3.4කින් වර්ධනය විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වාර්ෂික දළ ලියාහළ වාරිකය මගින් මනිනු ලබන රටෙහි රක්ෂණ ව්‍යාප්තිය, 2023 වසර අවසානය වන විට සියයට 1.0ක් විය. දිගුකාලීන රක්ෂණ අංශයේ වත්කම් පුළුල් වූ අතර සාමාන්‍ය රක්ෂණ අංශයේ වත්කම් පහත වැටුණි. දිගුකාලීන රක්ෂණ අංශයේ වත්කම් වර්ධනය සියයට 22.6ක් (වාර්ෂික ලක්ෂ්‍යමය) වූ අතර සාමාන්‍ය රක්ෂණයේ වත්කම් 2023 වසර අවසානයේ දී සියයට 4.2කින් (වාර්ෂික ලක්ෂ්‍යමය) අඩු විය. කෙසේ වෙතත්, දිගු කාලීන රක්ෂණ අංශයේ ඉහළ වත්කම් පදනම අනුව, 2023 වසරේ සමස්ත රක්ෂණ අංශයේ වත්කම් සියයට 14.7කින් වාර්ෂික පදනම මත වර්ධනය විය. සාමාන්‍ය රක්ෂණ අංශයේ ලාභදායීත්වය 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී අඩු විය. දිගුකාලීන රක්ෂණ අංශයේ බදු පෙර ලාභය 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 30.6කින් වර්ධනය විය. කෙසේ වෙතත්, මෙම කාලසීමාව තුළ සාමාන්‍ය රක්ෂණ අංශයේ බදු පෙර ලාභය සියයට 25.6කින් අඩු විය. එමෙන්ම, පෙර වසරට සාපේක්ෂව 2023 වසර තුළ දී සාමාන්‍ය රක්ෂණවල වත්කම්වල ප්‍රතිලාභ සහ කොටස් මත ප්‍රතිලාභය පිරිහී ගිය අතර දිගුකාලීන රක්ෂණ සඳහා එම දර්ශක වැඩිදියුණු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන අංශ දෙකෙහිම ප්‍රාග්ධන තත්ත්වයන් තවදුරටත් වැඩිදියුණු විය. සාමාන්‍ය රක්ෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වසරකට පෙර පැවති සියයට 210.0 සිට 2023 වසර අවසන් වන විට සියයට 252.0 දක්වා වැඩි විය. එමෙන්ම, දිගු කාලීන රක්ෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වසරකට පෙර පැවති සියයට 303.0 සිට සියයට 358.0 දක්වා වර්ධනය විය.

### සේවක අර්ථසාධක අරමුදල

**සේවක අර්ථසාධක අරමුදලෙහි (EPF) ශුද්ධ වටිනාකම 2022 වසර අවසානයට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට සියයට 11.5කින් සැලකිය යුතු ලෙස වැඩි විය.** අරමුදල විචක්ෂණශීලී ලෙස ආයෝජන කිරීම තුළින් උපයන ලද ආදායම මෙම වර්ධනය සඳහා හේතු විය. කෙසේ වුව ද, මෙම කාලය තුළ සාමාජිකයන් වෙත වූ මුළු වගකීම ද සියයට 12.9කින් වැඩි විය. මේ අතර, 2023 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් සියයට 8.2කින් වැඩි වූ අතර සාමාජිකයින්ට සහ ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන් හට ගෙවන ලද සමස්ත ප්‍රතිලාභ ප්‍රමාණය ද සියයට 32.4කින් සැලකිය යුතු ලෙස වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී රුපියල් බිලියන 31.6ක් ලෙස වාර්තා වූ අරමුලෙහි ශුද්ධ දායක මුදල් ලැබීමට සාපේක්ෂව එම අගය 2023 වසරේ දී රුපියල් බිලියන 5.3ක ඍණ අගයක් විය.

**2023 වසරේ සමස්ත ආයෝජන ආදායම රුපියල් බිලියන 469.3ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 315.8 හා සැසඳීමේදී සියයට 48.6ක කැපී පෙනෙන වර්ධනයක් විය.** පොලී ආදායම, අරමුදලෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, එය 2022 වසරේ දී උපයන ලද රුපියල් බිලියන 349.3ට සාපේක්ෂව 2023 වසරේ දී රුපියල් බිලියන 442.4 දක්වා සියයට 26.7කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2022 වසරේ දී රුපියල් බිලියන 7.5ක් වූ ලාභාංශ ආදායම 2023 වසරේ දී රුපියල් බිලියන 3ක් දක්වා සියයට 60කින් පහත වැටුණි. භාණ්ඩ හා සේවාවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, අරමුදලෙහි දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අනුපාතය ප්‍රශස්ථ මට්ටමක පවත්වාගත් අතර, 2023 වසරේ දී එම අගය සියයට 0.49ක් විය. එසේ වුව ද, ආයෝජන ආදායම වැඩිවීම හේතුවෙන් 2023 වසරේ දී අරමුදලේ බදු වියදම ඉහළ ගියේය.

**දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ ලබා දුන් විකල්ප අවස්ථාවන් ද්විත්වය මනාව සලකා බැලීමෙන් අනතුරුව, සේවක අර්ථසාධක අරමුදල බැඳුම්කර හුවමාරු කිරීමේ විකල්පය අනුගමනය කිරීමට තීරණය කළේය.** 2023 ජූලි 04 දින මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන ප්‍රකාශයට පත් කළ අතර, එම වැඩසටහනට අනුව විශ්‍රාම අරමුදල් සඳහා විකල්ප අවස්ථා දෙකක් ඉදිරිපත් විය. පළමු විකල්පය යටතේ සේවක අර්ථසාධක අරමුදල සතුව පැවති භාණ්ඩාගාර බැඳුම්කරවලින් නිශ්චිත අවම ප්‍රමාණයක් 2027 සිට 2038 දක්වා කල් පිරෙන නව භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ 12කට හුවමාරු කර ගැනීමට සේවක අර්ථසාධක අරමුදල වෙත අවස්ථාව ලබා දුන් අතර, එහිදී භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් උපයන ආදායම සඳහා වාර්ෂිකව සියයට 14ක ආදායම් බදු අනුපාතයකට සේවක අර්ථසාධක අරමුදල යටත් විය. දෙවන විකල්ප අවස්ථාව ලෙස, පැවති භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු නොකිරීමට තීරණය කළේ නම්,

**1.25 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථසාධක අරමුදලෙහි කර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය**

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023* |
|---|---|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (රු. බිලියන) | 2540.4 | 2824.3 | 3166.1 | 3459.9 | 3857.4 |
| සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (රු. බිලියන) | 2497.6 | 2767.8 | 3066.9 | 3380.6 | 3817.9 |
| මුළු දායක මුදල් ලැබීම් (රු. බිලියන) | 157.2 | 150.7 | 165.7 | 194.6 | 210.6 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) | 126.3 | 109.7 | 118.2 | 163.0 | 215.9 |
| ශුද්ධ දායක මුදල් ලැබීම් (රු. බිලියන) | 30.9 | 41.0 | 47.5 | 31.6 | (5.3) |
| සාමාජික ශේෂ මත පොලී අනුපාතිකය (%) | 9.25 | 9.00 | 9.00 | 9.00 | 13.00 |
| මුළු සාමාජික ගිණුම් (මිලියන) | 19.4 | 19.8 | 20.3 | 20.4 | 20.9 |
| සක්‍රීය සාමාජික ගිණුම් (මිලියන) | 2.9 | 2.6 | 2.5 | 2.7 | 2.7 |

*තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් උපයන බදු ගෙවිය යුතු ආදායම සඳහා සියයට 30ක ස්ථාවර බදු අනුපාතයක් අදාළ විය. මෙම විකල්ප අවස්ථාවන් පුළුල්ව විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, සේවක අර්ථසාධක අරමුදලෙහි භාරකරු ලෙස ක්‍රියා කරන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලය විසින් ණය හුවමාරු කිරීමේ අවස්ථාව සඳහා යොමු වීමට තීරණය කරන ලදී. දිගුකාලීන ඉදිරි දැක්මකින් යුතුව අරමුදලේ සාමාජිකයින්ගේ යහපත වෙනුවෙන් ගනු ලැබූ මෙම තීරණය අනුව සේවක අර්ථසාධක අරමුදල රුපියල් බිලියන 2,667.5ක මුහුණත වටිනාකමකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කර ගන්නා ලදී.

### සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය වාර්ෂිකව සියයට 11.9කින් රුපියල් බිලියන 520.5ක් දක්වා 2023 වසර අවසානයේ දී වර්ධනය විය.** එමෙන්ම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල විසින් කරන ලද ආයෝජන සියයට 8.3කින් වැඩි විය. මෙම ආයෝජනවලින් සියයට 93.8ක් 2023 වසර අවසන් වන විට රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. මෙම අරමුදල, 2023 වසරේ දී එහි සාමාජික ශේෂයන් මත සියයට 12.3ක ආයෝජන මත ප්‍රතිලාභ ලබා ගැනීමට සමත් විය. අරමුදලෙහි පැවති සාමාජික ගිණුම් මිලියන 15.5න් 2023 වසර අවසන් වන විට ගිණුම් මිලියන 2.5ක් සක්‍රීයව පැවතුණි. අරමුදලට දායක වන සේවා යෝජකයින් සංඛ්‍යාව 2022 වසර අවසානයේ 68,488ක් වූ අතර එය 2023 වසර අවසන් වන විට 75,485ක් දක්වා වැඩි විය. අරමුදලෙහි මුළු සාමාජික ශේෂය සියයට 0.2කින් අඩු වී 2023 වසර අවසන් වන විට රුපියල් බිලියන 458.5ක් ලෙස වාර්තා විය. 2023 වසර අවසන් වන විට, අරමුදල වෙත ලැබුණු මුළු දායකත්වය වාර්ෂිකව සියයට 7.4කින් රුපියල් බිලියන 37.1ක් දක්වා වර්ධනය වූ අතර සාමාජිකයින්ට ගෙවන ලද මුළු ප්‍රතිලාභ වාර්ෂිකව සියයට 53.0කින් රුපියල් බිලියන 38.3ක් දක්වා වර්ධනය විය.

## 1.5.3 මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය


### දේශීය මුදල් වෙළඳපොළ

**දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා හිඟය 2023 අවසන් වන විට සැලකිය යුතු ලෙස අඩු විය.** මේ සඳහා මහ බැංකුවේ විදේශ විනිමය මිලදී ගැනීම්, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කාලීන ප්‍රතිවික්‍රිණුම් වෙන්දේසි පැවැත්වීම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අඩු කිරීම සහ ඇතැම් බලපත්‍රලාභී බැංකු වෙත ද්‍රවශීලතා ආධාරක පහසුකම හරහා ද්‍රවශීලතාව සැපයීම හේතු විය. 2023 වසරේ දී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අඩු කිරීම හරහා ස්ථිර පදනමින් රුපියල් බිලියන 200ක් වෙළඳපොළට මුදාහරින ලදී. මීට අමතරව, මහ බැංකුව විවට වෙළඳපොළ වෙන්දේසි හරහා ද්විතීයික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම මගින් ද ස්ථිර පදනමින් රුපියල් බිලියන 8.5ක ද්‍රවශීලතාව ලබාදීම සිදු කරන ලදී. කෙසේ වුව ද, 2023 වසරේ දී වෙළඳපොළ ද්‍රවශීලතාව අසමමිතික ව්‍යාප්තියක් පෙන්නුම් කළේය. එහි දී ඇතැම් දේශීය බැංකු ද්‍රවශීලතා හිඟයක් වාර්තා කළ අතර, බොහෝ විදේශීය බැංකු සැලකිය යුතු ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කළේය. ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි දෛනික සාමාන්‍ය ගනුදෙනු වටිනාකම 2022 වසරේ දී රුපියල් බිලියන 15.7 සිට 2023 වසරේ දී රුපියල් බිලියන 8.6ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, ප්‍රතිමිලදීගැනීම් වෙළඳපොළෙහි දෛනික සාමාන්‍ය ගනුදෙනු වටිනාකම 2022 වසරේ දී රුපියල් බිලියන 6.8ක සිට 2023 වසරේ දී රුපියල් බිලියන

1

1.29 රූප සටහන

**2023 වසරේ විවට වෙළඳපොළ කටයුතු, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

14.4ක් දක්වා ඉහළ ගිය අතර, එමගින් මූල්‍ය ආයතන විසින් ඇපකර සුරැකුම් සහිත ණය ලබාදීම සඳහා වැඩි කැමැත්තක් දක්වන බව පෙන්නුම් කරන ලදී.

## දේශීය විදේශ විනිමය වෙළඳපොළ

**2023 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 12.1කින් අතිප්‍රමාණය විය.** 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලරයට රුපියල් 363.11ක් වූ විනිමය අනුපාතිකය, 2023 වසර අවසාන වන විට රුපියල් 323.92ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 මාර්තු 07 වන දා සිට වෙළඳපොළ බලවේග මගින් විනිමය අනුපාතිකය තීරණය කිරීමට ඉඩ සලසන ලදී. මේ අතර, බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සිදුකළ යුතු වූ අනිවාර්ය විදේශ විකුණුම් අවශ්‍යතාවය ක්‍රමානුකූලව ලිහිල් කිරීම සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ විදේශ විනිමය ගලා ඒම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වර්ධනය විය. මෙම ප්‍රවණතාව වෙළඳපොළ සහභාගිවන්නන් තුළ රුපියල තවදුරටත් අතිප්‍රමාණය වීම සම්බන්ධව බලාපොරොත්තු ඇති කළ අතර, විදේශ ප්‍රේෂණ සහ අපනයන ආදායම රුපියල් බවට පත්කිරීම ඉහළ නැංවීය. කෙසේ වෙතත්, රජය විසින් දේශීය ණය ප්‍රශස්තකරණය යටතේ බලපත්‍රලාභී බැංකු විසින් ආයෝජනය කරන ලද එ.ජ. ඩොලර්වලින් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල්වලින් පියවීම හේතුවෙන් එම බැංකු ඔවුන්ගේ විදේශ විනිමය වගකීම් ආවරණය කිරීම සඳහා දේශීය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් 2023 වසරේ දෙවන භාගයේ මුල් කාලය තුළ රුපියල අවප්‍රමාණය වීමේ යම් පීඩනයක් ඇති විය. කෙසේ වෙතත්, විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකරනු ලැබූ මැදිහත් වීම් හේතුවෙන් රුපියල මත වූ පීඩනය අඩු වූ අතර, විනිමය අනුපාතිකය ද ස්ථාවර විය. තවද, දේශීය විදේශ විනිමය අන්තර් බැංකු වෙළඳපොළෙහි වෙළඳ පරිමාව 2022 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 9.6ට සාපේක්ෂව වසර 2023 දී එ.ජ. ඩොලර් බිලියන 15.0 දක්වා සියයට 56.7කින් වර්ධනය විය.


## රජයේ සුරැකුම්පත් වෙළඳපොළ

**ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම් වලට අනුරූපව, ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ද අඩු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදා වක්‍රය ද පහළට විතැන් විය.** ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය 2023 වසර අවසානය වන විට සාමාන්‍ය හැඩැති වක්‍රයක් බවට පත්වීමේ ලකුණු පෙන්නුම් කර ඇත. තවද, වෙළඳපොළ තුළ දෛනික සාමාන්‍ය වෙළඳ පරිමාවන් සහ දෛනික සාමාන්‍ය වෙළඳ කටයුතු සංඛ්‍යාව ඉහළ යෑම හරහා නිරීක්ෂණය වූ පරිදි, 2023 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත්වල ද්‍රවශීලතාවය සුළු වශයෙන් ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ දෛනික සාමාන්‍ය වෙළඳ පරිමාව සහ දෛනික සාමාන්‍ය වෙළඳාම් සංඛ්‍යාව රුපියල් බිලියන 12.5ක් සහ 39ක් වූ අතර, 2023 වසර තුළ දී එය පිළිවෙළින් රුපියල් බිලියන 25.7ක් සහ 80.6ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු කෙටි කාලීන කල්පිරීම් සඳහා වැඩි වශයෙන් නැඹුරු විය. 2023 දෙවන භාගය තුළ දී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළේ එ.ජ. ඩොලර් මිලියන 216ක ශුද්ධ විදේශ ගලායෑමක් පැවතිය ද, 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 210ක ශුද්ධ විදේශ ගලා ඒමක් වාර්තා විය.

## කොටස් වෙළඳපොළ

**2023 වසර තුළ දී, මිල දර්ශක, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සහ දෛනික පිරිවැටුම අනුව දේශීය කොටස් වෙළඳපොළ එකිනෙකට වෙනස් කාර්යසාධනයක් වාර්තා කළේය.** සමස්තයක් ලෙස, සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ ස්ටැන්ඩර්ඩ් සහ පුවර්ස් ශ්‍රී ලංකා 20 (S&P SL20) යන මිල දර්ශක දෙකම වසර පුරාවට ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා බැංකු අංශය සැලකිල්ලට


**1.30 රූප සටහන** **මිල දර්ශකවල විචලනයන් සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය**




මූලයඃ කොළඹ කොටස් හුවමාරුව

නොගන්නා බවට වූ නිවේදනය සමඟ මිල දර්ශකවල සැලකිය යුතු ඉහළ යෑමක් ජූලි-අගෝස්තු මාස තුළ වාර්තා විය. යෝජිත බදු සංශෝධන, ආහාර සහ බලශක්ති මිල ගණන්වල ඉහළ යෑම් හේතුවෙන් සමස්ත කොටස් මිල දර්ශකය මත ඇති වූ සෘණාත්මක බලපෑම සමඟ සමස්ත දර්ශකවල අගය 2023 අවසානය වන විට පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, 2023 වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය සහ ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය පිළිවෙළින් සියයට 24.9කින් සහ සියයට 15.7කින් වර්ධනය වූ අතර 2023 වසර අවසානය වනවිට වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සියයට 9.7ක ඉහළ යෑමක් සමඟ රුපියල් බිලියන 4,233.3ක අගයක් වාර්තා කරන ලදී. කොළඹ කොටස් හුවමාරුව 2023 වසරේ දී රුපියල් මිලියන 1,696.81ක දෛනික සාමාන්‍ය පිරිවැටුමක් වාර්තා කළ අතර, එය 2022 දී වාර්තා වූ අගය වන රුපියල් මිලියන 2,972.3ට සාපේක්ෂ ව සියයට 43ක අඩු වීමකි. දේශීය කොටස් වෙළඳපොළ තුළ 2023 වසරේ දී විදේශීය

**1.31 රූප සටහන** **කොටස් වෙළඳපොළෙහි විදේශ සහභාගීත්වය**




මූලයඃ කොළඹ කොටස් හුවමාරුව

සහභාගීත්වය, ශුද්ධ විදේශ මිලදී ගැනීම් පිළිබඳ ව සලකා බැලීමේ දී 2022 වසරට සාපේක්ෂව අඩු විය. ඒ අනුව, වෙළඳපොළ විසින් 2023 වසරේ දී රුපියල් බිලියන 4.3ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 13.27ක) ශුද්ධ විදේශ ගලා ඒමක් වාර්තා කර ඇති අතර එය 2022 වසරේ දී රුපියල් බිලියන 30.6ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 74.30ක්) විය.

### සාංගමික ණය සුරකුම්පත් වෙළඳපොළ

**2023 වසරේ දී වාණිජ පත්‍ර (Commercial Papers) නිකුත් කිරීම 2022 වසරට සාපේක්ෂව අඩු විය.** 2023 වසර තුළ දී වාණිජ පත්‍ර නිකුත් කිරීම මගින් රුපියල් බිලියන 1.3ක් පමණක් රැස් කරගත් අතර, 2022 වසරේ දී එම අගය රුපියල් බිලියන 2.0ක් විය. තව ද, 2022 වසරේ දී වාර්තා වූ සියයට 11.00 සිට 36.00 පරාසයට සාපේක්ෂ ව වාණිජ පත්‍රවල පොලී අනුපාතික 2023 වසර තුළ දී සියයට 17.00 සිට 26.50 දක්වා පරාසයක විචලනය විය. සාංගමික ණයකර කොළඹ කොටස් වෙළඳපොළෙහි සමාගම් 5ක් විසින් මූලික නිකුතු 16ක් හරහා රුපියල් බිලියන 34.6ක් 2023 වසර තුළ දී රැස් කරගන්නා ලදී. එය 2022 වසර තුළ දී සමාගම් 4ක් විසින් සාංගමික ණයකරවල මූලික නිකුතු 10ක් මගින් රැස්කර ගත් රුපියල් බිලියන 12.7ට සාපේක්ෂව සැලකිය යුතු වැඩි වීමකි. ස්ථාවර සහ පාවෙන පොලී අනුපාතික සහිත ණයකර මෙම වසරේ දී නිකුත් කරන ලද අතර, ස්ථාවර පොලී අනුපාතික 2022 වසරේ දී පැවැති සියයට 15.42 සිට 28.00 දක්වා පරාසයට සාපේක්ෂව 2023 වසර තුළ දී සියයට 13.50 සිට 29.50 දක්වා පරාසයක පැවැතුණි.

## 1.5.4 මූල්‍ය අන්තර්ගතභාවය

**2023 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනයෙහි ලා අඛණ්ඩව කටයුතු කරන ලදී.** කෙසේ වෙතත්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක වීමත් සමඟම ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ලබාදුන් ණය යෝජනා ක්‍රම අත්හිටුවන ලදී. නමුදු, රජය විසින් සපයන අරමුදල් යටතේ ක්‍රියාත්මක කෙරෙන ණය යෝජනා ක්‍රම අවසන් අදියරේ ක්‍රියාත්මක වන බැවින් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත කාර්යයක් බවට පත්ව ඇත. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ පළමු අදියර 2024 වසරේ දී අවසන් වන

1

අතර දෙවන අදියර 2025 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිතය. තවද, මහජනතාවගේ මූල්‍ය හැසිරීම වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ශ්‍රී ලංකාව සඳහා වූ පුළුල් මූල්‍ය සාක්ෂරතා පෙර දැක්ම 2024 මැයි මාසයේ දී දියත් කෙරෙනු ඇත. තවද, වසර තුළ රටපුරා මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

### 1.5.5 මූල්‍ය යටිතල පහසුකම්


#### ගෙවීම් සහ පියවීම් පද්ධති

**ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු ඩිජිටල්කරණය වීමේ සැලකිය යුතු වර්ධනයක් 2023 වසරේ දී පෙන්නුම් කළ අතර සුළු පරිමාණ ගෙවීම් පද්ධතිවල අඛණ්ඩ ඉහළ වර්ධනය මේ සඳහා දායක වන ලදී.** ඩිජිටල් ගෙවීම් ක්‍රම භාවිතය සඳහා වැඩි වශයෙන් යොමු වීම මෙම ප්‍රවණතාවය මගින් පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය මෙන්ම ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන හා නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය මගින් සකස් කරන ලද උපාය මාර්ග මෙම ප්‍රවණතාවයෙහි සාර්ථකත්වයට හේතු වන ලදී.

**ඩිජිටල් ගෙවීම් මාධ්‍යයන් සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට, පද්ධතිවල සහභාගිකරුවන් හට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමට සහ පද්ධතිවල පැවැත්ම සහතික කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති තුළින් ගෙවීම් පද්ධතිවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කරන ලදී.** කාසි සහ නෝට්ටු භාවිතයට වඩා ක්ෂණිකව බැංකු අතර තත්කාලීනව මුදල් හුවමාරු කිරීම සඳහා වන මහජන කැමැත්ත වැඩිවීම රටේ ක්ෂණික ගෙවීම් පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි (CEFTS) ගනුදෙනු, ඩිජිටල් ගෙවීම් පද්ධති අතර ඉහළම වර්ධනයක් 2023 වසර තුළ වාර්තා කිරීමට හේතු විය. ඒ අනුව 2023 වසරේ දී, ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) මගින් බැංකු ගිණුම් වලින් බදු සහ රේගු බදු වැනි රාජ්‍ය ආයතන සඳහා වන ගෙවීම්වලට සෘජුවම පහසුකම් සැලසීම, LANKAQR ගනුදෙනු සහ ජස්ට්පේ (JustPay) මගින් ජංගම ගෙවීම් යෙදුමකට ගනුදෙනුකරුගේ ඕනෑම බැංකු ගිණුමක් සම්බන්ධ කිරීමෙන් ගනුදෙනුකරුවන් හට ගෙවීම් කිරීමට ඉඩ සැලසීම මෙන්ම ගෙවීම් කාඩ්පත් භාවිතය යන සියල්ල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**2023 වසර තුළ, තත්කාලීන බැංකු හුවමාරු කෙරෙහි සැලකිය යුතු යොමු වීමක් දක්නට ලැබුණු අතර, චෙක්පත් මගින් ක්‍රියාත්මක කරන ලද ගනුදෙනුවලට සාපේක්ෂව තත්කාලීන අරමුදල් හුවමාරු හරහා සිදු කරන ලද ගනුදෙනුවල වටිනාකම ඉක්මවා යෑම මගින් එය සනාථ වේ.** ගනුදෙනුකරුවන් අතර විශාල වටිනාකමින් යුතු අරමුදල් හුවමාරු කිරීමේ හැකියාව ඇති තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතිය හරහා සිදු කරන ලද පුද්ගලික හා ආයතනික යන ගනුදෙනු ද්විත්වයම අඛණ්ඩව වැඩිවිය. කෙසේ වෙතත්, එහි සහභාගිවන්නන් වෙනුවෙන් RTGS පද්ධතිය හරහා පියවීම් සිදු කරන ලද දිනය තුළ ද්‍රවශීලතා පහසුකම සහ නිත්‍ය ණය පහසුකම සම්බන්ධ ගනුදෙනුවල වටිනාකම සහ පරිමාව යන ද්විත්වයම පහත වැටීමට 2023 වසර තුළ වෙළඳපොළ ද්‍රවශීලතාවයේ සැලකිය

**1.32 රූප සටහන** **සුළු පරිමාණ ගනුදෙනුවල ප්‍රමාණය**



යුතු වර්ධනය හේතු වන ලදී. තවද, කලාපීය වශයෙන් ගෙවීම් පද්ධති ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින්, LANKAQR, ඉන්දියාවේ Unified Payments Interface (UPI) සහ චීනයේ යුනියන්පේ ඉන්ටර්නැෂනල් සමඟ 2023 දී ඒකාබද්ධ කරන ලදී.

**වෙළඳපළ ප්‍රවණතා සමීපව අධීක්ෂණය කිරීම, අවශ්‍ය අවස්ථාවලදී කඩිනම් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ රට තුළ ගෙවීම් ක්ෂේත්‍රයේ මතුවන අවදානම් අවම කිරීම සඳහා සුදුසු පරිදි පාර්ශවකරුවන් දැනුම්වත් කිරීම තුළින් ගෙවීම් සහ පියවීම් පද්ධති ස්ථාවරත්වය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහතික කරන ලදී.** තවද, රට තුළ කාර්යක්ෂම ගෙවීම් හා පියවීම් පද්ධති පවත්වාගෙන යෑමටත්, එමගින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහාය වීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටී.

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

**මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම තුළින් ඇතිවන අවිශ්වාසනීයත්වය, රටක වෙළඳපොළ විකෘතිතා, නියාමන සංකූලතා, කීර්තිනාමයට වන හානි සහ පද්ධතීන්ට බලපාන උපද්‍රව ආදිය ඇති කරලීම හරහා එහි මූල්‍ය පද්ධතිය සැලකිය යුතු ලෙස අවදානමට ලක් කරනු ලබයි.** 2023 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය, සැක කටයුතු ගනුදෙනු වාර්තා 1369ක් විශ්ලේෂණය කරමින් සහ ඉන් 236ක් නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන ආයතන වෙත වැඩිදුර විමර්ශනය සඳහා යොමු කරමින්, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව කටයුතු කරන ලදී. අවදානම මත පදනම් වූ අධීක්ෂණ ප්‍රවේශය යටතේ, මූල්‍ය බුද්ධි ඒකකය විසින් එතැන් පරීක්ෂාවන් 23ක් සිදු කරමින් හේතු දක්වන ලෙස දැනුම් දීමේ ලිපි 15ක් සහ දඩ නියම කිරීමේ ලිපි 13ක් මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද අතර, රුපියල් මිලියන 21.2ක දඩ මුදල් ලෙස රැස් කර ගන්නා ලදී. තවද, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් 2021/22 වසර සඳහා සිදු කරන ලද ජාතික අවදානම් ඇගයීමේ දී ප්‍රධාන වශයෙන් හඳුනාගත් තර්ජනයන්, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා අවභාවිත වීමට ඇති ඉඩකඩ සහ ශ්‍රී ලංකාව තුළ හඳුනාගත් ප්‍රධාන අවදානම් පිළිබඳව සඳහන් කරමින් 2023 සැප්තැම්බර් මාසයේ දී එහි සංක්ෂිප්ත වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. ජාතික අවදානම් ඇගයීමේ ප්‍රතිඵල අනුසාරයෙන් 2023 - 2028 වසර සඳහා වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය සකස් කර කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළව 2025 වසරේ දී සිදු කිරීමට නියමිත අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සහභාගී වන ප්‍රධාන පාර්ශ්වකරුවන්, ඒ වෙනුවෙන් සූදානම් කිරීමේ අරමුණින් ආයතනික මට්ටමින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුම් අදාළ පාර්ශ්වයන් වෙත ලබා දෙන ලදී. තවද, මෙම ක්‍රියාකාරී සැලසුම්වල සාර්ථකත්වය අධීක්ෂණය කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැලැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ 'කාර්යසාධන බලකායක්' ද අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී.

### මූල්‍ය අංශයට අදාළ නීති ප්‍රතිසංස්කරණ

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත සහ 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත 2023 සැප්තැම්බර්/නොවැම්බර් මාසවලදී නීතිගත කර බලාත්මක කරන ලදී.** 1988 අංක 30 දරන බැංකු පනතට අදාළ විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා එම පනතට සංශෝධන ඉදිරිපත් කරන ලද අතර දැනට එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. තවද, 2023 වසර තුළ දී, ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත සහ මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පනත කෙටුම්පත් කිරීමේ දී මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශයට තාක්ෂණික සහාය ලබා දෙන ලදී. 2023 වසර තුළ සිදු කරන ලද අනෙකුත් නීතිමය ප්‍රතිසංස්කරණ වනුයේ, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතට අදාළව සංශෝධන කෙටුම්පත් කිරීම සහ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය සඳහා වන නව නීති කෙටුම්පත් කිරීමට අදාළව වෙළඳ නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනතට (TCN Act) සංශෝධන කෙටුම්පත් කිරීම වේ.

### මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

**2023 වසර තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම නියාමන විෂය පථයට අදාළ වන මූල්‍ය සේවා සපයන්නන්ගේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව**

1

**ශක්තිමත් කිරීමේ අරමුණින් සුවිශේෂී මූලපිරීමක් ක්‍රියාවට නංවන ලදී.** ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අගෝස්තු 08 වන දින, 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10 (ඇ) වගන්තිය යටතේ, 2023 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ නව රෙගුලාසි නිකුත් කරන ලදී. ශක්තිමත් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව, මූල්‍ය අංශයේ විනිවිදභාවය, සාධාරණත්වය හා වගකීම් සහගත ව්‍යාපාරකරණය වර්ධනය කිරීම අරමුණු කරගත් පුළුල් වැඩපිළිවෙලකින් සමන්විත වන අතර, එමඟින් වඩා ශක්තිමත් සහ පාරිභෝගිකයා කෙන්ද්‍රකරගත් මූල්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීම අපේක්ෂා කෙරේ. තවද, මෙම රෙගුලාසි මඟින් පවතින ද්විස්ථර පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටියට අමතරව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අධීක්ෂණය සඳහා ඵලදායී අධීක්ෂණ යාන්ත්‍රණයක් වන, වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ අධිකාරී බලය සහ රාමුව සපයනු ඇති අතර මෙම රෙගුලාසි 2024 වසර තුළ ක්‍රමානුකූලව බලාත්මක වනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගන්නා ලද මෙම ක්‍රියාමාර්ග වලින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගිකයින්ගේ සුබසිද්ධිය මූලික කර ගනිමින් මූල්‍ය පද්ධතියේ විශ්වසනීයත්වය හා ස්ථායීතාවය පවත්වාගෙන යෑම අරමුණු කෙරේ.

### තැන්පතු රක්ෂණ සහ නිරාකරණ අධිකාරිය

**මහ බැංකු පනතේ 62 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතන නිරාකරණය කිරීමේ වගකීම දරන අධිකාරිය ලෙස නම් කර ඇත.** ඒ අනුව, මහ බැංකුව, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීමට දායක වූ අතර, මහ බැංකුවේ නිරාකරණ අධිකාරී බලයන් ශක්තිමත් කිරීම සහ එම නිරාකරණ බලතල කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව තැන්පතු රක්ෂණ ක්‍රමය පරිපාලනය කිරීම හරහා මූල්‍ය පද්ධති ස්ථායිතා රාමුව වැඩිදියුණු කිරීම උදෙසා තැන්පතු රක්ෂණ සහ නිරාකරණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

**මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති මහජන විශ්වාසය රැක ගැනීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ප්‍රවර්ධනය කිරීමට සහ දායක වීමට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධානයන්ට අනුව නෛතිකව ස්ථාපිත කරන ලදී.** ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සාමාජික ආයතන 63කින් සමන්විත වන අතර මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය කෙරෙහි තැන්පත්කරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා 2023 වසර තුළ දී රුපියල් මිලියන 505.0ක හානිපූරණ වියදම් ගෙවා ඇත. තවද, මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාවය සඳහා අත්‍යාවශ්‍ය වන ඵලදායී තැන්පතු රක්ෂණ ක්‍රමයක් සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය හා ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම අරමුණු කර ගෙන ශ්‍රී ලංකා රජය, ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක සම්බන්ධ වී සිටියි.

### විදේශ විනිමය නියාමනය සහ අධීක්ෂණය

**2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ රජයේ නියෝජිතයා වශයෙන්, රට තුළ විදේශ විනිමය ගනුදෙනු නියාමනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වගකීමෙන් බැඳී සිටී.** 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද "අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" ප්‍රකාරව, ශ්‍රී ලංකාවට අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම අධීක්ෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණෙනිව ශ්‍රී ලංකා රේගුව, බලපත්‍රලාභී බැංකු සහ තෝරාගත් ප්‍රධාන අපනයනකරුවන් යන පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන්, වසර තුළ දී, අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියට සැලකිය යුතු වැඩිදියුණු කිරීම් එක් කරන ලදී. එ.ජ. ඩොලර් මිලියන 14,997ක අපනයන ඉපැයීම් අගයක් වාර්තා කරමින් ඉන් එ.ජ. ඩොලර් මිලියන 4,009කට සමාන අගයක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරමින්, දේශීය විදේශ විනිමය වෙළඳපොලෙහි ද්‍රවශීලතාවය වර්ධනය කරලීමට, මෙම පියවරයන් උපකාරී විය.

**තවද, මුදල් හුවමාරු කිරීමේ කටයුතුවල නිරත පරිසීමිත වෙළෙන්දන්ගේ ක්‍රියාකාරකම් දැඩි අධීක්ෂණයකට ලක් කරන ලදී.** එහි ප්‍රතිඵලයක් වශයෙන්, පරිසීමිත වෙළෙන්දන් විසින් 2022 වසරේ දී බැංකු පද්ධතියට තැන්පත් කළ එ.ජ. ඩොලර් මිලියන 159.8ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 388ක අගයක් දක්වා වර්ධනය වීම තුළින්, එකී පරිසීමිත වෙළෙන්දන්ගේ කාර්යසාධනයේ වාර්තාගත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**විශේෂ සටහන 4**

## වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය: මූල්‍ය පද්ධතියේ විශ්වාසය පවත්වා ගැනීම


### හැඳින්වීම

පසුගිය දශක දෙකක පමණ කාලය තුළ විධිමත් නියාමනයන් සහිත දියුණු ආර්ථිකයන් තුළ පවා සිදු වූ මූල්‍ය බිඳවැටීම් සහ මූල්‍ය අර්බුද හමුවේ මූල්‍ය ආයතන, මූල්‍ය අධිකාරීන් සහ සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජනතාවගේ, විශේෂයෙන් ම මූල්‍ය පාරිභෝගිකයන්ගේ විශ්වාසය සහ පැහැදීම පවත්වා ගැනීම ඉතාමත් වැදගත් වන බව මනා ලෙස පෙන්නුම් කර ඇත. මෙම තත්ත්වය තුළ මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සහ මූල්‍ය සේවා සපයන්නන් විසින් සලසා ඇති මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මූල්‍ය පද්ධති සුපරීක්ෂණ කාර්යයේ විෂය පථය මෙන්ම ඒ සඳහා වන ප්‍රවේශයන් වඩාත් ශක්තිමත් කිරීමට සහ හැඩගස්වා ගැනීමට ලෝකයේ සෑම මූල්‍ය අධිකාරියක් ම යොමු විය. ඒ අනුව, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව, ඵලදායී නියාමනයන්, හැසිරීම් අධීක්ෂණය සහ පාරිභෝගික සවිබල ගැන්වීම මගින් ශක්තිමත් කිරීම ලොව පුරා මූල්‍ය අධිකාරීන්ගේ ප්‍රමුඛතාවයක් බවට පත්වෙමින් ඇත. නිදසුනක් ලෙස, ලෝක බැංකුව විසින් පවත්වන ලද 2022 ගෝලීය මූල්‍ය අන්තර්ගතභාවය සහ පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ සමීක්ෂණයට අනුව, එයට ප්‍රතිචාර දැක්වූ රටවල් 113ක් අතරින් රටවල් 109ක මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ රෙගුලාසි ක්‍රියාත්මක වන බව වාර්තා කර ඇත.

### වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය

මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහ ආර්ථික වර්ධනයට දායක වෙමින්, වෙළෙඳපොළ සුපිලිපන්නභාවය සහ තැන්පත්කරුවන්, ණය ගැණුම්කරුවන්, ආයෝජකයන් යන පාර්ශවකරුවන් මෙන්ම මහජනතාව අතර විශ්වාසය පිළිබඳ පුළුල් අරමුණ සාක්ෂාත් කර ගැනීම මගින් නියාමකයින් විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයේ මූලිකාංගයක් වන මෙම වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය භාවිත කරනු ලබයි. පුළුල් හෝ පූර්ණ විෂය පථයක් සහිත වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය මගින් මූල්‍ය සේවා සපයන්නන්ගේ නිෂ්පාදන, සේවා, පද්ධති සහ ක්‍රියා පටිපාටි පිළිබඳ අඛණ්ඩ සමාලෝචනයක් සිදුවන අතර එමගින් කඩිනම් නිවැරදි කිරීම් සහ බලාත්මක කිරීම් ක්‍රියාවට නංවනු ලැබේ. වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය, මූල්‍ය ආයතන විචක්ෂණශීලී අධීක්ෂණය සමඟ සසඳා බලන විට, අරමුණු, ප්‍රවේශය, ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් සමානකම් පැවතුණ ද, එහි සංකල්ප සහ අවධානය යොමු කරන ක්ෂේත්‍ර අනුව විචක්ෂණශීලී අධීක්ෂණයට වඩා වෙනස් වන අතර, එමගින් මූල්‍ය පාරිභෝගිකයින් සහ මූල්‍ය සේවා සපයන්නන් යන දෙඅංශයට ම වඩාත් සාධාරණ වූ තත්ත්වයක් ලබා දීමට කටයුතු කරනු ඇත.

**රූප සටහන වි.ස. 2.1** වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණ ක්‍රියාවලිය




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

### වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණ ප්‍රවේශයන්

විවිධ මෙහෙයුම් පරිසරයන් සහ ව්‍යුහයන් යටතේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය සැලසුම් කර ක්‍රියාත්මක වන බැවින්, නියාමන අරමුණු, සම්පත් සහ කුසලතා මට්ටම් මෙන්ම මූල්‍ය අංශයේ සහ සමස්ත ආර්ථිකයේ සංවර්ධනයට ද ගැලපෙන පරිදි ප්‍රධාන ප්‍රවේශයන් දෙකක් ඔස්සේ එය සකස් කළ හැකිය. අනුකූලතා මත පදනම් වූ ප්‍රවේශයේ දී, මූල්‍ය සේවා සපයන්නන් විසින් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම කෙරෙහි අධීක්ෂකවරුන් අවධානය යොමු කරන අතර, එහිදී නීති හා රෙගුලාසිවලට පූර්ණ අනුකූලතාව සහතික කිරීම සඳහා සුදුසු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ඇත. එසේ වූවද, අවදානම් මත පදනම් වූ ප්‍රවේශයේ දී අවදානම් විශ්ලේෂණය සහ අවදානම් අවම කිරීම් කෙරෙහි අධීක්ෂකවරුන් අවධානය යොමු කරයි. ඒ අනුව, අවදානම් මත පදනම් වූ ප්‍රවේශය වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණයෙහි වඩා පූර්වගාමී ප්‍රවේශයක් ලෙස හඳුනාගත හැකි අතර එහිදී අධීක්ෂණ ක්‍රියාවලියට පෙර සහ අධීක්ෂණ චක්‍රය තුළ දී හඳුනාගත් අවදානම් මට්ටම් අනුව අධීක්ෂණ ක්‍රියාකාරකම් වඩා සූක්ෂම ලෙස සකස් කිරීම සිදුවේ.

### ප්‍රධාන අධීක්ෂණ මෙවලම්

වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය තුළ මාධ්‍ය නිරීක්ෂණ සහ මූල්‍ය සේවා සමාලෝචන, තේමාත්මක සමාලෝචන (Thematic Review), හදිසි වෙළෙඳපොළ සංචාර සහ ඇමතුම් (mystery shopping and calls), මෙන්ම මූල්‍ය සේවා සපයන්නන්ගේ ස්වයං තක්සේරු කිරීම සහ මූල්‍ය සේවා සපයන්නන්ගේ ඉහළ කළමනාකාරිත්වය සමඟ නියුතු වී කටයුතු කිරීම වැනි අධීක්ෂණ මෙවලම් මාලාවක් ඇතුළත් වේ. මෙම මෙවලම් වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ අවදානම් සහ එහිදී මතුවන ගැටලු පාලනය කිරීම සඳහා යම් භාවිතයන් සහ පාලන ක්‍රමවේදයන්වල ප්‍රමාණාත්මක බව නිර්ණය කිරීම සම්බන්ධයෙන් විශේෂ

1

අවධානයක් යොමු කරමින් යොදාගනු ලබන අතර, මෙමගින් ඵලදායී වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණයක් සිදු කිරීම සඳහා අධීක්ෂකවරුන්හට පහසුකම් සලසා ඇත.

**මහ බැංකුවේ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණ කාර්යය**

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නියාමනයන්හි ගෝලීය වශයෙන් සිදුවූ සංවර්ධනය අනුව යමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේ දී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව පිහිටුවන ලද අතර, මුදල් නීති පනතේ 10(ඇ) වගන්තිය යටතේ, 2023 වසරේ අගෝස්තු මස දී, 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි නිකුත් කරන ලදී. 2024 වසරේ අගෝස්තු මාසයේ සිට පූර්ණ වශයෙන් බලාත්මක වන මෙම රෙගුලාසි මගින්, විවිධ නීතිමය තත්ත්ව යටතේ මීට පෙර නිකුත් කර ඇති පාරිභෝගික ආරක්ෂණ රාමු ඒකාබද්ධ කිරීම සහ ශක්තිමත් කිරීම ද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය බලතල ද ලබා දී ඇත.

මෙම රෙගුලාසි මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව, මූල්‍ය සේවා සපයන්නන්ගේ වාර්තා වී ඇති අනුකූලතා නොවීම් සහ අක්‍රමිකතා පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් යටතේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු සකස් කර ඇත. වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණයෙහි මුල් පියවරක් ලෙස, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සේවා සපයන්නන්ගේ පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය පිළිබඳ තේමාත්මක සමාලෝචනයක් සිදු කර ඇති අතර, මෙමගින් මූල්‍ය සේවා සපයන්නන්හට ඔවුන්ගේ අභ්‍යන්තර පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට අවස්ථාවක් සලසන ලද අතර ම, වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා පසුබිම සැකසීමද මෙය උපකාරී වනු ඇත.

**සමාප්තිය සහ ඉදිරි දැක්ම**

නවීන මූල්‍ය නිපැයුම් සහ සේවාවන්හි පවතින වැඩි අවදානම් සහ සංකීර්ණතා සමඟ සෑම රටක් ම ගමන් කරන තත්ත්වයක් තුළ මූල්‍ය අන්තර්ගතභාවය සහ පද්ධති ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන අංගයක් ලෙස මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සැලකිය හැක. ශක්තිමත් වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය නියාමනය කිරීමේ ප්‍රධාන යාන්ත්‍රණය ලෙස කටයුතු කරන අතර, නිරන්තරයෙන් ම මූල්‍ය පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සැලකීම සහ මූල්‍ය සේවා සපයන්නන්ගේ වගකීම් සහගත වෙළෙඳපොළ හැසිරීම තවදුරටත් ශක්තිමත් කරනු ලබන අතර, මෙමගින් සමස්ත මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි කිරීමට මග පෑදේ.

මේ සම්බන්ධයෙන්, මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ, නිපුණතා සහ ක්‍රියා පටිපාටි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට අනුව සංවර්ධනය කරමින් පවතී. වර්තමානයේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි අධීක්ෂණ ප්‍රවේශය, මෙවලම් සහ ඒ සම්බන්ධ සියලු අවශ්‍ය විස්තර සහිතව ඒකාබද්ධ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණ අත්පොතක් සකස් කර ඇති අතර 2024 වසරේ දෙවන භාගයේ දී සම්පූර්ණ විෂය පථයකින් සමන්විත පළමු වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය ආරම්භ කිරීමට අපේක්ෂා කර ඇත. ඉදිරියේ දී, මූල්‍ය පාරිභෝගිකයින්ගේ විශ්වාසය තහවුරු කරමින් වඩාත් ශක්තිමත් සහ ස්ථාවර මූල්‍ය පද්ධතියකට දායක වීමේ අරමුණින් වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පළපුරුද්ද සහ ප්‍රවීණත්වය ලබා ගැනීම සඳහා අනෙකුත් රටවල වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂකවරුන් සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ සන්ධානය (AFI) සහ ජාත්‍යන්තර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ සංවිධානය (FinCoNet) වැනි ජාත්‍යන්තර සංවිධාන වෙතින් වැඩි සහයෝගයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරනු ලබයි.

---

මූලාශ්‍ර


1. An Introduction to Developing a Risk-Based Approach to Financial Consumer Protection Supervision (2022) - World Bank
2. Establishing a Financial Consumer Protection Supervision Department (2021) – World Bank
3. Financial Consumer Protection and New Forms of Data Processing Beyond Credit Reporting (2018) – World Bank
4. Good Practices for Financial Consumer Protection (2017) – World Bank
5. Market Conduct Supervision in Small Countries: The Case of Armenia (2013) – World Bank
6. Market Conduct Supervision of Financial Services Providers A Risk-Based Supervision Framework (2016) - Alliance for Financial Inclusion
7. Market Conduct Supervision – A Toolkit (2023) - Alliance for Financial Inclusion
8. The Global State of Financial Inclusion and Consumer Protection (2022) - World Bank


**ණය තොරතුරු**

**මූල්‍ය ආයතනවල ණය පැහැර හැරීමේ අවදානම අවම කිරීම සහ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය අඛණ්ඩව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.** ඒ අනුව, ණය තොරතුරු කාර්යාංශය විසින් සිදු කරන සම්ප්‍රදායික ප්‍රමිතීන්ගෙන් එහා ගිය ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලිය මගින් පුද්ගලයන්ගේ ණය සුදුසුකම් පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් සපයන අතර එමගින් ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ණය තත්ත්වය හොඳින් කළමනාකරණය කිරීමට සහ ණය දෙන්නන්ට

විශ්වාසදායී පුරෝකථන මත පදනම්ව ණය දීමේ තීරණ කඩිනම් කිරීමට හැකියාව ලැබේ. ණය දීම පිළිබඳ වෙළඳපොළ දත්ත විශ්ලේෂණය කිරීම, අනාගත වෙළඳපොළ වර්ධනයන්, පාරිභෝගික හැසිරීම් වල වෙනස්කම් සහ වෙනස් වන සමාජ අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහා උසස් තාක්ෂණය උපයෝගී කර ගැනීම කෙරෙහි ද ණය තොරතුරු කාර්යාංශය අවධානය යොමු කරයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක යන අංශයන් ව්‍යුහාත්මකව ඇගයීමට ණය තොරතුරු කාර්යාංශය විසින් හඳුන්වා දුන් මෙම විශ්ලේෂණාත්මක නිෂ්පාදනය සඳහා ණය දෙන ආයතනවල පරිශීලකයින්ට පූර්ණ ප්‍රවේශය ඇත. තවද, මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සහ විස්තීරණ ණය දත්ත සහ ලියකියවිලි නොමැති අවිධිමත් අංශය ආවරණය කිරීම සඳහා, ණය තොරතුරු කාර්යාංශය විකල්ප දත්ත මූලාශ්‍ර ගවේෂණය කරමින් පවතී. රක්ෂණ කටයුතු පිළිබඳ දත්ත, උපයෝගිතා ගෙවීම් සහ විදුලි සංදේශ ගෙවීම්, සහ විද්‍යුත් වාණිජ දත්ත වැනි මෙම මූලාශ්‍ර ඇපකර තක්සේරු කිරීම සඳහා භාවිතා කළ හැකි විධිමත් දත්ත ප්‍රභවයන් ලෙස සැලකේ. තවද, සුරක්ෂිත ගනුදෙනු ලියාපදිංචි කිරීමේ පනත බලාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ චංචල වත්කම් උකස් කිරීම සඳහා ආරක්ෂිත ගනුදෙනු ණය රාමුවක් නිර්මාණය කරනු ඇත. මෙම රාමුව විසින් චංචල ඇපකර මත මූල්‍ය පහසුකම් සැපයීමට නියාමනය කරන ලද මූල්‍ය ආයතන දිරිමත් කරමින් එම ආයතන වල අයිතිවාසිකම් ආරක්ෂා කරනු ඇත.

## 1.6 රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

### 1.6.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

**අභියෝගාත්මක සමාජ-දේශපාලන වාතාවරණයක් මධ්‍යයේ වුව ද, ආදායම් වැඩි දියුණු කිරීම සහ වියදම් තාර්කිකකරණය වැනි දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග මගින් 2023 වසරේ සුවිශේෂී රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයක් ඇති කරමින් ප්‍රධාන මූල්‍ය ශේෂයන් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, එමගින් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩ පවත්වා ගෙන යෑමට සහ සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාවය ඉහළ නැංවීම සහතික කිරීමට හැකි විය.** ඒ අනුව, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කිරීම මගින් ගණනය කෙරෙන, රජයේ අභිමත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම පිළිබිඹු

**1.26 සංඛ්‍යා සටහන** **රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය**

| ශීර්ෂය | 2022 | 2023 (අ) | 2023/2022 | |
|---|---|---|---|---|
| | | | නිරපේක්ෂ වෙනස | % වෙනස |
| | | රුපියල් මිලියන | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **2,012,589** | **3,074,324** | **1,061,735** | **52.8** |
| මුළු ආදායම | 1,979,184 | 3,048,822 | 1,069,638 | 54.0 |
| බදු ආදායම | 1,751,132 | 2,720,563 | 969,431 | 55.4 |
| බදු නොවන ආදායම | 228,052 | 328,259 | 100,207 | 43.9 |
| ප්‍රදාන | 33,405 | 25,502 | (7,903) | (23.7) |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **4,472,556** | **5,356,591** | **884,035** | **19.8** |
| පුනරාවර්තන | 3,519,633 | 4,699,679 | 1,180,046 | 33.5 |
| පොලී ගෙවීම් | 1,565,190 | 2,455,600 | 890,410 | 56.9 |
| එයින් දේශීය | 1,436,569 | 2,332,208 | 895,639 | 62.3 |
| විදේශීය | 128,621 | 123,391 | (5,230) | (4.1) |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 952,923 | 656,912 | (296,011) | (31.1) |
| එයින් රාජ්‍ය ආයෝජන | 1,014,293 | 932,745 | (81,548) | (8.0) |
| **වර්තන ශිෂ්ඨමේ ශේෂය** | **-1,540,448** | **-1,650,857** | | |
| **ප්‍රාථමික ශේෂය** | **-894,777** | **173,332** | | |
| **සමස්ත අයවැය ශේෂය** | **-2,459,967** | **-2,282,267** | | |
| **මූල්‍යනය** | **2,459,967** | **2,282,267** | **(177,700)** | **(7.2)** |
| විදේශීය මූල්‍යනය | 424,822 | 494,655 | 69,833 | 16.4 |
| දේශීය මූල්‍යනය | 2,035,145 | 1,787,612 | (247,533) | (12.2) |
| | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ආ) | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **8.4** | **11.1** | | |
| මුළු ආදායම | 8.2 | 11.0 | | |
| බදු ආදායම | 7.3 | 9.8 | | |
| බදු නොවන ආදායම | 0.9 | 1.2 | | |
| ප්‍රදාන | 0.1 | 0.1 | | |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **18.6** | **19.4** | | |
| පුනරාවර්තන | 14.6 | 17.0 | | |
| පොලී ගෙවීම් | 6.5 | 8.9 | | |
| එයින් දේශීය | 6.0 | 8.4 | | |
| විදේශීය | 0.5 | 0.4 | | |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 4.0 | 2.4 | | |
| එයින් රාජ්‍ය ආයෝජන | 4.2 | 3.4 | | |
| **වර්තන ශිෂ්ඨමේ ශේෂය** | **-6.4** | **-6.0** | | |
| **ප්‍රාථමික ශේෂය** | **-3.7** | **0.6** | | |
| **සමස්ත අයවැය ශේෂය** | **-10.2** | **-8.3** | | |
| **මූල්‍යනය** | **10.2** | **8.3** | | |
| විදේශීය මූල්‍යනය | 1.8 | 1.8 | | |
| දේශීය මූල්‍යනය | 8.5 | 6.5 | | |

මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(අ) තාවකාලික

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

කරන ප්‍රාථමික ශේෂය, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දක්වා ඇති ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක අභිබවා යමින්, 2022 වසරේ දී වාර්තා කරන ලද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7ක (රුපියල් බිලියන 894.8) හිඟයට සාපේක්ෂව, 2023 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.6ක (රුපියල් බිලියන 173.3) අතිරික්තයක් වාර්තා කළේය.


1

ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් අවසන් වරට වාර්තා වූයේ 2018 වසරේ වන අතර, 1950 සිට ශ්‍රී ලංකාව ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් වාර්තා කර ඇත්තේ වසර හයක් තුළ පමණි. රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ ණය සමුච්චය වීම ඵලදායී ලෙස පාලනය කිරීම සඳහා ධනාත්මක ප්‍රාථමික ශේෂයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. මේ අතර, ඉහළ පොලී ගෙවීම් හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය[27] නාමික වශයෙන් පුළුල් වූව ද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස එය සුළු වශයෙන් අඩු විය. සමස්ත අයවැය හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ සියයට 10.2 (රුපියල් බිලියන 2,460.0) හා සැසඳීමේ දී 2023 වසරේ දී සියයට 8.3ක් (රුපියල් බිලියන 2,282.3ක්) දක්වා අඩු විය. සමස්ත අයවැය හිඟය සඳහා කරන ලද මූලික ඇස්තමේන්තුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.9ක් (රුපියල් බිලියන 2,404.0) විය.

### 1.6.2 රජයේ ආදායම, වියදම සහ ශුද්ධ ණය දීම්

**රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා රජය විසින් දක්වන කැපවීම පිළිබිඹු කරමින්, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී රජයේ ආදායම නාමික වශයෙන් සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** ඒ අනුව, නාමික වශයෙන් රජයේ ආදායම සියයට 54.0ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර, ද.දේ.නි.ට අනුව 2023 වසරේ දී ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.0ක් දක්වා ප්‍රතිශතාංක 2.8කින් ඉහළ ගියේය. 2022 වසරේ දෙවන භාගයේ දී සහ 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද බදු ප්‍රතිසංස්කරණ ගණනාවක් ආදායම් එක්රැස් කිරීම වැඩි වීමට හේතු විය. ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද, නිෂ්පාදන/සුරා බදු, ආනයන බදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද යන බදුවලින් ලද ආදායම ඉහළ යෑම බදු ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී හඳුන්වා දුන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ද රජයේ ආදායම ඉහළ යෑමට දායක විය. බදු නිදහස් සීමාව, බදු අනුපාත හා බදු ආදායම් කාණ්ඩ අනුව පුද්ගලික ආදායම් බදු ව්‍යුහයට සිදු කරන ලද සංශෝධන, විශේෂිත ව්‍යක්තිකයන්ට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වීම අනිවාර්ය කිරීම, සංස්ථාපිත ආදායම් බදු අනුපාතය ඉහළ නැංවීම සහ සංස්ථාපිත ආදායම් බදුවලට සම්බන්ධ සහනදායී අනුපාත ඉවත් කිරීම යනාදී ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා 2023 වසරේ දී ආදායම් බදු සැලකිය යුතු ලෙස වැඩි කර ගැනීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.2ක් ලෙස වාර්තා වූ ආදායම් බදු එක්රැස් කිරීම, 2023 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.3ක් දක්වා වැඩි විය. මේ අතර, 2022 වසරේ දී අදියර දෙකකින් එකතු කළ අගය මත බදු අනුපාතිකය ඉහළ නැංවීම සඳහා ගැළපුම් සිදු කිරීම සමඟ එම වසරේ අවසාන භාගයේ දී එකතු කළ අගය මත බද්දට අදාළ බදු පදනම පුළුල් වන පරිදි එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව පහළ දැමීම, 2023 වසරේ දී එකතු කළ අගය මත බදු එකතුවේ කැපී පෙනෙන වර්ධනයට දායක විය. ඒ අනුව, එකතු කළ අගය මත බදු එකතුව පෙර වසරේ පැවති ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.9ක සිට 2023 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.5ක් දක්වා වැඩි විය. මද්‍යසාර, දුම්වැටි, පෙට්‍රල් සහ ඩීසල් සඳහා වන නිෂ්පාදන/සුරා බදු ව්‍යුහයන් 2023 වසර තුළ දී කිහිප වතාවක් සංශෝධනය කිරීම, 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 1.4ක් වූ නිෂ්පාදන/සුරා බදුවලින් ලද ආදායම, 2023 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.7ක් දක්වා ඉහළ යෑමට හේතු විය. 2023 වසරේ දී ආනයන බදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඇතුළු ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධ බදු නාමික වශයෙන් සැලකිය යුතු වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කිරීම සඳහා අදාළ අනුපාත ඉහළ නංවමින් සිදු කරන ලද සංශෝධන හේතු විය. කෙසේ වුව ද, ද.දේ.නි. අනුව ගණනය කළ විට, එම බදුවලින්

**1.33 රූප සටහන** **රාජ්‍ය ආදායමේ සංයුතිය - 2023**





මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය


27 ජංගම ගිණුමේ ශේෂය මුළු ආදායම සහ මුළු පුනරාවර්තන වියදම් අතර වෙනස නියෝජනය කරයි.


ලද ආදායමේ වර්ධනය සුළු අගයක් වූ අතර, 2023 වසරේ වැඩි කාල සීමාවක් තුළ හදිසි නොවන ආනයන සඳහා සීමාවන් පවත්වාගෙන යෑම සහ මිලදී ගැනීමේ හැකියාව අඩු වීම හේතුවෙන් ආනයන අඩු වීම මෙයට හේතු විය. මේ අතර, සමාජ ආරක්ෂණ දායකත්ව බදු එකතුව 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 0.8ක් විය. තීරු බදු නොවන බදු වර්ග ක්‍රමයෙන් ඉවත් කිරීමට 2023 වසර තුළ දී පියවර ගැනීම හේතුවෙන්, සලකා බලන වසර තුළ දී, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් සහ සෙස් බද්දෙන් ලද ආදායම අඩු විය. මේ අතර, 2023 වසර තුළ දී බදු නොවන ආදායම ද නාමික සහ මූර්ත යන දෙයාකාරයෙන් ම ඉහළ ගිය අතර, ගාස්තු හා අය කිරීම් මෙන්ම රජය සතු ව්‍යවසායයන්ගේ ලාභ සහ ලාභාංශ පැවරුම් වැනි ප්‍රභවයන්ගෙන් ලද ඉහළ ආදායම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසර සඳහා වන මූලික අයවැය ඇස්තමේන්තුවලට අනුව, සමස්ත ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.5ක් ලෙස පුරෝකථනය කර තිබූ අතර, බදු ආදායම සහ බදු නොවන ආදායම, පිළිවෙළින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.3ක් සහ සියයට 1.2ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. පෙර වසරට සාපේක්ෂව 2023 වසරේ ආදායම් එක්රැස් කිරීමේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ ද, 2023 වසර සඳහා වූ ඉහළ අභිලාෂී මූලික අයවැය ඇස්තමේන්තුවලට සාපේක්ෂව සැබෑ ආදායමේ ඌන කාර්යසාධනයක් දක්නට ලැබුණි. 2023 වසරේ රැස් කෙරුණු ආදායම මූලික පුරෝකථනවලින් සියයට 88.4ක් වූ අතර බදු ආදායම සියයට 86.9ක් විය. අයවැයෙන් අපේක්ෂා කළ වේගයට වඩා වැඩි වේගයකින් උද්ධමනය පහත වැටීම, ආනයන ඉල්ලුම අඛණ්ඩව අඩු මට්ටමක පැවතීම, විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම සහ ආදායම් පරිපාලනය ආශ්‍රිත ගැටලු මෙම ඌන කාර්යසාධනයට හේතු ලෙස දැක්විය හැකිය. ආදායම් බදු ඉහළ නැංවීම සඳහා ආදායම් බදු ව්‍යුහයට සිදු කළ සංශෝධන වැනි බදු ක්‍රියාමාර්ග මුළු බදු ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස සෘජු බදු ආදායම ඉහළ යෑමට හේතු වී ඇති අතර, 2022 වසරේ සියයට 30.5ක්ව පැවති එම ප්‍රතිශතයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 33.5ක් දක්වා ඉහළ ගියේය.

**1.34 රූප සටහන**

## රාජ්‍ය ආදායම, වියදම සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්





2022 වසරේ දෙවන භාගයේ දී සහ 2023 වසරේ දී ක්‍රියාත්මක කෙරුණු බදු ප්‍රතිසංස්කරණ, 2023 වසරේ දී රජයේ ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් ඇති වීමට හේතු වූ අතර, දේශීය පොලී වියදම ඉහළ මට්ටමක පැවතියත් වියදම් තාර්කීකකරණ ක්‍රියාමාර්ග හරහා රජයේ වියදම යම්කිසි මට්ටමක පාලනයකට යටත්ව තබා ගැනීමට හැකි විය. විශේෂයෙන් ම වසර පහකට පසු සහ 1950 සිට ගත් කළ හයවන වතාවට ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කරමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ශේෂයන්වල කැපී පෙනෙන දියුණුවක් ඇති විය.

මූලාශ්‍ර: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

1

**ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් කැපී පෙනෙන ලෙස අඩු වී තිබියදීත්, ප්‍රධාන වශයෙන් දේශීය පොළී වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ඉහළ ගියේය.** ඒ අනුව, නාමික වශයෙන්, රජයේ වියදම සියයට 19.8ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර, ද.දේ.නි.ට අනුව 2023 වසරේ දී ප්‍රතිශතාංක 0.8කින් පමණක් වැඩි විය. 2023 වසරේ ජූනි මාසය දක්වා පැවති දැඩි මුදල් තත්ත්වයන් සහ දේශීය ණය ප්‍රශස්තකරණය පිළිබඳව පැවති අවිනිශ්චිතතා මධ්‍යයේ රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පැවති අවදානම් අධිමිල වැඩි වීම හේතුවෙන් දේශීය පොළී අනුපාත ඉහළ යෑම, නාමික වශයෙන් දේශීය පොළී වියදම් සැලකිය යුතු ඉහළ යෑමට බලපා ඇත. මීට අමතරව, රජයට විදේශ මූල්‍යනය සඳහා ඇති ප්‍රවේශය සීමිත වීම හේතුවෙන් දේශීය මූල්‍යනය මත අධික ලෙස රඳා පැවතීම ද දේශීය පොළී වියදම ඉහළ යෑමට හේතු විය. 2023 වසරේ දී පොළී වියදම සමස්ත රජයේ ආදායමෙන් සියයට 80.5ක් සහ සමස්ත රජයේ වියදමෙන් සියයට 45.8ක් වූ අතර, මෙම අගයන් 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 79.1ක් සහ සියයට 35.0ක් ලෙස සටහන් විය. මේ අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 සිට 60 දක්වා අඩු කිරීමට අදාළව පෙර වසරේ ක්‍රියාත්මක කළ සංශෝධන හේතුවෙන් වසර තුළ දී විශ්‍රාම යෑම් ඉහළ යෑම නිසා විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වන වියදම 2023 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, නොමිලේ ඖෂධ ලබාදීම සහ අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, සහනාධාර හා පැවරුම් ඉහළ යෑමට හේතු විය. අනෙක් අතට, රාජ්‍ය අංශයට නව බඳවා ගැනීම් නතර කිරීම සහ රාජ්‍ය අංශයේ සේවකයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විශ්‍රාම යෑමේ ප්‍රතිඵලයක් ලෙස වැටුප් හා වේතන නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද සුළු වශයෙන් අඩු විය. මේ අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළේය. ඉන්දියානු ණය ආධාර යටතේ 2022 වසරේ දී ලං.ඛ.නී.සං.ට ලබා දුන් ණය පහසුකම පියවීම හේතුවෙන් ශුද්ධ ණය දීම් සැලකිය යුතු ලෙස අඩු වීම මෙම පහළ යෑමට මූලික වශයෙන් හේතු විය. ශුද්ධ ණය දීමේ බලපෑම හැර ප්‍රාග්ධන වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ

**1.35 රූප සටහන** **රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2023**




මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පැවති සියයට 3.0 සිට 2023 වසරේ දී සියයට 3.3ක් දක්වා වැඩි විය. 2023 වසර සඳහා වන මූලික අයවැය ඇස්තමේන්තුවලට අනුව, සමස්ත වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 21.2ක් ලෙස පුරෝකථනය කර තිබූ අතර, පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්, පිළිවෙලින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16.8ක් සහ සියයට 4.4ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් අඩු කිරීම සඳහා වියදම් තාර්කිකකරණ ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට රජය ගත් ප්‍රයත්න නිසා අපේක්ෂිත මට්ටමට වඩා දේශීය පොළී ගෙවීම් ඉහළ ගිය ද, පුනරාවර්තන වියදම් අයවැය ඇස්තමේන්තුවලට වඩා විශාල ලෙස ඉහළ යෑම වළක්වා ගනිමින් සමස්ත වියදම පාලනය කර ගැනීමට හැකි විය.

### 1.6.3 අයවැය හිඟය මූල්‍යනය

**ප්‍රධාන වශයෙන් විදේශීය මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට දැනට පවතින සීමා හේතුවෙන්, 2023 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි.** ඒ අනුව, සලකා බලන ලද කාල සීමාව තුළ දී ශුද්ධ දේශීය මූල්‍යනය සමස්ත මූල්‍යනයෙන් සියයට 78.3ක් විය. 2021 වසරේ දී මෙම ප්‍රතිශතය සියයට 100 ඉක්මවා තිබූ අතර, පසුගිය වසර දෙකට සාපේක්ෂව 2023 වසරේ දී මෙම අගය සුළු වශයෙන් අඩු වූව ද, එවැනි සීමා නොපැවති 2019 සහ 2018 වසරවල දී වාර්තා වූ, පිළිවෙලින්, සියයට 62.3ට සහ සියයට 57.5ට සාපේක්ෂව වර්තමාන ප්‍රතිශතය තවමත් ඉහළ මට්ටමක පවතී. දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියට අදාළ ගනුදෙනුවල බලපෑම ඉවත් කර සලකා බැලීමේ දී, වසරේ මුල් භාගය තුළ දී පැවති අවිනිශ්චිතතා සහ භාණ්ඩාගාර බිල්පත්වල ඉහළ පොළී අනුපාත හේතුවෙන් දිගු කාලීන ණය

උපකරණවලට වඩා කෙටි කාලීන ණය උපකරණ සඳහා දැඩි වෙළඳපොළ ඉල්ලුමක් පෙන්නුම් කරමින්, සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු විය.[28] ද.දේ.නියෙහි ප්‍රතිශතයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2022 වසරේ දී වාර්තා වූ සියයට 6.7ක (රුපියල් බිලියන 1,608.2) සිට 2023 වසරේ දී සියයට 7.5ක් (රුපියල් බිලියන 2,058.6ක්) දක්වා ඉහළ ගියේය. අනෙක් අතට, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2022 වසරේ දී වාර්තා වූ සියයට 6.0 (රුපියල් බිලියන 1,440.2) සිට 2023 වසරේ දී සියයට 2.5ක් (රුපියල් බිලියන 692.3ක්) දක්වා අඩු විය. ද.දේ.නියෙහි ප්‍රතිශතයක් ලෙස බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ දේශීය මූල්‍යනය සැලකිය යුතු සංකෝචනයක් වාර්තා කරමින් සියයට 0.02ක (රුපියල් බිලියන 6.4ක) ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස සටහන් විය.[29] 2023 වසරේ දී මෙම පහළ යෑම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.5ක් (රුපියල් බිලියන 1,798.5ක්) ලෙස සටහන් වූ බැංකු නොවන මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය මගින් තුලනය විය. මේ අතර, විදේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය සමස්ත ශුද්ධ මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස, පෙර වසරේ වාර්තා කරන ලද සියයට 17.3ට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 21.7ක් දක්වා වර්ධනය විය. අයවැයට සහාය ලබා දීම සඳහා ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ වාරික දෙකකට අදාළව ලැබුණු දළ අරමුදල් 2023 වසරේ ශුද්ධ විදේශ මූල්‍යනය තුළ ඇතුළත් වේ. මීට අමතරව, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය වැනි අනෙකුත් බහුපාර්ශ්වික ආයතනවලින් සැලකිය යුතු මට්ටමක අරමුදල් ලැබී ඇත. මෙම අරමුදල් රජයේ ආර්ථික ස්ථායීකරණ වැඩසටහනට සහාය වීමට සහ සමාජ ආරක්ෂණ ජාල සඳහා වන වියදම් සඳහා ලබා දී ඇත.

**තෝරා ගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම හේතුවෙන් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන විසින් පහළ හෙළන ලද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් තවදුරටත් එම තත්ත්වයේ ම පවත්වා ගෙන යන ලදී.** ඒ අනුව, ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය සහ එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ විනිමය ණය පැහැර හැරීමට අදාළ ණය ශ්‍රේණිගත කිරීම (Long Term Foreign Currency Issuer Default Rating), පිළිවෙලින්, 'RD' (Restricted Default) සහ 'SD' (Selective Default) ලෙස පවත්වා ගෙන යන ලදී. මූඩීස් ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන දිගුකාලීන විදේශීය ණය පැහැර හැරීමට අදාළ ණය ශ්‍රේණිගත කිරීම 'Ca (ස්ථාවර)' තත්ත්වයෙහි පවත්වා ගෙන ගියේය. මේ අතර, දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන විසින් රජයේ දේශීය ණය සම්බන්ධ ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීමට කටයුතු කරන ලද අතර, දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමත් සමඟම එම ශ්‍රේණිගත කිරීම නැවත ඉහළ නංවන ලදී.

### 1.6.4 මධ්‍යම රජයේ ණය සහ රාජ්‍ය ණය[30]

**ප්‍රධාන වශයෙන් වශයෙන්, ඉහළ උද්ධමනය නිසා ද.දේ.නි.යේ ඇති වූ කැපී පෙනෙන වර්ධනය සහ රුපියලේ අගය ඉහළ යෑම නිසා විදේශ ණය මත ඇතිවූ බලපෑම හේතුවෙන්, මධ්‍යම රජයේ නොපියවූ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2022 වසර අවසානයේ දී පැවති සියයට 114.2 සිට 2023 වසරේ අවසානය වන විට සියයට 103.9ක් දක්වා පහත වැටුණි.** ඒ අනුව, දේශීය ණය සහ විදේශීය ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, 2022 වසරේ දී වාර්තා වූ, පිළිවෙලින්, සියයට 62.5 සහ සියයට 51.8 සිට 2023 වසරේ දී, පිළිවෙලින්, සියයට 61.7ක් සහ සියයට 42.1ක් දක්වා අඩු විය.[31] කෙසේ වෙතත්, සමස්ත ණයෙහි[32] නාමික අගය සියයට 4.4කින් වැඩි

28 වසර තුළ දී, දේශීය ණය ප්‍රශස්තකරණ මෙහෙයුමේ අංගයක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ මහ බැංකු තාවකාලික අත්තිකාරම් පියවන ලදී.

29 මෙම කොටස යටතේ බැංකු අංශයෙන් ශුද්ධ දේශීය මූල්‍යකරණයේ වාර්තා වී ඇති සංකෝචනයට ප්‍රතිවිරුද්ධව, මෙම පරිච්ඡේදයේ මූදල් අංශයේ වර්ධනයන් යටතේ ඇති සංඛ්‍යාන මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය ප්‍රසාරණය විමක් පෙන්නුම් කරයි. ලං.බ.නි.ස.හි රජයේ ඇපකර සහිත රාජ්‍ය ණය මධ්‍යම රජයේ ණය තොගයට මාරු කිරීම මූදල් අමාත්‍යාංශයේ වාර්තාවලට අනුව 2022 වසර අවසානය වන විට වාර්තා වුවත්, එම ගනුදෙනුව බැංකු අංශයේ වාර්තාවල ඔිණුම්ගත කර ඇත්තේ 2023 වසරේ දී වීම මෙම වෙනසට හේතු වී ඇත.

30 බැංකුවල ඇති රජය සතු තැන්පතු ගැළපුම් කළ පසු ඇති ශේෂය රජයේ ණය සංඛ්‍යාලේඛන ලෙස ඉදිරිපත් කර ඇත.

31 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ණය විදේශීය ණය ලෙස වර්ග කර ඇති අතර, නේවාසිකයන් සතු ණය දේශීය ණය ලෙස වර්ගීකරණය කර ඇත.

32 විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ දැනට සාකච්ඡා පැවැත්වෙන පසුබිම තුළ, මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 දින ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණය සම්බන්ධ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමෙන් ගෙවීමට නියමිතව තිබූ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් 2022 වසර සහ 2023 වසර අවසන් වන විට පැවති මධ්‍යම රජයේ නොපියවූ ණය ඇස්තමේන්තුවලට ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිතව තිබූ, එහෙත් නොගෙවන ලද පොලී ගෙවීම් මෙම ණය සේවාකරණ ගෙවීම්වලට ඇතුළත් වේ. තවද, 2022 වසරේ දෙසැම්බර් අග පැවති නොගෙවූ ණය ශේෂයට 2022 අප්‍රේල් සිට 2022 අවසානය දක්වා ගෙවීමට නියමිතව තිබූ, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළ සමහර කුපන්පත් ගෙවීම් ඇතුළත් නොවේ.

1


වීමට දේශීය ණය වර්ධනය වීම සම්පූර්ණයෙන් හේතු වූ අතර, දේශීය මුදලින් නාමනය කරන ලද විදේශීය ණය, 2022 වසරේ දී නිරීක්ෂණය කළ මට්ටම්වලට වඩා අඩු විය. සීමිත විදේශීය මූල්‍යන අවස්ථා හමුවේ මූල්‍යන අවශ්‍යතාවලින් සැලකිය යුතු ප්‍රමාණයක් දේශීය වෙළඳපොළෙන් සපුරා ගැනීම මුළු දේශීය ණයවල නාමික වැඩිවීම මගින් පෙන්නුම් කෙරේ. දේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස මැදි කාලීන හා දිගුකාලීන ණය, 2022 වසරේ දෙසැම්බර් මස අවසානයේ පැවති සියයට 65.7 සිට 2023 වසර අවසන් වන විට සියයට 74.2ක් දක්වා වැඩි විය. මෙම වෙනසට මූලික වශයෙන් හේතු වූයේ දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයට ලබා දී ඇති මහ බැංකු තාවකාලික අත්තිකාරම් දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර බවට පත් කිරීම වන අතර, ඒ හරහා මැදි හා දිගු කාලීන ණය තොගය වැඩි කිරීම තුළින් ණය කල්පිරීමේ කාලය දීර්ඝ කිරීමෙන් රජයේ දළ මූල්‍යන අවශ්‍යතාවය අඩු කිරීමට සහාය ලැබී ඇත. ජා.මූ. අරමුදල සමඟ එකඟ වූ ණය තිරසාර ඉලක්ක සපුරා ගැනීමේ දී මෙය ඉතා වැදගත් වේ. තවද, 2023 වසරේ පළමු භාගය තුළ දී රජය විසින් නොපියවූ රුපියල් ණය තොග පියවන ලද අතර, 2022 වසරේ දෙසැම්බර් මස සිට මධ්‍යම රජයේ ණය තොගය වෙත ඇතුළත් කෙරුණු රජයේ ඇපකර මත ලං.බ.නී.සං. ලබා ගෙන තිබූ විදේශ මුදලින් නාමනය කරන ලද ණය තොගය 2023 වසර අවසානය වන විටත් නොවෙනස්ව පැවතුණි. මේ අතර, 2022 වසරේ අවසානයට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට නාමික වශයෙන් විදේශ ණය අඩුවීමට ප්‍රධාන විදේශ මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ යෑම හේතු විය. 2023 වසරේ දී විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ විචලනය නිසා ඇති වූ විදේශ ණය අඩු වීම රුපියල් බිලියන 1,431.4ක් විය. කෙසේ වෙතත්, 2023 වසරේ මාර්තු සහ දෙසැම්බර් මාසවල දී ලැබුණු ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමේ වාරික දෙක ඇතුළු බහුපාර්ශ්වික සංවිධානවලින් ලැබුණු අරමුදල් මගින් විදේශ ණය තොගයේ රුපියල් අගය අඩුවීමේ බලපෑම යම්තාක් දුරකට සීමා විය. පසුගිය ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල දී ලැබුණු මුදල් මහ බැංකුවේ වගකීමක් ලෙස සැලකුණි. කෙසේ වෙතත්, නවතම වැඩපිළිවෙළ යටතේ රජයේ අයවැයට සහාය ලබා දීම කෙරෙහි අවධානය යොමු වීම හරහා එම අරමුදල් ලැබීම් රජය වෙත පැවරුණු අතර, එමගින් මධ්‍යම රජයේ සමස්ත ණය ප්‍රමාණය වැඩි විය. මධ්‍යම රජයේ සමස්ත ණයට සාපේක්ෂව රජයේ නොපියවූ විදේශ ණය ප්‍රමාණය, 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 45.3ට සාපේක්ෂව, 2023 වසර අවසන් වන සියයට 40.6ක් දක්වා අඩු විය.

**ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ නොපියවූ ණය අඩුවීමට සමගාමීව, 2022 වසර අවසානයේ පැවති ද.දේ.නි.යෙන් සියයට 119.2ක් වූ නොපියවූ රාජ්‍ය ණය[33] 2023 වසර අවසානයේ දී ද.දේ.නි.යෙන් සියයට 110.8ක් දක්වා අඩු වී ඇත.** නාමික වශයෙන් ගත් කළ 2022 වසර අවසානයේ රුපියල් බිලියන 28,672.7ක් වූ සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2023 වසර අවසානය වන විට රුපියල් බිලියන 30,627.3ක් දක්වා වැඩි වූ අතර එය වාර්ෂිකව සියයට 6.8ක වැඩිවීමකි.

**ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් ඇති අනෙකුත් ක්‍රියාමාර්ග සමඟ, ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් රජය 2023 වසරේ දී දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කළේය.** ඒ අනුව, සුදුසුකම් ලත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර විචල්‍ය කුපන් සහිත, ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද නව භාණ්ඩාගාර බැඳුම්කර පහක් බවට පරිවර්තනය කරන ලද අතර, විශ්‍රාම පාරිතෝෂික අරමුදල් සතුව තිබූ භාණ්ඩාගාර බැඳුම්කර මැදි හා දිගු කාලීන කල් පිරීම් සහිත නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. තවද, මහ බැංකුව සතු කල් නොපිරුණු භාණ්ඩාගාර බිල්පත් සහ රජයට ලබා දුන් නොපියවූ තාවකාලික

33 මධ්‍යම රජයේ ණය සහ රාජ්‍ය ඇපකර මත ගනු ලැබූ ණය නොපියවූ රාජ්‍ය ණය තුළ ඇතුළත් වේ.

**1.36 රූප සටහන** **මධ්‍යම රජයේ නොපියවූ ණය**




මූලයන: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.27 සංඛ්‍යා සටහන

## මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී) (අ) (ආ)

රුපියල් බිලියන

| ශීර්ෂය | 2022 | 2023 (ඇ) |
|---|---|---|
| **දේශීය ණය (ඈ)** | **15,033.9** | **17,051.9** |
| කල්පිරීමේ කාලය අනුව | | |
| කෙටි කාලීන (ඉ) | 4,267.7 | 3,616.2 |
| මැදි හා දිගු කාලීන (ඊ) | 9,882.1 | 12,646.9 |
| දේශීය වෙනත් (උ) | 884.1 | 788.7 |
| ආයතන අනුව (ඌ) | | |
| බැංකු (ඌ) | 8,525.7 | 9,102.8 |
| බැංකු නොවන (ඌ) | 6,164.0 | 7,506.3 |
| ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන් කිරීම් (එ) (ඒ) | 344.1 | 442.7 |
| **විදේශීය ණය (ඔ) (ඕ)** | **12,458.2** | **11,644.1** |
| බහුපාර්ශ්වීය | 3,611.6 | 3,817.0 |
| ද්විපාර්ශ්වීය සහ වාණිජ ණය | 8,846.6 | 7,827.1 |
| ව්‍යවහාර මුදල් අනුව | | |
| වි.ගැ.හි. | 1,604.7 | 1,737.1 |
| එ.ජ. ඩොලර් | 8,716.9 | 7,943.9 |
| ජපාන යෙන් | 979.6 | 819.4 |
| යූරෝ | 417.4 | 396.6 |
| වෙනත් | 739.6 | 747.1 |
| **මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය** | **27,492.0** | **28,695.9** |
| **රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ක) (ග)** | **1,180.7** | **1,931.3** |
| **රාජ්‍ය ණය** | **28,672.7** | **30,627.3** |
| **ද.දේ.නි.යෙහි % ලෙස (ව)** | | |
| **මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය** | **114.2** | **103.9** |
| **දේශීය ණය** | **62.5** | **61.7** |
| **විදේශීය ණය** | **51.8** | **42.1** |
| **රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය** | **4.9** | **7.0** |
| **රාජ්‍ය ණය** | **119.2** | **110.8** |

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, ණය සංඛ්‍යාලේඛන ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.

(ආ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණ පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් 2022 වසර අවසානයේ හා 2023 වසර අවසානයේ මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ. තවද, 2022 අප්‍රේල් සිට 2022 අවසානය දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව ගෙවීමට නියමිත සමහර කූපන්පත්වලට අදාළ ගෙවීම් 2022 දෙසැම්බර් අග වන විට ශේෂය තුළ ඇතුළත් නොවේ.

(ඇ) තාවකාලික

(ඈ) 2023 සිට දේශීය ණය සංඛ්‍යාලේඛන සැකසීමේ ක්‍රමය වෙනස් කර ඇති අතර, එය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් සනාථ කරන ලද දත්ත මත පදනම්ව සිදු කෙරේ.

(ඉ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බිල්පත් වටිනාකම් ඇතුළත් නොවේ.

(ඊ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම් ඇතුළත් නොවේ.

(උ) 2022 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි මධ්‍යම රජයේ ණය තුළට ඇතුළත් කෙරුණු ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවති භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබාගත් නොපියවූ විදේශීය ණය අයත් වේ.

(ඌ) මධ්‍යම තැන්පතු පද්ධතියෙහි පවතින තොරතුරු මත පදනම්ව 2022 වාර්ෂික වාර්තාවේ සිට ආයතන අනුව වර්ගීකරණය සංශෝධනය කර ඇත.

(එ) පරම අයිතිකරු සොයා ගැනීමට අපහසු ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ කළ ආයෝජනයන් සඳහා වෙන් කරන ලද සුරැකුම්පත් ඇතුළත් වේ.

(ඒ) විවිධ වෙළඳ කටයුතු යටතේ සිදු කරන ලද ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලට අදාළ ආයෝජන, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් යටතේ වෙන් කර ඇත.

(ඔ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය වාර්තාකරණ හා කළමනාකරණ පද්ධතියෙන් 2023 මාර්තු 09, 2023 මාර්තු 10 සහ 2024 පෙබරවාරි 26 වැනි දිනයන්හි දී ලබා ගත් දත්ත මත පදනම්ව 2022 සහ 2023 වසරවලට අදාළ විදේශීය ණය දත්ත සහ විදේශීය ණය වර්ගීකරණය සකස් කර ඇත.

(ඕ) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය කිහිපයකට අදාළ නොපියවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.

(ක) රාජ්‍ය ඇපකර මත වන ණය, 2024 පෙබරවාරි 29 වන දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් ලැබුණු දත්ත මත පදනම්ව සම්පාදනය කර ඇත.

(ග) 2014 ජූනි මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් මිලියන 175ක ජාත්‍යන්තර බැඳුම්කර ඇතුළත් වේ. මෙම ජාත්‍යන්තර බැඳුම්කරය 2019 ජූනි මාසයේ දී කල්පිරුණු අතර, වසර 05ක කාලයක් සඳහා යළි නිකුත් කරන ලදී.


(ව) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) භාවිත කර ඇත.

අත්තිකාරම්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කුපන්වලින් යුත් නව භාණ්ඩාගාර බැඳුම්කර දහයක් සහ දැනටමත් වෙළඳපොළෙහි පවතින භාණ්ඩාගාර බිල්පත් දොළහක් බවට පරිවර්තනය කරන ලදී. දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම කෙටි කාලීන ණය කල්පිරීම් මැදි කාලීන සිට දිගු කාලීන කල්පිරීම් බවට පරිවර්තනයකට හේතු වූ අතර, එමගින් ප්‍රතිමූල්‍යනය කිරීමේ දී ඇතිවන අවදානම අවම කෙරුණු අතර දේශීය ණය කළඹෙහි සාමාන්‍ය කල්පිරීම් කාලය දීර්ඝ කෙරුණි. වගකීම් ආපසු ගෙවීම දිගු කාලයක් පුරා පැතිරවීම මගින් නුදුරු කාලීනව මූල්‍ය පීඩනයක් ඇති වීම අඩු කෙරෙන අතර, එමගින් වඩාත් හොඳින් කළමනාකරණය කළ හැකි සහ තිරසාර ණය ව්‍යුහයක් ස්ථාපිත කිරීමට පහසුකම් සැපයේ. විදේශීය ණය ගෙවීම සඳහා සහනයක් ලබා ගැනීමට රජය බාහිර ණය හිමියන් සමඟ සක්‍රීයව සම්බන්ධ වෙමින් කතිකා කරමින් සිටියි. ඒ අනුව, දැනට ක්‍රියාත්මක කෙරෙන අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කිරීමේ ක්‍රියාවලියට මග පාදමින්, නිල ණය හිමියන්ගේ කමිටුව (Official Creditors Committee) සහ චීන ආනයන අපනයන බැංකුව (China EXIM) සමඟ ප්‍රතිපත්තිමය (Agreement in Principle) ගිවිසුමකට එළඹ ඇත. තුලනාත්මකව පිළියම් යෙදීම සහ එකඟ වූ ණය තිරසාර ඉලක්කවලට අනුකූලව විදේශීය වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පුද්ගලික ණය හිමියන් සමඟ සාකච්ඡා කිරීම සඳහා රජය සිය ප්‍රයත්න දිගටම සිදු කරයි.

### 1.6.5 මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

**මූලික වශයෙන් දේශීය පොළී ගෙවීම් වැඩි වීම හේතුවෙන්, මුළු ණය සේවාකරණ ගෙවීම්, 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 12.5ක සිට 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 15.4ක් දක්වා වැඩි විය.** රුපියල් බිලියන 1,283.1ක නාමික වැඩිවීමක් සනිටුහන් කරමින්, 2022 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 10.4ක් වූ දේශීය ණය සේවාකරණ ගෙවීම්, 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 13.7ක් දක්වා ඉහළ ගියේය. ඒ අතර, භාණ්ඩාගාර බැඳුම්කර පියවීම් වැඩි වීම හේතුවෙන් දේශීය ණය ආපසු ගෙවීම් වැඩිවූ අතර, එය 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී රුපියල් බිලියන 468.7ක වැඩිවීමකි. එයට සාපේක්ෂව, 2022 වසරේ දී රජය විසින් ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීමේ නිවේදනයෙන් පසු, ඇතැම් විදේශ ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම තවදුරටත් පවත්වා ගෙන යෑම හේතුවෙන්, 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.0ක සිට 2023 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.7ක් දක්වා විදේශ ණය සේවාකරණ ගෙවීම් අඩු විය.

**1.37 රූප සටහන** **මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

# 2 පරිච්ඡේදය

# මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

## සාරාංශය

2023 වසරේ සැප්තැම්බර් මාසයේ සිට බලාත්මක වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම හා පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම යන මහ බැංකුවේ කාර්යභාරය වඩාත් තහවුරු විය. මහ බැංකු පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ ලෙස මිල ස්ථායීතාව සහ අනෙක් අරමුණ ලෙස මූල්‍ය පද්ධති ස්ථායීතාව නියමකර ඇත. එමගින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස හඳුනාගෙන ඇති අතර, නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය ඒ සඳහා සහාය සපයනු ඇත. එපමණක් නොව, මහ බැංකුව සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස ද නම් කර තිබේ. 2022 වසරේ දරුණු ආර්ථික අර්බුදයත් සමඟ ඇති වූ ආර්ථික අභියෝග රාශියක් මධ්‍යයේ මහ බැංකු පනත බලාත්මක කරන ලදී. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ සහාය ද ඇතිව රජය සමඟ එක්ව මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ අර්බුද අවස්ථාවට අදාළ ප්‍රතිචාර මගින් සාර්ව ආර්ථික ස්ථාවරත්වය බොහෝ දුරට යළි ස්ථාපනය කෙරිණි. හිතකර උද්ධමන ප්‍රවණතා සහ බාහිර අංශයේ ඇති වූ යහපත් තත්ත්වය සැලකිල්ලට ගනිමින්, 2023 වසරේ ජූනි මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක සිට ලිහිල් ස්ථාවරයක් කරා යොමු විය. තෝරාගත් ණය උපකරණ සඳහා වන පොලී අනුපාතික මත සීමා පැනවීම, අවිනිශ්චිතතා මධ්‍යයේ ඵලදායී ලෙස මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කිරීම, සහ වෙළඳපොළ තුළ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හමුවේ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වේගවත් වූ අතර, 2023 වසර අවසානය වන විට වෙළඳපොළ පොලී අනුපාතිකවල කැපී පෙනෙන පහත වැටීමක් සිදු විය. ලිහිල් කෙරුණු මුදල් තත්ත්වයන්හි බලපෑම මූර්ත ආර්ථිකයට ව්‍යාප්ත වීමෙහි සලකුණු පෙන්නුම් කරමින්, 2023 වසරේ ජූනි මාසයේ සිට පෞද්ගලික අංශයේ ණය සංකෝචනය වීමේ ප්‍රවණතාවයෙහි වෙනස් වීමක් දක්නට ලැබුණි. විදේශීය අංශය පිළිබඳව සැලකීමේ දී, 2022 වසරේ මැද භාගයේ සිට විනිමය අනුපාතිකය තීරණය කිරීම සඳහා වෙළඳපොළ වෙත ලබාදෙන ලද දෛනික මාර්ගෝපදේශයන් අත්හිටුවමින්, 2023 වසරේ මාර්තු මාසයේ දී වඩාත් නම්‍යශීලී ලෙස විනිමය අනුපාතිකය තීරණය වීම සඳහා මහ බැංකුව විසින් ඉඩ ප්‍රස්තා සලසන ලදී. වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය වර්ධනය වීමට අනුකූලව, විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේගවලට අනුව නිදහසේ තීරණය වීමට ඉඩ ලබා දෙන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ අනවශ්‍ය ලෙස විශාල උච්චාවචන ඇතිවීම වැළැක්වීම සහ දළ නිල සංචිත වර්ධනය කිරීම පමණක් අරමුණු කරගනිමින් මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත මැදිහත්වීම් සිදු කරන ලදී. විදේශීය අංශයේ ඇති වූ වැඩිදියුණු වීම සහ විශ්වාසය නැවත ගොඩනැගීම පිළිබිඹු කරමින්, විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වූ අතර දළ නිල සංචිත සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, විදේශ විනිමය අර්බුදය තුළ මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කර තිබූ නියාමන සීමාවන්ගෙන් බහුතරයක් 2023 වසරේ දී ක්‍රමයෙන් ලිහිල් කෙරිණි. මූල්‍ය ක්ෂේත්‍රය තුළ, මහ බැංකුවේ විචක්ෂණ නියාමන ක්‍රියාමාර්ග සහ අර්බුද අවස්ථා සඳහා පෙර සූදානම මගින් මූල්‍ය ආයතනවලට ආර්ථික අර්බුදය හමුවේ ඇතිවූ බලපෑමට මුහුණ දීමට හැකි වූ අතර, එමගින් දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා විය. 2023 වසරේ දී, බැංකු අංශයේ පවතින ව්‍යුහාත්මක දුර්වලතා හඳුනා ගැනීමට සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට ප්‍රධාන බැංකු නවයක් සඳහා වත්කම්වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනයක් සිදු කරන ලදී. මේ අතර, මහ බැංකුව විසින් රටේ සාර්ව විචක්ෂණ අධිකාරියෙහි කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීමට ඉඩ සැලසීම සඳහා ආයතන අතර අන්තර් සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සිදු කරමින්, අදාළ රාමු සහ ක්‍රමවේද සකස් කෙරෙමින් පවතී. මහ බැංකු පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම 2023 වසරේ දී මහ බැංකුවේ

**ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවක් බවට පත්විය. තවද, විදේශ ගනුදෙනු සඳහා සක්‍රීයව පහසුකම් සලසන අතරම, ඩිජිටල් ගෙවීම් සහ විද්‍යුත් මුදල් සේවා ප්‍රවර්ධනය කිරීම මහ බැංකුව තවදුරටත් ඉදිරියට සිදු කළේය. ඵලදායී ආකාරයෙන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා මහ බැංකුවට වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය ආරම්භ කිරීමට හැකි වන පරිදි රෙගුලාසි නිකුත් කරන ලදී. මේ අතර, ලෝක බැංකුව මගින් ලබා දෙන ලද මූල්‍යනය හරහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කෙරුණු අතර, මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව අතිරේක අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රමෝපායක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත.**

# 2

## 2.1 මුදල් ප්‍රතිපත්ති රාමුව

**ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම යන අරමුණ 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී බලාත්මක කරන ලද 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් වඩාත් තහවුරු කරන ලදී.** ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සහ පවත්වා ගැනීම මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නිල වශයෙන් පිළිගන්නා අතර, සාක්ෂාත් කරගත යුතු උද්ධමන ඉලක්කය සඳහන් කරමින් මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් අත්සන් කිරීම අවශ්‍ය වේ. කාලයත් සමඟ මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත ක්‍රමයෙන් අනුගත වුවද, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නිල වශයෙන් භාවිතා කිරීමට අවශ්‍ය නීතිමය පසුබිම ශ්‍රී ලංකා මහ බැංකු පනත හඳුන්වාදීමත් සමඟ ස්ථාපිත විය. ඒ අනුව, මතුපිට උද්ධමනය සියයට 5ක ඉලක්කගත මට්ටමක පවත්වාගෙන යෑමට 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව මුදල් අමාත්‍යවරයා සමඟ ගිවිසුමකට එළැඹුණි.[1] උද්ධමනය සඳහා ඉලක්කය සෑම වසර තුනකට වරක් සමාලෝචනය කළ හැකි අතර, සුවිශේෂී තත්ත්වයක් මත ඊට පෙර වෙනස් කිරීම සඳහා සලකා බැලීමට හැකියාව ඇත. මහ බැංකුවේ විනිවිදභාවය සහ මහජන වගවීම වැඩි දියුණු කිරීම සඳහා වූ විධිවිධාන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි ඇතුළත් වේ. ඒ අනුව, උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්,[2] මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තාව මහජනතාවට ද ලබාදිය යුතුය. උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට ගතවන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් මෙම වාර්තාවේ ඇතුළත් විය යුතුය. මේ අතර, මහ බැංකුවේ කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ශක්තිමත් කරමින් මහ බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වය ඉහළ නැංවීමට මහ බැංකු පනත මගින් අවස්ථාව සලසන ලදී. ඒ අනුව, මහ බැංකු පනත මගින් දක්වා ඇති සුවිශේෂී තත්ත්වයන්හි දී හැර, මහ බැංකුව විසින් රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම තහනම් කර ඇත. රජයේ වියදම් මූල්‍යනය සඳහා මහ බැංකුව විසින් සපයන තාවකාලික අත්තිකාරම් සඳහා ද සීමා හඳුන්වා දී ඇත. උද්ධමන අපේක්ෂා හොඳින් පාලනය වන බව තහවුරු වන අතර ම ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකාවේ උද්ධමනය අඩු සහ ස්ථායී මට්ටමක පවත්වා ගැනීමට මහ බැංකු පනතෙහි විධිවිධාන උපකාරී වනු ඇති අතර, එමගින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ සැලසෙනු ඇත. මේ අතර, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ සභාව පිහිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් අවස්ථාව ලබා දී ඇති අතර, එහි සාමාජිකයන් ලෙස, එම සභාවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරන මහ බැංකුවේ අධිපති, භාණ්ඩාගාරයේ ලේකම් සහ ආර්ථික ප්‍රතිපත්ති විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ[3] ලේකම් කටයුතු කරති. මෑත කාලීන සාර්ව ආර්ථික වර්ධනයන්, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම සඳහා සම්බන්ධීකරණ සභාව කාර්තුවකට වරක් රැස්වේ.

## 2.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග

**මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, 2022 වසරේ දී ක්‍රියාත්මක වූ ඉතා දැඩි මුදල් ප්‍රතිපත්තියේ සිට 2023 වසරේ අග භාගයේ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් දක්වා ක්‍රමානුකූලව වෙනස් විය.**

1 මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම 2023 ඔක්තෝබර් 5 දිනැති අංක 2352/20 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය යටතේ මහජනතාවට සන්නිවේදනය කරන ලදී.

2 කාර්තුමය සාමාන්‍ය (වාර්ෂික ලක්ෂ්‍යමය) මතුපිට උද්ධමනය (කොප්‍රා.මි.ද. මත පදනම් වූ) අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා ප්‍රතිශතාංක ±2ක ආන්තිකයකින් ඉලක්කගත අනුපාතිකයෙන් බිහැන් වුවහොත්.

3 ආර්ථික ප්‍රතිපත්ති විෂයය මුදල් අමාත්‍යවරයා වෙත නොව වෙනත් අමාත්‍යවරයෙකු වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී.

උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු වීම හා උද්ධමන අපේක්ෂා මනාව පාලනය වීම, දේශීය ආර්ථිකයේ අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ පහළ ගිය ආර්ථික ක්‍රියාකාරකම් සහ විදේශීය අංශයේ පීඩන ලිහිල් වීම මගින් මහ බැංකුවට 2023 වසර තුළ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කිරීමට මග පෑදුණි. 2022 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය උපරිම අගයක් වාර්තා කිරීමෙන් පසුව අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලියට අනුකූලව මහ බැංකුව විසින් 2022 වසර අවසාන කාලයේ සිට පොලී අනුපාතික ඒවායේ ඉහළ මට්ටමේ සිට පහළ දැමීම සඳහා මූල්‍ය වෙළඳපොළ වෙත පෙළඹවීම් ඇති කරන ලදී. අධික වෙළඳපොළ පොලී අනුපාතික 2022 වසරේ අවසාන කාලයේ සිට ක්‍රමයෙන් අඩු වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා. මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ පිළිබඳ අවසන් එකඟතාවයකට පැමිණීමට සියලු 'පූර්ව ක්‍රියාමාර්ග' සපුරාලීම සඳහා 2023 මාර්තු මස මුල් කාලයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින් ඉහළ නැංවීමට මහ බැංකුවට සිදු විය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මූලික සාකච්ඡාවල දී තීරණය කළ ප්‍රමාණයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු අගයකි. මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මධ්‍යයේ වුවද, මහ බැංකුවේ ඵලදායී සන්නිවේදනය හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික වැඩිවීම මගින් වෙළඳපොළ පොලී අනුපාතික මත ඇතිවන බලපෑම සමනය කළේය. උද්ධමනයේ අඛණ්ඩ පහළ යෑමත් සමඟ මහ බැංකුව 2023 ජූනි මස ආරම්භයේ දී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ආරම්භ කළ අතර, 2023 වසර තුළ අවස්ථා හතරක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් අඩු කරන ලදී. සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල මන්දගාමී අඩු වීම සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව විසින් 2023 අගෝස්තු මස අවසානයේ දී තෝරාගත් ණය උපකරණ සඳහා වූ පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලද අතර ඒ හරහා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව එම උපකරණ සඳහා වූ අධික පොලී අනුපාතික අඩු කිරීමට නියෝග ලබා දෙන ලදී. රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික පහළ දැමීම සඳහා 2023 ජූලි මස අවසානයේ පැවති මට්ටමට සාපේක්ෂව 2023 වසර අවසානය වන විට ණය පොලී අනුපාතික අවම වශයෙන් පදනම් අංක 350කින් අඩු කළ යුතු බවට පුළුල් මාර්ගෝපදේශ මහ බැංකුව විසින් බැංකු වෙත නිකුත් කරන ලදී. එමෙන්ම, සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලට අනුරූප මට්ටමට පහළ යෑම සහතික කිරීම සඳහා බැංකු අංශය සමඟ නිරන්තර සන්නිවේදනය සිදු කරන ලදී. 2024 මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් අඩු කිරීම මගින් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට පියවර ගන්නා ලද අතර, ඒ හරහා අඩු උද්ධමනයක් පවතින වාතාවරණයක දී වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු කිරීම තුළින් ණය වර්ධනයට සහ ආර්ථික ක්‍රියාකාරකම්වල යථා තත්ත්වයට පත්වීමට සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2023 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී.** 2023 අගෝස්තු මාසය දක්වා කාලය තුළ දී දේශීය මුදල් වෙළඳපොළ සමස්ත ද්‍රවශීලතාව විශාල වශයෙන් හිඟ මට්ටමක පැවති අතර, එය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග වෙළඳපොළ පොලී අනුපාතික වෙත ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීමට බාධාවක් වී ඇතැයි අපේක්ෂා කෙරිණි. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට සමගාමීව, දේශීය මුදල් වෙළඳපොළේ පැවති අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය අවම කිරීම සඳහා මහ බැංකුව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2023 වසරේ අගෝස්තු 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 4.00 සිට සියයට 2.00 දක්වා අඩු කරන ලද අතර, එමගින් දේශීය මුදල් වෙළඳපොළට රුපියල් බිලියන 200ක පමණ ද්‍රවශීලතාව ලබා දෙන ලදී. තවද, අඛණ්ඩ හිඟ ද්‍රවශීලතා පීඩන සහිත බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා තත්ත්ව වැඩිදියුණු කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් විශේෂ ද්‍රවශීලතා ආධාරක පහසුකම් සපයන ලදී. මීට අමතරව, පූර්වෝපායී පියවරක් ලෙස, ඕනෑම මූල්‍ය අවදානම් අවස්ථාවක බලපත්‍රලාභී බැංකුවලට අරමුදල් සැපයීමට හැකි වන පරිදි මහ බැංකුව සිය හදිසි ද්‍රවශීලතා පහසුකම් සඳහා වූ රාමුව ශක්තිමත් කළේය. මහ බැංකුව එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලට අමතරව අවශ්‍යතා පරිදි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව කාලීන පදනමින් ලබා දෙමින් විවිට වෙළඳපොළ

කටයුතු ද සිදු කරන ලදී. තවද, ස්ථාවර පදනමින් ද්‍රවශීලතාව ලබා දීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර ස්ථාවර පදනමින් මිලදී ගැනීම සඳහා වෙන්දේසි 2023 වසරේ දී සහ 2024 වසරේ මුල් සති කිහිපය තුළ දී සිදු කරන ලදී.

2

**මහ බැංකුවේ එක්දින පදනමින් අරමුදල් සැපයීමේ පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අඩු කිරීම මගින් මුදල් වෙළඳපොළ නැවත සක්‍රීය කිරීමට ද පියවර ගන්නා ලදී.** 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීම මත සීමා පනවන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන දින දර්ශිත මාසයක් තුළ පස් වතාවකට (05) සීමා කරන ලද අතර, නිත්‍ය ණය පහසුකම ලබා ගත හැකි ප්‍රමාණය ඕනෑම එක් දිනක් සඳහා අදාළ බැංකුවේ පවතින ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් සියයට 90ක් දක්වා සීමා කරන ලදී. මෙම සීමාවන් පැනවීම හරහා ද්‍රවශීලතා කළමනාකරණයට විකල්ප ක්‍රමවේද සඳහා යොමුවීමට බලපත්‍රලාභී බැංකු පොළඹවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම්වල නැවත සක්‍රීය වීමක් දක්නට ලැබුණු අතර, මහ බැංකු පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අඩු විය. මුදල් වෙළඳපොළෙහි නිරීක්ෂණය වූ වැඩිදියුණු වීම් සැලකිල්ලට ගනිමින්, නිත්‍ය පහසුකම් භාවිතය සඳහා පැවති සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, නිත්‍ය ණය පහසුකම මත පැවැති සීමා ඉවත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම සඳහා වූ සීමාව 2024 පෙබරවාරි මැද දී සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි මාසයක් තුළ වාර දහයක් (10) දක්වා ලිහිල් කරන ලද අතර, 2024 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි එම සීමාව සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

**ඉහත දැක්වූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ මෙහෙයුම්වල සහාය ඇතිව 2023 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික අඩු වූ අතර සමස්ත ණය තත්ත්වය වැඩිදියුණු විය.** නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මෙහෙයුම් ඉලක්කය ලෙස මහ බැංකුව විසින් සමීපව නිරීක්ෂණය කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2023 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව දක්වා අඩු විය. මෙම ප්‍රවණතා මෙන්ම දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය ප්‍රකාශයට පත් කිරීම සහ ඒ හා සම්බන්ධ අවදානම් අධිමිල අඩු වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2023 වසර තුළ දී සැලකිය යුතු ලෙස අඩු වූ අතර එමගින් සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීම සඳහා සහාය ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ පොලී අනුපාතික ව්‍යුහය සාමාන්‍යකරණය වූ අතර පෞද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රසාරණය සඳහා යම් සහායක් ලබාදෙන මට්ටම් දක්වා වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ මැද සිට අබණ්ඩව සංකෝචනය වූ පෞද්ගලික අංශයට ලබා දුන් ණය, දේශීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය සලසමින් 2023 ජූනි මස සිට 2023 වසර අවසානය දක්වා මාසික පදනමින් ප්‍රසාරණය වීමක් වාර්තා විය. එම ණය ප්‍රසාරණය මධ්‍යයේ වුව ද 2023 ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ දී සැලකිය යුතු ලෙස ණය සංකෝචනය වීම හේතුවෙන්, 2023 වසර අවසානය වන විට පෞද්ගලික අංශයට ලබා දුන් ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.6කින් සංකෝචනය විය. මේ අතර, රජය මෙන්ම රජය සතු වාණිජ ව්‍යාපාර ඇතුළත් රාජ්‍ය අංශයට බැංකු පද්ධතිය විසින් ලබා දුන් ණය ද 2023 වසරේ දී සංකෝචනය විය. ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන ලබා දීම සඳහා වූ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම වෙනස් විය. ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ මාස දහ අටක් සඳහා මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන ලබා දීමේ තාවකාලික විධිවිධාන පැවතිය ද මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය අඩු කරගනිමින් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය අඩු කර ගන්නා ලද අතර, එය ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළට ද අනුකූල විය. මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය ක්‍රමයෙන් අඩු වීමත්, දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු වීම හා නිත්‍ය ණය පහසුකම ලබා ගැනීමට පැවති සීමා හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් රජයේ සුරැකුම්පත් ලබා දී මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම හරහා අරමුදල් ලබා ගැනීම අඩු වීමත් හේතුවෙන් 2023 වසරේ දී මහ බැංකුව විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය සංකෝචනය විය. ඒ අතරම,

දළ නිල සංචිත ගොඩනංවා ගැනීම සඳහා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමට දායක විය.

**නිර්-උද්ධමන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම, දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියෙන් පසු අවදානම් අධිමිල අඩු වීමට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීම සහ වසරේ දෙවන භාගයේ පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වේගවත් සම්ප්‍රේෂණයක් ඇති කිරීම කෙරෙහි 2023 වසරේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගයෙහි අවධානය යොමු විය.** උද්ධමන අපේක්ෂා පාලනය කිරීම මගින් නිර්-උද්ධමන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ අවිනිශ්චිතතා මධ්‍යයේ රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකයට අදාළව සැලකිය යුතු අධිමිලක් අඛණ්ඩව පැවතීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික අතර ඇති වූ විශාල පරතරය අඩු කිරීමට මූල්‍ය ආයතන පෙළඹවීම කෙරෙහි 2023 වසරේ මුල් භාගය තුළ දී මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ගයේ අවධානය යොමු විය. මහජනතාවගේ යහපත උදෙසා ලිහිල් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කඩිනම් කිරීම කෙරෙහි වසරේ දෙවන භාගයේ දී මහ බැංකුවේ සන්නිවේදනයේ අවධානය යොමු විය. වසර තුළ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය වඩාත් හොඳින් සිදුකිරීම සඳහා මහ බැංකුව විසින් සාම්ප්‍රදායික ක්‍රම මෙන්ම සමාජ මාධ්‍ය ද භාවිතා කරන ලදී. භාෂා ත්‍රිත්වයෙන් ම නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන මගින් මුදල් ප්‍රතිපත්ති නිවේදන සන්නිවේදනය කරන ලද අතර, ඊට අමතරව මහ බැංකු අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ඒ පිළිබඳ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම මාධ්‍ය සාකච්ඡා සමාජ මාධ්‍ය හරහා සජීවීව විකාශය කරන ලද අතර, වැදගත් පණිවිඩ කෙටි වීඩියෝ කොටස් ලෙස මහ බැංකුවේ සමාජ මාධ්‍ය නාලිකාවල පල කරන ලදී. උද්ධමනයේ අපේක්ෂිත වර්ධනයන් පිළිබඳව ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට මග පෙන්වීම හරහා මැදි කාලීන උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමට සහාය වීම සඳහා මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මාධ්‍ය නිවේදනයේ සහ උද්ධමනය පිළිබඳ මාධ්‍ය නිවේදනයේ උද්ධමන ව්‍යාප්ති සටහන ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන්නා වූ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගයේ සිදු වූ සැලකිය යුතු විකාශනයක් මෙම සන්නිවේදන ක්‍රමය මගින් සනිටුහන් විය. මේ අතර, මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම්වත් කිරීම පිණිස විවිධ සම්මන්ත්‍රණ සහ වැඩසටහන් සඳහා මහ බැංකු අධිපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහභාගි වූහ. මෙයට සමගාමීව, මහ බැංකුව විසින් සිය වාර්ෂික වාර්තාව ඇතුළුව අනෙකුත් ප්‍රකාශන නියමිත වේලාවට ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදී. 2023 වසරේ ජූලි මාසයේ දී මහ බැංකුවේ පළමු මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගයේ වැදගත් පියවරක් විය. අදාළ කාල සීමාව තුළ ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා හේතු සාධක වූ කරුණු සන්නිවේදනය කිරීම මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ වගවීම ඉහළ නැංවීමට දායක වීම මෙම ප්‍රකාශනයේ ප්‍රධාන අරමුණ වේ. මීට අමතරව, ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට ඉදිරි දැක්මක් සහිත තොරතුරු මත පදනම්ව දැනුම්වත් ආර්ථික තීරණ ගැනීමට අවශ්‍ය ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යවල අපේක්ෂිත වර්ධනයන් සන්නිවේදනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මහ බැංකු පනතේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුව, මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තාව ද්වි-වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය වන අතර, ඒ අනුව, ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් ලෙස පළමු මුදල් ප්‍රතිපත්ති වාර්තාව 2024 වසරේ පෙබරවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කළේය. මෙම මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමත් සමඟම, එම වාර්තාවේ අන්තර්ගතය වැඩි පිරිසක් වෙත ළඟා කරවීම වැඩිදියුණු කිරීමේ අරමුණින්, එහි වැදගත් කරුණු උද්දීපනය කරන තාක්ෂණික නොවන කෙටි වීඩියෝ කොටස් මහ බැංකුවේ සමාජ මාධ්‍ය නාලිකා හරහා පල කරන ලදී. මීට අමතරව, මුදල් ප්‍රතිපත්ති වාර්තා ද්විත්වය නිකුත් කිරීමේ දී මාධ්‍යවේදීන්, සහ ශාස්ත්‍රඥයන් හා වෘත්තිකයන් සඳහා වෙන වෙනම තාක්ෂණික දැනුම්වත් කිරීමේ සැසි පවත්වනු ලැබීය. මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමට, ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ඉහළ නැංවීමට සහ අවිනිශ්චිතතා අවම කිරීමට ඵලදායී මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය උපකාරී වේ. තවද, පැහැදිලි සන්නිවේදනය, ආර්ථික ස්ථායීතාවයට

2

සහ කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාවට දායක වෙමින්, මුදල් ප්‍රතිපත්තියේ විශ්වසනීයත්වය සහ ඵලදායීත්වය ඉහළ නංවනු ලබයි. ඒ අනුව, අනෙකුත් සාධක අතර, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ ඵලදායීතාව ඉහළ නැංවීමට 2023 වසරේ දී මහ බැංකුව ගත් උත්සාහයන්, නිර්-උද්ධමන ක්‍රියාවලියට, වෙළඳපොළ පොලී අනුපාතිකවල අවදානම් අධිමිල අඩු වීමට සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මූල්‍ය අංශයට හා මූර්ත ආර්ථිකයට වේගයෙන් සම්ප්‍රේෂණය වීමට සහාය වී ඇත.

## 2.3 විදේශීය අංශයේ ප්‍රතිපත්ති

### 2.3.1 විනිමය අනුපාතික ප්‍රතිපත්තිය

**ශ්‍රී ලංකාව 2023 වසරේ වැඩි කාලපරිච්ඡේදයක් තුළ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.** දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වැඩිදියුණු වීම සැලකිල්ලට ගනිමින් 2022 වසරේ මැයි මාසයේ සිට වෙළඳපොළට ලබා දුන් දෛනික මාර්ගෝපදේශය අත්හිටුවමින් 2023 වසරේ මාර්තු 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව විසින් විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හරින ලදී. ඒ අනුව, විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් වැළැක්වීම සඳහා සහ වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම් හරහා දළ නිල සංචිත රැස්කර ගැනීම පමණක් ඉලක්ක කර ගත් මහ බැංකුවේ සීමිත මැදිහත්වීම් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් මත පදනම්ව විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හරින ලදී. 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයේ ක්‍රමානුකූල ගැළපීමකට ඉඩ හැරීමට පෙර, 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී, ශ්‍රී ලංකා රුපියල ස්ථාවර මට්ටම්වල පවත්වා ගෙන යන ලදී. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම නිසා මෙම ගැළපුම යටතේ බලාපොරොත්තු වූ ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි විය. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. මෙම අස්ථාවරත්වය හේතුවෙන්, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ වෙත දෛනිකව වෙළඳපොළ මාර්ගෝපදේශ සැපයීම මහ බැංකුව විසින් 2022 වසරේ මැයි 13 දින සිට ආරම්භ කරන ලද අතර, එතුළින් දිනක් තුළ සිදු වූ සැලකිය යුතු විචලනයන් සහිත විනිමය අනුපාතිකය ස්ථාවර කර ගැනීමට උපකාරී විය. මෙය ක්‍රියාත්මක කරන ලද්දේ දෛනික පදනමින් මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයක් සහ එම මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයේ දෙපස (+/-) විචලන සීමාවන් ප්‍රකාශයට පත් කිරීමෙනි. මෙම සීමාව රු. 1.00 සිට රු. 10.00 දක්වා පරාසයක විචලනය වූ අතර, කලින් කලට මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය මත සමමිතික හෝ අසමමිතික වන ලෙස මෙය පවත්වා ගැණුනි. මෙම ක්‍රියාමාර්ග සමඟ, මෙම ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලදායක බව පිළිබිඹු කරමින් එය ක්‍රියාත්මක වූ කාලසීමාව තුළ විනිමය අනුපාතිකයේ වැඩි ස්ථාවරත්වයක් නිරීක්ෂණය විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයක් නැවත ඇති කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් දෛනික විචලන සීමාවන් ක්‍රමානුකූලව ලිහිල් කිරීම ආරම්භ කරන අතර ම, බලපත්‍රලාභී බැංකු විසින් රුපියල්වලට පරිවර්තනය කරන ලද අපනයන ආදායම අනිවාර්යයෙන් මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය ලිහිල් කරන ලදී. වෙළඳපොළට ලබා දුන් දෛනික මාර්ගෝපදේශය 2023 වසරේ මාර්තු මස මුල වන විට නතර කරන ලද අතර රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සේවා අංශය ආශ්‍රිත අපනයන ලැබීම් සහ රුපියල්වලට පරිවර්තනය කරන ලද භාණ්ඩ අපනයන ආදායමේ ඉතිරි වටිනාකම මත වැනි බලපත්‍රලාභී බැංකු මත පනවා තිබූ අනිවාර්ය විකිණුම් අවශ්‍යතාවය (සතිපතා මහ බැංකුවට විදේශ විනිමය විකිණීම සඳහා) වැනි 2022 වසරේ දී ක්‍රියාත්මක වූ විදේශ විනිමය පරිවර්තනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති 2023 වසරේ මාර්තු මාසයේ දී අවලංගු කරන ලදී. ඒ අනුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ අපේක්ෂා කැපී පෙනෙන ලෙස වැඩිදියුණු විය. එපමණක් නොව, ආමුඛ ආයෝජන විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (Inward Investments Swaps - IIS) යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත 2020 වසරේ දී නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් ද 2023 වසරේ දී අවලංගු කරන ලදී. ඉහත ක්‍රියාමාර්ග වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව මෙන්ම වෙළඳපොළ අපේක්ෂා වැඩිදියුණු කිරීමට උපකාරී වෙමින් 2023 වසරේ ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාමට හේතු විය.

**මහ බැංකු පනත බලාත්මක කිරීම තුළින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුපූරක වන ලෙස නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑමේ වැදගත්කම යළි අවධාරණය විය.** මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව

සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම මහ බැංකුවට පැවරී ඇත. නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් වැඩි දියුණු වූ සහ වඩා ද්‍රවශීලී විදේශ විනිමය වෙළඳපොළක් ගොඩනඟා ගැනීමට ද අපේක්ෂා කෙරේ. මහ බැංකු පනත විසින් නියම කරන ලද නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් සමඟ, මිත් පෙර විනිමය අනුපාතිකයෙහි පැවති අධිතක්සේරු වීම හරහා අපනයන අධෛර්යමත් වීමේ නැඹුරුව අනාගතයේ දී ඉවත් වනු ඇති අතර දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකය විදේශ විනිමය ඉල්ලුම සහ සැපයුමට අනුකූලව තීරණය වනු ඇත. නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය අනුගමනය කිරීමත් සමඟම, වෙළඳපොළ විශ්වාසය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වීම තුළින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සැලකිය යුතු ශුද්ධ ලැබීම් වාර්තා විය. ඒ අනුව, වෙළඳපොළ මූලධර්මයන්ට අනුකූලව විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 12.1කින් සහ 2024 මාර්තු අවසානය වන විට සියයට 7.6කින් අතිප්‍රමාණය විය. මෙම ප්‍රවණතා හේතුවෙන්, 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.7ක් සහ 2024 වසරේ පළමු කාර්තුවේ දී එ.ජ. ඩොලර් බිලියන 1.1ක් පමණ ශුද්ධ පදනම මත (වටිනාකම මත පදනම් වූ දිනයට අනුව) මිලදී ගැනීමට මහ බැංකුවට හැකි විය. තවද, කම්පනවලට ප්‍රතිචාර වශයෙන් විනිමය අනුපාතිකය ගැළපීමට ඉඩ සැලසීම මගින්, ගෙවුම් තුලනයේ ගැළපීම් හරහා විදේශීය අංශයේ ස්ථාවරත්වය නැවත ඇතිකර ගැනීමට හැකි වනු ඇති බැවින්, මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවට බාහිර කම්පනවලින් ඇතිවිය හැකි දැඩි බලපෑම්වලින් ආරක්ෂා වීමට හැකි වනු ඇත.

### 2.3.2 විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග

**විදේශ විනිමය අර්බුදය සමයේ දී ගත් බොහෝ පරිපාලන ක්‍රියාමාර්ග 2023 වසරේ දී ක්‍රමයෙන් ලිහිල් කරන ලදී.** 2021 සහ 2022 වසරවල ආර්ථික අර්බුදය සමයේ දී සහ ඊට පෙර කාලය තුළ, රජය, මහ බැංකුවේ උපදෙස් මත, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ පැවතුණු දැඩි විදේශ විනිමය හිඟය මඟහරවා ගැනීම සඳහා විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ගණනාවක් පැනවීය. මීට අමතරව, මහ බැංකුව විසින් විදේශ විනිමය ගෙවීම් සීමා කිරීමට පියවර කිහිපයක් ක්‍රියාවට නැංවූ අතර, විදේශ විනිමය ලැබීම් දිරිමත් කරන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව ක්‍රමයෙන් වැඩිදියුණු වීම සහ විදේශීය අංශයේ විවිධ අංශවල වැඩිදියුණු වෙමින් පවතින ඉදිරි දැක්ම අනුව එවැනි විදේශ විනිමය සීමා කිරීම් සහ අනෙකුත් සීමා බොහොමයක් 2023 වසරේ දී ඉවත් කරන ලදී. 2023 වසරේ මැයි මාසයේ දී, ණයවර ලිපි, ගෙවීම් මත ලියවිලි (Documents against Payment) සහ ප්‍රතිග්‍රහණය මත ලියවිලි (Documents against Acceptance) වැනි ගෙවීමේ නියමයන් මත ඇතැම් භාණ්ඩ ආනයනය කිරීමේ දී වසරකට පෙර පනවා තිබූ ප්‍රතිලාභයක් නොලැබෙන මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී. ඉවත් කරන ලද අනෙකුත් එවැනි සීමා කිරීම් අතරට, මහ බැංකුව විසින් විදේශ විනිමය සීමා කිරීම් සහ බලයලත් වෙළඳුන්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට අවශ්‍ය විදේශ විනිමය වෙත ප්‍රවේශ වීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට මහ බැංකුව විසින් ලබා දුන් අවිධිමත් මග පෙන්වීම ඇතුළත් වේ. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ඇතැම් ජංගම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීමට පනවා තිබූ ඇතැම් සීමාවන් ඉවත් කිරීම සඳහා සහ විගාමිකයන් විසින් ජංගම ගනුදෙනුවලින් ඉපැයූ මුදල් එම රටවලට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පැවති යම් සීමාවන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය නියෝග සහ විධාන නිකුත් කරන ලදී. භාණ්ඩ අපනයන ඉපැයීම් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අනිවාර්ය අවශ්‍යතාවය මත, අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ ක්‍රියාත්මක වූ පෙර රෙගුලාසි, 2019 වසරේ ඔක්තෝබර් මස විදේශ විනිමය පනත යටතේ නැවත නිකුත් කරන ලදී. 2021 වසරේ පෙබරවාරි මාසයේ දී, රට වෙත ආපසු ගෙන්වා ගත් එවැනි අපනයන ඉපැයීම් සඳහා අනිවාර්ය පරිවර්තන අවශ්‍යතාවය හඳුන්වා දෙන ලදී. භාණ්ඩ අපනයනයට අමතරව, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී නැවත මෙරටට ගෙන්වා ගැනීමේ සහ අපනයන ආදායම රුපියල්වලට පරිවර්තනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවයට සේවා අපනයන ආදායම ද ඇතුළත් විය. කෙසේ වෙතත්, සේවා අපනයන ආදායමට අදාළ පරිවර්තන අවශ්‍යතාවය 2022 වසරේ අගෝස්තු මාසයේ දී ඉවත් කරන ලදී.

2

**ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ලෙස ප්‍රාග්ධන ගනුදෙනු මත පනවා තිබූ ඇතැම් අත්හිටුවීම් සහ සීමා කිරීම් ද 2023 වසර තුළ දී ලිහිල් කරන ලදී.** අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ දී රටෙහි ගෙවුම් තුලන තත්ත්වයන්ට සහාය වීමේ අරමුණ ඇතිව රජය සහ මහ බැංකුව විසින් විදේශ විනිමය ගෙවීම් අධෛර්යමත් කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් අරඹන ලදී. ගෙවුම් තුලන තත්ත්වයන් වැඩිදියුණු වීමට පටන්ගැනීමත් සමඟ පෙර පනවා තිබූ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ඇතැම් ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ලිහිල් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් විදේශයන්හි ආයෝජන සිදු කිරීමේ අරමුණින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts) හරහා සිදුකරනු ලබන ගෙවීම් සඳහා වූ තාවකාලික අත්හිටුවීම, යම් මට්ටමකට ලිහිල් කරන ලදී. කෙසේ වුවත්, තෝරාගත් ප්‍රාග්ධන ගනුදෙනු කිහිපයක් සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා ගෙවීම් සිදු කිරීම සඳහා සීමාවන් තවදුරටත් පවතී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ නේවාසිකයින් සතු ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts) හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ මත වූ සීමා කිරීම් ද තවදුරටත් ලිහිල් කෙරිණි. කෙසේ වුවත්, ශ්‍රී ලංකාවේ නේවාසිකයින් සතු පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts) හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ මත පනවා තිබූ තාවකාලික සීමා කිරීම් තවදුරටත් පවතී. තවද, විගාමිකයන් සඳහා සංක්‍රමණික දීමනාව යටතේ ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් යැවීම මත පනවා තිබූ සීමාවන් තවදුරටත් ලිහිල් කරන ලදී. රජය සහ මහ බැංකුව, විදේශීය අංශයේ තත්ත්වයන්හි යම් සන්ධිස්ථානයන් කරා ළඟා වීමට යටත්ව, ඉතිරිව ඇති ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ඉවත් කිරීම පිළිබඳ සැලැස්මක් සකස් කර ඇත.

**මීට අමතරව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වත්මන් සහ අපේක්ෂිත වර්ධනයන් සැලකිල්ලට ගනිමින් වසර තුළ දී මහ බැංකුව තවදුරටත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.** රට තුළට විදේශ විනිමය ලැබීම් දිරිගැන්වීමේ පියවරක් ලෙස, ශ්‍රී ලංකාවේ සමාගම් සඳහා කොටස් ප්‍රාග්ධනය ලෙස ලැබෙන මුදලින් විදේශ ව්‍යවහාර මුදල් විශේෂ ගිණුම් - ආයෝජිත ගිණුම් (Special Foreign Currency Accounts - Investee) විවෘත කිරීමට සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළඳුන් හට අවසර දෙන ලදී. සමුද්‍රීය ඉන්ධන ගබඩා කිරීම්, ප්‍රවාහන සහ සැපයුම් ආදී ව්‍යාපාරවල නියැලී සිටින ආයතන අතර ඇතැම් විදේශ විනිමය ගනුදෙනු පුළුල් කිරීම සඳහා, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ එම ගිණුම්වලට ණය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් ද විධාන නිකුත් කරන ලදී. තව ද, අපනයන ආදායම නැවත මෙරටට ගෙන්වා ගැනීම අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස තෝරාගත් අපනයනකරුවන්ට තම අපනයන, ප්‍රේෂණ සමඟ සංසන්දනය කිරීමට ප්‍රවේශය ලබා දීම සඳහා 2022 වසරේ ජූනි මාසයේ දී හඳුන්වා දෙන ලද ස්වයංක්‍රීය අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය වසර තුළ තවදුරටත් වැඩිදියුණු විය. මීට අමතරව, (i) ණයවර ලිපි, ප්‍රතිග්‍රහණය මත ලියවිලි සහ ගෙවීම් මත ලියවිලි වැනි ගෙවීමේ නියමයන් යටතේ සිදු කරන ලද ඇතැම් භාණ්ඩ ආනයනය කිරීමේ දී ප්‍රතිලාභයක් නොලැබෙන ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතා වැනි ක්‍රියාමාර්ග; (ii) ද්විපාර්ශ්වීය බලයලත් වෙළඳුන් සමඟ මිල කැඳවුම් ඉල්ලුම් සිදු නොකොට සෘජු එතැන් විනිමය ගනුදෙනු හරහා මහ බැංකුව විදේශ විනිමය සැපයීමේ දී සතිපතා සිදු කරන ගනුදෙනු ප්‍රමාණය මත බරිත සාමාන්‍ය විනිමය අනුපාතිකයක් යොදා ගැනීම; (iii) විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ගනුදෙනු පිරිවැය ප්‍රතිපූර්ණය කිරීමෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීමක් ලබාදීම යනාදී වඩා වාසිදායී විනිමය අනුපාතිකයක් ලබා දෙන, ජා. මූ. අරමුදල විසින් බහු විදේශ විනිමය භාවිතයන් (multiple currency practices) ලෙස හඳුනාගත් ක්‍රියාමාර්ග 2023 වසරේ දී ඉවත් කරන ලදී.

### 2.3.3 ආනයන සීමා ලිහිල් කිරීම

**වාහන ආනයන සීමා කිරීම් හැර, ප්‍රමුඛතා පදනමක් මත ආනයන සීමා ලිහිල් කිරීම් සිදු කිරීමට අදාළ මහ බැංකුවේ පුළුල් නිර්දේශය මත, රජය 2023 වසරේ දී ආනයන සීමා ඉවත් කළේය.** අඛණ්ඩව පවතින ආනයන සීමා කිරීම් මගින් ආර්ථික ක්‍රියාකාරකම් මත ඇති වන බලපෑම සලකා බලමින් මෙන්ම දේශීය විදේශ විනිමය වෙළඳපොළේ වැඩිදියුණු වීම් සහ දළ නිල සංචිත ක්‍රමයෙන් ගොඩ නැගීම පිළිබඳව හොඳින් සලකා බැලීමෙන් පසු, පුද්ගලික මෝටර් රථ හැර තාවකාලිකව අත්හිටුවන ලද භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ලිහිල් කිරීමට මහ බැංකුව විසින් 2023 වසරේ මැයි මාසයේ දී

මුදල් අමාත්‍යාංශයට නිර්දේශ කරන ලදී. ඒ අනුව, තාවකාලිකව අත්හිටුවන ලද භාණ්ඩ ආනයනය කිරීම් තුළ මෝටර් රථ පමණක් පවත්වා ගනිමින්, 2023 වසරේ ජූනි, ජූලි සහ ඔක්තෝබර් මාසවල දී අදියර තුනක් යටතේ භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ඉවත් කරන ලදී. ප්‍රධාන වශයෙන් විවෘත ගිණුම් ගෙවීමේ ක්‍රමය මත, 2022 වසරේ මැයි මාසයේ දී ඇතැම් ගෙවීම් ක්‍රමයන් යටතේ පනවන ලද ආනයන සීමා කිරීම්, 2023 වසර පුරාවටම අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, ප්‍රතිග්‍රහණය මත ලියවිලි සහ ගෙවීම් මත ලියවිලි ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය 2024 වසරේ පෙබරවාරි මස අවසානය වන විට ඉවත් කරන ලදී. මෙම ලිහිල් කිරීම් සහ රජය විසින් 2023 වසරේ මැද සිට ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ ආනයන ක්‍රමානුකූලව ඉහළ යාම, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීමට සහ ආනයන භාණ්ඩවල මිල මට්ටම් අඩු කිරීමට උපකාරී විය.

**2023 වසරේ දී අනුගමනය කරන ලද ඉහත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වසර තුළ විදේශීය අංශයට ඉහළ ස්ථායීතාවයක් ලබා ගැනීමට උපකාරී විය.** මෙම වෙළඳපොළ මත පදනම් වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් රට වෙත වැඩි විදේශ විනිමය ලැබීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ අපේක්ෂාවන් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වීම මගින් ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය. මෙම තත්ත්වයන් මත, දේශීය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීමෙන් වසර තුළ දී ජාත්‍යන්තර සංචිත සැලකිය යුතු ලෙස ගොඩනගා ගැනීමට මහ බැංකුවට හැකි විය.

## 2.4 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

### 2.4.1 සාර්ව විචක්ෂණශීලී අධිකාරිය නම් කිරීම

**මහ බැංකු පනත සහ බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිහිටුවීම, මහජන විශ්වාසය තහවුරු කිරීම ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ප්‍රවර්ධනය කිරීම සහ දායකත්වය වැඩි කිරීමට ඇති ඉඩ හඳුනාගෙන ඇත.** ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියා පටිපාටි බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ප්‍රකාශ කරන අතර, තැන්පතු රක්ෂණ අරමුදලට අදාළ බලතල, රාජකාරි සහ කාර්යයන් ද නියම කර ඇත. රජයේ සහ ලෝක බැංකුවේ සහයෝගිතාවයෙන් ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය සහ ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීමට දායක වෙයි.

2

මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ලෝක බැංකුව විසින් පිරිනමනු ලබන මූල්‍යන ක්‍රමවේදයක් හරහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කරන ලද අතර රජය සමඟ අරමුදල් සැපයීමේ විධිවිධාන ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන කළඹ දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තුළ උපකරණ පරාසයක් හරහා පුළුල් කිරීම සඳහා නව ආයෝජන ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරමින් පවතී. මෙම ප්‍රතිපත්ති මත පදනම් වූ වැඩිදියුණු කිරීම් හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කරමින් තැන්පතු රක්ෂණකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය විසින් දක්වා ඇති මූලික තැන්පතු රක්ෂණ මූලධර්මවලට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම අරමුණු කරයි.

### 2.4.10 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමට සමගාමීව මූල්‍ය පද්ධතියේ ව්‍යුහාත්මක දුර්වලතාවලට පිළියම් යෙදීම, ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා මූල්‍ය අංශය බහුපාර්ශ්වික ආයතන සමඟ සහයෝගීතාවයෙන් සැලකිය යුතු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන්ට භාජනය වෙමින් පවතී.** වසර තුළ දී දේශීය බැංකු වත්කම්වලින් සියයට 90ක් නියෝජනය කරන දේශීය බැංකු නවයක් සඳහා වන ස්වාධීන වත්කම්වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචන සංරචක විමර්ශන ක්‍රියාවලිය අවසන් කරන ලදී. මෙම වත්කම්වල ගුණාත්මක බව සමාලෝචනයේ විෂය පථය තුළ රුපියල් ණය සහ අත්තිකාරම්, විදේශ මුදල් ණය, අත්තිකාරම් සහ විදේශ මුදලින් නාමනය කරන ලද මූල්‍ය උපකරණ ඇතුළත් විය. වත්කම් තත්ත්ව සමාලෝචනට යටත්ව, විශාල බැංකු පහක් සඳහා බැංකු පද්ධති ප්‍රාග්ධනය සහ විදේශ මුදල් ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීමට මහ බැංකුව විසින් මාර්ග සිතියමක් සකස් කරන ලදී. ඒ සඳහා වත්කම්වල ගුණාත්මක බව සමාලෝචනයේ ප්‍රතිඵල, ඉදිරි දැක්මක් සහිත ආතති පරීක්ෂාව සහ ස්ථෛර්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂිත බලපෑම ද සලකා බලන ලදී. වත්කම්වල ගුණාත්මක බව සමාලෝචනවලට යටත්ව අනෙකුත් බැංකු හතර සඳහා ද එවැනිම ක්‍රියාවලියක් සිදුවෙමින් පවතී. පොද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟය පියවා ගැනීමට නොහැකි වූ බැංකු සඳහා රජය විසින් ප්‍රාග්ධනීකරණය සඳහා උපාය මාර්ග සකස් කර ඇත. ඒ අනුව, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන වර්ධන ක්‍රියාවලියට සහාය වීම සඳහා 2024 අයවැය යටතේ රුපියල් බිලියන 450ක් වෙන් කර ඇත. තවද, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා සංශෝධන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව ක්ෂේත්‍රයේ අර්බුදවලට පෙර සුදානම් කිරීමේ රාමු ශක්තිමත් කිරීම සඳහා පිහිටුවන ලදී.** අන්තර් ආයතන සම්බන්ධීකරණය සහ සන්නිවේදනය පහසු කිරීම සඳහා මෙම කමිටු, මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත විය. මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති විය හැකි පද්ධතිමය අර්බුද හා එයින් මූර්ත ආර්ථිකයට ඇති බලපෑම් අධ්‍යයනය කිරීම සහ මූල්‍ය ක්ෂේත්‍රයට සිදුවිය හැකි හානි අවම කිරීමේ වගකීම මෙම කමිටු වෙත පැවරී ඇත. මෙම කමිටු දෙක අදියර දෙකකින් ක්‍රියාත්මක වන අතර කමිටු පළමු අදියරේ දී නියාමනය කරන ලද මූල්‍ය ආයතනවල ද්‍රවශීලතා අවදානම් සහ ප්‍රාග්ධන මට්ටම් සමීපව අධීක්ෂණය කරනු ඇත. දෙවන අදියරේ දී, අර්බුද සඳහා පෙර සූදානම, අර්බුද කළමනාකරණය සහ මූල්‍ය අර්බුදයක බලපෑම අවම කිරීම සඳහා ස්ථිර රාමුවක් ස්ථාපිත කෙරෙනු ඇත.

### 2.4.11 අනෙකුත් ප්‍රතිපත්ති

**මූල්‍ය පද්ධතියේ ධනාත්මක සහ ඍණාත්මක ප්‍රවණතා සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම උදෙසා වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** ඩිජිටල් ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වූ පාරිභෝගික ගැටලු විසඳීම සඳහා මහ බැංකුව පූර්වෝපායික පියවර ගෙන ඇත. ගෙවීම් සේවා සම්බන්ධ අනාරක්ෂිත, නොගැළපෙන හෝ අසාධාරණ භාවිතයන් පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය ඇති කිරීම උදෙසා මහ බැංකුවේ වෙබ් අඩවියේ ත්‍රිභාෂා වෙබ් පෝරමයක් හඳුන්වා දී ඇත. මුදල් ප්‍රතිපත්තිය පිළිබඳව පමණක් නොව, වංචා සහ තහනම් මූල්‍ය යෝජනා ක්‍රම ඇතුළු මූල්‍ය පද්ධතිය හා සම්බන්ධ අත්‍යවශ්‍ය පණිවිඩ ඉක්මණින් බෙදා හැරීම සහතික කිරීම සඳහා සියලු ආකාරයේ සමාජ මාධ්‍යවල ද මහ බැංකුව ක්‍රියාකාරීව සිටියි.

**පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා වසර තුළ දී පියවර ගන්නා ලදී.** සියලුම ප්‍රචාරණ මාධ්‍යන්ගේ නියැලීම නිරීක්ෂණය කිරීමට අමතරව, දැනට පවතින උපාය මාර්ගවල සඵලතාවය

අඛණ්ඩව තක්සේරු කිරීම සඳහා සමීක්ෂණ කිහිපයක් සිදු කිරීම සහ හඳුනාගත් කණ්ඩායම් කීපයක් සමඟ සාකච්ඡා කිරීම ද සිදු කරන ලදී. මෙම අදහස් ලබා ගැනීමේ ක්‍රම වේදයන්, වැඩිදියුණු කළ යුතු අංශ හඳුනා ගැනීම, මහජන ආකල්ප මැනීම සහ වෙනස් වන අවශ්‍යතා සපුරාලීම පිණිස සන්නිවේදන උපායමාර්ග මනාව සකස් කිරීම සඳහා උපකාරී විය.

මූල්‍ය පද්ධති ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා විචක්ෂණශීලී සන්නිවේදන උපාය මාර්ග හරහා මූල්‍ය පද්ධතිය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම ඉතා වැදගත් වේ. ඉහත සඳහන් කළ ප්‍රයත්න සඳහා උපකාරී වීමට පුළුල් පරාසයක ප්‍රේක්ෂකයින් වෙත අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදී.

2

2

**විශේෂාංග සටහන**

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

**මහ බැංකු කටයුතු**

| | |
|---|---|
| 2023 සැප්තැම්බර් 15 | ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම, මුදල් නීති පනත (422 වන අධිකාරිය) ඉවත් කිරීම, සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කරන ලදී. |
| 2023 ඔක්තෝබර් 03 | 2023 ඔක්තෝබර් මස 05 වැනි දින ගැසට් කරන ලද මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම මගින් මහ බැංකුව සඳහා උද්ධමන ඉලක්කයක් නියම කෙරුණු අතර, මහ බැංකුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය සියයට 5ක මට්ටමේ පවත්වාගෙන යාම අවශ්‍ය වේ. |

**මුදල් ප්‍රතිපත්තිය**

| | |
|---|---|
| 2023 ජනවාරි 02 | 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන දින දර්ශිත මසකට උපරිම අවස්ථා පහක් (05) දක්වා සීමා කරන ලද අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය ණය පහසුකම ලබාගැනීම ඕනෑම එක් දිනක් සඳහා අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි. |
| 2023 මාර්තු 03 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 15.50ක් සහ සියයට 16.50ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2023 ජූනි 01 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 250කින්, පිළිවෙළින්, සියයට 13.00ක් සහ සියයට 14.00ක් දක්වා අඩු කරන ලදී. |
| 2023 ජූලි 06 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 200කින්, පිළිවෙළින්, සියයට 11.00ක් සහ සියයට 12.00ක් දක්වා අඩු කරන ලදී. |
| 2023 අගෝස්තු 09 | 2023 අගෝස්තු 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00ක් දක්වා ප්‍රතිශතාංක 2.00කින් අඩු කරන ලදී. |
| 2023 ඔක්තෝබර් 05 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 10.00ක් සහ සියයට 11.00ක් දක්වා අඩු කරන ලදී. |
| 2023 නොවැම්බර් 24 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 9.00ක් සහ සියයට 10.00ක් දක්වා අඩු කරන ලදී. |

1 2023 ජනවාරි 01 සිට 2024 මාර්තු 28 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2023 ජනවාරි 01 සිට 2024 මාර්තු 28 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ එයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එම කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සවිස්තරාත්මක අනුවාදයක් මාර්ගගතව ලබා ගත හැක.

යොමුව : ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2023 → ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

සබැඳිය : https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථිකහාමූල්‍යවාර්තා/වාර්ෂිකආර්ථිකවිවරණය/වාර්ෂිකආර්ථිකවිවරණය2023/ප්‍රධාන ආර්ථිකප්‍රතිපත්තිමයක්‍රියාමාර්ග

| | |
|---|---|
| 2024 පෙබරවාරි 09 | 2024 පෙබරවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම මත පනවා තිබූ සීමාව ඉවත් කෙරුණු අතර, නිත්‍ය තැන්පතු පහසුකම මත පනවා තිබූ සීමාව දින දර්ශිත මාසයක් තුළ පස් වතාවක (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී. |
| 2024 මාර්තු 26 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, සියයට 8.50ක් සහ සියයට 9.50ක් දක්වා අඩු කරන ලදී. |
| | 2024 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවැති සීමාව ඉවත් කරන ලදී. |

**විශේෂ ණය යෝජනා ක්‍රම**

| | |
|---|---|
| 2023 සැප්තැම්බර් 15 | 2023 අංක 16 දරන නව මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ සහ දේශීය කෘෂිකාර්මික නියමු ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු අවසන් කරන ලදී. |
| 2024 ජනවාරි 03 | ඉදිරියේ දී රජයේ අරමුදල් මගින් හෝ අරමුදල් සපයනු ලබන නියෝජිත ආයතනවල අරමුදල් භාවිතයෙන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. නමුදු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කාලය අවසන් වනතෙක් එම ණය යෝජනා ක්‍රම අබණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කරනු ඇත. |

**ගෙවීම් සහ පියවීම්**

| | |
|---|---|
| 2023 පෙබරවාරි 01 | ලංකාපේ ආයතනය (LankaPay (Pvt) Ltd), චීනයේ ස්ථාපිත සී/ස යුනියන්පේ ඉන්ටනැෂනල් සමාගම (UnionPay International Co.Ltd/UPI), සහ ඉන්දියාවේ ස්ථාපිත සී/ස NPCI ඉන්ටනැෂනල් පේමන්ට්ස් සමාගම (NPCI International Payments Ltd /NIPL) සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාව තුළ දී LANKAQR ක්‍රමය හරහා චීන සහ ඉන්දියානු ජාතිකයින්ට ඔවුන්ගේ ගෙවීම් පසුම්බිවලින් ගෙවීම් සිදු කිරීමට පහසුකම් සලසා දෙන ලදී. චීන සංචාරකයින් හට 2023 පෙබරවාරි මස සිට මෙම ක්‍රමය හරහා ගනුදෙනු කිරීමට හැකියාව ලැබුණු අතර ඉන්දියානු සංචාරකයින් හට 2024 පෙබරවාරි 12 වැනි දින සිට මෙම හැකියාව ලැබුණි. |
| 2023 මැයි 08 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සේවා සපයන්නන් හරහා ක්‍රියාත්මක වන LANKAQR ගනුදෙනු සඳහා ගනුදෙනු මුදලින් උපරිම සියයට 1.8ක තනි වෙළඳ වට්ටම් අනුපාතිකයක් (MDR) හඳුන්වා දෙන ලදී. දේශීය LANKAQR ගනුදෙනු සඳහා සියයට 0.5ක් වෙළඳ වට්ටම් අනුපාතිකය එලෙසම පවත්වාගෙන යන ලදී. |
| 2023 අගෝස්තු 31 | ගෙවීම් පිළිවෙත් සහ සේවා සම්බන්ධ අනාරක්ෂිත, අසත්‍ය හෝ අසාධාරණ භාවිතයන් පිළිබඳව මහජනතාවගෙන් තොරතුරු එක්රැස් කිරීම සඳහා ත්‍රෛ භාෂා වෙබ් පිටුවක් හඳුන්වා දෙන ලදී. |

2

| | |
|---|---|
| 2023 දෙසැම්බර් 29 | ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව, සෘජු හර සේවාව, ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වන හවුල් යාන්ත්‍රණය සහ රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව වැනි විවිධ ඩිජිටල් ගනුදෙනු මාධ්‍යයන් සඳහා සහභාගී වීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට අනිවාර්ය කරන ලදී. එයට අමතරව, ගනුදෙනුකරුවෙකුගේ ණය සහ හර ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම් දීම් සක්‍රීය කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් ගනුදෙනු ප්‍රචලිත කිරීම, ඩිජිටල් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන ණය කාඩ්පත් පියවීම් එසැණින් යාවත්කාලීන කිරීම සහ ඩිජිටල් ගනුදෙනුවක් සිදු කිරීමේ දී ප්‍රතිලාභියා වෙත යැවෙන විස්තරය අනිවාර්ය කිරීම වැනි ප්‍රමුඛතාවයන් බලපත්‍රලාභී බැංකුවලට අනිවාර්ය කරන ලදී. මූල්‍ය අත්පත්කරුවන් ලෙස ක්‍රියාකරන බලපත්‍රලාභී බැංකුවලට වෙළඳ වට්ටම් අනුපාතය ඔවුන්ගේ වෙළඳුන් විසින් ගනුදෙනුකරුවන්ගෙන් අය කර නොගන්නා ලෙස උපදෙස් දෙන ලෙස ද දැනුම් දෙන ලදී.<br><br>විද්‍යුත් මුදල් පසුම්බි හරහා සිදු කෙරෙන ඩිජිටල් ගනුදෙනු සමඟ විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමට වැඩි දියුණු කරන ලද (enhanced) සහ මූලික (basic) විද්‍යුත් මුදල් පසුම්බියක රුපියල් 50,000 සහ රුපියල් 10,000 යන සීමාවන්, පිළිවෙලින්, රුපියල් 150,000 සහ රුපියල් 20,000 දක්වා 2024 ජනවාරි 01 වැනි දින සිට ඉහළ දමන ලදී. |
| 2024 ජනවාරි 17 | 2024 අප්‍රේල් 01 දින සිට ගනුදෙනුවක වටිනාකම රුපියල් 10,000ට සමාන හෝ ඊට වැඩි නම්, ජස්ට්පේ ජංගම ගෙවීම් යෙදුම භාවිත කිරීමේ දී අදාළ මූල්‍ය ආයතනයෙන් එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපදයක් (OTP) ඉල්ලා සිටීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය කරන ලදී. ජස්ට්පේ පහසුකම සහිත ජංගම ගෙවීම් යෙදුම මගින් පරිශීලකයාට ඕනෑම මූල්‍ය ආයතනයක ඇති ඔහුගේ ගිණුමක් ජංගම ගෙවීම් යෙදුමට සම්බන්ධ කිරීමට සහ එවැනි ගිණුම්වලින් අරමුදල් ලබාගැනීමෙන් ගෙවීම් සිදු කිරීමට හැකියාව ලබා දෙයි. |
| 2024 පෙබරවාරි 01 | NEPALPAY QR ජංගම යෙදුම හරහා නේපාල සංචාරකයින් සිදු කරන LANKAQR ගනුදෙනු පිළිගැනීම සඳහා ලංකාපේ පුද්ගලික ආයතනයට නේපාල නිෂ්කාශන ආයතනය හා සම්බන්ධ වීමට අනුමැතිය ලබාදෙන ලදී. |

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම**

| | |
|---|---|
| 2023 මාර්තු 03 | අනුකූලතා අඩුපාඩු පිළිබඳ නිසි සුපරීක්ෂාවෙන් කටයුතු කරන ලෙස දැනුම්වත් කිරීම සඳහා සියලු බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත 2023 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 07 | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නිශ්චල දේපළ වෙළඳාම් අංශය සඳහා වන ආයතනික අනුකූලතාව පිළිබඳව නිශ්චල දේපළ වෙළඳාම් ආයතන වෙත 2023 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 13 | මූල්‍ය බුද්ධි ඒකකයේ goAML පද්ධතිය වෙත දේශීයව සිදුවන විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ 2023 අංක 01 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2023 අගෝස්තු 07 | 2023 - 2028 අතර වසර 5ක කාලයකට අදාළව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2023 සැප්තැම්බර් 01 | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් නීතීඥවරුන් සහ නොතාරිස්වරුන් සඳහා වන අනුකූලතාවය පිළිබඳ 2023 අංක 02 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු**

| | |
|---|---|
| 2023 ජනවාරි 26 | "අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් - IIS යෝජනා ක්‍රමය" වෙනුවෙන් නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අවලංගු කිරීම. |

| | |
|---|---|
| | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන එ.ජ.ඩො./ ශ්‍රී.ලං.රු. ගැනුම්-විකිණුම් සහ විකිණුම්-ගැනුම්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙන්දේසි සඳහා අදාළ වන මෙහෙයුම් උපදෙස් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කිරීම. |
| 2023 පෙබරවාරි 24 | 2023 පෙබරවාරි 27 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත පදනම් වූ විදේශ විනිමය කටයුතු දිරිමත් කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා අනිවාර්යයෙන් විකිණීමට අවශ්‍යව තිබූ රුපියල්වලට පරිවර්තනය කෙරෙන සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පරිවර්තනය කෙරෙන සේවා අපනයන ලැබීම්/ ආදායම් සහ අනිවාර්ය පදනම යටතේ පරිවර්තනය කරන ලද අපනයන ලැබීම්වලින් සියයට විසිපහක (25%) ප්‍රමාණය සියයට පහළොවක් (15%) දක්වා අඩුකිරීම. |
| 2023 පෙබරවාරි 27 | "විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් - ආයෝජිත" විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත අවසර ලබා දෙමින් 2023 අංක 01 දරන විධානය නිකුත් කරන ලදී. |
| 2023 මාර්තු 03 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2022 මැයි 12 දින නිකුත් කරන ලද "විනිමය අනුපාතිකයේ දෛනිකව සිදුවන විචලනය කළමනාකරණය කිරීම", ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2021 ජනවාරි 27 දින නිකුත් කරන ලදුව, 2021 පෙබරවාරි 18 දින සංශෝධනය කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ වූ මෙහෙයුම් උපදෙස් 2023 මාර්තු 07 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කිරීම. |
| 2023 ජූනි 28 | ඉදිරි මාස 06ක් දක්වා බලපැවැත්වෙන පරිදි, තෝරා ගත් ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ අත් හිටුවීම/සීමා කිරීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 22 වගන්තිය යටතේ, 2023 ජූනි 28 දිනැති අංක 2338/40 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 04 | මුදල් පනතේ - 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 01 ප්‍රකාරව දේශීය වෙළඳපොළට භාණ්ඩ/නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ව්‍යවසායකයින් ඇතුළත් කරමින් ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2023 අංක 02 දරන විධානයන් නිකුත් කරන ලදී. |
| | මුදල් පනතේ - 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 01 ප්‍රකාරව දේශීය වෙළෙඳපොළට භාණ්ඩ/ නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටින ව්‍යවසායකයින්ට ගෙවීම් කිරීමට ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2023 අංක 03 දරන විධානයන් නිකුත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 20 | ඉදිරි මාස හය සඳහා කලින් නිකුත් කරන ලද නියෝග මගින් ඇතැම් ප්‍රාග්ධන සහ ජංගම ගනුදෙනු සඳහා පනවා තිබූ අත් හිටුවීම්/ සීමා කිරීම් ක්‍රමයෙන් ලිහිල් කිරීම සඳහා 22 වැනි වගන්තිය යටතේ, 2023 දෙසැම්බර් 20 දින අංක 2363/26 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. |
| 2024 ජනවාරි 01 | ජංගම ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සඳහා වන " විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම- ආයෝජිත " විධානයන්හි වලංගු කාලය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කරමින් 2024 අංක 01 දරන විධානයන් නිකුත් කරන ලදී. |
| **රාජ්‍ය ණය කළමනාකරණය** | |
| 2023 පෙබරවාරි 13 | සෘජු නිකුතු කවුළුව ඔස්සේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඉදිරිපත් කිරීම (Offering) අත්හිටුවන ලදී. |
| 2023 මාර්තු 16 | "2023 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (තොරතුරු හෙළිදරව් කිරීම) නියෝග" නිකුත් කරන ලදී. |

2

| | |
|---|---|
| 2023 අප්‍රේල් 04 | භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දෙවන අදියර විවෘතව පවතින කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම සිදු වන අවස්ථාවල දී, අදාළ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දෙවන අදියර, එම භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය අවසන් වූ වහාම පැයක කාලයක් සඳහා හෝ එම වෙන්දේසි දිනයේ ව්‍යාපාර කටයුතු අවසානය දක්වා යන අවස්ථා දෙකෙන් දීර්ඝතම අවස්ථාව දක්වා විවෘතව තබනු ලැබේ. |
| 2023 මැයි 12 | 1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත ප්‍රකාරව, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා පවතින සීමාව රුපියල් බිලියන 5,000 සිට රුපියල් බිලියන 6,000 දක්වා ඉහළ නැංවීමට කරන ලද යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |
| 2023 ජූනි 19 | 2023 ජූනි 19 වැනි දින අදාළ විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ, අන්තර්ජාලය මත පදනම් වූ නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ පද්ධතිය 2023 ජූනි 21 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී. |
| 2023 ජූලි 04 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති ණය තිරසරභාවය පිළිබඳ ඉලක්ක සපුරා ගැනීම සඳහා, විස්තීර්ණ ණය පහසුකමට අනුකූලව, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රශස්තකරණය (Domestic Debt Optimisation-DDO) පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2023 අගෝස්තු 21 | 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2(1)(අ) වගන්තියේ දක්වා තිබූ රුපියල් බිලියන 4,979ක් වූ රජයේ ණය ගැනීමේ උපරිම සීමාව, රුපියල් බිලියන 13,979ක් ලෙස සංශෝධනය කිරීම සඳහා වන විසර්ජන (සංශෝධිත) කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 14 | දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව පියවීම සිදු කරන ලදී. පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර, දිගු කල්පිරීම් සහිත රුපියල් බිලියන 3,204.5ක් වූ නව බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. තවද, ආයෝජකයින්ට ඔවුන්ගේ පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රුපියල් බිලියන 110.9ක උපචිත පොලියක් ගෙවන ලදී. |
| 2023 සැප්තැම්බර් 20 | භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය මත පදනම් වූ සෘජු නිකුතු කවුළුවක් 2023 සැප්තැම්බර් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 21 | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අංක 129(2) වගන්තියට අනුව සහ 2023 අංක 12 දරන විසර්ජන පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට දුන් නොපියවූ තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 344.7ක් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් මිලදී ගත් නොපියවූ භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 2,368.4ක් අතුරින් රුපියල් බිලියන 2,492.3ක්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කුපන් පොලියකින් යුතු නව භාණ්ඩාගාර බැඳුම්කර 10ක් බවට සහ රුපියල් බිලියන 220.8ක් එවකට වෙළඳපොළෙහි පැවති භාණ්ඩාගාර බිල්පත් 12ක් බවට 2023 සැප්තැම්බර් මස 21 දින පරිවර්තනය කරන ලදී. |
| 2023 නොවැම්බර් 03 | 2023 අගෝස්තු 18 වැනි දින අත්සන් කරන ලද මහජන බැංකුවේ අක්වෙරළ බැංකු ඒකක ණය ශේෂය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමට අනුව, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ අක්වෙරළ බැංකු ඒකක ණය හුවමාරුව එම බැංකුව සඳහා ක්‍රියාත්මක කරන ලදී. එම ණය මුදල් වන රුපියල් බිලියන 27.7 වෙනුවෙන් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර 5ක් වෙන් කරන ලදී. |

| | |
|---|---|
| 2024 මාර්තු 11 | 2024 මාර්තු 07 දින අදාළ සංශෝධිත විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දෙවන අදියර සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, වෙන්දේසියේ සමස්ත හිඟය හා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ සමස්ත වටිනාකමින් සියයට 10ක් හෝ රුපියල් බිලියන 5ක් යන ද්විත්වයෙන් ඉහළ අගයක් ගන්නා ප්‍රමාණය ලෙස අඩු කරන ලද අතර, 2024 මාර්තු 11 වැනි දින සිට මෙම විධානය බලාත්මක කරන ලදී. |
| | 2024 මාර්තු 07 වැනි දින අදාළ සංශෝධිත විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ භාණ්ඩාගාර බැඳුම්කරවල සෘජු නිකුතු කවුළුව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සම්පූර්ණයෙන් ම පිළිගනු ලබන සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා ඉදිරිපත් කළ මුදලින් සියයට 10ක් දක්වා අඩු කරන ලද අතර, 2024 මාර්තු 11 දින සිට මෙම විධානය බලාත්මක කරන ලදී. |
| **මූල්‍ය අංශය** | |
| **බලපත්‍රලාභී බැංකු** | |
| 2023 ජනවාරි 02 | 2023 ජනවාරි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බැංකු අනුපාතිකය මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති නවතම බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය මත පදනම් අංක +300 ආන්තිකයක් එකතු කොට තීරණය කරනු ලබන බවට දන්වමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2023 ජනවාරි 31 | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (බලපත්‍රලාභී බැංකුවල) ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේ දී, සුදුසුකම් ලත් මුල්‍ය නොවන සාංගමික ණය සුරැකුම්පත් සහ සුදුසුකම් ලත් මුල්‍ය නොවන සාමාන්‍ය කොටස් යන උපකරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතය සඳහා වන විධානවල කොන්දේසිවලට යටත්ව ද්‍රවශීල වත්කම් ලෙස සැලකීමට අවසර ලබා දෙමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 02 | පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන් සහ බලපත්‍රලාභී බැංකුවල තිරසාර බව සහතික කිරීම සඳහා සුදුසු මට්ටමේ ද්‍රවශීලතාවක් සහ ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කරමින් බැංකු පනත යටතේ විධාන නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 16 | 2022 මැයි 19 දිනැති නියෝගය මගින් ආවරණය වන දැනට පවතින සංයෝජිත වර්ගීකරණ කේත ලැයිස්තුවට අමතරව, අලුතින් එකතු කරන ලද සංයෝජිත වර්ගීකරණ කේත 64ක් සඳහා ණයවර ලිපි මත සියයට 100ක මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පවත්වා ගැනීම සඳහා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 17 | නව සංයෝජිත වර්ගීකරණ අංක 64ක් සඳහා 2022 අංක 03 දරන ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා යන බැංකු පනත් විධානයෙහි විධිවිධාන අදාළ කරමින්, එම බැංකු පනත් විධානය සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. |
| 2023 මාර්තු 07 | තම ව්‍යාපාර/ආදායම් මාර්ග පුනර්ජීවනය කිරීමට විභවතාවක් ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් දිරිමත් කිරීමේ අරමුණින් බලපෑමට ලක් වූ ණය ගනුදෙණුකරුවන් වෙත අවස්ථානුකූලව සුදුසු සහන සලසන ලෙස බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී. |
| 2023 අප්‍රේල් 21 | බලපත්‍රලාභී බැංකුවලට අදාළ නියාමන කටයුතු සඳහා සුදුසුකම් ලත් පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස අයි.සී.ආර්.ඒ. ලංකා ලිමිටඩ් ආයතනය පිළිගැනීම අත්හිටුවන ලෙස දන්වමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

2

| | |
|---|---|
| 2023 අප්‍රේල් 25 | බලපත්‍රලාභී බැංකුවල අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම පිළිබඳ 2023 අංක 01 දරන බැංකු පනත් විධානයට සංශෝධනයක් නිකුත් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් විධානයේ දක්වන ලද අවශ්‍යතා සපුරාලීමෙන් තොරව ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් සඳහා වන කළමණාකරණ දීමනා සහ අධ්‍යක්ෂක මණ්ඩල ගෙවීම් ඉහළ දැමීමෙන් වැළකිය යුතු වේ. |
| 2023 මැයි 17 | ණයවර ලිපි මත මුදල් තැන්පතු පවත්වාගෙන යෑම පිළිබඳව 2022 මැයි මස 19 සහ 2023 පෙබරවාරි මස 16 දින නිකුත් කරනු ලැබූ නියෝග අහෝසි කරන ලදී. |
| 2023 මැයි 18 | ආනයනවලට එරෙහි ආන්තික අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022 අංක 03 දරන බැංකු පනත් විධානය සහ 2023 අංක 02 දරන බැංකු පනත් විධානය අවලංගු කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2023 අගෝස්තු 25 | බලපත්‍රලාභී බැංකුවල ඇතැම් ශ්‍රී ලංකා රුපියල් ණය සඳහා උපරිම පොලී අනුපාත පනවමින් සහ අනෙකුත් සියලුම නව සහ පවතින රුපියල් ණයවල පොලී අනුපාත ඉලක්කගත දිනයන්හි දී නිශ්චිත ප්‍රතිශතවලින් අඩු කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කරමින් ශ්‍රී ලංකා රුපියල් ණය සඳහා වන පොලී අනුපාත යන මැයෙන් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 15 | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත, පාර්ලිමේන්තුව විසින් 2023 සැප්තැම්බර් 14 දින සහතික කරන ලද අතර, අංක 2358/46 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අනුව, ඉහත සඳහන් පනතේ විධිවිධාන 2023 නොවැම්බර් 15 සිට ක්‍රියාත්මක විය.<br><br>2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 2023 අංක 01 දරන නියෝගයන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 23 | 2024 සහ 2025 වසර සඳහා අදාළ වන නව බලපත්‍ර ගාස්තු ව්‍යුහය දන්වමින් වාර්ෂික බලපත්‍ර ගාස්තු පිළිබඳ බැංකු පනත් නිර්ණයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 27 | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කරන ලද නිර්ණයන් අංක 2360/02 ගැසට් නිවේදනය යටතේ සාමාන්‍ය ජනතාව වෙත නිකුත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 08 | පසුගිය කාලය තුළ පැවති අසාමාන්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අනුකූලවීමේ පොදු කාලසීමාවන් සහ ඇතැම් අනුකූලවීම් සඳහා වන සුවිශේෂ කාලසීමාවන් දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව සම්බන්ධයෙන් වූ 2021 අංක 16 දරන බැංකු පනත් විධානය සඳහා සංශෝධන නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 29 | ප්‍රයිස්වෝටර්හවුස්කූපර් සහ එස් ජේ එම් එස් ඇසෝසියේට්ස් යන විගණන ආයතනවල නම් වෙනස් කිරීමත් සමඟ එම විගණන ආයතනවල නම්, පිළිවෙලින්, ඩෙලොයිට් පාර්ට්නර්ස් සහ ඩෙලොයිට් ඇසෝසියේට්ස් ලෙස වෙනස් කරමින්, 2019 අංක 08 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ගිණුම් ප්‍රකාශ විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකයින්ගේ ලැයිස්තුව" යන චක්‍රලේඛයට සංශෝධන නිකුත් කරන ලදී. |
| 2024 මාර්තු 25 | ණය සංකේන්ද්‍රණ අවදානම අවම කරමින් බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය තහවුරු කිරීමේ අරමුණින්, 2026 ජනවාරි 01 දින සිට බලාත්මක කිරීමට නියමිතව, "බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම්" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| 2024 මාර්තු 28 | සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට පත් ව්‍යාපාර තිරසාර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් සහ බලපත්‍රලාභී බැංකුවල වත්කම්වල ගුණාත්මක බව ඉහළ නැංවීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | බැංකු (සංශෝධන) පනත<br>ආයතනික යහපාලනය පිළිබඳ සංශෝධිත විධාන |

**බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්**

| | |
|---|---|
| 2023 ජනවාරි 05 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2023 ජනවාරි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2023 ජනවාරි 18 | ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි 9.1. (ඌ) වගන්තිය ප්‍රකාරව අවලංගු කරන ලදී. |
| 2023 ජනවාරි 31 | බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ (ඒකාබද්ධකරණ වැඩපිළිවෙල) කොටසක් ලෙස එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත (මුදල් ව්‍යාපාර පනත) යටතේ නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කරන ලදී. තවද, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත (කල්බදු මූල්‍යකරණ පනත) යටතේ එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී.<br><br>ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම තුළින් අවිනිශ්චිත කාල වකවානු තුළ ඇති විය හැකි ආර්ථික කම්පන අවශෝෂණය සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාව ශක්තිමත් කිරීමේ පියවරක් වශයෙන් සහ ගනුදෙනුකරුවන්ගේ ණය අවශ්‍යතා සඳහා අඛණ්ඩව සහාය වීම සඳහා, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභ රටින් බැහැර කිරීම පිළිබඳ මාර්ගෝපදේශය බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2023 පෙබරවාරි 02 | නිශ්චිත කාර්යයන් සඳහා පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස ක්‍රියා කිරීමෙන් ඉක්රා ලංකා ලිමිටඩ් ආයතනය ඉවත් කර ඇති බව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී. |
| 2023 පෙබරවාරි 08 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 ජූලි 25 වැනි දින බලපත්‍රය අවලංගු කරන ලද ද ස්ටැන්ඩඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 මාර්තු 03 | පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් සඳහා සුදුසු සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම වෙතින් ඉල්ලා සිටින ලදී. |

2

| | |
|---|---|
| 2023 මාර්තු 21 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2020 මැයි 22 වැනි දින බලපත්‍රය අවලංගු කරන ලද ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 අප්‍රේල් 25 | 2023 අප්‍රේල් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතේ 37 (1) වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමේ නිවේදනයක් බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 09 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 මාර්තු 05 වැනි දින බලපත්‍රය අවලංගු කරන ලද සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 ජූලි 05 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2023 ජූලි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2023 ජූලි 31 | ඒකාබද්ධකරණ වැඩපිළිවෙලෙහි කොටසක් ලෙස, 2023 ජූලි 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වී ඇති අතර එම ඒකාබද්ධ වීමෙන් අනතුරුව පවතින ආයතනය නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී වේ. |
| 2023 සැප්තැම්බර් 01 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය මුහුණ දී තිබූ බරපතල තත්ත්වය මගහරවා ගනිමින් සෑහීමකට පත්විය හැකි ප්‍රගතියක් පෙන්වීමට අපොහොසත් වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි 2023 සැප්තැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි එම ආයතනය වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය අවලංගු කරන ලදී. |
| 2023 දෙසැම්බර් 15 | මුදල් ව්‍යාපාර පනත යටතේ ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයට, අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ඈවරකරුවෙකු පත් කිරීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2024 ජනවාරි 05 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෂෙරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2024 ජනවාරි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2024 පෙබරවාරි 13 | බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව දැනගැනීම සඳහා හෝ වෙනත් නිශ්චිත අරමුණක් සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල කාලෝචිත, නිවැරදි, ස්ථාවර සහ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණ ඇතිව කාලානුරූප වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳව උපදෙස් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | කුඩා සහ මධ්‍ය පරිමාණයේ බලපත්‍රලාභී මුදල් සමාගම්වල දිගු කාලීන තිරසරභාවය තහවුරු කිරීම සඳහා වන ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ II වන අදියර ක්‍රියාත්මක කිරීම. |

මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන ඇතුළුව, වර්තමාන වෙළඳපොළ ප්‍රවණතා සමඟ අනුකූලවන පරිදි පවත්නා නියාමන රාමුව සංශෝධනය කිරීම.

අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කරන අතරතුර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ස්ථායීභාවය වැඩිදියුණු කිරීමට අදාළ නීති සහ රෙගුලාසි හඳුන්වා දීම.

**මූල්‍ය අංශයට අදාළ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග**

2023 අගෝස්තු 08 — මූල්‍ය සේවා සපයන්නන් විසින් සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ සදාචාරාත්මක ව්‍යාපාර පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන වෙළඳපොළ අධීක්ෂණය සහ බලගැන්වීම් සිදු කිරීමට අවශ්‍ය පදනම සැපයීම සඳහා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය සේවා සපයන්නන් හට අදාළ වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (MLA) 10 (ඇ) වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

2024 ජනවාරි 31
2024 පෙබරවාරි 01
2024 පෙබරවාරි 06 — ලෝක බැංකුවේ මූල්‍ය අංශයේ සුරක්ෂිතතා ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකු සමූහයේ සාමාජික ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ණය ගිවිසුම් අත්සන් කරන ලදී.

# 2

# 3 පරිච්ඡේදය

# සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

## සාරාංශය

ඉහළ සාර්ව ආර්ථික ස්ථායීතාවය නැවත අත්කර ගැනීම තුළින් ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව යථා තත්ත්වයට පත්වෙමින් ඉදිරි වසරවල දී එහි විභව මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින, ඉහළ අභිලාෂයන්ගෙන් යුත් ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වා ගැනීම සහ එමගින් අපේක්ෂිත ආර්ථිකයේ ගැළපීම් සිදුවනු ඇතැයි යන උපකල්පනය සමඟ ආර්ථිකයේ බහුවිධ අංශයන්හි ස්ථායීතාවයක් ඇති වනු ඇතැයි අපේක්ෂිතය. වේගවත් නිර්-උද්ධමන ක්‍රියාවලියෙන් පසුව, අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ සැපයුම් අංශයේ කම්පන හේතුවෙන් විටින් විට උච්ඡාවචන ඇති විය හැකි වුවත්, උද්ධමනය 2024 වසරේ දී සාමාන්‍යයෙන් සියයට 5ක ඉලක්කගත මට්ටම ආසන්නයේ පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ. සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ආධාරයෙන් මධ්‍ය කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටමට ආසන්නයේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී, ඉහළ මහජන වගවීමක් සමඟ මහ බැංකුව සතුව පවතින ස්වාධීනත්වය, මධ්‍ය කාලීනව දේශීය මිල ස්ථායීතාවය පවත්වා ගැනීමට උපකාරී වේ. 2023 වසරේ දෙවන භාගයේ දී නිරීක්ෂණය වූ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීමේ මුල් සලකුණු ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී සියලු අංශවල පුළුල් ලෙස නැවත යථා තත්ත්වයට පත් වීමක් දක්වා පරිවර්තනය වනු ඇතැයි අපේක්ෂිතය. ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යෑමත් සමඟ ආනයන ඉල්ලුම වර්ධනය වීම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් විය හැකි වුව ද, 2023 වසරේ දී ඇති වූ හිතකර ප්‍රවණතා තවදුරටත් ඉදිරියට ගෙනයමින් සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් වීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ යෑම සහ අපේක්ෂිත ණය නොවන ලැබීම් සමඟ විදේශීය අංශය ශක්තිමත්ව වර්ධනය වනු ඇති අතර, විදේශීය ස්වාරක්ෂක ගොඩනැගෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2023 වසරේ දී පැවති දැඩි අවදානම් සැලකිය යුතු ලෙස අඩුවීමත් සමඟ, නීතිමය රාමුව ශක්තිමත් කිරීම හරහා අභියෝගවලට මුහුණ දීමේ හැකියාව වර්ධනය වීම තුළින් මූල්‍ය අංශයෙහි සේවා සැපයීම ඉදිරි කාලය තුළ දී පුළුල් වනු ඇතැයි අපේක්ෂිතය. රාජ්‍ය මූල්‍ය අංශය තුළ, ආර්ථිකය තිරසාර මාවතක් කරා යොමු වීම සහතික කිරීම සඳහා බෙහෙවින් ම අවශ්‍යව තිබූ ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු කරන අතර ම, රජය සිය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න සඳහා වූ කැපවීම නොපසුබටව පවත්වා ගනු ඇතැයි බලාපොරොත්තු වේ. දේශගුණික විපර්යාස, ජනගහනය වියපත් වීම සහ භූ දේශපාලනික අර්බුද හේතුවෙන් ඇති වන දිගුකාලීන අභියෝග මධ්‍යයේ, මැදි සහ දිගු කාලීනව ශ්‍රී ලංකා ආර්ථිකයේ සමස්ත ඉදිරි දැක්ම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමත් සමඟ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ පුළුල් දේශපාලනික හා සමාජ සම්මුතියක් සහිතව ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මත රඳා පවතිනු ඇත.

3

## 3.1 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

**2023 වසරේ දී අවදානම් දරා ගැනීමේ සළකුණු පෙන්නුම් කළ ගෝලීය ආර්ථිකය, මන්දගාමී වර්ධනය, බලාපොරොත්තු වූවාට වඩා මන්දගාමී නිර්-උද්ධමනය සහ භූ දේශපාලන අවිනිශ්චිතතාවයන්ගෙන් මතුවන අවදානම් ඇතුළු ආර්ථික ගැටලු රාශියකින් මිදී, ඉදිරියේ දී නැවත යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ජා.මූ. අරමුදල විසින් 2024 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට (World Economic Outlook) අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2022 වසරේ දී පැවති සියයට 3.5 සිට 2023 වසරේ දී සියයට 3.1ක් දක්වා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ගෝලීය ආර්ථික වර්ධනය 2024 වසරේ දී සියයට 3.1ක අගයක පවතිනු ඇතැයි ද, එක්සත් ජනපදය ඇතුළු විශාල ආර්ථිකයන් කිහිපයක් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම සහ චීනයේ රාජ්‍ය මූල්‍ය උත්තේජක හේතුවෙන්, 2025 වසරේ දී එය සියයට 3.2ක් දක්වා ඉහළ යනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, උද්ධමනය මැඩපැවැත්වීම සඳහා ගනු ලැබූ සීමාකාරී මුදල් ප්‍රතිපත්තිවල බලපෑම, ඉහළ මට්ටමක පවතින ණය හමුවේ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති වන ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම, සහ යටි දැරි ඵලදායිතා වර්ධනය මන්දගාමී වීමේ බලපෑම පිළිබිඹු කරමින්, 2024-2025 වසර සඳහා පුරෝකථනය කළ ගෝලීය වර්ධනය, පෙර වසරවල (2000-2019) පැවති වර්ධනයේ සාමාන්‍යය වන සියයට 3.8ට වඩා පහළ අගයක පවතී. සංවර්ධිත ආර්ථිකයන් යම් පසුබෑමක් අත්විඳිනු ඇතැයි අපේක්ෂිත අතර, එම රටවල 2022 වසරේ සියයට 2.6ක වර්ධනය 2023 වසරේ දී සියයට 1.6ක් දක්වා සහ ඉන් පසු 2024 වසරේ දී සියයට 1.5ක් දක්වා පහත වැටීමෙන් අනතුරුව, 2025 වසරේ දී සියයට 1.8ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. යුක්‍රේන යුද්ධයේ බලපෑම අඩුවීම හේතුවෙන් යුරෝ කලාපයේ ආර්ථිකයන් සහ එක්සත් රාජධානිය, සිය පහළ වර්ධන අනුපාතවලින් 2024 වසරේ දී යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කළ ද, සංවර්ධිත ආර්ථිකයන්හි සමස්ත මන්දගාමී වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නේ, දැඩි මුදල් ප්‍රතිපත්තිය මෙන්ම සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම් සමඟ ඇති වූ එක්සත් ජනපද ආර්ථික වර්ධනයේ මන්දගාමීත්වයයි. එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය ශ්‍රී ලංකාව සඳහා ඇති විශාලතම අපනයන ගමනාන්තයන් වන බැවින් සංවර්ධිත ආර්ථිකයන්හි මෙම අපේක්ෂිත මන්දගාමී වර්ධනය ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ හැකිය. එසේම, වියදම් කිරීමට ඉහළ හැකියාවක් සහිත සංචාරකයින්ගේ පැමිණීම අපේක්ෂිත ආකාරයට යථා ත්ත්ත්වයට පත්වීම කෙරෙහි සංවර්ධිත ආර්ථිකයන්හි ආර්ථික වර්ධනයේ පසුබෑම අහිතකර ලෙස බලපානු ඇත. මේ අතර, නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2022 වසරේ දී මෙන්ම 2023 සහ 2024 වසරවල දී සියයට 4.1ක ස්ථාවර වර්ධනයක් පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය 2025 වසරේ දී සියයට 4.2ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. ආර්ථික අභියෝග සඳහා මුහුණ දීමට මෙම ආර්ථිකයන්ට ඇති හැකියාව, ප්‍රධාන වශයෙන් ඉන්දියාවේ සහ චීනයේ ශක්තිමත් වර්ධන වේගයන් තුළින් පිළිබිඹු කෙරේ. ඉන්දියානු ආර්ථිකය 2023 වසරේ දී සියයට 6.7කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, දේශීයව පවතින දැඩි ඉල්ලුම පිළිබිඹු කරමින්, 2024 සහ 2025 යන වසර දෙකෙහි දී ම සියයට 6.5ක් වැනි ශක්තිමත් වර්ධන මට්ටමක් පවත්වාගනු ඇතැයි පුරෝකථනය කර ඇත.

**3.1 සංඛ්‍යා සටහන** **ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | 2022 (ආ) | 2023 (ඇ) | 2024 (ප්‍රක්ෂේපණ) | 2025 (ප්‍රක්ෂේපණ) |
|---|---|---|---|---|
| **ලෝක නිෂ්පාදිතය** | **3.5** | **3.1** | **3.1** | **3.2** |
| සංවර්ධිත ආර්ථික | 2.6 | 1.6 | 1.5 | 1.8 |
| ඇමරිකා එක්සත් ජනපදය | 1.9 | 2.5 | 2.1 | 1.7 |
| යුරෝ කලාපය | 3.4 | 0.5 | 0.9 | 1.7 |
| එක්සත් රාජධානිය | 4.3 | 0.5 | 0.6 | 1.6 |
| ජපානය | 1.0 | 1.9 | 0.9 | 0.8 |
| නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 4.1 | 4.1 | 4.1 | 4.2 |
| නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව | 4.5 | 5.4 | 5.2 | 4.8 |
| චීනය | 3.0 | 5.2 | 4.6 | 4.1 |
| ඉන්දියාව | 7.2 | 6.7 | 6.5 | 6.5 |
| **ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **5.2** | **0.4** | **3.3** | **3.6** |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථික | 7.3 | 4.6 | 2.6 | 2.0 |
| නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 9.8 | 8.4 | 8.1 | 6.0 |
| වෙළඳ භාණ්ඩ මිල | | | | |
| ඉන්ධන | 39.2 | -16.0 | -2.3 | -4.8 |
| ඉන්ධන නොවන | 7.9 | -6.1 | -0.9 | -0.4 |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලය: World Economic Outlook (2024 ජනවාරි) ජා.මූ අරමුදල

චීනයේ ආර්ථික වර්ධනය 2023 වසරේ දී සියයට 5.2ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, ස්වභාවික විපත්වලට මුහුණ දීමේ හැකියාව ඉහළ නැංවීමට යොදා ගත් රාජ්‍ය මූල්‍ය සහාය සැලකිල්ලට ගත් කළ, 2024 වසරේ දී සහ 2025 වසරේ දී, පිළිවෙලින්, සියයට 4.6කින් සහ සියයට 4.1කින් වර්ධනය වනු ඇති බවට පුරෝකථනය කර තිබේ. විශේෂයෙන් ම භාණ්ඩ වෙළඳාම, සංචාරක කර්මාන්තය, විදේශීය ඍජු ආයෝජන සහ මූල්‍ය ආධාර ඔස්සේ චීන හා ඉන්දියානු ආර්ථිකයන් සමඟ ඇති ශක්තිමත් ආර්ථික හා භූ දේශපාලනික සම්බන්ධතා සැලකීමේ දී, එම ආර්ථිකයන්හි ඉහළ අපේක්ෂිත වර්ධන වේගය ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි හිතකර බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම, ශ්‍රම වෙළඳපොළ ලිහිල් වීම සහ බලශක්ති මිල සාපේක්ෂ ලෙස පහළ යෑමේ බලපෑම හේතුවෙන් ගෝලීය මතුපිට උද්ධමනය පෙර බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන් පහත වැටීම මගින් ගෝලීය මුදල් තත්ත්වයන් අපේක්ෂා කළ හැකි මට්ටමට ලිහිල් කිරීම සඳහා හිතකර තත්ත්ව නිර්මාණය කෙරෙමින් පවතී.** ගෝලීය උද්ධමනය, 2022 වසරේ පැවති සියයට 8.7 සිට 2023 වසරේ දී සියයට 6.8ක් දක්වා පහත වැටී ඇති අතර, ඉන් පසුව 2024 වසරේ දී සියයට 5.8ක් දක්වා තවදුරටත් ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. භාණ්ඩ මිල, ප්‍රධාන වශයෙන් තෙල් මිල, ඉදිරි වසර දෙක තුළ දී පහත වැටීම නිර්-උද්ධමනය වේගවත් කිරීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කළ ද, ගාසා තීරයේ ගැටුම් මැදපෙරදිග කලාපයට ව්‍යාප්ත වීමට ඇති හැකියාව මෙන්ම රතු මුහුදේ සිදුවන පහර දීම් අඛණ්ඩව පැවතීම ද ඇතුළු, භූ දේශපාලනික කම්පනවල ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ මිල ඉහළ යෑමේ නව ප්‍රවණතාවන් ගෝලීය උද්ධමනය වේගවත් කළ හැකිය. ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යෑම නිසා වැඩි වන ආනයන වියදම් හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් වන අතර ම, ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල උද්ධමනය ඉහළ යෑම සඳහා ද බලපෑ හැකිය. එල් නිනෝ (El Niño) සංසිද්ධිය ද සමඟින් ගංවතුර සහ නියඟය වැනි කාලගුණය හා සම්බන්ධ අහිතකර බලපෑම් ඇති වීම ද ආහාර මිල ඉහළ යෑමට හේතු විය හැකි අතර, එය ගෝලීය වශයෙන් මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීමේ උත්සාහයන් ව්‍යවර්ථ කරනු ඇත. මෙයට අමතරව, ණය සේවාකරණ පිරිවැය ඉහළ යෑම හේතුවෙන් සැලකිය යුතු ණය අර්බුදයකට මුහුණ දීමේ අවදානමක් සහිත බොහෝ ආර්ථිකයන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සඳහා යොමු වීම එම රටවල වර්ධන අපේක්ෂාවන්ට තවදුරටත් බාධා ඇති කළ හැකිය.

**උද්ධමන පීඩන ඉහළ යෑම පිළිබඳව සලකා බලා 2022 වසරේ දී ක්‍රමයෙන් දැඩි කරන ලද ගෝලීය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, උද්ධමනය තවදුරටත් ඉහළ අගයක පැවතීම හේතුවෙන් 2023 වසරේ දී සැලකිය යුතු ලෙස තීව්‍ර මට්ටම් කරා දැඩි කරන ලදී.** බොහෝ සංවර්ධිත මෙන්ම නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි උද්ධමනය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීමට භූ දේශපාලනික අර්බුද හේතුවෙන් සැපයුම් අඩාල වීම්, වසංගතය කාලය තුළ මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ පසු බලපෑම්, ඉහළ උද්ධමන අපේක්ෂා සහ වැටුප් පීඩන යන ප්‍රධාන සාධක හේතු විය. උද්ධමනය මන්දගාමී වීමේ මුල් ලක්ෂණ කිහිපයක් නිරීක්ෂණය වූව ද, බටහිර ආර්ථිකයන් චීනය සමඟ ඇති සබඳතා අඩු කිරීම හේතුවෙන් ඇති වූ ආර්ථික විසංයෝජනය, රතු මුහුදේ අර්බුදකාරී තත්ත්වය මගින් ගෝලීය සහ කලාපීය සැපයුම් දාම කෙරෙහි ඇති වන බලපෑම සමඟ පහසුවෙන් අඩු නොවන මූලික උද්ධමන මට්ටම් වැනි අනෙකුත් අහිතකර ගෝලීය ප්‍රවණතා මෙන්ම ලැබෙමින් පවතින දත්ත අනුව ලොව පුරා මහ බැංකු 2024 වසරේ දී ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමේ දී ප්‍රවේශම් සහගත වනු ඇත. මේ අතර, 2024 වසරේ මේ දක්වා කාලය තුළ අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව එ.ජ. ඩොලරය ශක්තිමත් විය. එක්සත් ජනපද ආර්ථිකයේ නව රැකියා ජනනය කිරීම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ යෑම ඇතුළුව, එක්සත් ජනපද ආර්ථිකයේ ශක්තිමත් ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු වන්නට ඇත. තවද, අඛණ්ඩ උද්ධමන පීඩන මධ්‍යයේ පොලී අනුපාත සාමාන්‍යකරණය කිරීම ප්‍රමාද වීම ද නුදුරු අනාගතයේ දී එක්සත් ජනපද ඩොලරය වඩා ශක්තිමත් වීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.2 දේශීය ආර්ථිකයේ ඉදිරි දැක්ම

### 3.2.1 උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම


**අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ සැපයුම් පාර්ශ්වයේ අපගමන හේතුවෙන් ඇතැම් අවස්ථාවන්හි දී යම් විචලනයක් සිදුවිය හැකි වුවද, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටම ආසන්නයේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** සීඝ්‍ර නිර්-උද්ධමන ක්‍රියාවලියකින් පසුව, 2023 වසර අවසානය වන විට උද්ධමනය අඩු

තනි අගයක මට්ටමක් කරා ළඟා විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් 2024 වසරේ ජනවාරි මාසයේ ක්‍රියාත්මක කළ එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් උද්ධමනයේ තාවකාලික වැඩිවීමක් 2024 වසරේ මුල් භාගයේ දී නිරීක්ෂණය විය. එසේ වුවද, 2024 වසරේ මේ දක්වා වාර්තා වූ දත්ත මගින්, එකතු කළ අගය මත බදු වෙනස් කිරීම නිසා උද්ධමනය මත ඇතිවන ඍජු සහ වක්‍ර බලපෑම, අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ, මුලින් අපේක්ෂා කළ තරම් විශාල නොවිය හැකි බව පෙන්නුම් කෙරේ. තවද, 2024 වසරේ මාර්තු මාසයේ සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තුව කැපී පෙනෙන ලෙස අඩු කිරීම සහ ආහාර මිල ගණන් අඩුවීම මගින් මෙම බදු වැඩිවීමේ බලපෑම් අර්ධ වශයෙන් සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසරේ මාර්තු මාසයේ දී නිරීක්ෂණය වූ උද්ධමනයේ සැලකිය යුතු අඩුවීම සඳහා මෙම බලපෑම් අර්ධ වශයෙන් හේතු වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් පුරෝකථනවලට අනුව,[1] 2024 වසරේ දෙවන කාර්තුවේ දී උද්ධමනය සියයට 5ක ඉලක්කයට වඩා අඩු මට්ටමක පැවතීමට මෙම බලපෑම් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වසරේ අවසාන භාගයේ දී මතුපිට උද්ධමනයේ හැසිරීම මීළඟ වටයේ සිදු කිරීමට නියමිත විදුලි ගාස්තු සංශෝධන සහ පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන සහ ගෑස් මිල සඳහා වන මාසික සංශෝධන මගින් යම් බලපෑමකට ලක් විය හැකිය. කෙසේ වෙතත්, සමස්තයක් ලෙස, 2024 වසර තුළ දී උද්ධමනය සියයට 5ක ඉලක්කය ආසන්නයේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට පවතින දත්තවලට අනුව, සමස්ත ඉල්ලුම්

1 මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් වන කාර්තුමය පුරෝකථන ආකෘතිය (Quarterly Projection Model - QPM) භාවිතා කරනු ලැබේ. සෑම මූදල් ප්‍රතිපත්ති වාරයකදීම මෙම පුරෝකථන යාවත්කාලීන කරනු ලබන අතර, ඒ සඳහා, වෙනත් මූලාශ්‍ර අතර, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මාසික උද්ධමන දත්ත නිකුත් කිරීම සහ දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය දත්ත නිකුත් කිරීම් ද ඇතුළු ව, නවතම ආර්ථික ප්‍රවණතා පිළිබඳ දත්ත සහ තොරතුරු භාවිතා කෙරේ. දත්ත යාවත්කාලීන කිරීමට අමතරව, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්හි නුදුරු කාලීන පුරෝකථන මෙන්ම කාර්යමණ්ඩල විනිශ්චයන් කාර්තුමය පුරෝකථන ආකෘතිය මත පදනම් වූ මැදි කාලීන පුරෝකථන සඳහා ප්‍රධාන යෙදවුම් ලෙස ගනු ලැබේ. 2023 වාර්ෂික ආර්ථික විවරණයෙහි සාකච්ඡා කෙරෙන පුරෝකථන 2024 මාර්තු මාසයේ පුරෝකථන වාරය මත පදනම් වේ.

**3.1 රූප සටහන**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය* මත පදනම් වූ මතුපිට උද්ධමනයේ පුරෝකථන**
**(කාර්තුමය සාමාන්‍ය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013-100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.
**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.**
2024 මාර්තු මස පුරෝකථන වාරයේ දී පැවති සියලුම දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මත පුරෝකථන පදනම් වේ.
ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූප සටහනේ දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

**3.2 සංඛ්‍යා සටහන**

## කෙටි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන (අ)

| දර්ශකය | ඒකකය | 2022 (ආ) | 2023 (ඇ) | පුරෝකථන 2024 |
|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඈ)** | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | -7.3 (ඇ) | -2.3 | 3.0 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් ට්‍රිලියන | 24.1 (ඇ) | 27.6 | 29.9 |
| ඒක පුද්ගල ද.දේ.නි. (ඉ) (ඊ) | එ.ජ. ඩොලර් | 3,464 (ඇ) | 3,830 | 4,075 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 28.6 (ඇ) | 25.3 | 25.8 |
| දේශීය ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 25.0 (ඇ) | 23.8 | 22.4 |
| ජාතික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 27.2 (ඇ) | 27.2 | 26.3 |
| **විදේශීය අංශය (ඈ)** | | | | |
| වෙළඳ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -6.7 | -5.8 | -7.8 |
| අපනයන | එ.ජ. ඩොලර් බිලියන | 13.1 | 11.9 | 12.9 |
| ආනයන | එ.ජ. ඩොලර් බිලියන | 18.3 | 16.8 | 20.0 |
| ජංගම ගිණුමේ ශේෂය (උ) | ද.දේ.නි.යේ % වශයෙන් | -1.9 | 1.8 | 0.5 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 1.2 | 3.1 | 3.4 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| සමස්ත ආදායම සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 8.4 (උඉ) | 11.1 (ඈ) | 13.0 (එ) |
| වියදම හා ශුද්ධ ණය දීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 18.6 (උඉ) | 19.4 (ඈ) | 22.3 (එ) |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -6.4 (උඉ) | -6.0 (ඈ) | -3.2 (එ) |
| ප්‍රාථමික ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.7 (උඉ) | 0.6 (ඈ) | 0.8 (එ) |
| ප්‍රාථමික ගිණුමේ ශේෂය (බැංකු ප්‍රාග්ධනීකරණය සමඟ) | ද.දේ.නි.යේ % වශයෙන් | - | - | -1.3 (එ) |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -10.2 (උඉ) | -8.3 (ඈ) | -7.3 (එ) |
| සමස්ත අයවැය හිඟය (බැංකු ප්‍රාග්ධනීකරණය සමඟ) | ද.දේ.නි.යේ % වශයෙන් | - | - | -9.4 (එ) |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 114.2 (උඉ) | 103.9 (ඈ) | 110.3 (එ) |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඒ) | සියයට | 15.4 | 7.3 | 15.0 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඒ) | සියයට | 6.2 | -0.6 | 8.5 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය | සියයට | 46.4 (ඔ) | 17.4 (ඕ) | 5.0 (ඕ) |

(අ) 2024 මාර්තු මස මැද වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

(ඉ) නවතම ජනගහන සංඛ්‍යා සමඟ යාවත්කාලීන කරන ලද ඇස්තමේන්තු

(ඊ) කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය භාවිතයෙන් ගණනය කරන ලද එ.ජ. ඩොලරයට අනුව කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතය මත පදනම්ව

(උ) උපචිත පදනම මත පදනම් වේ.

(උඉ) 2024 මාර්තු 15 දින ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. දත්ත මත පදනම්ව සංශෝධනය කරන ලදී.

(එ) 2024 වසර සඳහා වන පුරෝකථන 2023 දෙසැම්බර් මස ජා.මූ. අරමුදලේ කාර්ය මණ්ඩල වාර්තාව මත පදනම් වේ.

(ඒ) වසර අග පැවති අගයන් පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය

(ඔ) කො.පා.මි.ද. (2013=100) මත පදනම් වේ.

(ඕ) කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

පීඩන නොමැති වාතාවරණයක් තුළ, 2025 වසරේ මුල් භාගයේ දී උද්ධමනය කෙටි කාලයක් සඳහා පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් 2024 වසරේ මුල් භාගයේ දී බදු සංශෝධන සහ කැපී පෙනෙන ආහාර උද්ධමනය හේතුවෙන් උද්ධමනය වැඩිවීම නිසා ඇතිවන හිතකර පදනම් බලපෑම හේතුවේ. මේ අතර, ඉල්ලුම් තත්ත්වයන් යටපත්ව පැවතුණ ද, බොහෝ දුරට එකතු කළ අගය මත බදු ව්‍යුහයේ වෙනස්කම් හේතුවෙන්, ඉදිරි කාර්තුවල දී මූලික උද්ධමනය ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. බලශක්ති සම්බන්ධ වියදම් මූලික උද්ධමනය මනිනු ලබන පරිභෝජන පැසට ඇතුළත් නොවන බැවින් අඩු කරන ලද විදුලි ගාස්තුවලින් ඇතිවන සෘජු බලපෑම මූලික උද්ධමනයේ අඩුවීම සඳහා බල නොපෑමත්,

මූලික උද්ධමනය සාමාන්‍යයෙන් සාපේක්ෂව ඉහළ ස්ථායීතාවකින් පැවතීමත්, මූලික උද්ධමනයේ මෙම පුරෝකථනය කළ මාර්ගය කෙරෙහි බලපානු ඇත. මතුපිට උද්ධමනයට වඩා අඩු වශයෙන් වුවද හිතකර පදනම් බලපෑම අර්ධ වශයෙන් දායක වීම හේතුවෙන්, මූලික උද්ධමනය ද, මතුපිට උද්ධමනයේ ගමන් පථයට අනුකූලව යමින් 2025 වසරේ මුල් භාගයේ දී පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ මූලික උද්ධමනය මැදි කාලීනව මැදි-තනි අගයක ආසන්නයේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3


**පවතින දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා, අයහපත් කාලගුණික තත්ත්ව සහ භූ දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිතබව සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ මට්ටමක පවතී.** ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පුරෝකථන අනුව අපේක්ෂිත දේශීය රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම; සහ ඇමරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘතිය මගින් ලබාදෙන පොලී අනුපාතික මාර්ගය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සාර්ව ආර්ථික ප්‍රතිචාර මත පුරෝකථන රඳා පවතී. මෙම උපකල්පනවල සිදුවන ඕනෑම සැලකිය යුතු මට්ටමේ වෙනසක්, සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. පුරෝකථන සඳහා සෘජුව හෝ වක්‍රව භාවිතා වන විවිධ සාධක ඒවායේ දැනට සලකා ඇති මට්ටම්වලින් අපගමනය වීමේ හැකියාව සහ කිසියම් අනපේක්ෂිත වර්ධන හේතුවෙන් පුරෝකථන සඳහා අවිනිශ්චිතතා හට ගනී. විශේෂයෙන්, අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ආහාර සහ බලශක්ති මිල ඉහළ යෑමට ඇති හැකියාව නිසා සිදුවන බලපෑම; අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම හා එමගින් ආහාර මිල ගණන් මත ඇතිවන බලපෑම; වෙනත් සාධක අතර, මිල අධික මූලාශ්‍ර භාවිතා කිරීමේ අවශ්‍යතාව ඇතිවන පරිදි විදුලි උත්පාදන සංයුතියට බලපෑම් ඇතිකරමින් සිදුවිය හැකි කාලගුණ විෂමතාවල ද දායකත්වය ඇතිව, පෙර අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි මට්ටමකින් විදුලි ගාස්තු ඉහළ නැංවීමට ඇති හැකියාව; ඉහළ වැටුප් සඳහා ඇති ඉල්ලුම සාක්ෂාත් වීමට ඇති හැකියාව වැනි සාධක මගින් උද්ධමනය පුරෝකථනයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, උද්ධමනය පුරෝකථනය කළ අගයන්වලට වඩා පහළ යෑමේ අවදානම් සැලකුවිට, සැපයුම් තත්ත්වයන් ඉක්මනින් යථා තත්ත්වයට පත්වීම සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ කල් පවත්නා බලපෑම ඇතුළත් වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය තහවුරු කරමින්, දේශීය හා ගෝලීය ආර්ථික තත්ත්වයන්හි ඉදිරි වෙනස්වීම් මත පදනම්ව උද්ධමන ඉදිරි දැක්මෙහි ඇති විය හැකි අපගමනයන් පිළිබඳව සෑම මුදල් ප්‍රතිපත්ති වාරයක දී ම මහ බැංකුව විසින් මහජනතාවට අඛණ්ඩව සන්නිවේදනය කරනු ඇත.

### 3.2.2 වර්ධන අපේක්ෂා

**කාර්තු හයක් මුළුල්ලේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංකෝචන වාර්තා කිරීමෙන් අනතුරුව, ආර්ථිකය 2023 වසරේ දෙවන භාගයේ දී ධනාත්මක කාර්යසාධනයක් වාර්තා කළ අතර, ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ අඩු උද්ධමනකාරී පරිසරයේ ප්‍රතිලාභ අඛණ්ඩව ආර්ථිකය වෙත ගලා යෑම හේතුවෙන් 2024 වසර තුළ දී ආර්ථිකය සියයට 3කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත මට්ටමට වඩා වේගවත්ව සංචාරක අංශය යථා තත්ත්වයට පත්වීම මගින්, අනෙකුත් ආශ්‍රිත අංශ වෙත ද ධනාත්මක බලපෑම් ඇති කරමින්, නුදුරු කාලීන වර්ධන ප්‍රවණතාව සඳහා සහාය සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආනයන සීමා ඉවත් කිරීම, ණය පිරිවැය සහ අමු ද්‍රව්‍ය මිල අඩු වීම වැනි මෑත කාලීනව දක්නට ලැබුණු ධනාත්මක වර්ධනයන් හේතුවෙන් කර්මාන්ත අංශය ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහත සඳහන් කළ ප්‍රවණතා සහ පසුගිය කාලයේ දී ඉදිකිරීම් නවතා දැමූ රජයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම මධ්‍යයේ, ඉදි කිරීම් අංශයේ යථා තත්ත්වයට පත්වීමක් එම අංශයේ ඉදිරි ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කෙරේ. කෘෂි අංශයේ වැඩි දියුණු වූ කාර්යසාධනය පෙන්නුම් කරමින්, මෑතක දී අවසන් වුණු 2023/24 මහ කන්නය තුළ දී ප්‍රධාන බෝග ක්ෂේත්‍ර ධනාත්මක ඵලදාවක් වාර්තා කර ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, දැනට පවතින

**3.2 රූප සටහන**

**කාර්තුමය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.

2024 මාර්තු මස පුරෝකථන වාරයේ දී පැවති සියලුම දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මත පුරෝකථන පදනම් වේ.

ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූප සටහනේ දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන මූර්ත ද.දේ.නි.යේ වර්ධනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද නිල් පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් මූර්ත ද.දේ.නි.යේ වර්ධනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් සාර්ව ආර්ථික විචල්‍යවල දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි. නිතර වෙනස්වන ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා හමුවේ, මූලික පුරෝකථන මත විවිධ ඉහළ යෑමේ හා පහළ යෑමේ අවදානම් ඇති විය හැකිය. සලකන ලද උපකල්පනවල සහ විනිශ්චයන්හි සිදුවන සැලකිය යුතු වෙනස්කම් සැබෑ ආර්ථික වර්ධන මාර්ගය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

දත්ත අනුව අයහපත් කාලගුණික තත්ත්වයන්ගෙන් බලපෑමක් ඇති නොවන්නේ නම් මෙම ධනාත්මක ප්‍රවණතාව වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ දී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල සැලකියයුතු මට්ටමේ ඉහළ යෑම සමාහාර ඉල්ලුම වර්ධනය සඳහා සහාය සපයනු ඇත. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ රාජ්‍ය මූල්‍ය අවකාශයෙහි අපේක්ෂිත වැඩි දියුණු වීම මගින් නුදුරු කාලීන වර්ධන ගමන් මග සඳහා සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වැටුප්වල අපේක්ෂිත ක්‍රමික ගැළපුම් මගින් ද ඉල්ලුම් වර්ධනය සඳහා උපකාරයක් සැලසෙනු ඇත. සාර්ව ආර්ථික ස්ථායීතාවය නැවත තහවුරු වී ඇති බව පෙනී ගිය ද, අපේක්ෂිත මැතිවරණ මධ්‍යයේ 2024 වසර තුළ ආර්ථිකයේ වර්ධනය සඳහා ප්‍රතිපත්තිවල නිශ්චිතතාව සහ අඛණ්ඩතාව ඉතා වැදගත් වේ. දේශීය සේවාවන් සඳහා, විශේෂයෙන් ම සංචාරක අංශය තුළින් වන විදේශ ඉල්ලුම අඛණ්ඩව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිත අතර, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කාරී රටවල ඉහළ ගිය වර්ධන අපේක්ෂා මධ්‍යයේ අපනයන ශක්තිමත් කිරීම සඳහා දැනට ක්‍රියාවට නංවමින් පවතින ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ලැබීම ආරම්භ වීමත් සමඟ මැදි කාලීනව අපනයන සඳහා නව ඉල්ලුමක් නිර්මාණය වනු ඇත. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම, නිසි කලට ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසන් කිරීම, සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ඉදිරියට කරගෙන යෑම සඳහා වන රජයේ කැපවීම මත ආර්ථිකයේ කෙටි කාලීන සහ මැදි කාලීන වර්ධන ප්‍රවණතාව රඳා පවතී. විශේෂයෙන් ම රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායයන්ට අදාළ ප්‍රතිසංස්කරණ ඇතුළු මෙම ප්‍රතිසංස්කරණ හරහා එම අංශය වෙත දැනට යොදවා ඇති සම්පත් මුදා ගෙන එම සම්පත් ඵලදායී අංශ වෙත යොමු කිරීම තුළින් දිගු කාලයක් මුළුල්ලේ අවශ්‍යතාවක්ව පැවති ඵලදායීතාව ඉහළ නැංවීම මෙන්ම ආර්ථිකයේ විභවතාව තවදුරටත් ශක්තිමත් වීම සඳහා සහාය ලබාදිය හැක. කෙසේවෙතත්, ජනගහනය වයස්ගතවීමේ අහිතකර බලපෑම් මධ්‍යයේ, විශේෂයෙන් ම ඉහළ නිපුණතා සහිත වෘත්තිකයින් ඇතුළු මානව ප්‍රාග්ධනය රටෙන් ඉවතට ගලා යෑම, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය සඳහා පවතින ප්‍රධාන අවදානමක් වේ. ශීඝ්‍රයෙන්

මතුවන දේශගුණික විපර්යාසවල බලපෑම් මගින්, කෘෂිකර්මාන්තය පමණක් නොව විදුලිය උත්පාදනය, ඉදිකිරීම් සහ සංචාරක අංශය වැනි අංශ වෙත නිරන්තරයෙන් ඇති කෙරෙන සැපයුම් කම්පන හරහා කෙටි කාලීන සිට මැදි කාලීන වර්ධනය සඳහා අපේක්ෂා කරන මට්ටමට වඩා ඉහළ බලපෑමක් ඇති කරනු ඇත. ආර්ථිකයේ විභවතාවය වෙත ළඟා වීමේ දී දුර්වල ආර්ථික විවිධාංගීකරණය තවදුරටත් බාධකයක් වන අතර, විශේෂයෙන් ම ශීඝ්‍රයෙන් වෙනස්වන ගෝලීය පරිසර තත්ත්වයන් සැලකීමේ දී එය ආර්ථික අවදානම් නිර්මාණය කරන ප්‍රභවයක්ව පවතී. තවද, සියලුම ප්‍රධාන ආර්ථික අංශ ආවරණය වන පරිදි ආර්ථිකයේ සමස්ත ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වන ඉලක්කගත ක්‍රියාමාර්ග ද මෙම සුවිශේෂී අවස්ථාවේ දී ඉතා වැදගත් වේ. සූක්ෂම ආර්ථිකය පිළිබඳව සැලකීමේ දී, කෙටි කාලීනව කම්පන සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැංවීමට මෙන්ම, ආර්ථික බලගැන්වීම තුළින් පුද්ගලයින්ට ඉදිරි කාලයේ දී ආර්ථික ඉඩ ප්‍රස්ථා නිර්මාණය කර දීම සහ තිරසාර සංවර්ධනයක් ඇති කරලීම සඳහා, සමාජ ආරක්ෂණ ජාලවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රතිපාදන සැපයීම හරහා එම ජාල ශක්තිමත් කිරීමට දැනට සිදුකර ඇති මුලපිරීම් කඩිනම් කිරීම අවශ්‍ය වේ. රාජ්‍ය මූල්‍ය තිරසාරත්වය සඳහා රජයේ වියදම් තාර්කිකකරණය කිරීම වැදගත් වන අතර, දිගු කාලීන ආර්ථික වර්ධනය තිරසාරව පවත්වා ගැනීමේ අරමුණින් යුතුව සෞඛ්‍ය සහ අධ්‍යාපනය සැමට සමානව ලබාදීම සහතික කිරීම සඳහා එවැනි අංශ වෙත කෙරෙන රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කළ යුතු වේ. තවද, පාලන දුර්වලතා සහ දූෂණ අවදානම් පිළිබඳ ගැටලු විසඳාලීම සඳහා හඳුනාගත් ක්‍රියාමාර්ග නිසි කලට ක්‍රියාවට නැංවීම, ආර්ථිකයේ මෙන්ම එහි ජනතාවගේ ප්‍රගමනය සඳහා සාර්ව ආර්ථික වශයෙන් තීරණාත්මක වේ.

### 3.2.3 මුදල් අංශයේ ඉදිරි දැක්ම

**පවතින දත්ත මගින් පිළිබිඹු වන හිතකර උද්ධමනය සහ උද්ධමන ඉදිරි දැක්මට අනුව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඉදිරි කාලය තුළ දී ලිහිල්ව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර එය ආර්ථික ක්‍රියාකාරකම් දිරිගැන්වීමට උපකාරී වනු ඇත.** මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග, දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව වැඩිදියුණු වීම සහ රජයේ සුරැකුම්පත් හා සම්බන්ධව පැවති අවදානම් අධිමිල අඩු වීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන් ම ණය පොලී අනුපාතික තවදුරටත් සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් මූල්‍ය පිරිවැය අඩු වීම හරහා ව්‍යාපාර සහ කුටුම්භ සඳහා අවශ්‍ය සහන සැලසෙනු ඇත. 2023 වසරේ ජූනි මාසයේ සිට බැංකු අංශය විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි දක්නට ලැබුණු ප්‍රසාරණය, ණය පොලී අනුපාතික සාමාන්‍යකරණය වීම සහ ව්‍යාපාරික අපේක්ෂා වැඩිදියුණු වීම මගින් සහාය ලබමින් අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම්හි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය සැලසෙනු ඇත. මේ අතර, අත්‍යවශ්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මෙන්ම ණය තිරසාරභාවය යළි ඇති කිරීම හරහා රජයේ මූල්‍යන අවශ්‍යතා අඩු වීම හේතුවෙන් රාජ්‍ය අංශයට බැංකු අංශයේ නිරාවරණය වීම පෙර වසරවලට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ඉදිරි කාලය තුළ දී බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් සහ ද්විපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් විදේශීය මූල්‍යන ලැබීමත් සමඟ ණය මූල්‍යකරණය සඳහා රජය දේශීය මූලාශ්‍ර මත අධික ලෙස රඳා පැවතීම අඩු වනු ඇති අතර, එමගින් ආර්ථිකයේ ඵලදායී අංශ සඳහා එම මූල්‍යන යොදා ගැනීමට හැකි වනු ඇත. බැංකු අංශය විසින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දෙන ණය මධ්‍යස්ථ ප්‍රසාරණයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන නමුත්, පිරිවැය පිළිබිඹු කරන මිල යාන්ත්‍රණ ක්‍රියාවට නැංවීම මධ්‍යයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර බැංකු මූල්‍යන මත රඳා පැවතීම අඩු වනු ඇත. එමෙන්ම, බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දෙන ශුද්ධ ණය ඉදිරියේ දී අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ඉදිරි කාලයේ දී මහ බැංකුව විසින් රජයට මූල්‍යන ලබා දීම සිදු නොවනු ඇත. අපේක්ෂිත විදේශ විනිමය ගලා ඒම සහ නිල සංචිත ගොඩනංවා ගැනීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම සමඟ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ඉදිරි කාලය තුළ දී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත දේශීය ණය ප්‍රසාරණය සහ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමත් සමඟ, පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2024 වසරේ දී සියයට 15.0ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, දේශීය ආර්ථිකයේ අපේක්ෂිත ප්‍රසාරණය සහ

මැදි කාලීන උද්ධමන ඉලක්කයට අනුකූලව පුළුල් මුදල් සැපයුම වාර්ෂිකව සියයට 10.0-11.0ක පමණ මධ්‍යස්ථ වර්ධනයක් මැදි කාලීනව වාර්තා කරනු ඇත.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඉදිරියේ දී ද දත්ත මත පදනම්ව, ඉදිරි දැක්මක් සහිතව අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.** ලැබෙන දත්තවලට අනුකූලව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග සඳහා කාලෝචිත ගැළපීම් සිදු කෙරෙනු ඇත. විනිවිදභාවය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව මහ බැංකුව සිය ප්‍රතිපත්ති, අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කරනු ලබන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හා එම ක්‍රියාමාර්ග ගැනීමට බලපෑ කරුණු පිළිබඳව අඛණ්ඩව සන්නිවේදනය කරනු ලබන අතර, එය මහජනතාවගේ අපේක්ෂා කළමනාකරණයට ඉවහල් වන අතර ම, සමස්ත මිල සහ සාර්ව ආර්ථික ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීමට දායක වනු ඇත. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳව මහජනතාව වඩාත් හොඳින් දැනුම්වත් කිරීමටත් එමගින් මහ බැංකුව විසින් ගනු ලබන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් ද්වි-වාර්ෂිකව මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කරනු ඇත.

**ආර්ථිකයට සහ එහි පාර්ශ්වකරුවන්ට දූරදර්ශී ප්‍රතිපත්තිවල ප්‍රතිලාභ අඛණ්ඩව ලබා දීම සහතික කිරීම සඳහා මහ බැංකුවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වැදගත් වේ.** කෙටි කාලයක් තුළ අත්පත් කරගත් සීඝ්‍ර නිර්-උද්ධමනය සහ අඩු පොලී අනුපාතික තත්ත්වය වෙත නැවත ළඟා වීම සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ස්වාධීන හා කාලෝචිත මුදල් ප්‍රතිපත්ති මැදිහත්වීම් හේතු විය. එබැවින්, එවැනි වැඩිදියුණු වූ මහ බැංකු ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම සහ මුදල් ප්‍රතිපත්තියට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙන් වන බලපෑම් වළක්වා ගැනීම ඉදිරි කාලයේ දී ආර්ථිකයේ සහ එහි පාර්ශ්වකරුවන්ගේ යහපත සඳහා හේතු වනු ඇත.

### 3.2.4 විදේශීය අංශයේ ඉදිරි දැක්ම

**2024 වසර සහ ඉන් ඉදිරියට විදේශීය අංශයේ ඉදිරි දැක්ම, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සාර්ථකව නිම කිරීම සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ දක්වා ඇති ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ඉදිරියට ගෙන යෑම මත රඳා පවතී.** ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා ඉවත් කිරීම සහ ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීය හවුල්කරුවන්ගේ විශ්වාසය තිරසාර ලෙස වැඩිදියුණු කිරීම සඳහා මෙම කරුණු ඉතා වැදගත් වනු ඇත. 2024 වසරේ අපනයන ආදායමේ මධ්‍යස්ථ වර්ධනයක් අපේක්ෂා කළ ද, ආනයන සීමා ලිහිල් කිරීම, වැඩිදියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම් සහ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම හේතුවෙන් මහජනතාවගේ සහ ව්‍යාපාරවල වියදම් කිරීමේ හැකියාව ඉහළ යෑම පිළිබිඹු කරමින් ආනයන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ දී වෙළඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආනයන වියදමේ අඛණ්ඩ වර්ධනයක් තිබියදීත් අපනයන ආදායමෙහි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම සහ ඉහළ යෑම හේතුවෙන්, වෙළඳ හිඟය මධ්‍ය කාලීනව කළමනාකරණය කරගත හැකි මට්ටම් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසරේ දී සහ ඉන් ඉදිරියට සේවා ගිණුමේ ඉහළ අතිරික්තයක් වාර්තා වීම සඳහා සංචාරක ඉපැයීම්වල පුරෝකථනය කරන ලද ඉහළ යෑම මෙන්ම අනෙකුත් සේවා අපනයනවල තරගකාරීත්වයේ අපේක්ෂිත වැඩිදියුණු වීම හේතු වනු ඇත. ගෝලීය ආර්ථිකය ක්‍රමානුකූලව සාමාන්‍යකරණය වීමත් සමඟ දියුණු වෙමින් පවතින සංචාරක කර්මාන්තයෙන් මෙන්ම මෙම අංශයේ සම්පූර්ණ විභවය අත්කර ගැනීම සඳහා වූ අඛණ්ඩ උපායමාර්ගික සැලසුම් තුළින් ශ්‍රී ලංකාව මධ්‍ය කාලීනව ප්‍රතිලාභ ලබනු ඇත. කෙසේ වෙතත්, සංචාරක ක්ෂේත්‍රයේ අපේක්ෂිත වර්ධනය ජාත්‍යන්තර ප්‍රමිතීන් හා තිරසාර සංචාරක ක්‍රියාමාර්ග සමඟ සමපාත විය යුතු අතර, ඇස්තමේන්තුගත ආදායම සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම තුළින් රටට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වේ. ප්‍රවාහන සේවා ක්‍රියාකාරකම් අපේක්ෂිත මට්ටමට යථා තත්ත්වයට පත්වීමත්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා උප අංශයේ ඉහළ වර්ධනයත් සමඟ සේවා ගිණුමේ අතිරික්තය මධ්‍ය කාලීනව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සහ ඉන් අනතුරුව පොලී ගෙවීම් අඩු වීමත් සමඟ 2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඛණ්ඩ පොලී සහ ලාභාංශ ගෙවීම් හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය මධ්‍ය කාලීනව පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසර සහ ඉන් ඉදිරියට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 වසරේ දී අතිරික්තයක් වාර්තා කළ ජංගම

3

## විශේෂ සටහන 7

# ශ්‍රී ලංකාවේ විදේශීය ජංගම ගිණුමෙහි ප්‍රවණතා වඩාත් තිරසාර කිරීම

ශ්‍රී ලංකාව 2023 වසරේ දී ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කළේය. මෙම අතිරික්තයට වෙළඳ භාණ්ඩ ආනයනයේ කැපී පෙනෙන අඩුවීම, සංචාරක ඉපැයීම්වල සැලකිය යුතු වැඩිවීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල යහපත් වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රධාන වශයෙන්, වෙළඳ භාණ්ඩ ගිණුමේ විශාල හිඟයන් හේතුවෙන් ශ්‍රී ලංකාව වසර ගණනාවක් පුරා අඛණ්ඩව විදේශීය ජංගම ගිණුමේ හිඟයන් අත්විඳිමින් සිටියේය. සේවා වෙළඳාම් ගිණුමේ සහ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්ත වාර්තා වුව ද, මෙම අතිරික්ත, වෙළඳ භාණ්ඩ ගිණුමේ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟයන්ගෙන් ජංගම ගිණුම වෙත වන බලපෑම සමනය කිරීමට ප්‍රමාණවත් නොවීය (රූප සටහන වි.ස. 7.1).

ඓතිහාසිකව, ගෝලීය අත්දැකීම් මඟින් පෙන්නුම් කරන්නේ, ණය පැහැර හැරීමකට තුඩු දෙන ගෙවුම් තුලන අර්බුදයක් වැනි සැලකිය යුතු ආර්ථික කම්පනයකින් පසු, විනිමය අනුපාතිකයේ සිදුවන ගැළපුම සහ අර්බුදය විසඳීමට ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස අර්බුදය ඇතිවූ වසරට පසු ආසන්නම වසරේදී ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති වන බවයි. මෙම පසුබිම තුළ, පෙර අත්දැකීම් පිළිඹිබු කරන්නේ, ආර්ථික වශයෙන් පීඩාකාරී කාලපරිච්ඡේදයකින් අනතුරුව මැදි හා දිගු කාලීනව ජංගම ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමට සමහර රටවල් සමත් වූ බවයි. ඒ අතරම, ජංගම ගිණුමේ හිඟයන් වාර්තා කිරීමේ පෙර පැවති ප්‍රවණතාවයට නැවත පත්වූ රටවල් ද ඇත (රූප සටහන වි.ස. 7.2). සාමාන්‍යයෙන්, දිගු කාලීනව එවැනි ජංගම ගිණුමේ අතිරික්තයන් පවත්වා ගැනීමට හැකි වූ රටවල්, පහළ මට්ටම්වල උද්ධමනය කළමනාකරණය කරමින්, අපනයන තරඟකාරිත්වයට සහාය වන පරිදි පූර්ව අර්බුද මට්ටමට සාපේක්ෂව ඉහළ මට්ටමක විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට සමත් විය. මෙම අතිරික්ත පවත්වා ගැනීම සඳහා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ක්‍රමයෙන් වේගවත් කිරීම සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම (එනම් වර්ධනය වූ ප්‍රාථමික ශේෂය සහ අඩු අයවැය හිඟය) ඉලක්ක කරගත් ප්‍රතිපත්ති සහාය විය. මෙම පසුබිම තුළ, ආර්ථික කම්පන වලට පසුව ඇතිවන ජංගම ගිණුමේ අතිරික්තයන්හි තිරසාරභාවයට බලපාන සාධක සහ අඛණ්ඩ ජංගම ගිණුමේ අතිරික්තයන් හෝ හිඟයන් පවත්වාගෙන යෑමේ ආර්ථික බලපෑම් සලකා බැලීම වැදගත් වේ.


ජංගම ගිණුමේ ශේෂය රටේ ඉතුරුම්-ආයෝජන පරතරය පිළිබිඹු කරයි. ජංගම ගිණුමේ අතිරික්තයක් ධන ඉතුරුම්-ආයෝජන පරතරයක් පිළිබිඹු කරන අතර ජංගම ගිණුමේ හිඟයක් සෘණ ඉතුරුම්-ආයෝජන පරතරයක් පිළිබිඹු කරයි. ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ අතිරික්තය පිළිබිඹු කරමින්, ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2023 වසරේ දී ධන අගයක් වාර්තා කරමින් ඉහළ ගියේය. මෙම අතිරික්තය, දේශීය ආයෝජනය අඩුවීමේ සහ ලෝකයේ සෙසු රටවලින් ලැබුණු ශුද්ධ ජංගම සංක්‍රාම කැපී පෙනෙන ලෙස වැඩිවීම හේතුවෙන් ජාතික ඉතුරුම් වැඩිවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

### විවිධ රටවල අත්දැකීම්

1997-1998 වසරවල ඇති වූ නැගෙනහිර ආසියාතික මූල්‍ය අර්බුදය අතරතුර, තායිලන්තය, දකුණු කොරියාව, ඉන්දුනීසියාව, පිලිපීනය සහ මැලේසියාව වැනි රටවල් ගෙවුම් තුලන අර්බුදයන්ට මුහුණ දුන් අතර, එය එම රටවල දේශීය මුදල් තියුණු ලෙස අවප්‍රමාණය වීම ඇතුළු සාර්ව ආර්ථික කම්පන රාශියකට හේතු විය. ඊට

**වි.ස. 7.1 රූප සටහන**

**ජංගම ගිණුමේ සංයුතිය: 1970-2023**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිචාර වශයෙන්, මෙම රටවල් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වාගෙන යෑම, මූල්‍ය අංශය සඳහා නියාමන රාමුව ශක්තිමත් කිරීම, උද්ධමන ඉලක්කකරණ රාමු වෙත යොමු වීම, අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්ති වෙත යොමු වීමෙන් විදේශීය ස්වාරක්ෂක ශක්තිමත් කිරීම ඇතුළු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීය (Wellisz 2022). එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශාල ජංගම ගිණුමේ අතිරික්තයන් සමඟින් V-හැඩැති, ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවණතා දැකීමට මෙම ආර්ථිකයන්ට හැකි විය. කෙසේ වෙතත්, මෙම අතිරික්තයන් මැදි කාලීන සිට දිගු කාලීනව පවත්වා ගැනීමට හැකි වූයේ සමහර රටවලට පමණි. අපනයන මත පදනම් වූ වර්ධන උපාය මාර්ග, අපනයන වෙළඳපොළවල විවිධාංගීකරණය සහ මෙම ආර්ථිකයන් විසින් ක්‍රියාත්මක කරන ලද විචක්ෂණශීලී සාර්ව ආර්ථික කළමනාකරණය, මෙම රටවල් විසින් අත්කර ගන්නා ලද අඛණ්ඩ ජංගම ගිණුමේ අතිරික්තයන් සඳහා හේතු විය. උදාහරණයක් වශයෙන්, දකුණු කොරියාවේ අපනයනාභිමුඛ වර්ධන ප්‍රතිපත්ති සහ විවිධාංගීකරණය වූ අපනයන වෙළඳපොළ, අර්බුදයෙන් පසු අවදානම්වලට මුහුණ දීමට එම ආර්ථිකයට ඇති හැකියාවට දායක වූ අතර එමඟින් ජංගම ගිණුමේ අතිරික්තයන් පවත්වා ගැනීමට හැකි විය. තායිලන්තය පශ්චාත් අර්බුද තත්ත්වයේ දී සිය මුදල් ඒකකය පාවීමට ඉඩ හැරීමෙන් ස්ථාවර විනිමය අනුපාතික ප්‍රතිපත්තියක සිට ස්වාධීනව පාවෙන විනිමය අනුපාතික ප්‍රතිපත්තියකට යොමු වූ අතර එමඟින් එරට විදේශ ශේෂයන් ගැළපීමට පහසුකම් සලසන ලදී (Sharma 2003). අර්බුදයෙන් පසුකාලීනව ජංගම ගිණුමේ අතිරික්තයක් අත්පත් කර ගැනීමෙන් අනතුරුව, විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය සහ සේවා අපනයන ප්‍රවර්ධනය කිරීම ඇතුළු සුදුසු ප්‍රතිපත්තිමය

**වි.ස. 7.2**
**රූප සටහන**

**තෝරාගත් රටවල ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලාශ්‍ර: ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් දශක ගණනාවක් පුරා ජංගම ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමට තායිලන්තයට හැකි විය.

ඉන්දුනීසියාවට පශ්චාත් අර්බුද සමයේ ජංගම ගිණුමේ අතිරික්තයන් දශකයක් පුරා පවත්වා ගැනීමට හැකි වුවද, ඉන්දුනීසියාවේ භාණ්ඩ අපනයනයට අහිතකර ලෙස බලපෑම් ඇති කරමින් භාණ්ඩ මිලෙහි තියුණු පහත වැටීම හේතුවෙන් 2012 වසරේ සිට එරට ජංගම ගිණුමේ හිඟයන් වාර්තා විය (IMF 2016). ලෝකයේ අනෙකුත් රටවල් සැළකීමේදී, 2020 වසරේ දී සැම්බියාව විදේශීය ණය අර්බුදයකට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තියුණු ලෙස විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම සහ ගෙවුම් තුලන අභියෝග ඇති විය. අර්බුදයෙන් පසු තාවකාලිකව ජංගම ගිණුමේ අතිරික්තයන් වාර්තා කිරීමට සැම්බියාවට හැකි වුවද, තඹ අපනයනය සැලකිය යුතු ලෙස අඩුවීම සහ ආනයන ඉහළ මට්ටමකට නැවත පත්වීම හේතුවෙන් ජංගම ගිණුම 2023 වසරෙහි හිඟයක් වාර්තා කර ඇති බවට ඇස්තමේන්තු කර ඇත (IMF 2023). ආර්ජන්ටිනාව, මෙක්සිකෝව සහ ඉක්වදෝරය යන රටවල්වල ජංගම ගිණුමේ හිඟයන් ණය අර්බුදවලින් පසුව සිදු කළ ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව අතිරික්තයන් බවට පත් වූ අවස්ථා වලදී ද මෙවැනිම අත්දැකීම් නිරීක්ෂණය කළ හැකිය. කෙසේ වෙතත්, මෙම අතිරික්තයන් දිගු කාලීනව නොපැවතිණි. එබැවින්, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, විවිධාංගීකරණ උපාය මාර්ග, විචක්ෂණශීලී සාර්ව ආර්ථික කළමනාකරණය මෙන්ම බාහිර අවදානම්වලට ඔරොත්තු දීමට රටට ඇති හැකියාව ඇතුළු සාධක රාශියක් මත පදනම්ව, අර්බුදයෙන් පසු ජංගම ගිණුමේ අතිරික්තයන් අඛණ්ඩව පවත්වා ගැනීම සම්බන්ධයෙන් රටවල් වලට මිශ්‍ර අත්දැකීම් ඇති බව පැහැදිලිය.

**ජංගම ගිණුමේ අතිරික්තයන් සැමවිටම හිතකර ද?**

ජංගම ගිණුමේ අතිරික්තයක් සංචිත ගොඩ නැගීමේ අරමුණ සඳහා හිතකර වනු ඇතැයි සැලකිය හැකිය. කෙසේ වෙතත්, ජංගම ගිණුමේ අඛණ්ඩ අතිරික්තයක් දේශීය ව්‍යවහාර මුදල සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය වීමට හේතු විය හැකි අතර, වෙළඳ තරඟකාරිත්වය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ව්‍යවහාර මුදල අනිසි ලෙස අතිප්‍රමාණය වීම වැළැක්වීම පිණිස දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වීමට මහ බැංකුවට අත්‍යවශ්‍ය වනු ඇත. කෙසේ වෙතත්, යම් රටවල් දිගු කලක් තිස්සේ එවැනි භාවිතයන් අනුගමනය කිරීම, එවැනි රටවල් ඔවුන්ගේ වෙළඳ අතිරික්තයන් ඉහළ නැංවීම සඳහා අපනයන සහනාධාරයකට සමානව තම ව්‍යවහාර මුදල් උඟන වටිනාකමකින් යුක්තව (undervalued) පවත්වාගෙන යන "කෘත්‍රිමව ව්‍යවහාර මුදලේ අගය පාලනය කරන්නන් ("currency manipulators")" ලෙස හැඳින්වීමට හේතු විය හැකිය. තවද, අඩු දේශීය ඉල්ලුම හෝ සීමාකාරී වෙළඳ ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන සීමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජංගම ගිණුමේ අතිරික්තය අත්කර ගන්නේ නම්, එය අනාගත ආර්ථික වර්ධනයට බලපාන දේශීය පරිභෝජනයට සහ ආයෝජනයට බාධාවක් විය හැකිය. ආර්ථික අර්බුදයකින් පසු තිරසාර ජංගම ගිණුමේ ශේෂයක් සාක්ෂාත් කර ගැනීම සඳහා, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා බාධා වන ආකාරයේ ගැළපීම් සිදු නොවන බව සහතික කරන සුදුසු ප්‍රතිපත්ති සංකලනයක් අනුගමනය කිරීම අවශ්‍ය වේ. මෙහිදී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්ලුම් සහ සැපයුම් තත්ත්ව මත විනිමය අනුපාතිකය තීරණය කෙරෙන නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, අඩු සහ ස්ථාවර උද්ධමනයක් පවත්වා ගැනීම සහ අපනයන ප්‍රවර්ධනය සහ විවිධාංගීකරණය කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

**සමාජීය**

ජංගම ගිණුම් ශේෂයේ ප්‍රශස්ත මට්ටමක් පිළිබඳව හෝ රටක් අඛණ්ඩව ජංගම ගිණුමේ හිඟයක් හෝ අතිරික්තයක් පවත්වා ගත යුතුද යන්න පිළිබඳව විද්වතුන් හෝ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර එකඟතාවයක් නොමැත (Ghosh and Ramakrishnan 2006; Devadas and Loayza 2018; World Economic Forum 2023). ජංගම ගිණුමේ හිඟයක් හෝ අතිරික්තයක් පමණක් ආර්ථිකයකට හිතකර හෝ අහිතකර ලෙස අර්ථ දැක්විය නොහැක. විදේශීය අංශයේ හිඟයන් නිසා මුදල් හෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ක්ෂණික වෙනසක් අවශ්‍ය නොවන්නේ නම් හෝ, රටේ ජාත්‍යන්තර සංචිත මට්ටම අඩු වීමකට තුඩු දෙන හෝ විදේශීය ණය සේවාකරණය කිරීමේ හැකියාව කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකි ආකාරයේ ගෙවුම් තුලන අර්බුදයක් ඇති නොකරන්නේ නම් ජංගම ගිණුමක් තිරසාර යැයි සැලකේ. ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීම ඓතිහාසික වශයෙන් අඛණ්ඩ ජංගම ගිණුමේ හිඟයක් වාර්තා කළ ආර්ථිකයකට හිතකර ලෙස අර්ථකථනය කළ ද, අඛණ්ඩ ජංගම ගිණුමේ අතිරික්තයක් උඟන වටිනාකමකින් යුත් ව්‍යවහාර මුදල් ඒකකයක් පිළිබිඹු කළ හැකි අතර, එම නිසා වෙළඳ තරඟකාරිත්වය නැතිවීමට තුඩු දෙන පරිදි රටේ දේශීය ව්‍යවහාර මුදල පසු කාලීනව අතිප්‍රමාණය කිරීම අත්‍යවශ්‍ය වේ. අවසාන වශයෙන්, ස්ථාවර විනිමය අනුපාතිකයක්, අඩු උද්ධමන මට්ටමක් සහ ක්‍රමානුකූල ආර්ථික වර්ධන මාවතක් ඇති කරන අපනයන ප්‍රවර්ධනය සහ විවිධාංගීකරණය සමඟ සුදුසු ප්‍රතිපත්ති සංකලනයක් අනුගමනය කළ හැකි නම්, මැදි සහ දිගු කාලීනව තිරසාර ජංගම ගිණුමේ ශේෂයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

---

මූලාශ්‍ර


1. Devadas S and Loayza N (2018) *When is a Current Account Deficit Bad?,* World Bank Research and Policy Briefs No. 130415, World Bank.
2. Ghosh A and Ramakrishnan U (2006) *Do Current Account Deficits Matter?,* Finance and Development, 43:4, International Monetary Fund (IMF).
3. IMF (2023) *Zambia: Second Review Under the Arrangement Under the Extended Credit Facility - Staff Report,* IMF.
4. IMF (2016) *2015 Article IV Consultation -Press Release; Staff Report; and Statement by the Executive Director for Indonesia,* IMF Country Report No. 16/81, IMF.
5. Sharma S (2003) *The Asian Financial Crisis: Crisis, Reform and Recovery,* Manchester University Press.
6. Wellisz C (2022) *From the Asian Financial Crisis to Today,* Finance and Development, IMF.
7. World Economic Forum (2023) *What is a country's current account balance, and is a deficit good or bad for its economy?,* World Economic Forum.

ගිණුම 2024 වසරේ දී ද අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කරන නමුත් එය පෙර වසරට වඩා අඩු මට්ටමක පවතිනු ඇත. මධ්‍ය කාලීනව, ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීමෙන් සහ විදේශ වෙළඳාමෙහි යෙදිය හැකි අංශවලට හිතකර වූ ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් පසු ජංගම ගිණුමේ හිඟය තිරසාර මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. ඕනෑම ඉහළ වෙළඳ හෝ ජංගම ගිණුමේ අසමතුලිතතා පවතින පසුබිමක් තුළ විනිමය අනුපාතිකය ස්ථායීකාරකයක් ලෙස ක්‍රියා කරනු ඇත.

**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් ඇති වුණු ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂාවන්ගෙන් මූල්‍ය ගිණුම වෙත වන ලැබීම් සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** එසේම ජා.මූ. අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වැනි බහුපාර්ශ්වික ආයතන වෙතින් ලැබෙන විදේශීය මූල්‍යන සහාය සහ ද්විපාර්ශ්වික මූල්‍යන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වන ලැබීම් වැඩි වනු ඇති අතර, එමගින් 2024 වසරේ සහ ඉන් ඔබ්බට දළ නිල සංචිත ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, 2024 වසර තුළ මූල්‍යකරණය සඳහා ලබා දී ඇති ස්ථිර කැපවීම් සහ ඉන්පසු ඉදිරි කාලසීමාව තුළ ද මූල්‍යකරණය අඛණ්ඩව සිදුවන බවට ඇති දැඩි අපේක්ෂාවන් සමඟ, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙන් සහාය දක්වන වැඩසටහන සම්පූර්ණයෙන් ම මූල්‍යකරණය කර ඇත. ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ නව මූල්‍යකරණය හරහා 2027 වසර දක්වා වැඩසටහනේ ඇති මූල්‍ය පරතරයන් සම්පූර්ණයෙන් සපුරාලීමට අපේක්ෂා කෙරේ.

**එපමණක් නොව, විශේෂයෙන් ම කොළඹ වරාය නගරයට සහ හම්බන්තොට කාර්මික කලාපයට ණය නොවන විදේශ ලැබීම් ආකාරයෙන් මූල්‍ය ගිණුමට ලැබෙන විදේශීය සෘජු ආයෝජන මධ්‍ය කාලීනව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ආයෝජන ප්‍රවර්ධනයට අදාළ වන ආයතනික විධිවිධාන සඳහා යෝජිත වැඩිදියුණු කිරීම් සහ ව්‍යාපාර කිරීමේ තත්ත්වයන් පිළිබඳ දීර්ඝ කාලීන ගැටලු විසඳීමට දරන ප්‍රයත්න හේතුවෙන් ශ්‍රී ලංකාව පිළිබඳව ආයෝජකයින් අතර පවතින සෘණාත්මක අවබෝධය සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහත වර්ධනයන් හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළේ සහ කොළඹ කොටස් වෙළඳපොළේ විදේශ ආයෝජන මධ්‍ය කාලීනව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය ශුද්ධ මිලදී ගැනීම් තුළින් සංචිත ගොඩනඟා ගැනීමට සහ වෙළඳපොළ තත්ත්වයන්ට අනුව තීරණය වන හා නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීමට මහ බැංකුව කැපවී සිටින අතර, එම ක්‍රියාමාර්ග බාහිර කම්පනවලට එරෙහිව ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එපමණක් නොව, මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත කරන ඕනෑම මැදිහත්වීමක්, සංචිත ගොඩ නැගීමේ සහ විනිමය අනුපාතිකයේ යම් කෙටි කාලීන දැඩි විචලන අවම කිරීමේ අරමුණු සඳහා පමණක් සීමා වනු ඇත.

### 3.2.5 මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම

**මෑත වසරවල අභියෝගාත්මක සාර්ව මූල්‍ය තත්ත්වවලට මුහුණ දුන් මූල්‍ය අංශය, 2023 වසරේ දී යථා තත්ත්වයට පත් වීමේ සහ ස්ථාවර වීමේ සලකුණු පෙන්නුම් කළ අතර, ඉදිරි කාලය තුළ සාර්ව ආර්ථික අවදානම් පහව යාමත් සමඟ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මූල්‍ය ක්ෂේත්‍රයේ මතු වූ දුර්වලතා සහ අවිනිශ්චිතතා හේතුවෙන් ආර්ථිකයේ සහ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සහ ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් ගැනීමට සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීමට මහ බැංකුවට සිදු විය. පහළ යන පොළී අනුපාතයන් තුළින් පෙන්නුම් කරන මුදල් තත්ත්වයන් ලිහිල් කිරීම සහ පොළී අනුපාතවල පවතින අවිනිශ්චිතතා පහව යාමත් සමඟ, පුද්ගලික අංශයට ලබා දෙන ණය 2023 වසරේ දී වාර්තා කළ අඩුවීමට සාපේක්ෂව 2024 වසරේ දී නැවත වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවදානම් රහිත පොළී අනුපාත, ණය පොළී අනුපාතයට වඩා ඉහළ අගයක පැවතීම හේතුවෙන් මතු වූ විෂමතාව නිවැරදි කරමින් පසුගිය සමයේ යටිකුරුව පැවති රජයේ සුරැකුම්පත්වල ඵලදා වක්‍රය යථා තත්ත්වයට පත් වීමත් සමඟ බැංකු විසින් සිය වත්කම් වෙන් කිරීම් යළි තුලනය කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ස්වෛරීත්ව ණය වෙනුවට ස්වෛරීත්ව සුරැකුම්පත් හුවමාරු කර ගැනීමක් සිදු විය හැකි රජයේ විදේශ විනිමය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ, ස්වෛරීත්ව ණය සඳහා වූ නැඹුරුවෙහි යම් තරමක නිවැරදි වීමක් සිදු වුවද, ඒ සමඟ ණය කළඹෙහි සිදුවන හැකිලීම හේතුවෙන් මූල්‍ය අතරමැදිකරණයෙහි එක් වරම පහත වැටීමක් සිදු විය හැක. එමෙන්ම, ස්වෛරී-බැංකු සම්බන්ධය තුළ පැවති ප්‍රධාන දුර්වලතාවලට පිළියම් යෙදීම

සඳහා ශිෂ්ට ප්‍රයෝග සහ රෙගුලාසි හරහා සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතී. ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම, ණය ගැනුම්කරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව මත වූ පීඩනය අඩු වීම සහ වෙළඳපොළ පොලී අනුපාතිකයන් නිවැරදි වීම පිළිබිඹු කරමින් පුද්ගලික අංශයට ණය ලබා දීම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත ණය වර්ධනය හා වෙළඳාම සම්බන්ධයෙන් පවතින සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු වීම තුළින් බැංකු අංශයේ ණය ගුණාත්මකභාවය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ස්වෛරී ශුද්ධ විදේශ විනිමය ණය සහ ද්‍රවශීල නොවන විදේශ විනිමය ස්වෛරීත්ව උපකරණ, ද්‍රවශීල ස්වෛරීත්ව උපකරණ සමඟ හුවමාරු වීමට ඉඩ ඇති බැවින් එමගින් බැංකුවල ද්‍රවශීලතා මට්ටම් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, පූර්ව-ආරක්ෂිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සහ චර්යාත්මක ප්‍රතිචාර හරහා අවම සාර්ව මූල්‍ය බලපෑමක් සහිතව සුමට විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මෙහෙයුමක් දියත් කිරීමට ද රජය උත්සාහ කරයි. බැංකු සිය ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ඉහළ පෙළේ දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පුළුල් ප්‍රාග්ධනීකරණ සැලසුම් සකස් කරමින් සිටින අතර, එමගින් සුමට ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියන් සඳහා අනුබල දෙන අතරම ආර්ථිකයට එල්ල වන අහිතකර බලපෑම් වළක්වා ගැනීමට ද අපේක්ෂා කෙරේ. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශයේ ණය වර්ධනය, සාම්ප්‍රදායික ණය නිෂ්පාදන සඳහා පවතින සීමිත වර්ධන අවස්ථා මධ්‍යයේ අඛණ්ඩව විවිධාංගීකරණය වෙමින් බැංකු අංශයේ ණය වර්ධන ප්‍රවණතාවට අනුරූප වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. සාර්ව මූල්‍ය තත්ත්වයන් සහ ණය ලබා දීම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශයේ ණය අවදානම ලිහිල් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම සඳහා ව්‍යුහාත්මක, නෛතික සහ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ සහ නවෝත්පාදන මාලාවක් අඛණ්ඩව ක්‍රියාවට නංවනු ඇත.** බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශය සතු ඔරොත්තු දීමේ හැකියාව සහ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් ඒකාබද්ධ කිරීමේ ප්‍රයත්න 2024 වසරේ දී ද අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂා කෙරේ. අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම ගෙවීම් යෙදුම් මගින් පහසුකම් සපයන ක්ෂණික ගෙවීම් පද්ධතිය හරහා සිදුවන ගනුදෙනු වර්ධනය වීම හේතුවෙන් ගෙවීම් සහ පියවීම් සම්බන්ධ ඉදිරි දැක්ම තුළ ඩිජිටල් ගනුදෙනුවල ශක්තිමත් වර්ධනයක් අපේක්ෂා කෙරේ. පාරිභෝගිකයින් සහ වෙළඳුන් අතර ඩිජිටල් ගෙවීම් භාවිතය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් ගනුදෙනු ක්‍රම පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් දියත් කරනු ඇත. රට තුළ ආරක්ෂිත, කාර්යක්ෂම සහ විශ්වසනීය ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණයන් ව්‍යාප්ත කිරීම සඳහා, මහ බැංකුව මූල්‍ය ආයතන සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරනු ඇත. මූල්‍ය අංශය සතු ඔරොත්තු දීමේ හැකියාව පවත්වාගෙන යාමේ අරමුණින්, පද්ධතිමය අසමතුලිතතාවයන් පාලනය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි වන අවස්ථාවන්වල දී සහ අහිතකර ආර්ථික හා මූල්‍ය තත්ත්වයන් යටතේ වුව ද මූල්‍ය සේවා සුමටව සැපයීමට සහාය වීම සඳහා, රටේ සාර්ව විචක්ෂණශීලී අධිකාරිය ලෙස මහ බැංකුව විසින් සාර්ව විචක්ෂණශීලී මෙවලම් ක්‍රියාත්මක කරනු ඇත.

**මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම සඳහා මනා අනුපිළිවෙලක් සහිත ස්ථාවර ප්‍රතිපත්ති කාලීනව ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.** ජා.මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම හරහා අපේක්ෂා කරන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ අඛණ්ඩ ප්‍රගතිය, මූල්‍ය අංශයේ අඩුපාඩු හා දුර්වලතා හඳුනා ගැනීමට සහ පද්ධතිය තුළ ඔරොත්තු දීමේ හැකියාව සහ විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙවැනි උත්සාහයන් මධ්‍යයේ වුව ද දේශපාලන අවිනිශ්චිතතා ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්ට බරපතල ලෙස බලපෑ හැකි අතර, ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයෙහි යම්කිසි අපගමනය වීමක් සිදු වුවහොත්, එය ආර්ථිකයට සහ මූල්‍ය පද්ධතියට බොහෝ දුරට ආපසු හැරවිය නොහැකි හානි සිදු කළ හැකිය.

### 3.2.6 රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම

**විචක්ෂණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ දිගු කලක සිට සිදු කළ යුතුව පවතින ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ උදෙසා රජයේ කැපවීම පිළිබිඹු කරමින්, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමට අනුකූලව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම සහ ණය තිරසාරබව යළි ඇති කිරීම සඳහා සිය ප්‍රයත්න අඛණ්ඩව පවත්වා ගෙන යෑමට රජය විසින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2024 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දක්වා ඇති සංශෝධිත මැදි කාලීන සාර්ව ආර්ථික රාජ්‍ය මූල්‍ය රාමුවට අනුව, 2027 වසර වන විට ද.දේ.නි.යෙන් සියයට 15 පසු කර යමින්, ඉහළ අභිලාෂී ආදායම් ඉලක්කයක් සපුරා

ගැනීම සඳහා රජය අරමුණු කරයි. මෙයට සමගාමීව, 2025 සහ ඉන් ඉදිරියට ද.දේ.නි.යෙන් අවම වශයෙන් සියයට 2.3ක ප්‍රාථමික අතිරික්තයක් අත්කර ගැනීමට ප්‍රයත්න දරන අතර, 2026 සිට සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යෙන් සියයට 5කට අඩු අගයකට සීමා කිරීමට පියවර ගනිමින් සිටියි. මෙම ස්ථාවරය අනුව යමින්, රජය විසින් 2022 මැද භාගයේ සිට ආදායම් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබූ අතර, බදු ආදායම් රැස් කිරීම සැලකිය යුතු ලෙස ඉහළ යෑමට තුඩු දෙමින්, මෙම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන්හි බලපෑම 2023 වසරේ සිට රාජ්‍ය මූල්‍ය තුළ නිරූපණය වෙමින් පවතියි. තවද, සැලසුම් කර ඇති පරිදි ක්‍රියාත්මක කළහොත් බදු එකතු කිරීම තවදුරටත් වර්ධනය කරමින්, 2025 දී දේපල බද්දක් මෙන්ම තෑගි සහ උරුම බද්දක් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම තුළින් ද ඉදිරි කාලයේ දී ආදායම් ඉහළ නැංවීමට ද අපේක්ෂිතය. පුද්ගල ආදායම් බදු සඳහා පුද්ගලයින් අනිවාර්යයෙන් ලියාපදිංචි කිරීම, විශාල බදු ගෙවන්නන්ගේ සහ ඉහළ වත්කම් සහිත බදු ගෙවන්නන්ගේ ඒකක ශක්තිමත් කිරීම, ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) වැඩිදියුණු කිරීම සහ සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අහෝසි කිරීම මගින් ආදායම් එකතු කිරීමේ ආයතනවල ආදායම් පරිපාලන කටයුතු වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. මූල්‍ය ආයතන, කොළඹ කොටස් වෙළෙඳපොළ, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා රජය විසින් මෑතකාලීනව දරන ලද ප්‍රයත්නය, රාජ්‍ය ආයතන සහ ආදායම් රැස් කිරීමේ අධිකාරිය සමඟ අන්තර් සම්බන්ධතා ගොඩනැගීම මගින් බදු පරිපාලනය වැඩිදියුණු කිරීම හා බදු පැහැර හැරීම අවම කිරීම පිණිස ගනු ලැබූ අගය කළ යුතු පියවරකි. කෙසේ වෙතත්, ඉදිරි මැතිවරණයට පෙර හෝ පසුව, අපහසුවෙන් අත්පත් කර ගත් රාජ්‍ය මූල්‍ය අංශයේ ජයග්‍රහණ ආපසු හැරවීම ජා.මූ. අරමුදල් වැඩසටහන අඩාල කර ආර්ථිකය අස්ථාවර කරනු ඇති අතර, ඉන් 2022 වසරේ දී නිරීක්ෂණය වූ සමාජ-ආර්ථික හා දේශපාලන අර්බුදයට වඩා දරුණු අර්බුදයක් ඇති වීමට හේතු වනු ඇත. මීට අමතරව, මැදි කාලීනව රජයේ වියදම් ද.දේ.නි.යෙන් සියයට 20ක් තුළ කළමනාකරණය කිරීමට රජය අරමුණු කරයි. මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවෙහි දක්වා ඇති පරිදි රාජ්‍ය වියදම් විධිමත් කරන අතර ම, සෞඛ්‍ය, අධ්‍යාපනය, පොදු ප්‍රවාහනය සහ සමාජ ආරක්ෂණය වැනි ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා සුදුසු ප්‍රතිපාදන ලබා දීම, සැමට සාධාරණව සහ කඩිනම්ව ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ රාජ්‍ය ප්‍රසම්පාදනයට සම්බන්ධ නව නීති ක්‍රියාත්මක කිරීම මගින් රාජ්‍ය මූල්‍ය රීති සකස් කිරීම, විනිවිදභාවය වැඩිදියුණු කිරීම, අධීක්ෂණ යාන්ත්‍රණයන් ඇති කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දැඩි විනයක් පවත්වා ගෙන යෑම හරහා රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, ප්‍රාග්ධන වියදම් පිරිවැය පිරිමැසුම්දායක ආකාරයෙන් සංවර්ධන ප්‍රමුඛතාවලට අනුකූලව පෙළගැස්වීම සඳහා රජය ප්‍රාග්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දැඩි ව්‍යාපෘති ඇගයීමක් සහ ප්‍රමුඛතා ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරමින් සිටියි. ඒ අතර ම, නව ණය කළමනාකරණ නීතියක් ක්‍රියාත්මක කිරීමත් සමඟ රාජ්‍ය ණය කළමනාකරණය ඒ සඳහා ම වෙන් වූ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයකට පැවරීමට අපේක්ෂා කෙරේ.

**මේ අතර, ජා.මූ. අරමුදලේ ස්වෛරීත්ව අවදානම් සහ ණය තිරසාර රාමුව යටතේ පිහිටුවා ඇති ප්‍රමාණාත්මක ඉලක්ක මගින් මෙහෙයවනු ලබන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙන අතර, රජය සතු වාණිජ ව්‍යවසායයන්හි දිගු කලක සිට පවතින ප්‍රතිසංස්කරණමය ගැටලු විසඳීමට සහ අනෙකුත් දූෂණ හා විනිවිදභාවය සම්බන්ධ අවදානම්වලට විසඳුම් සෙවීමට ඒ සමඟ ප්‍රයත්න දරනු ලැබේ.** මේ සම්බන්ධයෙන්, විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නයන්ට අනුපූරක ලෙසත් ණය තිරසාර ඉලක්ක සපුරාලීම සඳහාත් 2023 වසරේ දී රජය විසින් දේශීය ණය ප්‍රශස්තකරණ මෙහෙයුමේ ප්‍රධාන අංග සම්පූර්ණ කරන ලදී. විදේශ ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම සහ ජා.මූ.අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ රජය ඉටු කිරීමට කැපවී ඇති රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාවතට අනුගත වීම මගින් මැදි කාලීනව ණය ගමන්පථය තිරසාර මට්ටමකට ගෙන ඒමට අපේක්ෂා කෙරේ. මේ අතර, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ අලාභ රජයේ ණය බවට පරිවර්තනය වීමේ හැකියාව සීමා කරමින් පිරිවැය නිරූපණය කරන මිලකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම, රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් දිගුකාලීනව මුහුණ දුන් මූල්‍ය ගැටලු මර්දනය කිරීමට උපකාරී වේ. මෙවැනි ප්‍රතිපත්ති ඇතුළු දැනට ක්‍රියාත්මක රජය සතු වාණිජ ව්‍යාපාරයන්හි

3

ප්‍රතිසංස්කරණ සමඟ උපාය මාර්ගික නොවන රජය සතු වාණිජ ව්‍යාපාරවල ආයෝජනවලින් ඉවත් වීම වැනි ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ඔස්සේ එම ආයතන මගින් අයවැය මත ඇති කෙරෙන පීඩනය අඩු කිරීමට අපේක්ෂා කෙරේ. තවද, ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු පිළිබඳ විස්තර ප්‍රසිද්ධ කිරීම, බදු නිදහස් කිරීම් පිළිබඳ ඇතැම් තොරතුරු පොදු අවකාශය (public domain) තුළ හෙළිදරව් කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් පත් කිරීම යනාදී ක්‍රියාමාර්ග විනිවිදභාවය ඉහළ නැංවීම, වගවීම වැඩි කිරීම සහ අල්ලස් ගැටලුවලට පිළියම් යෙදීම සඳහා ගෙන ඇති ප්‍රශංසනීය පියවර වේ. ජා.මූ. අරමුදල විසින් මෑතක දී සිදු කරන ලද පාලන නිර්ණ තක්සේරුවේ (Governance Diagnostic Assessment) නිර්දේශයන්ගෙන් සකස් කෙරුණු රජයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම මගින් විනිවිදභාවය ඉහළ නංවන අතර, එම නිර්දේශ සම්බන්ධයෙන් ඇති කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දෙයි. මෙම නිර්දේශ සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම මගින් ශ්‍රී ලංකාව අසාර්ථක රාජ්‍යයක් බවට පත්වීම වැළැක්වීම සඳහා අත්‍යවශ්‍ය, යහපාලනය පිළිබඳ රාජ්‍ය අංශයේ සහ මහජනතාවගේ විශ්වාසය ශක්තිමත් කරනු ඇත. දේශීය හා විදේශීය පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව රජය විසින් ගනු ලබන ඒකාබද්ධ ප්‍රයත්න මගින් මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය අංශයේ තිරසාර බව යථා තත්ත්වයට පත් කිරීමට හේතු වන රාජ්‍ය මූල්‍ය අංශයේ අභියෝගවලට පිළියම් සෙවීමට සහ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

# සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය[1]


| | සංඛ්‍යා සටහන් අංක |
|---|---|
| **1. මූර්ත අංශය** | 1 - 5 |
| **2. විදේශීය අංශය** | 6 - 14 |
| **3. රාජ්‍ය මූල්‍ය අංශය** | 15 - 16 |
| **4. මුදල් සහ මූල්‍ය අංශය** | 17 - 19 |


[1] සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයේ මාර්ගගත සංස්කරණය Excel පැතුරුම්පත් ආකෘතියෙන් ලබා ගත හැකි අතර එහි අමතර දත්ත අන්තර්ගත වේ.

යොමුව - ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2023 → සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

# බර සහ මිණුම්

## පරිවර්තන සාධක

### බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක

| | | |
|---|---|---|
| අක්කර 1 | = | හෙක්ටයාර (හෙ.) 0.405 |
| රාත්තල් 1 | = | කිලෝග්‍රෑම් (කි.ග්‍රෑ.) 0.454 |
| දිගු ටොන් 1 (රා. 2,240) | = | මෙට්‍රික් ටොන් (මෙ.ටො.) 1.016 |
| හොණ්ඩර 1 | = | කිලෝග්‍රෑම් 50.802 |
| සැතපුම් 1 | = | කිලෝමීටර් (කි.මී.) 1.609 |
| දිගු ටොන් සැතපුම් 1 | = | මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1.635 |
| අක්කරයකට රාත්තල් 1 | = | හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1.121 |
| අක්කරයකට හොණ්ඩර 1 | = | හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 125.535 |
| එ.රා. පයින්ට් 1 | = | ලීටර් 0.568 |
| එ.රා. ගැලුම් 1 | = | ලීටර් 4.55 |

### මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක

| | | |
|---|---|---|
| හෙක්ටයාර 1 | = | අක්කර 2.471 |
| කිලෝග්‍රෑම් 1 | = | රාත්තල් 2.205 |
| මෙට්‍රික් ටොන් 1 (කිලෝග්‍රෑම් 1,000) | = | දිගු ටොන් 0.984 |
| මීටර් 1 | = | අඩි 3.281 |
| කිලෝමීටර් 1 | = | සැතපුම් 0.621 |
| මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1 | = | දිගු ටොන් සැතපුම් 0.612 |
| ලීටර් 1 | = | එ.රා. පයින්ට් 1.76 ▫ එ.රා.ගැ. 0.220 |
| හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1 | = | අක්කරයට රාත්තල් 0.892 |

### වී/සහල් පරිවර්තන

| | | |
|---|---|---|
| වී බුසල් 1 (රාත්තල් 46) | = | කිලෝග්‍රෑම් 20.87 |
| වී මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 47.92 |
| | = | සහල් මෙට්‍රික් ටොන් 0.7 |
| සහල් මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 68.46 |
| | = | වී මෙට්‍රික් ටොන් 1.43 |
| අක්කරයකට වී බුසල් 1 | = | හෙක්ටයාරයට වී කිලෝග්‍රෑම් 51.55 |

### පොල්/පොල් නිෂ්පාදන පරිවර්තන

| | | |
|---|---|---|
| කපාපු පොල් (දිසිදි පොල්) මෙට්‍රික් ටොන් 1 | = | පොල් ගෙඩි 8,960 |
| පොල් තෙල් මෙට්‍රික් ටොන් 1 | = | පොල් ගෙඩි 9,250 |
| කොප්පරා මෙට්‍රික් ටොන් 1 | = | පොල් ගෙඩි 5,500 |
| උකු කළ පොල් කිරි මෙට්‍රික් ටොන් 1 | = | පොල් ගෙඩි 4,000 |

# කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (අ)

රුපියල් මිලියන

| ශීර්ෂය | පවත්නා වෙළෙඳපොළ මිල අනුව | | | 2015 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2021 (අා) | 2022 (අා) (ඇ) | 2023 (ඇ) | 2021 (අා) | 2022 (අා) (ඇ) | 2023 (ඇ) |
| **නිමැවුම් ප්‍රවේශය** | | | | | | |
| භෝග වගාව | 1,092,133 | 1,367,845 | 1,423,553 | 644,773 | 619,434 | 641,080 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදන | 169,970 | 258,931 | 386,121 | 94,039 | 83,322 | 84,812 |
| වන වගාව, ගස් කැපීම, වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන හා පැල බෝ කිරීම | 98,006 | 143,234 | 160,305 | 74,181 | 84,958 | 81,518 |
| ධීවර කර්මාන්තය | 188,007 | 274,710 | 318,041 | 137,555 | 123,128 | 126,839 |
| පතල් හා කැණීම් කර්මාන්තය | 355,214 | 450,745 | 400,852 | 287,969 | 198,612 | 154,291 |
| ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 1,097,498 | 1,704,133 | 1,924,359 | 1,014,150 | 869,373 | 899,777 |
| රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩා බුමුතුරුණු නිෂ්පාදනය | 953,158 | 1,516,831 | 1,433,732 | 473,911 | 511,863 | 450,498 |
| වෙනත් නිෂ්පාදන කර්මාන්ත | 1,113,427 | 1,508,296 | 1,592,902 | 759,090 | 581,223 | 550,106 |
| විදුලිය නිෂ්පාදනය, ජලය බෙදාහැරීම සහ මලාපවහන කටයුතු | 184,103 | 71,461 | 298,262 | 230,014 | 220,187 | 213,563 |
| ඉදිකිරීම් කර්මාන්තය | 1,572,211 | 1,921,624 | 1,421,045 | 1,172,761 | 927,321 | 734,859 |
| තොග හා සිල්ලර වෙළඳාම | 2,254,632 | 3,344,708 | 3,863,407 | 1,675,083 | 1,675,534 | 1,677,928 |
| මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,644,942 | 2,644,080 | 3,633,369 | 1,344,119 | 1,384,459 | 1,438,759 |
| නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා | 164,560 | 350,895 | 517,732 | 130,743 | 166,030 | 209,140 |
| තොරතුරු හා සන්නිවේදන | 475,127 | 575,547 | 559,248 | 418,083 | 416,328 | 361,295 |
| මූල්‍ය සහ රක්ෂණ සේවා | 1,120,638 | 1,687,303 | 2,165,247 | 744,764 | 608,635 | 576,239 |
| නිවාස අයිතිය හා දේපොළ වෙළෙඳාම සහ වෘත්තීයමය සේවා | 1,203,953 | 1,461,518 | 1,714,004 | 932,460 | 802,924 | 775,825 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ සේවා | 1,770,239 | 1,947,566 | 2,055,478 | 1,172,791 | 1,169,143 | 1,162,374 |
| වෙනත් පෞද්ගලික සේවා | 1,206,712 | 1,708,257 | 2,048,824 | 992,662 | 995,154 | 998,877 |
| **මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය** | **16,664,532** | **22,937,682** | **25,916,480** | **12,299,149** | **11,437,626** | **11,137,782** |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 947,839 | 1,126,080 | 1,713,185 | 826,356 | 723,576 | 743,954 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **17,612,370** | **24,063,762** | **27,629,665** | **13,125,505** | **12,161,201** | **11,881,736** |
| **වියදම් ප්‍රවේශය** | | | | | | |
| පරිභෝජනය | 12,443,651 | 18,038,220 | 21,051,610 | 9,297,802 | 9,279,727 | 9,078,316 |
| පෞද්ගලික | 10,779,024 | 16,310,959 | 19,158,507 | 7,959,371 | 7,922,720 | 7,795,132 |
| රාජ්‍ය | 1,664,627 | 1,727,261 | 1,893,103 | 1,338,431 | 1,357,007 | 1,283,184 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 6,469,768 | 6,883,029 | 6,990,752 | 4,627,584 | 2,872,361 | 2,644,879 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදම** | **18,913,420** | **24,921,249** | **28,042,363** | **13,925,386** | **12,152,088** | **11,723,195** |
| භාණ්ඩ හා සේවා අපනයන | 2,980,263 | 5,187,912 | 5,634,247 | 2,159,760 | 2,380,525 | 2,649,808 |
| භාණ්ඩ හා සේවා ආනයන | 4,281,313 | 6,045,399 | 6,046,945 | 2,959,641 | 2,371,412 | 2,491,267 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **17,612,370** | **24,063,762** | **27,629,665** | **13,125,505** | **12,161,201** | **11,881,736** |
| **ආදායම් ප්‍රවේශය** | | | | | | |
| සේවක ආදායම් | 4,846,606 | 6,204,469 | 6,159,055 | 3,421,335 | 3,382,269 | 2,981,040 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 5,806,619 | 8,116,619 | 9,833,760 | 4,335,046 | 3,737,065 | 3,838,854 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 5,008,924 | 7,148,973 | 8,739,599 | 3,708,116 | 3,143,429 | 3,278,404 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 797,695 | 967,327 | 1,094,161 | 626,930 | 593,636 | 560,449 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 5,967,807 | 8,560,202 | 9,741,337 | 4,503,363 | 4,281,197 | 4,235,566 |
| මිශ්‍ර ආදායම් | 5,698,277 | 8,209,465 | 9,359,281 | 4,308,378 | 4,112,656 | 4,073,869 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 269,530 | 350,737 | 382,056 | 194,985 | 168,542 | 161,697 |
| නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද වෙනත් බදු | 43,500 | 56,711 | 182,329 | 39,405 | 37,094 | 82,322 |
| **මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය** | **16,664,532** | **22,937,682** | **25,916,480** | **12,299,149** | **11,437,626** | **11,137,782** |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 947,838 | 1,126,080 | 1,713,185 | 826,356 | 723,575 | 743,954 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **17,612,370** | **24,063,762** | **27,629,665** | **13,125,505** | **12,161,201** | **11,881,736** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(අා) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# ජනගහනය, ශ්‍රම බලකාය සහ විදේශ සේවා නියුක්තිය

| ශීර්ෂය | 2019 | 2020 | 2021 | 2022 | 2023 (අ) |
|---|---|---|---|---|---|
| **ජනගහනය** | | | | | |
| මධ්‍ය වාර්ෂික ජනගහනය, පුද්ගලයින් දහස් (ආ) | 21,803 | 21,919 | 22,156 | 22,181 | 22,037 |
| පුරුෂ | 10,556 | 10,613 | 10,727 | 10,740 | 10,670 |
| ස්ත්‍රී | 11,247 | 11,306 | 11,429 | 11,441 | 11,367 |
| මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධනය, ٪ | 0.6 | 0.5 | 1.1 | 0.1 | -0.6 |
| ජන ඝනත්වය, ව.කි.මී. 1කට පුද්ගලයන් | 348 | 350 | 353 | 354 | 351 |
| **ශ්‍රම බලකායෙහි ප්‍රවණතා (ඇ)** | | | | | |
| ශ්‍රම බලකාය, '000 | 8,592 | 8,467 | 8,553 | 8,547 | 8,408 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය (ඈ) | 52.3 | 50.6 | 49.9 | 49.8 | 48.6 |
| ස්ත්‍රී /පුරුෂ භාවය අනුව | | | | | |
| පුරුෂ | 73.0 | 71.9 | 71.0 | 70.5 | 68.6 |
| ස්ත්‍රී | 34.5 | 32.0 | 31.8 | 32.1 | 31.3 |
| රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය | | | | | |
| රාජ්‍ය අංශයේ සේවකයන් | 14.9 | 14.8 | 15.2 | 15.2 | 14.6 |
| පෞද්ගලික අංශයේ සේවකයන් | 43.0 | 42.7 | 42.0 | 42.8 | 44.5 |
| සේව්‍යයන් | 2.6 | 2.5 | 2.7 | 3.0 | 2.6 |
| ස්වයං රැකියාවල නියුතු වූවන් | 32.5 | 33.2 | 33.4 | 33.0 | 32.8 |
| ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් | 7.0 | 6.8 | 6.6 | 6.0 | 5.5 |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| ආර්ථික ක්‍රියාකාරීත්වය අනුව සේවා නියුක්තිය (ඉ) | | | | | |
| කෘෂිකර්මාන්ත | 25.3 | 27.1 | 27.3 | 26.5 | 26.1 |
| කර්මාන්ත | 27.6 | 26.9 | 26.0 | 26.5 | 25.5 |
| සේවා | 47.1 | 46.0 | 46.7 | 47.0 | 48.4 |
| සේවා වියුක්ති අනුපාතිකය, ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස | 4.8 | 5.5 | 5.1 | 4.7 | 4.7 |
| ස්ත්‍රී /පුරුෂ භාවය අනුව | | | | | |
| පුරුෂ | 3.3 | 4.0 | 3.7 | 3.7 | 3.6 |
| ස්ත්‍රී | 7.4 | 8.5 | 7.9 | 6.5 | 7.0 |
| තරුණ සේවා වියුක්ති අනුපාතිකය (වයස අවු. 15-24) | 21.5 | 26.5 | 26.5 | 22.8 | 23.0 |
| **විදේශ සේවා නියුක්තිය** | | | | | |
| විදේශීය රැකියා සංඛ්‍යාව | 203,087 | 53,711 | 122,264 | 311,056 | 297,656 |
| ස්ත්‍රී/පුරුෂ භාවය, ප්‍රතිශතයක් ලෙස | | | | | |
| පුරුෂ | 60.2 | 60.5 | 66.3 | 60.1 | 55.3 |
| ස්ත්‍රී | 39.8 | 39.5 | 33.7 | 39.9 | 44.7 |
| ශ්‍රම කාණ්ඩ, ප්‍රතිශතයක් ලෙස | | | | | |
| පුහුණු ශ්‍රමිකයන් | 74.8 | 74.0 | 74.1 | 66.1 | 70.1 |
| අඩු පුහුණු ශ්‍රමිකයන් | 25.2 | 26.0 | 25.9 | 33.9 | 29.9 |

(අ) තාවකාලික
(ආ) 2012 ජන හා නිවාස සංගණනය පදනම් කොටගෙන සකස්කර ඇත.
(ඇ) අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ඈ) කුටුම්බ ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස ශ්‍රම බලකාය
(ඉ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණය 4 වන සංශෝධනය මත පදනම් වේ.

මූලයන්: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## මූර්ත අංශය

**3 වැනි සංඛ්‍යා සටහන**

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100)

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | මාසික වෙනස (%) | | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | මූලික කො.පා.මි.ද. | කො.පා.මි.ද. | මූලික කො.පා.මි.ද. | කො.පා.මි.ද. | මූලික කො.පා.මි.ද. |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | - | - |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |
| | ජූනි | 192.3 | 169.9 | 0.0 | -0.6 | 12.0 | 9.8 |
| | ජූලි | 190.2 | 170.4 | -1.1 | 0.3 | 6.3 | 5.9 |
| | අගෝස්තු | 190.1 | 171.2 | -0.1 | 0.5 | 4.0 | 4.6 |
| | සැප්තැම්බර් | 191.8 | 172.0 | 0.9 | 0.5 | 1.3 | 1.9 |
| | ඔක්තෝබර් | 191.4 | 172.4 | -0.2 | 0.2 | 1.5 | 1.2 |
| | නොවැම්බර් | 193.4 | 172.4 | 1.0 | 0.0 | 3.4 | 0.8 |
| | දෙසැම්බර් | 195.1 | 172.5 | 0.9 | 0.1 | 4.0 | 0.6 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4 වැනි සංඛ්‍යා සටහන**

### ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100)

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | මාසික වෙනස (%) | | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | මූලික ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. | මූලික ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. | මූලික ජා.පා.මි.ද. |
| 2023 | ජනවාරි | 201.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 52.0 |
| | පෙබරවාරි | 204.1 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 50.1 |
| | මාර්තු | 204.8 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 31.8 |
| | මැයි | 203.1 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 21.6 |
| | ජූනි | 203.3 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 11.3 |
| | ජූලි | 201.9 | 188.0 | -0.7 | 0.8 | 4.6 | 6.3 |
| | අගෝස්තු | 201.9 | 188.7 | 0.0 | 0.4 | 2.1 | 4.1 |
| | සැප්තැම්බර් | 203.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | 1.7 |
| | ඔක්තෝබර් | 203.6 | 189.2 | 0.0 | 0.1 | 1.0 | 0.6 |
| | නොවැම්බර් | 206.0 | 189.3 | 1.2 | 0.1 | 2.8 | 0.8 |
| | දෙසැම්බර් | 208.8 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 0.9 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# වැටුප් ප්‍රමාණ දර්ශක

| | දර්ශකය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|
| | නාමික | මූර්ත (අ) | නාමික | මූර්ත (අ) |
| **රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) (ආ)** | | | | |
| 2020 | 114.6 | 94.8 | 9.2 | 2.9 |
| 2021 | 114.6 | 88.7 | 0.0 | -6.4 |
| 2022 | 133.1 | 70.5 | 16.1 | -20.6 |
| 2023 (ඇ) | 133.1 | 58.1 | 0.0 | -17.5 |
| **විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) (ඈ)** | | | | |
| 2020 | 4,282.0 | 88.8 (ඉ) | 0.2 | -4.2 |
| 2021 | 7,469.5 | 146.0 (ඉ) | 74.4 | 64.3 |
| 2022 | 8,198.6 | 112.9 (ඉ) | 9.8 | -22.7 |
| 2023 (ඇ) | 8,232.9 | 93.0 (ඉ) | 0.4 | -17.6 |
| **අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) (ඊ)** | | | | |
| 2020 | 112.7 | 102.6 | 6.4 | 0.2 |
| 2021 | 123.1 | 104.7 | 9.2 | 2.0 |
| 2022 | 153.3 | 88.3 | 24.5 | -15.7 |
| 2023 (ඇ) | 170.8 | 82.0 | 11.4 | -7.1 |

(අ) ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) මත පදනම් වේ.

(ආ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2016 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මඟින් රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහයට සිදුකරන ලද වෙනස්කම් ග්‍රහණය කරගැනීම සඳහා රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 වසරේ සිට 2016 වසරට යාවත්කාලීන කරන ලදී. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්ති ව්‍යුහය පිළිබඳ දත්ත, ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 නොවැම්බර් මස පවත්වන ලද රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශවල සේවා නියුක්තිය පිළිබඳ සංගණනයෙන් ලබා ගන්නා ලදී.

(ඇ) තාවකාලික

(ඈ) 1978 දෙසැම්බර් 31 වන දින සේවයේ යෙදී සිටි සංඛ්‍යාව පදනම් කොටගත් බර තැබීම් මත දර්ශක අංක ගණනය කරනු ලැබේ. දර්ශක අංක ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත්තේ පඩි පාලක සභා මඟින් අනුමත කළ විවිධ කර්මාන්තවල අවම වැටුප්ය.

(ඉ) කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07=100) මත පදනම් වේ.

(ඊ) අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් හා රැකියා ව්‍යුහයේ මෑතකාලීනව සිදු වූ වෙනස්කම් නිරූපණය කිරීමේ අරමුණින් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 සිට 2018 දක්වා යාවත්කාලීන කරන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පද්ධතිය මඟින් රැස් කරනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් දර්ශකය (2006/07=100) භාවිතා කරමින් දර්ශක අගය ගණනය කරනු ලැබේ. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්ති ව්‍යුහය පිළිබඳ දත්ත, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දී පවත්වන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණවලින් ලබාගන්නා ලදී.

## අපනයන සංයුතිය

වටිනාකම එ.ජ.ඩොලර් මිලියන වලිනි

| කාණ්ඩය | 2019 | 2020 | 2021 | 2022 | 2023 (අ) | | වාර්ෂික වෙනස්වීම (%) 2022/2023 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | වටිනාකම | දායකත්වය (%) | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,461.9** | **2,336.2** | **2,729.5** | **2,568.0** | **2,566.5** | **21.5** | **-0.1** |
| තේ | 1,346.4 | 1,240.9 | 1,324.4 | 1,258.8 | 1,309.9 | 11.0 | 4.1 |
| කුළුබඩු | 312.5 | 333.5 | 454.8 | 368.7 | 392.9 | 3.3 | 6.5 |
